# LST REVIEW

වෙළුම 31 | නිකුතුව 349 | 2023 ජුනි
www.lstlanka.org

LAW & SOCIETY TRUST

# අරගලය

## විරෝධතාවයේ දේශපාලනය

**LST Review**

වෙළුම 31 | නිකුතුව 349 | 2023 ජූනි

**අරගලය**

නීතිය හා සමාජය භාරය

ISSN : 2815-02444

---

**හර්තාලයේ සිට අරගලය දක්වා:**
**ශ්‍රී ලංකාවේ විරෝධතා දේශපාලනයේ වෙනස් වන මුහුණුවර**
*සකුන්තලා කදිර්ගාමර්*

**අපට ලොක්කන් නැතුවම බැරි ද?**
**පශ්චාත් අරගල දේශපාලන සන්දර්භය පිළිබඳ මහජන අදහස් විමසීමක්**
*විදුර මුණසිංහ සහ ප්‍රභාත් හේමන්ත කුමාර*

**මාර්ගගත අවකාශයේ දී අරගලය: සමාජ මාධ්‍යවල දේශපාලන භූමිකාව පිළිබඳ දළ සටහනක්**
*ලාරා විජේසූරිය සහ සමල් විමුක්ති හේමචන්ද්‍ර*

**ගෝඨාගෝගම මහජන සරසවිය: විකල්ප බුද්ධිමය අවකාශයක් අත්හදා බැලීමක්**
*සමල් විමුක්ති හේමචන්ද්‍ර*

**ජනතා අරගලයේ කාන්තාවෝ**
*ස්වස්තිකා අරුලිංගම් සහ මරීසා ද සිල්වා*

**අරගලය - ශ්‍රී ලංකාවේ ජනතා අරගලය: විරෝධතා කලාව ඔස්සේ විරෝධතාවයේ කලාව ප්‍රකාශ කිරීම්**
*සකුන ගමගේ*

---

ශ්‍රී ලංකාවේ මුද්‍රණය කරන ලදී

# පටුන


**කතුවැකිය**

## ලිපි

**හර්තාලයේ සිට අරගලය දක්වා: ශ්‍රී ලංකාවේ විරෝධතා දේශපාලනයේ වෙනස් වන මුහුණුවර** 3

*සකුන්තලා කදිර්ගාමර්*

**අපට ලොක්කන් නැතුවම බැරි ද? පශ්චාත් අරගල දේශපාලන සන්දර්භය පිළිබඳ මහජන අදහස් විමසීමක්** 18

*විදුර මුණසිංහ සහ ප්‍රභාත් හේමන්ත කුමාර*

**මාර්ගගත අවකාශයේ දී අරගලය: සමාජ මාධ්‍යවල දේශපාලන භූමිකාව පිළිබඳ දළ සටහනක්** 36

*ලාරා විජේසූරිය සහ සමල් විමුක්ති හේමචන්ද්‍ර*

**ගෝඨාගෝගම මහජන සරසවිය: විකල්ප බුද්ධිමය අවකාශයක් අත්හදා බැලීමක්** 48

*සමල් විමුක්ති හේමචන්ද්‍ර*

**ජනතා අරගලයේ කාන්තාවෝ** 57

*ස්වස්තිකා අරුලිංගම් සහ මරීසා ද සිල්වා*

**අරගලය - ශ්‍රී ලංකාවේ ජනතා අරගලය: විරෝධතා කලාව ඔස්සේ විරෝධතාවයේ කලාව ප්‍රකාශ කිරීම්** 62

*සකුන ගමගේ*


# කතුවැකිය

මෙම එල් එස් ටී රිවීව් සඟරාව එළිදැක්වෙන්නේ (2022 මාර්තු 15) අරගලය ආරම්භ වී වසරකින් ය. අරගලය වූ කලී ජනතා විරෝධතාවන්හි පුපුරායෑමක් විය. ස්ත්‍රීපුරුෂ සමාජභාව බාධක, පන්ති බාධක සියල්ල අභිබවමින් ක්‍රියාත්මක වූ මෙම විරෝධතා සඳහා එතෙක් අක්‍රියව සහ නිහඬව සිටි මධ්‍යම පන්තිය පවා ඇදී ආවේය. ගෝඨාභය රාජපක්ෂගේ ඡන්ද පදනම වූ ගොවීන් සහ වෘත්තීය සමිති ද ඔහුට එරෙහි වී පිටුපා යාමත් සමග ඔහුට පක්ෂපාතී වූ පිරිස් ද අරගලයට සම්බන්ධ වූයේ පක්ෂ කෙරෙහි වූ විශ්වාසවන්තකම් ද අබිභවා යමිනි. මෙම විරෝධතාවය සුළුතර කණ්ඩායම් වෙත ප්‍රවේශ වෙමින් ඔවුන් ව ද ආකර්ෂණය කර ගත් අතර, මෙතෙක් ආමන්ත්‍රණය නොකළ ඔවුන්ගේ ඉල්ලීම් වෙත අවධානය යොමු කරමින්, ඔවුන්ගේ අතීත අරගලවලටද තාවකාලිකව පිළිගැනීමක් ලබා දුනි. මෙම අරගලයට නායකත්වය දුන්නේ දේශපාලනඥයින් නොවේ. තරුණ මෙන්ම වියපත් තැනැත්තන් ද එකසේ ඊට ඇදී ආහ. ඒ අර්ථයෙන් ගත් කල එය සුවිශේෂී වූ අරගලයක් විය.

අධික ජීවන වියදම, ඉහළ උද්ධමනය සහ ඉන්ධන හා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟය අරගලයට සම්බන්ධ වීමට ජනතාව පෙළඹවූ උත්ප්‍රේරකයන් වූ අතර, එය රජයේ ක්‍රියාමාර්ග ගැඹුරින් විමසා බලමින්, දූෂණය, ඥාති සංග්‍රහය, බහිෂ්කරණය සහ ඒකාධිපතිවාදය නැමති ගොහොරේ ගිලී ඇති ශ්‍රී ලංකාවේ දේශපාලනයෙහි ස්වභාවය ඉස්මතු කර පෙන්වූයේය.

ජනතාවට අරගලය බොහෝ ආකාරවලින් වැදගත් විය. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ පැරණි නියෝජිත ආයතනවලට අභියෝග කරන දේශපාලන ක්‍රියාවලියක් වූ සිද්ධියක් වූ එය පවතින ක්‍රමය පිරිසිදු කර අලුතින් ගොඩනැගීමේ අවස්ථාවක් නිර්මාණය කළේය. "ගෝඨා ගෝ හෝම්" (ගෝඨා ගෙදර යන්න) සහ "සිස්ටම් චේන්ජ්" (ක්‍රමය වෙනස් කරන්න) අරගලයේ සටන් පාඨ විය. අරගලය සුවිශේෂී සංසිද්ධියක් මෙන්ම දේශපාලන, සමාජීය සහ බුද්ධිමය අවකාශයක් ද විය. එය නැවුම් අනාගතයකට පියමං කළ හැකි මගක් විය. අරගලයෙන් ප්‍රජාතන්ත්‍රවාදී ශක්තියක් මුදා හැරියේය; ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පැහැදිලිව පෙනෙන්නට තිබෙන ප්‍රහේලිකා සහ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ ඇති අර්බුදය ඉන් ඉස්මතු කර පෙන්වූයේය. පවතින ක්‍රමය වෙනස් කරන ලෙස තරුණ ප්‍රජාවගෙන් ඉදිරිපත්වූ ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමට පවතින ක්‍රමය අසමත් වීමේ ප්‍රතිඵලයක් වූයේ අරගලය යි - ශ්‍රී ලංකා ඉතිහාසය තුළ තරුණයින්

පවතින ක්‍රමයට සහ බල ව්‍යුහයන්ට අභියෝග කළ තුන්වැනි අවස්ථාව එය විය.

දේශපාලන සහ නිලධාරිවාදී ප්‍රභූ පැලැන්තිය බුක්ති විඳින බලතල මත සමාජමය සංවරණ සහ සංතුලන ලෙස ක්‍රියා කරන ජන සභා පිහිටුවීම, ඡන්දයෙන් තේරී පත්වූවන් ඉවත් කිරීමේ අයිතිය සහ ඍජු ප්‍රජාතන්ත්‍රවාදයේ අනෙකුත් යාන්ත්‍රණ හා පුරවැසි ව්‍යාපාර ස්ථාපනය කිරීම, සහ ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡාවලදී සහභාගීත්ව පුරවැසි සංවිධාන ස්ථාපනය කිරීම වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටීම සඳහා එය අවස්ථාව විය. මේවා, නියෝජිත පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ දීර්ඝ කාලයක් තිස්සේ පවතින අඩුපාඩු ආමන්ත්‍රණය කිරීමට යෙදිය හැකි පිළියම් පිළිබඳ අදහස් කිහිපයකි.

අරගල කාලය තුළ දී පුරවැසි ව්‍යාපාරයෙහි මැදිහත්වීම් ශ්‍රී ලංකාවේ දේශපාලනයට සම්පූර්ණයෙන් ම නව මානයක් එක් කළ අතර, එය දේශපාලනය තුළ පුරවැසියාගේ භූමිකාව අක්‍රීය බලා සිටින්නෙකුගේ භූමිකාවේ සිට, සුපරීක්ෂාකාරී හා සහභාගීත්ව දේශපාලන ක්‍රියාකාරීන්ගේ භූමිකාවක් දක්වා මාරුවීම සනිටුහන් කරයි. එම සංක්‍රාන්ති ක්‍රියාවලිය, එතරම් හිස් නොවන, එහෙත් සම්පූර්ණයෙන් ම නොසලකා හරින ලද මෙම සංකල්පවල අර්ථයට අනුකූලව අපගේ ප්‍රජාතන්ත්‍රවාදය සහ ප්‍රජාතන්ත්‍රවාදී-සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පදනම් ප්‍රතිනිර්මාණය කිරීමට හා ගැඹුරු කිරීමට අවශ්‍ය නව බුද්ධිමය හා දේශපාලනමය ශක්තියක් ද සපයා දී ඇත. එමෙන් ම, අරගලය මගින් කලාව, කාටූන් චිත්‍ර සහ මූර්ති හරහා නව ස්වරූපවල පුරවැසි සන්නිවේදනයක් සඳහා අවකාශයක් ද නිර්මාණය කළේය.

එල් එස් ටී රිවීව් සඟරාව, පහත සඳහන් මාතෘකා ඔස්සේ රචනා කර ඇති ලිපි එකතුවක් හරහා මෙම බහුවිධ මානයන් ග්‍රහණය කරගනියිː ශ්‍රී ලංකාවේ විරෝධතා ව්‍යාපාරවල ඉතිහාසය පිළිබඳ සමාලෝචනයක් (සකුන්තලා කදිර්ගාමර් රචනා කළ "හර්තාලයේ සිට අරගලය දක්වාඃ ශ්‍රී ලංකාවේ විරෝධතා දේශපාලනයේ වෙනස්වන මුහුණුවර"); අරගලයේ පසුබිම තුළ මහජන මතය පිළිබඳ විශ්ලේෂණයක් (විදුර මුණසිංහ සහ ප්‍රභාත් හේමන්ත කුමාර රචනා කළ "අපිට ලොක්කන් නොමැතිව පාලනය කළ හැකිද? අරගලයේ දේශපාලන සන්දර්භය තුළ මහජන මතය පිළිබඳ විශ්ලේෂණයක්"); අරගලයේ පසුබිම තුළ සමාජ මාධ්‍යවල දේශපාලන භූමිකාව පිළිබඳ කෙටි සටහනක් (ලාරා විජේසූරිය සහ සමල් විමුක්ති හේමචන්ද්‍ර රචනා කළ "මාර්ගගත අරගලයඃ සමාජ මාධ්‍යවල දේශපාලන භූමිකාව පිළිබඳ සැකෙවින්"); විකල්ප බුද්ධිමය අවකාශයක් නිර්මාණය කිරීමේ දී එහි භූමිකාව (සමල් විමුක්ති හේමචන්ද්‍ර රචනා කළ "ගෝඨාගෝගම ජනතා විශ්වවිද්‍යාලයඃ විකල්ප බුද්ධිමය අවකාශයක අත්හදා බැලීමක්"); අරගලයේ දී කාන්තාවන්ගේ භූමිකාව පිළිබඳ විශ්ලේෂණයක් - ස්ත්‍රී පුරුෂ සමාජභාව, වාර්ගිකත්ව සහ ප්‍රදේශ සීමා බිඳ දැමීම (ස්වස්තිකා අරුලිංගම් සහ මරිසා ද සිල්වා රචනා කළ "ජනතා අරගලයේ කාන්තාවෝ"); සහ විරෝධයපෑමේ කලාව නිර්මාණය කිරීම සඳහා එය ජනිත කර දුන් අවස්ථාව (සකුණ ගමගේ රචනා කළ " අරගලය - ශ්‍රී ලංකාවේ ජනතා සටන : විරෝධතා කලා හරහා විරෝධයපෑමේ කලාව ප්‍රකාශ කිරීම") යන ලිපි මීට ඇතුළත් වේ.

පොදු අවකාශ තුළ සහ ජනතා පරිකල්පනය තුළ අරගලය මුල් බැසගෙන මේ වන විට වසරක් ගෙවී ගොස් ඇති අතර, වර්තමාන රජය නැවත බලය තහවුරු කර ගැනීමත් සමග එම දර්ශනය දැන් වෙනස් වී ඇත. මෙම ව්‍යාපාරය දේශපාලන ග්‍රහණයට ගනු ඇතැයි යන බිය හේතුවෙන් අරගලයට මධ්‍යම පාන්තිකයින්ගෙන් ලැබුණු සහයෝගය හීනවී ගොස් ඇති අතර, "ක්‍රමයේ වෙනසක්" ඉල්ලා සිටින සටන් පාඨ දැන් "ආණ්ඩුවට අවස්ථාවක් දෙන්න" යන ඉල්ලීම් සමග තරග කරමින් තිබේ. මෙම මිශ්‍ර පණිවුඩ ලැබෙන්නේ රජය 'ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත' වැනි කුරිරු නීති සම්මත කර ගැනීම සලකා බලමින් සිටින සහ ජනතාවගේ ජීවන අවස්ථාවන් කෙරෙහි දැඩි බලපෑම් ඇති කළ හැකි ව්‍යුහාත්මක ගැළපීම් සිදු කිරීම සඳහා අවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණ පරාසයක් සලකා බලමින් සිටින පසුබිම තුළයි. "ක්‍රමයේ වෙනසක්" ඉල්ලා සිටින මෙම ව්‍යාපාරය ඒකාධිපතිවාදී 'පොලිස් රාජ්‍යය'[1] විසින් යටපත් කරමින් තිබීමේ සලකුණු පෙනෙන්නට තිබේ. පහසුවෙන් ලබා ගතහැකි උපකරණ, එනම් නීතිය සහ ආරක්ෂක අංශ, යොදා ගනිමින් රජය මහජන විරෝධතාවලට එරෙහිව කටයුතු කිරීමට කැසකවමින් වෙමින් සිටියි.

ඉතිහාසයෙන් පාඩම් ඉගෙන නොගැනීමේ දරදඬුකම සහ එවැනි නොසැලකිලිමත්කම්වලට එරෙහිව සටන් කිරීමට ශක්තිය ලබා ගැනීම සඳහා විරෝධතා දේශපාලනය ප්‍රතිසංවිධානය කළ හැකිය.

[1] "අරගලය", වසරක කාලය - ත්‍රස්ත විරෝධී පනත පක්ෂය විනාශ කරමින් තිබේ." *සන්ඩේ ටයිම්ස්, 2023 අප්‍රේල් 09* https://www.sundaytimes.lk/230409/

# හර්තාලයේ සිට අරගලය දක්වා: ශ්‍රී ලංකාවේ විරෝධතා දේශපාලනයේ වෙනස් වන මුහුණුවර

*සකුන්තලා කදිර්ගාමර්**

*නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ විරෝධතා දේශපාලනයේ මුහුණුවර වෙනස්වී ඇති අන්දම පිළිබඳව සවිස්තරාත්මක විශ්ලේෂණයක් කතුවරිය විසින් ඉදිරිපත් කරයි.*

*එසේම, විරෝධතා වටා ඇති භාෂාව වර්ගීකරණය සහ සුමට කිරීම සඳහා ඉන්දියාවෙන් ලබාදුන් ගැඹුරු දායකත්වය සම්බන්ධයෙන් සහ මෑතකාලීන ගෝලීය විරෝධතා ව්‍යාපාර පිළිබඳව ඇය සඳහන් කරන්නීය.*[1]

ශ්‍රී ලංකාව නිදහස ලබා ගැනීමෙන් පසු ඉතිහාසය තුළ රජයෙන් සිදුකළ යම් යම් ක්‍රියා සහ නොකර හැරීම්වලට එරෙහිව පුරවැසියන් විරෝධතාවය ප්‍රකාශ කළ අවස්ථා ගණනාවක් තිබේ. (රාජ්‍ය විරෝධි කුමන්ත්‍රණ සහ සන්නද්ධ කැරලි වැනි) එම විරෝධතා අතරින් සමහරක් පැහැදිලිව ම ව්‍යවස්ථා විරෝධී සහ නීති විරෝධ ඒවා වන අතර, ව්‍යවස්ථා විරෝධී හෝ නීති විරෝධී නොවන විරෝධය ප්‍රකාශ කිරීම් ගණනාවක් ද තිබේ. භාෂණයේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ කම්කරු අයිතිවාසිකම් සහතික කර ඇති (නැතහොත් ඒ බව වචනයෙන් හෝ ප්‍රකාශ කර ඇති) ප්‍රජාතන්ත්‍රවාදී රටවල (විරෝධතා දැක්වීම සඳහා ඇතුළුව) සමාගමයේ නිදහස සඳහා ඇති අයිතිය මනා ලෙස ස්ථාපනය කර තිබේ. විරෝධය දැක්වීම සඳහා ඇති අයිතිය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය පුළුල් ලෙස ගෙන, වැඩවර්ජන සිදු කිරීම සඳහා ඇති අයිතිය ද ඊට ඇතුල් කිරීම සඳහා වෘත්තීය සමිති යොමු වී ඇති අතර, එහි ව්‍යවස්ථානුකූලභාවය විසංවාදයට ලක්වී ඇති නමුත් එය නිරතුරුව ම යොදා ගනු ලබන උපාය මාර්ගයක් බවට පත් වී තිබේ.

දේශපාලන පක්ෂ, විපක්ෂයේ සිටින විට පෙළපාලි සහ විරෝධතා සංවිධානය කිරීමට හෝ ඒවාට සහායදීමට ඉදිරිපත් වන නමුත්, ඒ අවස්ථාව වන විට බලයේ සිටින ආණ්ඩු විරෝධතාවලට සහ විරෝධතාකරුවන්ට විරුද්ධත්වය දක්වති. විශේෂයෙන් ම විරෝධතාකරුවන් නිවැරදි දේ වෙනුවෙන් පෙනී සිටිමින් සත්‍යය කථා කිරීම තම ශක්තිය බවට පත්කරගන්නා අවස්ථාවල සහ පීඩාවට පත්ව සිටින පුරවැසියන්ගේ ජීවන යථාර්ථයන් හෙළිදරව් කරන විට ආණ්ඩු එවැනි විරෝධතා සලකන්නේ කරදර වශයෙන් වේ. බොහෝ විට විරෝධතා සඳහා ආණ්ඩුවේ හෝ එහි බලතල ක්‍රියාත්මක කරන්නන්ගේ ප්‍රතිචාරය වන්නේ ප්‍රචණ්ඩත්වයයි. අනෙක් අතට විරෝධතාකරුවන් ද ඊට ප්‍රතිපිළිතුරු දීම සඳහා ප්‍රචණ්ඩත්වය යොදගැනීමත් සමගින් සියලු විරෝධතා කඩාකප්පල් කිරීම් සහ ප්‍රචණ්ඩත්වය හා බැඳුනු ඒවාය යන අදහසක් නිර්මාණය වේ. නමුත් එම අදහස සැබවින් ම පදනම් විරහිත විය හැක.

[1] ආචාර්ය සකුන්තලා කදිර්ගාමර් විධායක අධ්‍යක්ෂිකා නීතිය හා සමාජය භාරය

# හර්තාල්, සත්‍යග්‍රහ සහ මහා වැඩවර්ජන (බන්ද්) වලට ආකර්ෂණය වූ දකුණු ආසියාව

*විරෝධතාවලදී භාවිතා කරනු ලබන භාෂාව වර්ගීකරණය කිරීම සහ සියුම්ව සකස් කිරීම උදෙසා ඉන්දියාව ඉමහත් දායකත්වයක් ලබා දී ඇත. හර්තාල් සත්‍යග්‍රහ සහ බන්ද් - මෙම සියලු යෙදුම්වලින්* සමාන අරමුණු අදහස් කෙරෙන අතර, ඉන්දියාවේ විරෝධතා දේශපාලනය පිළිබඳ විශේෂ දැනුමක් හෝ අත්දැකීම් නොමැති අයට බොහෝ විට මෙම යෙදුම් අතර ඇති සියුම් වෙනස නොදැනෙනු ඇත. ඉන්දියානුවන්ට සහ අනෙකුත් උප මහාද්වීපිකයින්ට, 'හර්තාල්', 'සත්‍යග්‍රහ', 'බන්ද්' සහ 'චක්ක ජෑම්' යන වචන ගැඹුරු හැඟීම් දනවන අතර, නිසැකවම නිදහස සහ ස්වාධීනත්වය දිනා ගැනීමේ නීත්‍යානුකූල අරගලය වූ "ඉන්දියාව හැරයනු" *ව්‍යාපාරය හා සම්බන්ධ බොහෝ මතකයන් පුනර්ජීවනය කරයි.*

'හර්තාල්' යන්න ඉන්දියානු භාෂා බොහොමයක භාවිතා වන යෙදුමක් වන අතර ප්‍රථම වරට එය 20 වන සියවසේ මුල් භාගයේ ඉන්දියානු නිදහස් ව්‍යාපාරයේ දී භාවිතා විය. ගුජරාටි භාෂාවේ යෙදුමක් වන මෙය ගුජරාටි වැසියෙකු වූ මහත්මා ගාන්ධි නිදහස දිනා ගැනීම සඳහා වූ ඔහුගේ මහා වැඩ වර්ජන හැඳින්වීමට භාවිතා කළ අතර, ඔහු එම යෙදුම ඉතා සාර්ථක ලෙස ස්ථාපනය කළේය.

හර්තාලයක් යනු සේවා ස්ථාන, කාර්යාල, කඩ සාප්පු සහ අධිකරණ සම්පූර්ණයෙන් ම වසා දමන ලෙස ඉල්ලා සිටිමින් මහජනතාව සිවිල් නීතිවලට අවනත නොවී විරෝධතා දැක්වීමකි. එය කම්කරු වර්ජනයකට සමානය. මහා වැඩ වර්ජනයක් වනවාට අමතරව පාසල් සහ ව්‍යාපාරික ස්ථාන ද ස්වේච්ඡාවෙන් ම වසා දැමීම ද එයට ඇතුළත් වේ. එය ජනප්‍රිය නොවන හෝ පිළිගත නොහැකි තීරණයක් අහෝසි කරන ලෙස රජයකට බලපෑම් කරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටීමකි. මූලික වශයෙන් ම දේශපාලන හේතූන් මත යොදා ගනු ලබන හර්තාල් ව්‍යාපාර, රජයේ ප්‍රතිපත්තියකට හෝ ක්‍රියාමාර්ගයකට විරෝධය දැක්වීම සඳහා විරුද්ධ පක්ෂයක් විසින් බොහෝ විට භාවිතා කරන උපක්‍රමයකි.

සංස්කෘත සහ හින්දි භාෂා වලින් 'සත්‍යග්‍රහ' යන්නෙහි තේරුම "සත්‍යය දරාසිටීම" යන්නයි. සංකල්පයක් ලෙස සහ නිර්දේශපාලනික උපාය මාර්ගයක් ලෙස සත්‍යග්‍රහ හඳුන්වා දෙනු ලැබුවේ ද 20 වැනි සියවසේ මුල් භාගයේදී මහත්මා ගාන්ධි විසින් වන අතර, දුෂ්ට යැයි ඔහු දුටු දෙයට - එනම් ඉන්දියාවේ යටත් විජිත පාලනයට - එරෙහි වූ අධිෂ්ඨානශීලී, එහෙත් අවිහිංසාවාදී විරෝධය පෑමක් ලෙස එය හඳුන්වා දෙන ලදී. සත්‍යග්‍රහයේ ස්වරූප තුනක් ඇත: සහයෝගය නොදැක්වීම, සිවිල් නීති නොපිළිපැදම සහ වර්ජනය කිරීම යනු එම ස්වරූප තුනයි. 'සත්‍යග්‍රහය' යන යෙදුම විරෝධතා පිටුපස ඇති දේශපාලනය මධ්‍යස්ථ කරවන අතර, විරෝධතාවලට සුචරිතය පිළිබඳ හැඟීමක් - එනම්, පුරවැසි සද්ගුණයක්, කාවද්දයි.

වචනාර්ථයෙන් ගත් කල 'බන්ද්' යන්නෙහි තේරුම "වසා දැමීම" යන්නය. එය ප්‍රධාන වශයෙන් ම ඉන්දියාව සහ නේපාලය වැනි දකුණු ආසියානු රටවල දේශපාලන ක්‍රියාකාරීන් විසින් භාවිතා කරනු ලබන, සිවිල් නීති නොපිළිපැදීම හරහා විරෝධය දැක්වීමේ ස්වරූපයකි. එය වැඩ වර්ජනයකට සමානකම් දරයි. බන්ද් විරෝධතාවයක් අතරතුර දී ප්‍රජාවකට මහා වැඩ වර්ජනයක් වුව ද නිර්මාණය කළ හැකිය.

"චක්ක ජෑම්" යනු විරෝධතා දැක්වීමක් ලෙස මාර්ගයක් අවහිර කිරීමට හෝ හිතාමතා ම මාර්ග තදබදයක් ඇති කිරීමට භාවිතා කරනු ලබන උපක්‍රම වේ. මෙම විරෝධතාවලදී, රථවාහන ගමනාගමනය සම්පූර්ණයෙන් ම නතර කිරීම සඳහා ක්‍රියාකාරීන් විසින් දුම්රිය මාර්ගවල හෝ මාර්ගවල තදබදයක් ඇති කරනු ලැබිය හැක.

මහත්මා ගාන්ධිට සත්‍යග්‍රහයක් පිළිබඳ අදහස මුලින් ම ඇති වූයේ 1906 වර්ෂයේ දී දකුණු අප්‍රිකාවේ ට්‍රාන්ස්වාල් හි බ්‍රිතාන්‍ය යටත් විජිත රජය විසින් ආසියානුවන්ට එරෙහිව වෙනස් කොට සැලකීමේ නීතියක් සම්මත කරගැනීමට ප්‍රතිචාරයක් වශයෙනි. කෙසේ වෙතත්, ඔහු සත්‍යග්‍රහ ව්‍යාපාරයක් මුලින් ම දියත් කළේ 1917 වර්ෂයේ දී ඉන්දියාවේ ඉන්ඩිගෝ වගාකරන ප්‍රදේශයක් වන චම්පාරන් දිස්ත්‍රික්කයේ දී වන අතර, එය ඉන්දියානු නිදහස් ව්‍යාපාරයේ ඓතිහාසික වශයෙන් වැදගත් කැරැල්ලක් ලෙස සලකනු ලැබේ.

බොහෝ අඳගොවීන්ට ඔවුන්ගේ කුලී අයිතියෙහි කොන්දේසියක් ලෙස, ඉතා අල්ප ගෙවීමක් ලැබ, ඔවුන්ගේ ඉඩම්වල යම් කොටසක ඉන්ඩිගෝ වගා කිරීමට බල කෙරුණු යටත් විජිත යුගයේ නීතිවලට එරෙහිව ගාන්ධි චම්පාරන්හි දී ගොවි විරෝධයක් සංවිධානය කළේය. ඉන්ඩිගෝ යනු ඩයි සෑදීමට භාවිතා කරන ලද අමුද්‍රව්‍යයක් වූ නමුත්, එය ආර්ථික බෝගයක් වූ බැවින් එය වගා කළ ගොවීහු වෙළඳපොළ මිල අවදානමට මුහුණ දුන්හ. ඉන්ඩිගෝ වගාව පස හානියට ද හේතුවක් විය. බ්‍රිතාන්‍ය යටත්විජිත ක්‍රමය

තුළ ඉන්දියානුවන්ගේ සහභාගීත්වය තිබිය යුතුය යන මැදහත් මත දැරූවන්, සහ ඉන්දියාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය බිඳ දැමීම සඳහා ප්‍රචණ්ඩ ක්‍රම භාවිතා කිරීමට අනුබල දුන් බෙංගාලයේ අන්තවාදීන් අතර දෝලනය වෙමින් පැවති, බෙදී ගොස් තිබූ ඉන්දියානු නිදහස් අරගලයට සහ ඉන්දියානු තරුණයින්ට චම්පාරන් සත්‍යග්‍රහයෙන් මග පෙන්වීමක් ලබා දුන්නේය.

1918 දී අහමදාබාද් කර්මාන්තශාලාවේ කම්කරුවන් වැඩි වැටුප් ඉල්ලා උද්ඝෝෂණ කළ අවස්ථාවේ ගාන්ධි එම කර්මාන්තශාලාවේ කම්කරුවන්ගේ වැඩ වර්ජනයට සහාය දුන්නේය. වසංගතය පැවති කාලයේදී කර්මාන්තශාලා හිමියන් කම්කරුවන්ගේ වැටුප් වැඩි කළ නමුත්, වසංගත තත්ත්වය පහව ගිය පසු, කර්මාන්තශාලා හිමියෝ වැටුප් අඩු කිරීමට උත්සාහ කළහ. කම්කරුවන් එම වැටුප් අඩු කිරීමට එකඟ නොවූ අතර, නව වැටුප් පරිමාණයක් ගැන සාකච්ඡා කිරීමට ඔවුන්ට අවශ්‍ය විය. කර්මාන්ත හිමියන් එය ප්‍රතික්ෂේප කළ විට වැඩ වර්ජනයකට යන ලෙස ගාන්ධි කම්කරුවන්ගෙන් ඉල්ලා සිටි අතර ඔහු උපවාසයක් කරමින් ඔවුන්ට සහයෝගය දැක්වූයේය. කර්මාන්තශාලා හිමියන් මත සදාචාරාත්මක පීඩනය වැඩි කිරීමත් සමග අවසානයේ දී ඔවුන් වැටුප් වැඩිවීමක් ලබා දීමට එකඟ වූහ. උපවාසයක් සිදු කිරීම මගින් ගාන්ධි වර්ජනයට සදාචාරාත්මක මානයක් ගෙන දුන් අතර ඔහු කර්මාන්තශාලා හිමියන් සමග තිබූ මිත්‍රත්වය නොතකා එය සිදු කළේය.

1918 වර්ෂයේ දී, තම භෝග වලින් ලැබුණු අස්වැන්න අඩුවීම නිසා පූර්ණ බදු සහනයක් ලැබීමට ගොවීන්ට හිමිකම තිබුණු නමුත් රජයේ ආදායම අහිමි කර ගැනීමට අකමැති වූ රජය බදු ගෙවන ලෙස එම ගොවීන්ට බලපෑම් කිරීම හේතුවෙන් පීඩාවට පත් ගොවීන්ට උපකාර කිරීමට ගාන්ධි සර්දාර් වල්ලබ්භායි පටෙල් සමග එකතු විය. ඛේඩා සත්‍යග්‍රහය සංවිධානය කරමින් ගාන්ධි මෙම අසාධාරණයට එරෙහිව මරණය දක්වා සටන් කරන ලෙස සියලු ගොවීන්ගෙන් ඉල්ලා සිටියේය. තමන්ට බදු ගෙවීමට හැකියාව තිබුණ ද දුප්පත් ගොවීන්ට සහාය දැක්වීමක් ලෙස බදු නොගෙවා සිටින ලෙස ඔහු පොහොසත් ගොවීන්ගෙන් ඉල්ලා සිටියේය.

ඇතැම් දේශපාලන නඩු ජූරි සභාවකින් තොරව විභාග කිරීමට ඉඩ දුන්, සහ නඩු විභාගයකින් තොරව සැකකරුවන් සිරගත කිරීමට අවසර දුන් රව්ලට් පනතට විරෝධය දැක්වීම සඳහා ගාන්ධි 1919 අප්‍රේල් මාසයේ දී හර්තාලයක් ප්‍රකාශයට පත් කළේය. රව්ලට් පනත මගින් ත්‍රස්තවාදී ප්‍රචණ්ඩත්වය මැඩපැවැත්විය හැකි බව ප්‍රකාශ කරමින් බ්‍රිතාන්‍යයින් අධිරාජ්‍යවාදී ව්‍යවස්ථාදායක සභාව හරහා 1919 පෙබරවාරි මාසයේ දී රව්ලට් පනත සම්මත කළහ. වරෙන්තු නොමැතිව අත්අඩංගුවට ගෙන වසර 2 ක් රඳවා තබා ගැනීමට ඉඩ සලසන විධිවිධාන මෙම පනතෙහි ඇතුළත් වූ බැවින් මෙම පනත මගින් ඉන්දියානුවන්ගේ ප්‍රජා නිදහස දැඩි ලෙස සීමා කරන ලදී. සත්‍යග්‍රහ ව්‍යාපාරයේ ප්‍රධාන අංග වූ නිරාහාරව සිටීම සහ යාඥා කිරීම් සිදු කරමින් රටපුරා හර්තාලයක් සිදු කරන ලෙස ගාන්ධි ඉල්ලා සිටියේය. හර්තාලයේ සහ සත්‍යග්‍රහයේ උපාය මාර්ග එකට එක් කරමින් ගාන්ධි බ්‍රිතාන්‍යයින්ගේ අසාධාරණයට එරෙහිව ප්‍රබල ප්‍රතිරෝධයක් ඇති කළේය. කෙසේ වෙතත්, මෙම ව්‍යාපාරය අපේක්ෂා කළ දිශාවට වඩා වෙනස් දිශාවක් ඔස්සේ ගමන් කරමින් 1919 අප්‍රේල් 13 වෙනි දින පන්ජාබ් ප්‍රදේශයේ ජලියවාලා බාග් සංහාරයට හේතුවූ සිද්ධීන් ඇතුළු ප්‍රචණ්ඩකාරී සිදුවීම් හටගත්තේය. රව්ලට් සත්‍යග්‍රහය එහි අවිහිංසාවාදී මූලධර්ම වලින් බැහැර වූ බැවින් ගාන්ධි 1919 අප්‍රේල් 18 වෙනි දින එම සත්‍යග්‍රහය නතර කළේය.

භාරත් බන්ද් යනු ඉන්දියාව පුරා මහා වැඩවර්ජනයක් කැඳවීමක් වන අතර, එක් ප්‍රාන්තයක් සඳහා හෝ මහ නගර සභාවක් සඳහා වුව ද බන්ද් කැඳවීමක් සිදු කළ හැක. බන්ද් ව්‍යාපාරයක් ප්‍රකාශයට පත් කළ විට සාමාන්‍ය ජනතාව රැකියාවට නොගොස් නිවසේ රැඳී සිටිනු ඇතැයි එය ප්‍රකාශයට පත් කරන ප්‍රජාව හෝ දේශපාලන පක්ෂය අපේක්ෂා කරයි. සාප්පු හිමියන් වෙළඳසැල් වසා තබනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අතර පොදු ප්‍රවාහන ක්‍රම ක්‍රියාකරවන්නන් මාර්ග යෙන් ඉවත්ව සිටිනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ විශාල නගර සම්පූර්ණයෙන් ම අකර්මණ්‍ය වූ අවස්ථා තිබේ.

2010 වර්ෂයේ දී ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය (එන්.ඩී.ඒ.) සහ එක්සත් ප්‍රගතිශීලී සන්ධානයේ පක්ෂවලට අයත් නොවන පක්ෂ 13 ක් ඉන්ධන මිල ඉහළ දැමීමට එරෙහිව විරෝධය පළ කරමින් රටපුරා බන්ද් වැඩ වර්ජනයක් කැඳවූහ. මෙම වැඩ වර්ජනය මගින් විශේෂයෙන් ම ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සංධානය සහ වාමාංශික පක්ෂ විසින් පාලනය කරන ලද ප්‍රාන්තවල ඉන්දියානුවන් ඔවුන්ගේ දෛනික කාර්යයන් ඉටු කිරීම වැළැක්වූයේය.

අගමැති මන්මෝහන් සිං විසින් සිදු කළ ආර්ථික ප්‍රතිසංස්කරණවලට ප්‍රතිචාර වශයෙන්, ඩීසල් සහ ආහාර පිසීමට ගන්නා ගෑස් සඳහා ලබා දුන් සහනාධාර කපා හැරීමට එරෙහිවත්, සුපිරි වෙළඳසැල් සහ මහා පරිමාණ සුපිරි වෙළඳසැල් ඇතුළු සිල්ලර

බඩු වෙළඳාම් කිරීමේ අංශයේ බහුතර කොටස් හිමිකර ගැනීමට විදේශීය ආයෝජකයින්ට ඉඩ දීමේ තීරණයට එරෙහිවත් විරෝධය පළ කරමින් 2012 වර්ෂයේ දී භාරතීය ජනතා පක්ෂය සහ අනෙකුත් පක්ෂ රටපුරා මහා බන්ද් වැඩ වර්ජනයක් කැඳවූහ.

2018 වර්ෂයේ දී, මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ පූනේ දිස්ත්‍රික්කයේ හින්දුත්ව දෘෂ්ටිවාදයේ ආධාරකරුවන් විසින් බෞද්ධයින්ට මෙන්ම ඇතැම් හින්දු දාලිත්වරුන්ට සහ සීක්වරුන්ට එල්ල කරන ප්‍රහාරයකට ප්‍රතිචාර දක්වමින් ප්‍රකාශ් අම්බෙඩ්කාර් බන්ද් ව්‍යාපාරයක් කැඳවූයේ ය. ඔවුහු පොලීසිය කිසිවක් නොකර සිටීම සම්බන්ධයෙන්ද විරෝධය පළ කළහ. මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ ජනගහනයෙන් සියයට 50 ට අධික පිරිසක් මෙම බන්ද් ව්‍යාපාරයට සහාය දැක්වූහ.

මෑත කාලයේ ඉන්දියාවේ සිදු වූ, ගෝලීය අවධානයට පවා ලක් වූ සියලු ම විරෝධතා අතරින් ප්‍රධාන ස්ථානයක් ගන්නේ ඉන්දියාවේ (2020-2021) පැවති ගොවි විරෝධතා ය. කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සහතික මිලක් ලැබීම සුරක්ෂිත කරන, නියාමනය කරන ලද 'කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කමිටු' ක්‍රමය ක්‍රමයෙන් පිරිහී ගොස් අවසානයේ දී එම ක්‍රමය අවසන් වී යාමට හේතු වනු ඇතැයි ගොවීන් විශ්වාස කළ ගොවිපළ නීති මාලාවකට එරෙහිව ගොවීහු විරෝධය පළ කළහ. මෙ නීති හේතුවෙන් තමන්ට සමාගම්වල බලයටයටත් වීමට සිදුවනු ඇතැයි ගොවීහු බිය වූහ. තවද, නිසි කලට මිලදී ගැනීම සහතික කරමින් සහ භෝග සඳහා ප්‍රමාණවත් මිලක් ලබා දෙන බවට පොරොන්දු වෙමින්, ගොවීන්ට මූල්‍ය ණය ලබා දෙමින්, අතරමැදියන් ලෙස ක්‍රියා කරන කෘෂිකර්මාන්ත අංශයේ සිටින කුඩා පරිමාණ ව්‍යාපාරිකයින් (කොමිස් නියෝජිතයින්) සමග තමන්ට තිබෙන සබඳතා මෙම නීති හේතුවෙන් අවසන්වී යනු ඇතැයි ගොවීහු විශ්වාස කළහ. මෙම ගොවි විරෝධතා වසරකට අධික කාලයක් පුරා පැවති අතර, එහිදී බොහෝ ප්‍රාන්තවලින් පැමිණි ගොවීහු විශාල සංඛ්‍යාවක් දිල්ලි නුවරට එක්රැස්වී, මාර්ග අසල කඳවුරු බැඳ, ඔවුන්ගේ ආහාර පිසගනිමින්, සීතල විඳදරා ගනිමින් විරෝධතාවයේ නිරත වූ අතර, එකී නීතිය ඉල්ලා අස්කරගන්නා තෙක් ඔවුන් එම ස්ථානවලින් ඉවත්ව යාම හෝ බාධක ඉවත් කර ගැනීම ප්‍රතික්ෂේප කළහ. මෙම ගොවීහු ඔවුන්ගේ විරෝධතාවල දෘශ්‍ය නාටකය තීව්‍ර කරමින්, අවසානයේ දී ඔවුන්ගේ ට්‍රැක්ටර්වලින් දිල්ලි නුවරට රැස්වී නිදහස් දින පෙළපාලියට සහභාගී වූහ. ඉන්දියාවේ ගොවි විරෝධතාවයේ සංවත්සරය සනිටුහන් කරමින් 2021 සැප්තැම්බර් 27 වෙනි දින භාරත් බන්ද් (සමස්ත ඉන්දීය වැඩවර්ජනයක්) පවත්වන ලදී. අවසානයේ දී රජය එම පනත ඉල්ලා අස්කර ගත්තේය. මෙම ගොවි විරෝධතාවයන් දේශපාලන පක්ෂයක් හෝ පිළිගත් දේශපාලන ක්‍රියාකාරීන් විසින් ආරම්භ කරන ලද්දක් නොව, ගොවීන් විසින්ම ආරම්භ කරන ලද්දක් වූ බැවින් සහ එය විවිධ වයස් කාණ්ඩ, ආගම්, ජනවර්ග සහ ප්‍රාන්තවලට අයත් ගොවීන් එක්සත් කළ බැවින් එය අසාමාන්‍ය විරෝධතාවයක් විය. එය විධිමත් නායකත්ව ව්‍යුහයක් මත රඳා පැවතියේ නැත.

ඉන්දියාවේ විවිධ ප්‍රාන්තවල බන්ද්, චක්ක ජෑම්, හර්තාල්, සත්‍යග්‍රහ, වැඩ වර්ජන සහ උද්ඝෝෂණ නිතර නිතර අඛණ්ඩව සිදුවෙමින් පවතින අතර, එම විරෝධතා ව්‍යාපාර ගාන්ධිගේ නිදහස් අරගලවලට සමානවීම සහ ඒ හරහා ඒවා වලංගුකරණය වීමත් ප්‍රධාන දේශපාලන පක්ෂ එවැනි ක්‍රියාමාර්ගවලට යොමුවන වාර ගණනත් සැලකිල්ලට ගෙන ජනප්‍රිය සංස්කෘතිය තුළ ඒවා නීත්‍යානුකූල බවට පත්වී ඇත. එසේ වුවද ඉන්දියාවේ පවා ඒවායෙහි ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් පවතින්නේ ව්‍යාකූලත්වයකි. බොහෝ විට, මේවා 19(1) වැනි ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති, සංගම් සහ වෘත්තීය සමිති පිහිටුවා ගැනීම සඳහා ඇති මූලික අයිතියට සම්බන්ධ වේ. විරෝධතා දැක්වීමේ අයිතිය වටිනා ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකමක් බැවින් හර්තාල් ව්‍යවස්ථා විරෝධී විය නොහැකි බව ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය බොහෝ වාර ගණනක් ප්‍රකාශ කර ඇතත්, වර්ජනය කිරීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස අධිකරණය පිළිනොගන්නා අතර බන්ද් නීත්‍යානුකූල යැයි සලකන්නේ ද නැත.

මහත්මා ගාන්ධිගේ වැඩපිළිවෙළ මගින් පෙළඹවීම ලැබූ යාපනය තරුණ කොංග්‍රසය ප්‍රථම වතාවට බ්‍රිතාන්‍යයන්ගෙන් "පූරණ ස්වරාජ්" හෙවත් සම්පූර්ණ ස්වයං පාලනයක් ඉල්ලා සිටිමින්, ඩොනමෝර් කොමිසම විසින් යෝජනා කරන ලද සීමිත ප්‍රතිසංස්කරණ ප්‍රතික්ෂේප කළ අවස්ථාවේ ඉන්දියාවේ විරෝධතා භාෂාව ශ්‍රී ලංකාවේ (එකල ඉංග්‍රීසි භාෂාවෙන් සිලෝන් ලෙස හැඳින්වූ) දක්වා පැතිර ගියේය. යාපනය තරුණ කොංග්‍රසය බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව සංකේතාත්මක විරෝධතා දැක්වීමක් සිදු කළ අතර, මෙම විරෝධතා භාෂාව භාවිතා කරමින් විරෝධතා සහ සත්‍යග්‍රහ කිහිපයක් පවත්වන ලදී.[1]

# නිදහසෙන් පසු ශ්‍රී ලංකාවේ විරෝධතා දේශපාලනය

## 1953 අගෝස්තු 12 හර්තාලය සිහිපත් කිරීමඃ කප්පාදු පියවරයන්ට එරෙහි විරෝධතාව

"හර්තාල්" යන යෙදුමෙහි සිංහල අර්ථය "වර්ජනය" යන්නයි. 1953 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ සිදුකළ හර්තාල් ව්‍යාපාරය, නිදහස ලබා වසර හුදෙක් පහකින් ඡන්දයෙන් තේරී පත් වූ රජයකට එරෙහිව සිදු කරන ලද පළමු ජනතා අරගලය වූ බැවින් එය මෙරට දේශපාලන ඉතිහාසයේ විශේෂයෙන් සටහන් වී තිබේ. එවකට බලයේ සිටි එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ රජයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ගවලට විරෝධය පළ කරමින් රටපුරා සිවිල් නීති පිළිපැදීම ප්‍රතික්ෂේප කරමින් වැඩවර්ජනය විරෝධතාවක් පවත්වන ලදී. එය ශ්‍රී ලංකාවේ ප්‍රථම මහජන දේශපාලන ක්‍රියාමාර්ගය වූ අතර, නිදහස දිනා ගැනීමෙන් පසුව ඇති වූ පළමු ප්‍රධාන සමාජ අර්බුදය ද විය. ගාන්ධිගේ හර්තාල්වලදී මෙන් නොව, මෙහි දී ජීවිත හානි සහ සැලකිය යුතු ප්‍රමාණයක දේපළ හානි ද සිදු විය.

රජයට විරුද්ධ වන ලෙසත්, රජයට එරෙහිව සිවිල් නීති පිළිපැදීමෙන් වැළකී, වැඩ වර්ජන ක්‍රියාත්මක කරමින් විරෝධතා පවත්වන ලෙසත් ලංකා සමසමාජ පක්ෂය සහ අනෙකුත් වාමාංශික පක්ෂ මහජනතාවගෙන් ඉල්ලා සිටියහ. හර්තාලය මූලික වශයෙන් ම කම්කරු පන්තියේ විරෝධතාවයක් වූ බැවින් විරෝධතාකරුවන් කුල, වාර්ගික හෝ ආගම් භේද මත බෙදී නොසිටියහ. විරෝධතාකරුවන් පොදු යටිතල පහසුකම්වලට හානිකරමින් ඒවා විනාශ කළ අතර, හර්තාලයේ පරමාර්ථය රජය බියට පත් කර රජයේ ගමන් මග නවතාලීම බව හොඳින් ම අවබෝධ විය. විරෝධතාවය පැවතියේ එක් දිනයක් පමණක් වූ නමුත්, එහිදී අවම වශයෙන් පුද්ගලයින් 10 දෙනෙකු මිය ගොස්, මාර්ග, පාලම්, දුම්රිය මාර්ග සහ අනෙකුත් දේපළ වලට සැලකිය යුතු හානි සිදු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අගමැති ඩඩ්ලි සේනානායක ඉල්ලා අස් විය.

එම අවධියේ දී ලංකාව ආර්ථික අර්බුදයක ගිලෙමින් පැවතියේය - රට අඳුරට තල්ලු කළ අර්බුද ගණනාවකින් පළමුවැන්න එය විය. කොරියන් යුද්ධය අවසන්වීමත් සමග රබර් සහ තේ අපනයනය දැඩි ලෙස පහත වැටීම හේතුවෙන්, සුභසාධන වියදම් සඳහා වැය කිරීමට තිබූ මුදල ශක්තිමත් කර දුන් වෙළඳ භාණ්ඩවල මිල වාසිය තවදුරටත් භුක්තිවිඳීමට ශ්‍රී ලංකාවට නොහැකි විය. 1952 වර්ෂයේ දී එක්සත් ජාතික පක්ෂය පැහැදිලි බහුතර බලයක් සහිතව බලයට පත් වූ අතර, එමනිසා එය ප්‍රබල තත්ත්වයක පසුවූ බැවින් ආර්ථිකය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා පියවර ගැනීමට එම පක්ෂය සූදානම් විය. එය රටේ ප්‍රධාන ආහාරය වන සහල්වල මිල ඉහළ යමින් පැවති කාලයක් වුවද, සහල් සඳහා ලබා දුන් සහනාධාරය ඉවත් කිරීමට රජය පියවර ගත්තේය. එමෙන්ම සීනි වැනි අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ දැමීම, පාසල් දරුවන්ට දිවා ආහාරය සැපයීම නවතා දැමීම, සෞඛ්‍ය සහ වෙනත් සමාජ වැඩසටහන් සඳහා වන වියදම් කපා හැරීම, සහ දුම්රිය ප්‍රවාහන, තැපැල්, දුරකථන සහ විදුලි පණිවුඩ ගාස්තු වැඩි කිරීම වැනි පියවර ගන්නා ලදී. ඒ සියල්ල සුබසාධන රාජ්‍යය තර්ජනයට ලක්වී තිබෙන බව සංකේතවත් කරන්නක් විය.

"රටේ සංවර්ධන වැඩසටහන සඳහා අරමුදල් සපයා ගැනීමට රජයට නොහැකි වූ නිසා" ආහාර සහනාධාරය ඉවත් කිරීමට රජයට සිදුවිය යන හේතුව දක්වමින් මුදල් ඇමති ජේ.ආර්. ජයවර්ධන මහතා මෙම පියවර සාධාරණීකරණය කළේය. ප්‍රසිද්ධ ප්‍රංශ රැජිණක් වූ මාරි ඇන්ටොනෙට්ගේ සංවේදිතාවයෙන් යුතුව, ඔහු තමන්ට අවශ්‍ය ආහාර තමන් විසින් ම වවා ගන්නා ලෙස සහනාධාර ලබා ගැනීමට දෑත් දිගුකර ගෙන සිටි දිළිඳු ජනතාවට උපදෙස් දුන් අතර, නිසැකව ම ඔහු එසේ පවසන්නට ඇත්තේ මෙම රට ඉඩම් හිමියන්ගෙන් සැදුම් ලත් රටක් ය යන උපකල්පනය මත විය යුතු ය. රජය සමාජයේ ධනවත් කොටස් වෙත බදු සහන සහ වෙනත් සහන ප්‍රකාශයට පත් කළේ එම සහන ආර්ථිකයේ වර්ධනයට ඉවහල් වනු ඇතැයි යන පදනම මත වූ නමුත්, ජේ.ආර්. ජයවර්ධනගේ එම අදහස් පොදු ජනතාව අතර අනුනාද වූයේ නැත.

ඉන්දීය සම්භවයක් සහිත ලක්ෂ සංඛ්‍යාත වතු කම්කරුවන්ගේ පුරවැසිභාවය ඉවත් කරමින් එ.ජා.ප. රජය ඒ වන විටත් වතු කම්කරුවන් සහ දෙමළ දේශපාලන පක්ෂ හුදකලා කර දමා තිබුණි. තමන්ට අත්විඳීමට සිදුව තිබූ අධික ජීවන වියදම සහ දුර්වල ජීවන තත්වයන් නිසා කම්කරුවන් සහ දුප්පතුන් කෙරෙහි රජයට කිසිදු සහකම්පනයක් නොමැති බව විශ්වාස කළ කම්කරුවන් සහ ගම්බද දිළිඳු ජනතාව තුළ රජය කෙරෙහි කෝපයක් ඇති විය.

## හර්තාලයේ නායකත්වය සහ දේශපාලන සංවිධානය කිරීම

රජයේ කප්පාදු කිරීමේ ක්‍රියාමාර්ගවලට එරෙහි මහජන විරෝධය ඇවිලී යන අතරතුර, කම්කරුවන් අතර සහ ගම්බද ප්‍රදේශවල සැලකිය යුතු සහයෝගයක් තිබූ ලංකා සමසමාජ පක්ෂය, 1953 අගෝස්තු 12 වෙනි දින හර්තාලයක් - එනම්, එක්දින විරෝධතාවක් නිවේදනය කළේය. කොමියුනිස්ට් පක්ෂය සහ සමසමාජ පක්ෂයෙන් කැඩී ගිය දක්ෂිණාංශික ජාතිකවාදී කණ්ඩායමක් වූ විප්ලවකාරි සමසමාජ පක්ෂය ද මෙම උද්සෝෂණයට එක් විය. 1951 වර්ෂයේ දී එක්සත් ජාතික පක්ෂයෙන් කැඩී වෙන්වී පිහිටුවා ගෙන, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක විසින් නායකත්වය දෙන ලද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන විරුද්ධ පක්ෂය විය. විපක්ෂය වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩුවේ මර්දනය හෙළා දුටු නමුත් විරෝධතාවයට සහාය දැක්වූයේ නැත. ඉලංකෙයි තමිල් අරසු කච්චි පක්ෂය හෝ ෆෙඩරල් පක්ෂය හර්තාලයට සෘජුව ම සහභාගී නොවූ නමුත් විරෝධතාවයට සහාය පළ කළහ. රජය හුදකලාවී සිටියේය.

අගෝස්තු 12 වෙනි දා කම්කරුවන්, ගොවීන් සහ තරුණයින් කොළඹට ඇතුල් වන මාර්ග සියල්ල බාධක යොදා අවහිර කළ අතර, ඔවුහු පොලීසිය සමග පවා සටන් කළහ. කොළඹ සහ අනෙකුත් ප්‍රදේශ අතර සන්නිවේදන සබඳතා ඇනහිටියේය. පාලම් විනාශ කරන ලදී. ප්‍රවාහන හා තැපැල් සේවා නතර විය. ඇතැම් දුම්රිය මාර්ග කඩා දමන ලද අතර දුම්රිය කිහිපයක් නවතා ඔවුන්ගේ ග්‍රහණයට ගන්නා ලදී. කොළඹ සහ දකුණේ හා බටහිර ගම්බද ප්‍රදේශවල කම්කරුවන් හා තරුණයින් 9 දෙනෙකු පොලීසිය විසින් වෙඩි තබා මරා දමන ලද අතර, තවත් විරෝධතාකරුවන් 175 දෙනෙකුට බරපතල තුවාල සිදු කරන ලදී. විරෝධතාවය කැඳවනු ලැබුවේ එක් දිනක් සඳහා වුවද, ඇතැම් ප්‍රදේශවල, විශේෂයෙන් ම කොළඹ තදාසන්න ප්‍රදේශවල සහ දකුණු ප්‍රදේශවල මෙම විරෝධතා අඛණ්ඩව පැවැත්වුණි. විරෝධතා නවත්වන ලෙස සමසමාජ පක්ෂය ඉල්ලා සිටිය ද, විරෝධතාවය තුළින් ම ජවයක් සහ බලයක් වර්ධනය වී තිබිණි.

## හර්තාලයට රජය දැක්වූ ප්‍රතිචාරය

තමන් වටලනු ලැබ ඇති බවක් දැනුණු එක්සත් ජාතික පක්ෂ අමාත්‍ය මණ්ඩලය තම ආරක්ෂාව ගැන ඇතිවූ බිය හේතුවෙන් කොළඹ වරායේ නැංගුරම් ලා තිබූ බ්‍රිතාන්‍ය යුද නෞකාවේදී රැස්වූහ. අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් පරිදි ආණ්ඩුකාර ජෙනරාල් ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක විරෝධතාකරුවන් මැඩපැවැත්වීම සඳහා හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කළේය. ඔහු යුධ හමුදාව කැඳවා, දුටු තැන වෙඩි තබන ලෙස නියෝග නිකුත් කර, වාමාංශික පක්ෂවල කාර්යාල සහ මුද්‍රණාලවලට මුද්‍රා තබා, ඇඳිරි නීතිය ද පනවා, දේපළවලට හානි කිරීම සම්බන්ධයෙන් මරණ දඬුවම හඳුන්වා දුන්නේය. මෙම කුරිරු ක්‍රියාමාර්ග යොදා ගනිනමින් ප්‍රචණ්ඩත්වය මැඩපවත්වන ලදී.

ලංකා සම සමාජ පක්ෂය හර්තාලයට බොහෝ දුරකට දායකත්වය සැපයූයේ ආවේගශීලී අන්දමින් පවත්වන ලද කථා හරහා වේ. එම පක්ෂය කිසිදු ක්‍රියාමාර්ග යක් සංවිධානය නොකළ අතර, ආරක්ෂක කමිටු ගොඩනගන ලෙස ඉල්ලා සිටියේ ද නැත. වැදගත් කරුණ නම්, ඇතිවූ අවුල් සහගත තත්ත්වයෙන් පසුව ඒ සම්බන්ධයෙන් පසුවිපරමක් හෝ මීළඟ ක්‍රියාදමයක් සිදු නොවූ බැවින් (අවුරුදු හැත්තෑවකට පසුව බිහි වූ අරගලයට මෙන්ම) මෙම හර්තාලයට ද නායකයෙකු නැති බව පෙනෙන්නට තිබුණි. හර්තාලයෙන් පසුව රජයට එරෙහිව වඩාත් සාමූහික වූ ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා සංවිධානයවීමට ලංකා සමසමාජ පක්ෂය අපොහොසත්වීම එම පක්ෂයේ නිල ඉතිහාස කර්තෘ ලෙස්ලි ගුණවර්ධන මෙසේ පැහැදිලි කළේය: "මෙම පොදුජන ව්‍යාපාරය රජය මහජනතාව මත බර පටවමින් ගන්නා ලද ක්‍රියාමාර්ගවලට එරෙහිව විරෝධතාවය දැක්වීමේ අවධියකට පැමිණීමක් පමණක් වූ අතර, එය රජය පෙරළීම ඉලක්ක කරගත් අවධියකට එළඹ තිබුණේ නැත." නැවතත් මහ මැතිවරණයක් පවත්වන ලෙස ඉල්ලා එක්සත් ජාතික පක්ෂ රජයට බල කිරීම සඳහා සටන නැවත සංවිධානය කරන ලදී. හර්තාලය විප්ලවවාදී වෙනසක් සඳහා පොළඹවන්නක් ලෙස නොව, පාර්ලිමේන්තුවේ තමන් ගෙනගිය හැසිරවීමේ උපක්‍රම සඳහා අනුබද්ධයක් ලෙස ලංකා සමසමාජ පක්ෂය විසින් සලකනු ලැබූ බව පෙනී ගියේය.

ඇතමුන් 1953 හර්තාලය හඳුනා ගත්තේ පන්ති අරගලයක් වශයෙනි. බලපෑමක් ඇති කිරීමේ බලයක් කම්කරු පංතිවලට තිබෙන බව ලංකාවේ /ශ්‍රී ලංකාවේ දේශපාලකයින් අවබෝධ කර ගැනීම එම හර්තාලයේ දිගුකාලීන බලපෑම විය. අනෙක් අතට මෙය වෘත්තීය

සමිතිවල දේශපාලන හා බලපෑම් සිදු කිරීමේ බලය වැඩි කළේය.[2]

1953 හර්තාලය සහ 2022 අරගලය යන විරෝධතා දෙකම නායකත්වයක් නොමැති ව්‍යාපාර බව පෙනුනද 1953 හර්තාලය මෙන් නොව 2022 අරගලය මගින් "ක්‍රමයේ වෙනසක්" ඉල්ලා සිටියේය. අරගලය එම අලුත් ක්‍රමයේ පරාමිතීන් සම්පූර්ණයෙන් ම ප්‍රකාශ නොකළ ද, 'වෙනස' යන්න අවධාරණය කළ ක්‍රමයේ වෙනස සියලු දෙනාටම දැනුනේය.

## 1956 සත්‍යග්‍රහ ව්‍යාපාරයඃ සිංහල භාෂාව නිල භාෂාව කිරීමේ පනතට එරෙහි උද්ඝෝෂණය

1953 හර්තාලයේ දී සිංහල සහ දෙමළ පක්ෂ කෙටි කලකට එකමුතු වූ නමුත්, "සිංහල පමණක්" ප්‍රතිපත්තිය හඳුන්වාදීමත් සමග එම එකමුතුකම කෙටි කලකින් ම බිඳී ගියේය. කලක් භාෂා සමානාත්මතාවය සහ සාධාරණත්වය අනුමත කළ වමේ පක්ෂ එම ස්ථාවරය අත්හැරියේය. ජාතික හර්තාලය දෙමළ පක්ෂ විසින් මෙහෙයවන ලද සත්‍යග්‍රහ ව්‍යාපාරවලට මග පෑදූ අතර, මෙය දෙමළ දේශපාලන පක්ෂ වඩාත් ප්‍රිය කළ නව දේශපාලන විරෝධතා ස්වරූපය බවට පත් විය.

සිංහල පමණක් ය යන රජයේ භාෂා ප්‍රතිපත්තියට සහ භාෂා පනතට එරෙහිව ප්‍රථම අවිහිංසාවාදී උද්ඝෝෂණය 1956 වර්ෂයේ දී ඇති විය. සිංහල පමණක් ප්‍රතිපත්තිය නිසා දෙමළ පක්ෂ කලකිරීමට පත් වූ අතර ඔවුහු එයට දැඩි ලෙස විරෝධය පළ කළහ. ඔවුහු එය සමාන පුරවැසියන් ලෙස ඔවුන්ට ඇති තත්ත්වය බාදනය කිරීමේ යාන්ත්‍රණයක් ලෙස සහ ඔවුන්ගේ ආර්ථික අවස්ථාවන්ට ද බලපාන්නක් ලෙස දුටුවෝය.

ෆෙඩරල් පක්ෂයේ එස්.ජේ.වී. චෙල්වනායගම් ගේ නායකත්වයෙන් දෙමළ ජනතාව සිය ගණනක් 1956 භාෂා පනතට විරෝධය පළ කරමින් ගාලු මුවදොර පිටියේ සාමකාමීව වාඩි වී සත්‍යග්‍රහයක් දියත් කළහ. එහෙත්, සිංහල මැර පිරිසක් ඔවුන්ට පහර දී, ඔවුන්ව හිංසනයට සහ නින්දාවට පත් කළහ.

ලංකාවේ ප්‍රමුඛ පෙළේ දෙමළ නීතිඥයෙක් සහ සෙනෙට් සභිකයෙක් වූ සෝමසුන්දරම් නඩේසන් මෙසේ සිහිපත් කළේයඃ "පාර්ලිමේන්තු සභා ගර්භය පිහිටි භූමියේ දී ම, මේ රටේ අගමැතිතුමා ඉදිරියේ දී ම, මැරවරයින් එහි අසුන්ගෙන සිටි අහිංසක මිනිසුන්ට ප්‍රහාර එල්ල කර, ඔවුන්ට තරවටු කර, ඔවුන්ට අනුකම්පා විරහිතව පහර දුන්නා. මිනිසුන්ට එරෙහිව මේ සියලු අවනීතිය ක්‍රියාත්මක වෙද්දී එක වෙඩිල්ලක්වත් පත්තු වුණේ නැහැ. ඇයි ඒ? නියෝග දීලා තිබුණාඃ 'වෙඩි තියන්න එපා, ඔහේ බලාගෙන ඉන්න' කියලා"[3]

රජය කෝලාහල සහ ප්‍රචණ්ඩත්වය උසිගන්වන බවත්, "සිංහල පමණක්" ප්‍රතිපත්තිය පිළිගැනීමට දෙමළ ජනතාව බිය ගැන්වීම සඳහා අන්ත ජාතිකවාදී සිංහල සංවිධාන සහ භික්ෂූන් වහන්සේලා ඒවාට සක්‍රීයව සහාය දෙන බවත් ඔහු සඳහන් කළේය.[4]

ඇතිවූ ප්‍රචණ්ඩත්වය හොඳින් ලේඛනගත විය. සත්‍යග්‍රහයට සහභාගීවූවන්ට පහර දී, ගල්මුල් ප්‍රහාර එල්ල කරන ලදී; අවම වශයෙන් එක් දෙමළ ජාතිකයෙකු අසල බේරේ වැවට විසි කරනු ලැබූ අතර තවත් අයෙකුගේ කනක් "සපාකා ඉරා දමා තිබුණි". (ඩි වොටා 2004) තුවාල ලැබූ දෙමළ ජනතාව අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු ද විය. පොලිසිය ප්‍රධාන වශයෙන් ම උදාසීන නිරීක්ෂකයන් ලෙස සිටියහ. තමන්ට පහර දෙන්නේ නම් මිස මැදිහත් නොවන ලෙස ඔවුන්ට පැහැදිලි නියෝග ලබා දී තිබුණු බවක් පෙනෙන්නට තිබුණි. (එම).

ගාලුමුවදොර පිටියේ දී දෙමළ ජනයාට එල්ල වූ ප්‍රහාරය සහ ඉන් පසුව කොළඹදී ඇති වූ ප්‍රචණ්ඩත්වය නගරය පුරා ම දෙමළ ජනයාට එරෙහිව තවදුරටත් ප්‍රහාර එල්ල කිරීම සහ කොල්ලකෑම් සිදු කිරීම දිරිමත් කළ අතර, එය දිවයින පුරා රාජ්‍ය අනුග්‍රහය ලැබූ සිංහල මැර ප්‍රහාර රැල්ලක් අවුළුවාලීය. "සිංහල පමණක්" පනත් කෙටුම්පත විවාදයට ගන්නා අවස්ථාවේදීත් රට පුරා ප්‍රචණ්ඩත්වය පැතිර යමින් දෙමළ ජනයාට ප්‍රහාර එල්ල විය.

දෙමළ ජාතිකයන් 10,000 ගේ සහභාගීත්වයෙන් මඩකලපුවේ පැවති උද්ඝෝෂණයකට ශ්‍රී ලංකා පොලිසිය වෙඩි තැබූහ. එම වෙඩි තැබීමෙන් අවම වශයෙන් දෙමළ ජාතිකයන් දෙදෙනෙකු මිය ගියහ. පසුව ෆෙඩරල් පක්ෂය නගරයේ සැලසුම් කර තිබූ තවත් විශාල පාගමනක් අගමැති එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක තහනම් කළේය. මඩකලපුවේ සහ ත්‍රිකුණාමලයේ ද ප්‍රචණ්ඩත්වය පැතිරී ගිය නමුත්, දරුණුතම ප්‍රචණ්ඩත්වය ඇති වූයේ ජනපදකරණය සඳහා සිංහල පදිංචිකරුවන්ට විවෘත කර තිබූ ගල්ඔය ප්‍රදේශයේ දී ය. 1956 ජූනි 11 වෙනි දින රාත්‍රියේ දී එම ප්‍රදේශයේ සිංහල මැර කල්ලි විසින් දෙමළ ජනතාව

ඝාතනය කරන ලදී. සිංහල මැර කල්ලි - මනඃකල්පිත කටකතාවලින් පෙළඹවීමට පත්ව - රජයේ මෝටර් රථ, බුල්ඩෝසර් සහ අධිබලැති පුපුරණ ද්‍රව්‍ය අත්පත් කරගෙන, දින කිහිපයක් පුරා එම ජනපදයේ දෙමළ සුළුතර ජනයා භීතියට පත් කළහ. නිසැකව ම සියයකට වඩා වැඩි දෙමළ ජනතාවක් සමූල ඝාතනය කරන ලද අතර, තවත් සිය ගණනක් සැඟවී සිටියහ." (මනෝර් 2009).

මියගිය සංඛ්‍යාව සහ එම භීතියට පත්කිරීමේ ව්‍යාපාරයේ ප්‍රමාණය වාර්තා කිරීමේදී සත්‍ය ගනණට වඩා අඩුවෙන් වාර්තා කරන ලදී. "මඩකලපුවේ සහ ගල්ඔය නිම්නයේ කෙතරම් ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවී ඇත්ද යත්, පුද්ගලයින් 20 ත් 200 ත් අතර සංඛ්‍යාවක් මිය ගොස් ඇති අතර, මෙම ගණනය කිරීම සිදු කරන්නේ කුමන පාර්ශ්වය ද යන්න අනුව මෙම සංඛ්‍යා වෙනස් විය (රිගින්ස් 2016).

ඉන් පසුව, මුළු දිවයින පුරා ප්‍රචණ්ඩත්වය පැතිර ගියේය. කොළඹ දී හින්දු පූජකයෙකු පණපිටින් පුළුස්සා දමනු ලැබූ අතර, කොළඹ නගරයේ මාර්ගවල සැරිසැරූ කල්ලියක් මාර්ගයේ ගමන් කළ මගීන්ට සිංහල පුවත්පත් කියවිය හැකිද යන්න පරීක්ෂා කළහ. කියවීමට බැරි අයට පහර දුන්හ, නැත හොත් මරා දැමූහ. රජය දින පහක් බලා සිට පසුව හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කළේය.[5] මෙය 1953 හර්තාලය කළමනාකරණය කළ ආකාරයට වඩා හාත්පසින්ම වෙනස් විය.

ගල්ඔය ප්‍රචණ්ඩත්වය පෙර නොවූ විරූ පරිමාණයෙන් ඇති වූ අතර, වසර දෙකකට පසුව ඇති වූ එයටත් වඩා විනාශකාරී ප්‍රචණ්ඩත්වයකට එය පූර්වාදර්ශයක් විය. (තම්බයියා, 1992).

## 1958 සත්‍යග්‍රහ ව්‍යාපාරය: අගමැති විසින් බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම අහෝසි කිරීමට විරෝධය පළ කිරීම

1957 ජූලි 26 වෙනි දින අග්‍රාමාත්‍ය බණ්ඩාරනායක සහ දෙමළ පක්ෂයේ නායක චෙල්වනායගම් දෙමළ ජනතාව වැඩිවශයෙන් ම වාසය කරන ප්‍රදේශවල යම් මට්ටමක ස්වයං පාලනයක් පිහිටුවීම සඳහා විධිවිධාන සම්පාදනය කිරීමේ ගිවිසුමකට අත්සන් තැබූහ. භාෂාමය පදනමක් මත කලාප වෙන් කිරීම, දෙමළ භාෂාව සඳහා සමානාත්මතාවය ලබා දීම, වතුකරයේ වැඩ කරන දෙමළ ජනතාවට නැවත පුරවැසිභාවය ලබා දීම සහ සම්ප්‍රදායිකව දෙමළ භාෂාව කතා කරන ප්‍රදේශ ජනපදකරණය වහාම නැවැත්වීම ද මෙම ගිවිසුමේ ඇතුළත් අංග විය. කෙසේ වෙතත්, මෙම දේශපාලන අවකාශයට සංඝ සමාජයේ සහ සිංහල ප්‍රජාවේ බොහෝ සාමාජිකයින් විරුද්ධ වූ අතර, ඔවුහු මෙම ගිවිසුමට එරෙහිව දේශපාලනය සංවිධානය කළහ.

1958 වර්ෂයේ දී අග්‍රාමාත්‍යවරයා විසින් බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම ඒකපාර්ශ්විකව අහෝසි කරන ලද අතර, ඉන් පසුව දෙමළ පක්ෂ සත්‍යග්‍රහ ව්‍යාපාරයක් දියත් කළේය. එය ක්‍රියාත්මක වීමත් සමග, වවුනියාවේ පැවති ෆෙඩරල් පක්ෂ සම්මේලනයට යමින් සිටි දෙමළ ජනතාවට සිංහල මැර කල්ලි පහර දීමට පටන් ගත්හ. මෙම කෝලාහල මුළු රට ම අවුළුවාලන ලදී. රජය හදිසි නීතිය ප්‍රකාශයට පත් කළේ දින හතරක් ගත වූ පසුව වන අතර, ඒ වන විට අහිංසක සිවිල් වැසියන් සිය ගණනක් ඝාතනය කර තිබුණි. භාෂා ප්‍රතිපත්තිය හේතුවෙන් ඇති වූ ආතතීන් දේශපාලන නොසන්සුන්තාවයක් නිර්මාණය වීම දක්වා පැතිර ගියේය. තමන් විසින් ම මුදා හරින ලද ජාතිකවාදී බලවේගවල ගොදුරක් බවට පත්වූ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යවරයා, 1959 සැප්තැම්බර් 26 වෙනි දින ඔහුගේ ඡන්ද පදනම සමන්විත වූ කුළුණු පහෙන් තුනක් ම නියෝජනය කළ, ගුරුවරයෙක් සහ ආයුර්වේද වෛද්‍යවරයෙක් ද වූ, සෝමාරාම නැමති බෞද්ධ භික්ෂුවක් විසින් ඝාතනය කරනු ලැබුවේය.[6]

නිදහස ලබා ගැනීමෙන් පසු එළඹි පළමු දශකය දෙස ආපසු හැරී බලන විට, එය ආර්ථික අහිමි කිරීම් හා ජාතිය ගොඩනැගීම, ජාතික අනන්‍යතාවය සහ සුළුතර කණ්ඩායම්වලට හිමි ස්ථානය සම්බන්ධ නොවිසඳුණු ආතතීන් ආදිය මගින් නිර්මාණය කරන ලද ප්‍රචණ්ඩ විරෝධතා සහ ප්‍රචණ්ඩත්වයන් ඇති වූ කැළඹිලි සහිත කාල පරිච්ඡේදයක් බව පෙනේ. මෙම ප්‍රශ්න පසුගිය කාලය මුළුල්ලේ අඛණ්ඩව දේශපාලනයේ ප්‍රමුඛ ගැටළු වී පවතියි.

පාලනය කිරීමේ වගකීම දරන ආයතනවලින් සහ රාජ්‍ය ව්‍යුහයන්ගෙන් පුරවැසියන් දුරස්වීම සහ එම ආයතන කෙරෙහි ඔවුන්ගේ අවිශ්වාසය වැඩිවීම අඛණ්ඩව සිදු වූ අතර වසර හැත්තෑපහකට පසුව 'අරගලය' නිර්මාණය වීම එහි අවසන් ප්‍රතිඵලය විය.

# 1961 ෆෙඩරල් පක්ෂයේ සත්‍යග්‍රහ ව්‍යාපාරය: දෙමළ ප්‍රජාව කොන් කිරීමට එරෙහිව අඛණ්ඩ විරෝධතා

1960 ජුලි මාසයේ දී පිහිටුවන ලද සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ රජය, පරිපාලන හා අධිකරණ ක්ෂේත්‍ර 'සම්පූර්ණ සිංහලකරණය' කිරීමට රජය දුන් පොරොන්දුව ඉටුකිරීම කඩිනම් කළේය. ඒ අනුව, පරිපාලනයේ සියලු ම අංශවල එකම රාජ්‍ය භාෂාව ලෙස සිංහල භාෂාව ක්‍රියාත්මක කරන ලදී. එමෙන් ම, දිවයිනේ සෑම ප්‍රදේශයක ම අධිකරණවල භාවිතා වන භාෂාව සිංහල භාෂාව බවට පත් කරන නීති සම්පාදනය කිරීමට ද රජය අදහස් කළේය. මෙම ක්‍රියාමාර්ග දෙමළ ජනතාව තුළ ඔවුන්ගේ දේශපාලන අනාගතය පිළිබඳ අනාරක්ෂිතතා වැඩි කිරීමට හේතු වූ අතර, මෙයට පිළියම් යොදන ලෙස ෆෙඩරල් පක්ෂයේ නායකත්වයට ස්වකීය ඡන්දදායකයින්ගෙන් දැඩි පීඩනයක් එල්ල විය. දෙමළ නායකයින් සාකච්ඡා මාර්ගයෙන් මෙම ප්‍රශ්නය විසඳා ගැනීමට උත්සාහ කළ නමුත්, සාකච්ඡා වට දෙකක් පැවැත්වීමෙන් අනතුරුව එම සාකච්ඡා බිඳවැටුණු බැවින් 1961 පෙබරවාරි 20 වෙනි දිනට පෙර උතුරු නැගෙනහිර ප්‍රදේශවල පුළුල් 'සත්‍යග්‍රහ' ව්‍යාපාරයක් පැවැත්වීමට ෆෙඩරල් පක්ෂය තීරණය කළේය.

පෙබරවාරි 19 වෙනි දින, එම පක්ෂයේ නායක එස්.ජේ.වී. චෙල්වනායගම් දීර්ඝ ප්‍රකාශයක් නිකුත් කරමින් සත්‍යග්‍රහ ව්‍යාපාරයේ සීමාවන් නියම කළේය. මෙම කාර්යය සඳහා ම ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වූ පුද්ගල කණ්ඩායම් එම දිස්ත්‍රික්කවල කච්චේරි හෙවත් පරිපාලන ලේකම් කාර්යාලවල පිවිසුම් දොරටුව ඉදිරිපිට වාඩි වී රජයේ සේවකයින්ට අවහිර කරමින් ඔවුන් සේවය කිරීම වැළැක්විය යුතු විය. මෙම ව්‍යාපාරය මුලින් ම යාපනයෙන් ආරම්භ කර, පසුව මඩකලපුව, ත්‍රිකුණාමලය, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල ද ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණි. අවිහිංසාවාදී ක්‍රියාමාර්ග හරහා උතුරු නැගෙනහිර ප්‍රදේශවල සිවිල් පරිපාලනය අඩාල කිරීම මෙහි අරමුණ විය.

1961 පෙබරවාරි 20 වෙනි දින, මෙම සත්‍යග්‍රහයට ස්වේච්ඡාවෙන් සම්බන්ධ වන පුද්ගලයින්ගේ පළමුවැනි කණ්ඩායම පක්ෂ කාර්යාලයට රැස්වී ඉන්පසුව යාපනය කච්චේරිය දෙසට පෙළපාලියකින් පිටත් වූහ. චෙල්වනායගම් කණ්ඩායමේ ප්‍රධානත්වය ගත් අතර, සත්‍යග්‍රහයෙහි නිරතවූවන් කච්චේරියට ඇතුළු වන දොරටු ඉදිරිපිට ස්ථාන ගත කළහ. කච්චේරියේ ප්‍රධාන දොරටුවට සහ නිලධාරී නිවස්නයේ දොරටුව යන දෙකෙහිම ඉදිරිපිටින් බිම වාඩිවී සිටි ඔවුහු, රජයේ සේවකයින් ඔවුන්ගේ කාර්යාල පරිශ්‍රයට ඇතුළු වී රාජකාරි කිරීම අවහිර කළහ.

ඇතැම් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ කාන්තාවෝ ඉදිරිපෙළ නායකයින් පිටුපසින් වාඩි වූ අතර, එකල පැවති ගාන්ධිවාදී ආචාර විධි වලට අනුකූල වනු පිණිස ප්‍රසිද්ධ ගායිකාවක් 'භජන්' ගායනා කළාය. ඇය මහත්මා ගාන්ධි ප්‍රිය කළ භක්ති ගීත ගායනා කිරීමෙන් ගායනය ආරම්භ කළාය. ප්‍රධාන ගායිකාව එක් එක් පේළිය ගායනා කළ අතර, අනෙක් අය එම පේළි පුනරුච්චාරණය කළහ. සිත්ගන්නා කරුණ නම්, අරගලයට සම්බන්ධ වූ විරෝධතාකරුවන් ද ඒ සමාන ප්‍රවේශයන් අනුගමනය කළ අතර, ප්‍රධාන විරෝධතාකරුවෙකු ඔහුගේ හෝ ඇයගේ විරෝධතා වදන් පෙළ ගායනා කළ විට, අනෙක් අය ඔවුන්ගේ පිටපත් භාවිතා කරමින් ඔවුන්ගේ ප්‍රතිචාර ගායනා කළහ.

සත්‍යග්‍රහයෙහි නිරතවූවන් මග අවහිර කිරීමට ගත් උත්සාහයන් ව්‍යවර්ථ කරමින්, දිසාපතිවරයාට තම සේවා ස්ථානයට ළඟා විය හැකි බව සහතික කරමින් හිදැසක් නිර්මාණය කර වටරවුම බිඳ දැමීමට පොලිසියට හැකි විය. දිසාපතිවරයා පැන යාමෙන් කෝපයට පත් මහජනතාව වාහනයට ගල් ප්‍රහාර කිහිපයක් එල්ල කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස වාහනයේ ඉදිරිපස වීදුරුව පුපුරා ගියේය. පොලිසිය මහජනතාව දෙසට හැරී, විසමානුපාතික බලයක් යොදා ප්‍රතිචාර දක්වමින්, එම පිරිසට බැටන් ප්‍රහාර එල්ල කර, අහසට වෙඩි තබා, කඳුළු ගෑස් ප්‍රහාරයක් ද එල්ල කළහ. අවිහිංසාවාදී සත්‍යග්‍රහය ප්‍රචණ්ඩ ගැටුමක් බවට පත්වීමේ පැහැදිලි අනතුරක් තිබූ බැවින් සාමකාමීව විසිර යන ලෙස ෆෙඩරල් පක්ෂ නායකයෝ ජනතාවගෙන් ඉල්ලා සිටියහ. පිරිස ක්‍රමයෙන් විසිර ගිය අතර, කලබලකාරී තත්ත්වය පහව ගිය නිසා සත්‍යග්‍රහය අත්හරින ලදී. දෙමළ නායකින් එම දිනය ලංකාවේ දෙමළ භාෂාව කතා කරන ජනතාවට විශිෂ්ට දිනයක් ලෙසත්, දෙමළ ජනතාව ඔවුන්ගේ අයිතිවාසිකම් නැවත දිනා ගැනීම සඳහා ඍජු ක්‍රියාමාර්ගවලට යොමු වූ දිනය ලෙසත් අනුස්මරණය කළ අතර, එය "ගින්නෙන් බවුතීස්ම ලැබීමක්" (ඉතා දුෂ්කර ආරම්භයක්) ලෙස ද විස්තර කරන ලදී.

සත්‍යග්‍රහයෙහි නිරතවූවන් සහ මහජනතාව ඇතුළුව පුද්ගලයින් 53 දෙනෙකු, තුවාල ලබා රෝහල්ගත කරන ලද අතර, සත්‍යග්‍රයෙහි නිරතවූවන් සහ

මහජනතාව ඇතුළුව 300 ට අධික පිරිසක් සුළු තුවාල සඳහා ප්‍රතිකාර ලබා ගත්හ. සත්‍යග්‍රහයෙහි නිරතවූවන්ට එරෙහි පොලිස් ක්‍රියාමාර්ගය හේතුවෙන් දෙමළ ජනතාව ප්‍රකෝපයට පත් වුවද, එමගින් දෙමළ ජනතාව අතර සත්‍යග්‍රහය ප්‍රචලිත වූ අතර, ඊළඟ දශකය පුරා ම ඔවුන් මෙම විරෝධතා ස්වරූපය ඔවුන්ගේ විරෝධතාවල ප්‍රමිතිය ලෙස යොදා ගත්හ.

ඊළඟ වර්ෂවලදී සුළු ජාතීන් අමනාප කරවන ප්‍රතිපත්ති රාශියක් ඇති වූ අතර, විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාග, භාෂාව, රාජ්‍ය අංශයේ රැකියා සඳහා ප්‍රවේශය සහ පුද්ගලික ආරක්ෂාව සම්බන්ධ ප්‍රතිපත්ති මෙයට ඇතුළත් විය. සත්‍යග්‍රහ ව්‍යාපාරවලට සහ සාමකාමී විරෝධතාවලට තවදුරටත් ගෞරවයක් ලැබීම හෝ ඒවායින් ප්‍රතිඵලයක් ලැබීම සිදු නොවූ බැවින්, දෙමළ ප්‍රජාව තුළ, විශේෂයෙන් ම සටන්කාමීත්වය මගින් පමණක් ප්‍රතිඵල ලැබෙන්නේ ය යන ස්ථාවරය දැරූ දෙමළ තරුණයින් තුළ එහි වටිනාකම හීන වී ගියේය.

## විරෝධතා දේශපාලනය නව මුහුණුවරඃ සත්‍යග්‍රහයේ සිට වෙන්වීම දක්වා සහ ඉන් ඔබ්බට

දෙමළ ඊළාම් විමුක්ති කොටි (එල්.ටී.ටී.ඊ.) සංවිධානයේ නැගී සිටීමත් සමග භාෂාව, සමාන අයිතිවාසිකම්, ෆෙඩරල්වාදය සහ පළාත් සභා හරහා ප්‍රාදේශීය ස්වයං පාලනය පිළිබඳ කතිකාව වෙනුවට සටන්කාමීත්වය සහ වෙනම රාජ්‍යයක් සඳහා වන ඉල්ලීම දිනාග ැනීම පැතිර ගියේය. අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමේ ක්‍රම - එනම්, පාර්ලිමේන්තු විවාද, හර්තාල් සහ සත්‍යග්‍රහ ව්‍යාපාර ආදිය වෙනුවට සන්නද්ධ අරගලයකට සහාය දැක්වීම කථාබහට ලක් වූ අතර, එය සම්පූර්ණයෙන් ම බෙදුම්වාදී යුද්ධයකින් අවසන් විය. මෙම සන්නද්ධ අරගලය පැවති කාලය තුළ උතුරු නැගෙනහිර ප්‍රදේශ පාලනය කළ නොහැකි තත්ත්වයකට පත්වී, පුද්ගල ඝාතන, මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර සහ ගරිල්ලා ප්‍රහාර ගණනාවක් සිදු වූ අතර එය මුළු රටට ම බලපෑවේය.

2009 වර්ෂයේ දී එල්.ටී.ටී.ඊ. සංවිධානය යුධමය වශයෙන් පරාජය කිරීමත් සමග යුද්ධය අවසන් වූ නමුත්, ඉන් පසුව එළඹි වර්ෂවලදී ද එම ගැටුම් ඇතිවීමට බලපෑ හේතු තවමත් විසඳා නැත. එය " යුක්තිය නොමැති සාමයක්" සහිත නොසන්සුන් යුගය ලෙස විස්තර කරන ලදී. එසේ වුවත්, යුධ ගැටුම්, හමුදා සෝදිසි කිරීම් සහ නිරන්තරයෙන් යොදා ගන්නා ලද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හේතුවෙන් ඇති වූ විනාශයේ සෙවණැළි තුළ දෙමළ විරෝධය සීමා කරන ලදී.

වීදිවල පෙළ ගැසී සිටි සහ ගොඩනැගිලිවලට ඇතුල්වන දොරටු අවහිර කරගෙන සිටි දෙමළ විරෝධතාකරුවන්ට එරෙහිව රජය දක්ෂ ලෙස බලහත්කාරය යොදා ගනිමින් ප්‍රතිචාර දැක්වූ අතරතුර දෙමළ දේශපාලනඥයින් සහ ක්‍රියාකාරීහු විරෝධතා දැක්වීමේ විකල්ප ක්‍රම සෙවූහ. 2021 පෙබරවාරි මාසයේ දී අවසන් වන ලද "පොතුවිල් සිට පොලිගාංඩි" දක්වා වූ (P2P) විරෝධතා පාගමන ශ්‍රී ලාංකීය දෙමළ ජනතාවගේ දේශපාලන ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයක් ලෙස සලකනු ලැබේ. දින පහක් පුරා පැවති පොතුවිල් - පොලිගාංඩි විරෝධතා පාගමන 2021 පෙබරවාරි 3 වෙනි දින නැගෙනහිර පළාතෙන් ආරම්භ වී 2021 පෙබරවාරි 7 වෙනි දින උතුරු පළාතෙන් අවසන් විය. දහස් ගණන් දෙමළ ජනතාව අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් සිට යාපනය දිස්ත්‍රික්කයේ පොලිගංඩි දක්වා පාගමනින් ද, වාහනවල නැගී ද ගමන් කළහ. පොතුවිල් - පොලිගැංඩි විරෝධතා පාගමන අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, මුලතිවු, වවුනියාව. මන්නාරම, කිලිනොච්චිය සහ යාපනය යන දිස්ත්‍රික්ක හරහා කිලෝමීටර් 700 ක දුරක් ආවරණය කරමින් දස දහස් සංඛ්‍යාත දෙමළ සහ දෙමළ කතා කරන මුස්ලිම් ජනතාව ආකර්ෂණය කර ගත් දීර්ඝ ගමනක් වූ අතර, එම ජනතාව මෙම පාගමන පුරාවට කැපී පෙනෙන සහයෝගීතාවයක් සහ එකමුතුකමක් පෙන්නම් කරමින් පාගමනට ඔවුන් තුළ තිබූ සහයෝගය ප්‍රදර්ශනය කළහ.[7] පොතුවිල් - පොලිගාංඩි විරෝධතාවය දීර්ඝ කාලයක් පුරා මර්ධනය කරනු ලැබ සිටි ශ්‍රී ලාංකික දෙමළ ප්‍රජාවට මහා පරිමාණ සහ පුළුල් විෂය පථයකට අයත් "නිර්මාණශීලී දේශපාලන ව්‍යාපාරයක නිරත වීමට" අවස්ථාවක් ලබා දුන්නේය. දෙමළ ප්‍රජාව සංවිධානයවීම වළක්වන, මර්දනකාරී නෛතික හා දේශපාලන පසුබිමක් තුළ පවා මේ ආකාරයේ දැවැන්ත දේශපාලන ප්‍රදර්ශනයක් සංවිධානය කර ක්‍රියාත්මක කිරීමට එම ප්‍රජාව තුළ ඇති නිර්මාණාත්මක හැකියාව පුළුල් ලෝකයට ප්‍රදර්ශනය කිරීමක් ලෙස මෙම පාගමන විස්තර කරන ලදී.

පොතුවිල් - පොලිගාංඩි විරෝධතාවය දෙමළ ජනතාවගේ අතීත අවිහිංසාවාදී විරෝධතා පිළිබඳ මතක නැවත අලුත් කළ අතර, එය මෙරට දෙමළ දේශපාලනයේ අනාගත ගමන් මග ප්‍රජාතන්ත්‍රවාදී, ප්‍රචණ්ඩ නොවන ස්වරූපයක් තුළ, සක්‍රීය ලෙස ගතික විය හැකි, විය යුතු සහ වනු ඇති බව ඇඟවූයේය.[8]

# සත්‍යග්‍රහ ව්‍යාපාර - සිවිල් නීති නොපිළිපැදීම, අවිහිංසාවාදී ක්‍රියාමාර්ග සහ ආර්ථික සාධාරණත්වය සුරක්ෂිත කිරීම සඳහා උපවාස

තමන්ගේ දුක්ගැනවිලිවලට ඇහුම්කන් නොදෙන බව විශ්වාස කරන පිරිස් සාම්ප්‍රදායිකව ආණ්ඩුවට එරෙහිව වැඩ වර්ජන සහ සත්‍යග්‍රහ ව්‍යාපාර සිදුකිරීමට යොමු වෙන නමුත්, කැබිනට් අමාත්‍යවරයකුව සිටිය දී ම වෘත්තීය සමිති නායකයා ලෙස සාර්ථක වැඩ වර්ජනයක් දියත් කළ එකම ඇමැතිවරයා සෞම්‍යමූර්ති තොණ්ඩමන් විය හැක. බොහෝ වාමාංශික වෘත්තීය සමිති ක්‍රියාකාරීන් ආණ්ඩුවේ ඇමැතිවරු බවට පත් වන විට කම්කරු පන්තියට එරෙහි වී ඔවුන්ට පිටුපෑවද, සෞම්‍යමූර්ති තොණ්ඩමන් එසේ කළේ නැත. ජයවර්ධන රජයේ අමාත්‍යවරයකුව සිටියදී ඔහු ආර්ථිකය අඩපණ කරමින් සාර්ථක ලෙස වතු කම්කරුවන්ගේ වැඩවර්ජනයක් දියත් කළ අතර, ඔහු එම සෘජු ක්‍රියාමාර්ගය "සෑම සේවකයෙක් ම වැඩ කරනවා වෙනුවට, ආගමික ස්ථානයකට ගොස් වැටුප් වැඩිවීමක් ඉල්ලා මුළු දවසම එහි සිටිමින් යාඥා කරන යාඥා ව්‍යාපාරයක්" ලෙස හැඳින්වූයේය.

රජය තොණ්ඩමන්ගේ ඉල්ලීමට යටත් වූ අතර, ඔහු මෙය වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයේ සාර්ථක ජයග්‍රහණයක් ලෙස නොව "යාච්ඤාවලට කඳු සෙලවිය හැකි" බවට වන සාක්ෂියක් ලෙස පෙන්වා දෙමින්, " අපගේ යාච්ඤාවලට පිළිතුරු ලැබී ඇත" යනුවෙන් සැනසීමෙන් යුතුව ප්‍රකාශ කළේය.[9]

සේවායෝජකයින්ගේ දරුදඬුකම සහ ඉහළ යන ජීවන වියදමට සරිලන ලෙස වතු කම්කරුවන්ගේ වැටුප් වැඩිකරන ලෙස ඉදිරිපත් කරන ඉල්ලීම් විසඳීම ප්‍රතික්ෂේප කිරීම කම්කරුවන්, රජය සහ සේවා යෝජකයින් අතර සම්බන්ධතාවයට දිගින් දිගටම හානි කරයි.[10] විරෝධතාවලට වතු කම්කරුවන් ලබා දෙන සහයෝගය වර්ධනය වෙමින් පවතින අතර, ඔවුන්ගේ ඡන්දය ලබා ගැනීම සඳහා ඔවුන්ට සහ ඔවුන්ගේ නායකයින්ට මැතිවරණවලට පෙර පොරොන්දු ලබා දෙන නමුත් මැතිවරණයෙන් පසු වැටුප් සංශෝධනය කිරීමට කටයුතු නොකිරීම පිළිබඳව කම්කරුවෝ දැඩි කලකිරීමට පත්ව සිටිති. "ඔවුන්ට (වතු කම්කරුවන්ට) සාධාරණ ලෙස නොසලකන්නේ නම් ඔවුන් වෙත දැත් දිගුකරගෙන සිටින රැඩිකල්වාදය වෙත යොමුවීමට ඔවුන්ට සිදු වනු ඇත" යනුවෙන් වෘත්තීය සමිති නායකයෝ අනතුරු ඇඟවූහ.

වර්තමානයේ (2023) රුපියල දැඩි ලෙස අවප්‍රමාණය වී ඇති බැවින් සහ ආනයන වියදම් වැඩි වීම නිසා උද්ධමනය අහස උසට නැග ඇති බැවින්, රුපියල් 1,000 ක දෛනික වැටුපක් ලබා ගැනීම සඳහා වන අරගලය අර්ථ විරහිත වේ. රජය පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටියදී, වැවිලි කර්මාන්තය ද එයටම බලපාන අර්බුදයකට මුහුණ දී සිටින අතර, කම්කරුවෝ ඒ තුළ සිරවී සිටිති.

යහපාලන රජය ද විරෝධතාවලට මුහුණ දුන් අවස්ථාවක් වන්නේ මුලතිව් දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් පිරිසක් එම දිස්ත්‍රික්කයේ කේප්පාපිලවු ප්‍රදේශයේ පිහිටි අක්කර 133 ක ඉඩම එහි නියම අයිතිකරුවන්ට නිදහස් කරන ලෙස රජයට බලකරමින් 2017 දෙසැම්බර් මාසයේ දී දින 300 ක සත්‍යග්‍රහ ව්‍යාපාරයක් දියත් කළ අවස්ථාවයි. විපක්ෂ නායක සහ ප්‍රධාන දෙමළ පක්ෂය වන දෙමළ ජාතික සංධානයේ (ටී.එන්.ඒ.) නායක ආර්. සම්පන්දන් යුද හමුදාව විසින් අත්පත් කර ගෙන තිබෙන ඉඩම් නිදහස් කර ගැනීම සඳහා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ මැදිහත්වීම ලබා දෙන ලෙස කිහිප වතාවක් ම ඉල්ලා සිටියේය. මුලතිව් දිස්ත්‍රික්කයේ කේප්පාපිලව් ප්‍රදේශයේ පිහිටි, තමන් අත්පත් කරගෙන සිටි ඉඩම ප්‍රදේශවාසීන්ට ලබාදීමට ශ්‍රී ලංකා යුද හමුදාව අවසානයේ එකඟ විය.

යුද හමුදාව ගැටළුවට තුඩු දුන් මෙම ඉඩම නැවත සාමාන්‍ය ජනතාවට ලබා දීම සඳහා එම ඉඩමෙන් ඉවත්වී, හට පිරිස් වෙනත් ස්ථානයක ස්ථානගත කළේය. එම ප්‍රදේශයේ පිහිටි, ත්‍රිවිධ හමුදාව විසින් භාවිතා කරන ලද ගොඩනැගිලි කඩා ඉවත් නොකරන බවටත්, ඒවා ජනතාවට ප්‍රයෝජනයට ගත හැකි බවටත් යුධ හමුදාව සහතික වී ඇත.

එම ඉඩම ආපසු ලබාදීමත් සමඟ, කේප්පාපිලවු ප්‍රදේශයේ අවතැන්ව සිටි පුද්ගලයින් නව වසරේ දී නැවත පදිංචි කිරීමට ද අමාත්‍යාංශය කටයුතු යොදා ඇත.

යෝජිත හම්බන්තොට වන අලි කළමනාකරණ රක්ෂිතය රජයේ ගැසට් පත්‍රයට ඇතුල් කරන ලෙස රජයට බලකරමින් 2021 ජනවාරි 18 වෙනි දින වල්සපුගල ප්‍රදේශයේ ගොවීන් පිරිසක් සත්‍යග්‍රහ ව්‍යාපාරයක් දියත් කළහ. ගොවි සංවිධාන අසූහයක් (86) මෙම සත්‍යග්‍රහ ව්‍යාපාරයට සහයෝගය දුන් අතර, එය අඛණ්ඩව දින 68 ක් පැවත්වන ලදී.

සමස්ත ලංකා ගොවිජන සම්මේලනය අලි මිනිස් ගැටුමට විසඳුම් ලබා දෙන ලෙස ඉල්ලා උතුරු මැද

පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චියේ දී අඛණ්ඩව දින පහළොවක සත්‍යග්‍රහ ව්‍යාපාරයක නිරත වූහ. ඔවුහු අලි මිනිස් ගැටුම පිළිබඳව දැනුවත් කිරීමට සහ එයට නවීන විසඳුමක් යෝජනා කිරීමට අපේක්ෂා කරති. අලි මිනිස් ගැටුම හේතුවෙන් ගොවීන්ගේ ජීවිතයට එල්ලවන අයහපත් බලපෑම දිනෙන් දින වර්ධනය වෙමින් පවතින නිසාත්, මෙම ගැටලුවට නව විසඳුමක් ලබා දීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීම සඳහාත් ගොවීන් මාර්තු 19 වෙනි දින මෙම සත්‍යාග්‍රහය ආරම්භ කළ බව ද *මෝර්නිං* පුවත්පතට අදහස් දක්වමින් සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ සභාපති සුසන්ත කුමාර මහතා පැවසුවේය. "ශ්‍රී ලංකාවේ ප්‍රධාන වනජීවී කලාප නිවැරදිව හඳුනාගෙන, එම කලාප වටා අලිවැට ඉදිකරන ලෙස අපි යෝජනා කරනවා. මෙම අලි වැටවල් අනිවාර්යයෙන්ම විදුලි වැටවල් විය යුතු නැහැ - ඒවා මීටර් 20 ක් පළල, තල් ගස් වලින් සැදූ වැටවල් විය හැකි අතර මී මැස්සන්ගේ වාසස්ථාන මගින් ඒවා ශක්තිමත් කළ යුතු යි."

2022 මාර්තු මාසයේ දී, එක්සත් ජාතික පක්ෂය දිගුකාලීන ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා රජය සමග පොදු එකඟතාවකට එළඹීමේ අරමුණ ඇතිව සත්‍යග්‍රහයක් පැවැත්වූයේය. වෙනස් නොවන, ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක් තුළ රට ඉදිරියට ගෙන යා යුතු බවත, ඉදිරි වසර 15 - 20 ක කාලය සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමට රජය පෙළඹවීම සත්‍යග්‍රහයේ අරමුණ බවත් එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් පාලිත රංගේ බණ්ඩාර මහතා මාධ්‍ය වෙත අදහස් දක්වමින් පැවසුවේය.

අරගලය අතරතුර, 2022 නොවැම්බර් මාසයේ දී, අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ නායකයින් දෙදෙනෙකු නිදහස් කරන ලෙස බලකරමින් කොළඹ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කාර්යාලය ඉදිරිපිට 'සත්‍යග්‍රහ ව්‍යාපාරයක්' දියත් කරන ලදී. අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ සහ අන්තර් විශ්වවිද්‍යාල භික්ෂු බලමණ්ඩලයේ පූජ්‍ය ගල්වැව සිරිධම්ම හිමියන් වහාම නිදහස් කරන ලෙස ඉල්ලා මෙම සත්‍යග්‍රහය පවත්වන ලදී. මෙම ශිෂ්‍ය නායකයින් දෙදෙනා කොළඹ පැවති විරෝධතාවයකට සහභාගී වීම සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තබාගෙන තිබුණි. මෙම 'සත්‍යග්‍රහ ව්‍යාපාරයේ' නිරතවූවන් ඔවුන්ගේ අරමුණ ඉස්මතු කර පෙන්වීම සඳහා ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක වෙත ලිපියක් භාර දුන්හ.

## විරෝධතා ව්‍යාපාරවල බලය සහ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයට ඒවායින් එල්ලවන බලපෑම

පසුගිය වසර කිහිපය තුළදී, ලෝකය පුරා විරෝධතා රැල්ලක් ඇතිවී තිබෙන අතර, ඇතැම් විරෝධතා මනාව ස්ථාවර වී සිටි දූෂිත පාලකයින් පලවා හරිමින් සහ පාලන තන්ත්‍ර වෙනස් කරමින් ඉතා ප්‍රබල බලපෑම් ඇති කර තිබේ. ඇතැම් විරෝධතා මගින් බාධා ඇති කරමින් පවතින තත්ත්වයට අභියෝග කර ඇති නමුත්, ඒවායින් පද්ධතිමය වෙනසක් ඇතිකිරීමේ අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට හැකිවී නැත. යුක්රේනයේ තැඹිලි පැහැ විප්ලවයට (Orange Revolution) සහ ටියුනීසියාව, ලිබියාව, ඊජිප්තුව, සිරියාව සහ යේමනය පුරා පැතිර ගිය අරාබි වසන්තයට එම රටවල් ප්‍රජාතන්ත්‍රවාදය සහ ස්ථාවරත්වය කරා ගමන් කරන මාවතට ගැනීමට නොහැකි වූ නමුත්, එමගින් ඒකාධිපති පාලනයට අභියෝග කළ ප්‍රබල බලපෑමක් ඇති කළේය.

2004 වර්ෂයේ අගභාගයේ දී දියත් කරන ලද, යුක්රේනයේ තැඹිලි පැහැ විප්ලවය නැමති විරෝධතාවය මූලික වශයෙන් ම ක්‍රෙම්ලිනයේ පිටුබලය ලැබූ අපේක්ෂක වික්ටර් යනුකොවිච් යුක්‍රේන ජනාධිපති ධුරය සොරාගැනීම වැළැක්වීමටත්, ඔහුගේ ප්‍රතිසංස්කරණවාදී ප්‍රතිවාදියා වූ වික්ටර් යුෂ්චෙන්කෝ තෝරා පත්කර ගැනීමටත් සමත් විය. කෙසේ වෙතත්, වැඩිකල් නොගොස් ම, යුෂ්චෙන්කෝට අභ්‍යන්තර ගැටුම් හේතුවෙන් ඇතිවූ බලපෑම් නිසා දැඩි ලෙස ව්‍යාකූල වූ ඔහුගේ පස් අවුරුදු ධූර කාලය තුළ යුරෝ-අත්ලාන්තික් ඒකාබද්ධ කිරීම සඳහා සාර්ථක ලෙස යුක්රේනය මෙහෙයවීමට නොහැකි විය. මෙම තත්ත්වය යනුකොවිච්ට නොසිතූ ලෙස පෙරලා පැමිණ 2010 ජනාධිපතිවරණ තරඟයෙන් ජයග්‍රහණය කිරීමට මග පෑදුවේය. යනුකොවිච් ජනාධිපති ධූරයට පත්වූව ද, නිදහස් මාධ්‍ය අවහිර කිරීමට ඔහුට නොහැකි විය. ඒ වෙනුවට, තැඹිලි පැහැ විප්ලවයේ ජයග්‍රහණ ආපසු හැරවීමට ඔහු උත්සාහ දැරුවද, එය 2014 වර්ෂයේ නැගීසිටීම නිර්මාණය කිරීමට හේතු වූ අතර, අවසානයේ ඔහුගේ පාලනය බිඳවැටීමට එය හේතු විය.

තැඹිලි පැහැ විප්ලවය යුක්රේනුවන් තමන්ව සහ තමන්ගේ ජාතික අනන්‍යතාවය අවබෝධ කර ගත් ආකාරය කෙරෙහි ද ප්‍රබල බලපෑමක් ඇති කළේය.

නිදහස ලබා ගැනීමෙන් පසු පළමු වසර දහතුන තුළ යුක්රේනය සහ රුසියාව අතර දේශපාලන, සංස්කෘතික, සමාජීය සහ ආර්ථික සීමාවන් අපැහැදිලිව පැවතුණි. දේශසීමාව දෙපස සිටින බොහෝ මිනිසුන් සංකල්පමය වශයෙන් වෙන් වූ රටවල් දෙකෙහි ඉරනම් එකිනෙකින් වෙන් කළ නොහැකි ලෙස එකට බැඳී ඇති බව අඛණ්ඩව සැලකූහ. 2004 වර්ෂයේ දී මිලියන ගණනක් යුක්රේනුවන් නිදහස් මැතිවරණ ආරක්ෂා කර ගැනීම සඳහා සංවිධානය වූ විට මෙය බරපතල ලෙස වෙනස් වූ අතර, වර්තමානයේ (2023) ඔවුන් රුසියාවට එරෙහිව තම රට සහ තමන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාව අඛණ්ඩව ආරක්ෂා කරමින් සිටිති.

විරෝධතාවලට නොසලකා හැරීමට නොහැකි පසුබිමක් ඇත. විරෝධතාවලට මුහුණ දෙන රජයන් සාමාන්‍යයෙන් තමන්ගේ නීත්‍යානුකූල බල අධිකාරියට එල්ලවන නීති විරෝධී සහ නීත්‍යානුකූල නොවන අභියෝග ලෙස සලකා ඒවාට ප්‍රතිචාර දක්වන නමුත්, විරෝධතාවලට නොසලකා හැරිය නොහැකි සහ නොසලකා නොහැරිය යුතු සන්දර්භයන් ඇත.

මෙම විරෝධතා භූගෝලීය වශයෙන් කවර ස්ථානයක පැවැත්වුවද, විරෝධතාකරුවන් දේශපාලන වර්ණාවලියේ කවර ස්ථානයක සිටියද, පොදුවේ ගත් කල විරෝධතා යනු ප්‍රජාතන්ත්‍රවාදයේ සහ ආර්ථික හා සමාජ සංවර්ධනයේ අසාර්ථකත්වයන්, ජනතාව තුළ ඇති අතෘප්තිය සහ නිල දේශපාලන ක්‍රියාවලීන් කෙරෙහි විශ්වාසයක් නොමැතිකම, දේශපාලනඥයින් කෙරෙහි ඇති කලකිරීම සහ රජයන් කෙරෙහි විශ්වාසයක් නොමැතිකම හේතුවෙන් බිහිවන ජනතා ව්‍යාපාර වේ. මෙම අධ්‍යයනය මගින් ආවරණය කරන ලද කාල සීමාව තුළ සෑම ප්‍රදේශයක ම සමාජ නොසන්සුන්තා ඉහළ ගිය වබත්, මෙම විරෝධතාවයන් පෙළපාලි සහ වැඩ වර්ජනවල සිට සමාජ හා දේශපාලන ව්‍යාපාර ප්‍රයත්න සහ කැරලි වැනි අසංවිධානාත්මක ජනතා ක්‍රියාමාර්ග දක්වා වූ විවිධ ස්වරූප ගත් බවත් විරෝධතා පිළිබඳ අධ්‍යයනය තුළින් සොයා ගත් ප්‍රධාන කරුණු වලින් පෙනී යයි. 2006 - 2020 කාලය තුළ ලොව පුරා විරෝධතාකරුවන්ගේ ප්‍රමුඛතම ඉල්ලීම වූයේ "සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයයි". (ඔර්ටිස් සහ තවත් අය. 2022).

මෙම අධ්‍යයනයේ දී තුන්දහසකට ආසන්න විරෝධතා සංඛ්‍යාවක් සමාලෝචනය කරන ලද අතර, ඒවා සිදුවීමේ වාර ගණන අනුව අවරෝහණ පිළිවෙළට ප්‍රධාන කාණ්ඩ හතරකට වර්ග කර ඇත: (i) සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක් නොමැතිකම, දූෂණය සහ වෙනත් දුක්ගැනවිලි කෙරෙහි අවධානය යොමු කරන ලද, දේශපාලන නියෝජනයේ / දේශපාලන ක්‍රමවල අසාර්ථකත්වය සම්බන්ධ විරෝධතා; (ii) ආර්ථික අසාධාරණකම් සහ කප්පාදු ප්‍රතිසංස්කරණවලට එරෙහි විරෝධතා; (iii) ස්වදේශික/වාර්ගික අයිතිවාසිකම්වල සිට කාන්තා අයිතිවාසිකම් සහ පුද්ගල නිදහස දක්වා වූ සිවිල් අයිතිවාසිකම් සම්බන්ධ විරෝධතා; සහ (iv) ස්වල්ප දෙනෙක් සඳහා වෙනුවට සියලු ම දෙනා සඳහා පරිපූර්ණ යුක්තිය සහ වඩා හොඳ ජාත්‍යන්තර ක්‍රමවේදයක් ඉල්ලා සිටින විරෝධතා.

ඉහත සාකච්ඡා කළ පරිදි දේශපාලන විරෝධතා ව්‍යාපාර ශ්‍රී ලංකාවට අමුතු දෙයක් නොවේ. සත්‍යග්‍රහ සහ හර්තාල් වලට අමතරව, ශ්‍රී ලංකාව සිංහල තරුණයින් විසින් මෙහෙයවන ලද සන්නද්ධ කැරලි දෙකක් සහ මූලික වශයෙන් ම, අසහනයට පත් දෙමළ තරුණයින් විසින් මෙහෙයවන ලද තිස් අවුරුදු බෙදුම්වාදී යුද්ධයක් අත්විඳ ඇත. එසේ වුවත්, මහාචාර්ය ජයදේව උයන්ගොඩ විසින් හඳුනාගන්නා ලද පරිදි, "ශ්‍රී ලංකාවේ අපට දැන් තිබෙන්නේ, දේශපාලන හා බුද්ධිමතුන් පැලැන්තිය විසින් ද ඉගෙන ගත යුතු මහජනතාව, එනම් සාමාන්‍ය පුරවැසියන්, නැත හොත් පොදු ජනතාව අලුතින් ගොඩනැගිය යුත්තේ කුමන ආකාරයේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්ද, කුමන ආකාරයේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක්ද යන ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා අපි ප්‍රයෝජනයට ගත යුතු ඓතිහාසික අවස්ථාවකි."[11]

බොහෝ දෙනා නිරීක්ෂණය කළ දේ කුමක්ද යන්න මහාචාර්ය උයන්ගොඩ පෙන්වා දුන්නේය. අරගලය ප්‍රජාතන්ත්‍රවාදී ශක්තියක් මුදා හැරියේය; එය ඉතා පැහැදිලි ව පෙනෙන, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රහේලිකා සහ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ ඇති අර්බුදය ඉස්මතු කළේය. දැන් ශ්‍රී ලංකාවට සිටින්නේ, කලක් කෙටි කාලීන ජනප්‍රිය ජනවරමක් බුක්ති විඳි ජනාධිපතිවරයෙකු වෙනුවට, පාර්ලිමේන්තුව විසින් තෝරා ගන්නා ලද ජනාධිපතිවරයෙකි. එම ජනාධිපතිවරයා, ජනතා ඡන්දයෙන් තම ආසනයේ ජය තහවුරු කර ගැනීමට නොහැකි වූ, පාර්ලිමේන්තුවට නම් කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකි. ශ්‍රී ලංකාවේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ ඇති අර්බුදය ගැන තවත් කීමට ඇත්තේ කුමක්ද?

අරගලය යනු ක්‍රමය වෙනස් කරන ලෙස තරුණ ප්‍රජාවගෙන් ඉදිරිපත්වූ ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමට පවතින ක්‍රමවේදය අසමත් වීමේ ප්‍රතිඵලයක් විය -

එය එවැනි ඉල්ලීම් ඉදිරිපත්කළ තුන්වැනි අවස්ථාව විය. විරෝධතාවය සහ ප්‍රතිරෝධය දැක්වීමේ පුරවැසි ව්‍යාපාරවල සටන් පාඨ සහ ඉල්ලීම් හරහා ප්‍රකාශිත "ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන චින්තනයේ ස්වදේශීය සංවිධානයක්" බිහිවීම උයන්ගොඩ විසින් ඉස්මතු කර පෙන්වයි, දේශපාලන සහ නිලධාරීවාදී ප්‍රභූ පැලැන්තිය බුක්ති විඳින බලතල මත සමාජමය සංවරණ සහ සංතුලන ලෙස ක්‍රියා කරන ජන සභා පිහිටුවීම,ඡන්දයෙන් තේරී පත්වූවන් ඉවත් කිරීමේ අයිතිය සහ සෘජු ප්‍රජාතන්ත්‍රවාදයේ අනෙකුත් යාන්ත්‍රණ සහ පුරවැසි ව්‍යාපාර ස්ථාපනය කිරීම, සහ ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡා වලදී සහභාගීත්ව පුරවැසි සංවිධාන ස්ථාපනය කිරීම වැනි ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටීම ආදිය නියෝජිත පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ දීර්ඝ කාලයක් තිස්සේ තිබූ අඩුපාඩු ආමන්ත්‍රණය කිරීමට යෙදිය හැකි පිළියම් පිළිබඳ අදහස් කිහිපයකි. පසුගිය මාස හතරක කාලය තුළ දී පුරවැසි ව්‍යාපාරයෙහි මැදිහත්වීම් ශ්‍රී ලංකාවේ දේශපාලනයට සම්පූර්ණයෙන් ම නව මානයක් ද එක් කර තිබෙන අතර, එය දේශපාලනය තුළ පුරවැසියාගේ භූමිකාව අක්‍රීය බලාසිටින්නෙකුගේ භූමිකාවේ සිට සුපරීක්ෂාකාරී සහ සහභාගීත්ව දේශපාලන ක්‍රියාකාරීන්ගේ භූමිකාවක් දක්වා මාරුවීම සනිටුහන් කරයි. එම සංක්‍රාන්ති ක්‍රියාවලිය, එතරම් හිස් නොවන, එහෙත් සම්පූර්ණයෙන් ම නොසලකා හරින ලද මෙම සංකල්පවල අර්ථයට අනුකූල වන, අපගේ ප්‍රජාතන්ත්‍රවාදය සහ ප්‍රජාතන්ත්‍රවාදී-සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පදනම් ප්‍රතිනිර්මාණය කිරීමට හා ගැඹුරු කිරීමට අවශ්‍ය නව බුද්ධිමය හා දේශපාලන ශක්තියක් ද සපයා දී ඇත.[12]

අරගලය පොදු අවකාශයන් තුළ සහ මහජන පරිකල්පනය තුළ මුල් බැස ගෙන වසරක කාලයක් ගෙවී ගොස් ඇති අතර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉල්ලා අස්වී මාස දහයක කාලයක් සම්පූර්ණ වී තිබේ. ජීවන වියදම සහ උද්ධමනය තවදුරටත් ඉහළ මට්ටමක පවතින අතර, පෝලිම් සහ භාණ්ඩ හිගයන් පහව ගොස් තිබේ. ප්‍රචණ්ඩත්වය හට ගැනීම සහ මෙම ව්‍යාපාරය දේශපාලන ග්‍රහණයට ගනු ඇතැයි යන බිය නිසා අරගලයට මධ්‍යම පාන්තිකයින්ගෙන් ලැබුණු සහයෝගය හීනවී ගොස් ඇති අතර, "ක්‍රමයේ වෙනසක්" ඉල්ලා සිටින සටන් පාඨ දැන් "ආණ්ඩුවට අවස්ථාවක් දෙන්න" යන ඉල්ලීම් සමග තරග කරමින් තිබේ. මෙම මිශ්‍ර පණිවුඩ ලැබෙමින් පවතින්නේ රජය 'ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත' වැනි කුරිරු නීති සම්මත කර ගැනීමට සලකා බලමින් සිටින සහ ජනතාවගේ ජීවන අවස්ථා කෙරෙහි දැඩි බලපෑම් ඇති කළ හැකි ව්‍යූහාත්මක ගැළපීම් සිදු කිරීම සඳහා අවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණ පරාසයක් සලකා බලමින් සිටින පසුබිමක් තුළයි. "ක්‍රමයේ වෙනසක්" ඉල්ලා සිටින මෙම ව්‍යාපාරය ඒකාධිපතිවාදී 'පොලිස් රාජ්‍යය' විසින් යටපත් කරමින් තිබීමේ සලකුණු පෙනෙන්නට තිබේ.[13] පහසුවෙන් ලබා ගැනීමට තිබෙන උපකරණ, එනම් නීතිය සහ ආරක්ෂක අංශ, යොදා ගනිමින් මහජන විරෝධතාවලට එරෙහිව කටයුතු කිරීමට රජය කැසකවමින් සිටියි. එවැනි මුරණ්ඩුකම්වලට එරෙහිව කටයුතු කිරීම පිණිස, විරෝධතා දේශපාලනය නැවත හැඩගස්වාගෙන එහි ශක්තිය ගොඩනගා ගත හැක.

## පසු සටහන්

1 ඩී.බී.එස්. ජෙයරාජ්, "යටත් විජිත පාලනයෙන් "පූරණ ස්වරාජ්" (සම්පූර්ණ නිදහස) ඉල්ලා සිටීමෙන් සහ 1931 යාපනයේ රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ වර්ජනය කිරීම ක්‍රියාත්මක කිරීම මගින් යාපනයේ තරුණ කොංග්‍රසය ඉතිහාසගත විය" at https://www.dailymirror.lk/opinion/75-Years-of-Independence-and-the-Tamils-of-Sri-Lanka/172-253544

2 සමන් ගුණදාස, "ශ්‍රී ලංකාවේ 1953 මහජන නැගිටීමේ (හර්තාලයේ) පාඩම්", *World Socialist* වෙබ් අඩවිය, 2020 සැප්තැම්බර් 2, https://www.wsws.org/en/articles/2020/09/02/hart-s02.html

3 ශ්‍රී ලංකාවේ 1956 පළමු දෙමළ විරෝධී සංහාරය සිහිපත් කිරීම, *ටැමිල් ගාඩියන්,* 2023 ජනවාරි 9, https://www.tamilgirdian.com/content/remembering-1956-sri-lanka-s-first-anti-tamil-pogrom

4 එම

5 ඩී.බී.එස්. ජෙයරාජ්ගෙ 1961 දෙමළ සත්‍යග්‍රහයට පළමු දිනයේ දුෂ්කර ආරම්භයක්, *ෆයිනෑන්ෂල් ටයිම්ස්,* 2021 පෙබරවාරි 18, https://www.ft.lk/columns/1961-Tamil-Satyagraha-has-baptism-of-fire-on-first-day/4-713351

6 එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායකගේ පදනම වූ පංච මහා කුළුණු හෙවත් පංච මහා බලවේගය වූයේ එවකට සිටි සංඝයා වහන්සේ, දේශීය වෛද්‍යවරුන්, ගුරුවරුන්, ගොවීන් සහ කම්කරුවන් ය.

7 ඩී.බී.එස්. ජෙයරාජ්ගෙ 'දෙමළ ජනතාවගේ 2021 'පොතුවිල් - පොලිගංඩි විරෝධතා පාගමන සහ 1961 'සත්‍යග්‍රහය', *ඩේලි මිරර්,* 2021 පෙබරවාරි 13 https://www.dailymirror.lk/opinion/Tamil-P2P-Protest-of-2021-and-the-Tamil-Satyagraha-of-1961/172-205729

8 එම

9 ඩී.බී.එස්. ජෙයරාජ් ""වතුකරයේ දෙමළ නායක සෞම්යමූර්ති තොණ්ඩමන්ගේ ප්‍රායෝගික දේශපාලනය," ඩේලි මිරර්, 2019.09.01. https://www.historyofceylontea.com/ceylon-publications/ceylon-tea-articles/pragmatic-politics-of-plantation-tamil-leader-saumiyamoorthy-thondaman.html https://www.historyofceylontea.com/ceylon-publications/ceylon-tea-articles/pragmatic-politics-of-plantation-tamil-leader-saumiyamoorthy-thondaman.html ද බලන්න.

10 ලංකා කම්කරු කොන්ග්‍රස් නායක ආර්. යෝගරාජන් 2021 මාර්තු 10 වෙනි දින වීක් එන්ඩ් එක්ස්ප්‍රස් කලාපයේ අනතුරු අඟවයි: "ඔවුන්ට (වතු කම්කරුවන්ට) සාධාරණ ලෙස සලකන්නේ නැත්නම් ඔවුන් රැඩිකල්වාදයේ බලා සිටින හස්තයට හසුවනු ඇත."

11 මහාචාර්ය ජේ. උයන්ගොඩ, "අරගලයේ අදහස් බරපතල ලෙස සැලකීම", https://groundviews.org/2022/07/19/taking-aragalaya-ideas-seriously/

12 එම

13 අරගලය, වසරකට පසු: ප්‍රතිත්‍රස්ත පනත පක්ෂය නරක් කරයි, https://www.sundaytimes.lk/230409/

## ආශ්‍රිත ලේඛන


ඩිවොටා නීල්. බ්ලෝබැක්: ශ්‍රී ලංකාවේ භාෂාමය ජාතිකවාදය ආයතනික පිරිහීම සහ ජනවාර්ගික ගැටුම ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 2004

මේනර්, ජේම්ස්. The Expedient Utopian: Bandaranaike and Ceylon. කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 2009 මාර්තු 19

ඔර්ටිස්, අයි., බර්ක්, එස්., බෙරේඩා, එම්., සේන්ස් කොර්ටීස්, එච්. "ලොකයේ විරෝධතා පිළිබඳ විශ්ලේෂණයක් 2006 - 2020", ලෝකයේ විරෝධතා, පැල්ග්‍රේව් මැක්මිලන්, 2022, Cham. https://doi.org/10.1007/978-3-030-88513-7_2

තම්බයියා, එස්.ජේ., බුදුදහම පාවා දුන්නේද?: ශ්‍රී ලංකාවේ ආගම, දේශපානය සහ ප්‍රචණ්ඩත්වය. චිකාගෝ විශ්වවිද්‍යාල මුද්‍රණාලය 1992

රිගින්ස් විලියම් හොවාර්ඩ්. ලංකාව: නව ජාතියක උභතෝකෝටිකයන්. ප්‍රින්ස්ටන් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 2016

# අපට ලොක්කන් නැතුවම බැරි ද? පශ්චාත් අරගල[1] දේශපාලන සන්දර්භය පිළිබඳ මහජන අදහස් විමසීමක්[2]

*විදුර මුණසිංහ* සහ ප්‍රභාත් හේමන්ත කුමාර ***

*2022 අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලදී දිවයිනේ ප්‍රදේශ හයක නීතිය හා සමාජ භාරයෙන් සිදුකළ සම්මුඛ සාකච්ඡා මාලාවක් පදනම් කරගනිමින් අරගලයෙන් පසු දේශපාලන පසුබිම සම්බන්ධයෙන් ජනතා අදහස් විශ්ලේෂණයක් කතුවරයා විසින් ඉදිරිපත් කරයි.*


## සාරාංශය

මෙම ලිපිය පදනම් වන්නේ 2022 අගෝස්තු හා සැප්තැම්බර් මාසවල නීතිය හා සමාජ භාරය විසින් ප්‍රධාන කාරණාවන් 2 ක් සම්බන්ධයෙන් මහජන අදහස් විමසුනු පිණිස දිවයිනේ ප්‍රදේශ 6 ක සිදුකළ සම්මුඛ සාකච්ඡා මාලාවක් මතය. එකී කරුණු 2 වන්නේ:

1. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ඉල්ලා අස්වීම සමඟ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විසින් සිය ජනාධිපතිවරයා ලෙස එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ පත්කර ගැනීමත් සමඟ නිදහසින් පසු මෙරට පක්ෂ දේශපාලනයේ ප්‍රධාන කඳවුරු දෙක වූ එජාප සහ ශ්‍රිලනිප බෙදීම කෙරෙහි කවර බලපෑමක් ඇතිකර ඇතිද[3]

*සහ*

2. මහා රැල්ලක් සේ නැඟ ආ අරගලය ජනතාව විසින් රාජ්‍ය නායකයා පලවා හැරීමත් සමඟ නිර්මාණය වූ අරගලය අවිනිශ්චිත දේශපාලන තත්ත්වය තුළ එක්වරම බැස ගියේ ඇයි යන කාරණාවන්ය.

මහජන අදහස් මත පදනම්ව කතුවරුන් මෙහිදී ප්‍රධාන කරුණු 3 ක් ගෙනහැර දක්වයි. එනම්,

1. ප්‍රධාන කඳවුරු දෙක නියෝජනය කරන පක්ෂ අතර වෙනසක් ඇතැයි ජනතාවගෙන් වැඩි පිරිසක් තවදුරටත් පිළිනොගන්නා නමුත් ශ්‍රිලනිප/ ශ්‍රිලපොපෙ කඳවුරේ සංකල්ප ලෙස ප්‍රවර්ධනය කරනු ලැබ ඇති දේශීයත්ව- සිංහල-බෞද්ධ- ගැමි ආධිපත්‍යය පිළිබඳ අදහස්වලට තවමත් ජනතාව තුළ පිළිගැනීමක් ඇත. අනාගතයේදී ද එම අදහස් දේශපාලනය තුළ තීරණාත්මක වියහැකි නමුත් කවර පක්ෂයක්/ නායකත්වයක් එම අදහස් නියෝජනය කිරීමේ සුජාතභාවය හිමිකර ගැනීමේ හැකියාව ලැබේද යන්න මේ වන විට කිව නොහැක.


* විදුර මුණසිංහ නීතිය හා සමාජ භාරයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකයකු ලෙස කටයුතු කරයි.

**ප්‍රභාත් හේමන්ත කුමාර නීතිය හා සමාජ භාරයේ සහකාර පර්යේෂකයකු ලෙස කටයුතු කරයි.

2. ජනතාව පැවැති තත්ත්වයට එරෙහිව බරපතල ලෙස විරෝධය දැක්වූ නමුත් එතැනින් එහාට රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් වන තීරණ සම්බන්ධයෙන් මැදිහත්වෙමින් ආණ්ඩුකරණ ක්‍රියාවලිය හා දිගින් දිගටම විවේචනාත්මකව සම්බන්ධවීමේ වුවමනාවක් ජනතාවට නොවූ අතර ඒ සඳහා තමන්ට හැකියාව ඇතැයි ජනතාව විශ්වාස නොකරති. ඔවුන්ට අනුව එය තමන්ට වඩා දේශපාලනයේ දැනුම් තේරුම් ඇති 'ලොක්කන්ගේ' වැඩකි. අරගලය, බලය සම්බන්ධයෙන් වන සුසදමාර්ශී විතැන්වීමක් ලෙස භාර ගැනීමට ජනතාවගේ සූදානමක් ඇති බවක් පෙනෙන්නට නැත.

3. මෙරට දේශපාලනය තුළ අනුග්‍රාහක සම්බන්ධය තීරණාත්මකය. ප්‍රධාන දේශපාලන පක්ෂ නැවත නැවත බලයට පත්වන්නේ මෙම ක්‍රියාදාමය හරහාය. අරගලයත් සමඟ මෙම සම්බන්ධය මේ වන විට දුර්වලව ඇති අතර සාම්ප්‍රදායික ප්‍රධාන දේශපාලන පක්ෂ නොවන බලවේග වෙත ඉඩක් විවෘත වී ඇත්තේ මේ හරහාය. නමුත් නව පාලනය තුළ පැරණි පක්ෂ නැවත සිය අනුග්‍රාහක දේශපාලන ජාලය ශක්තිමත් කරමින් සිටින අතර ඉදිරි මැතිවරණයකදී එය නැවත වරක් තීරණාත්මක භූමිකාවක් ඉටු කරනු ඇත.

මෙය අනාගතයේදී මැතිවරණ තුළින් බලය ලබාගැනීමට අපේක්ෂා කරන පැරණි ප්‍රධාන කඳවුරු දෙකට පිටතින් වන ඕනෑම බලවේගයකට මුහුණ දීමට සිදුවන ප්‍රධාන අභියෝගයකි. අනෙක් අතට අනුග්‍රාහක දේශපාලනය විසින් දේශපාලනය සාමාන්‍ය ජනයාගේ නොව දේශපාලන ප්‍රභූන්ගේ බලප්‍රදේශයක් බවට පත්කොට ඇත. පාර්ලිමේන්තු දේශපාලනයෙන් ඔබ්බට දේශපාලන බලය අභ්‍යාස කරන ජනතාවක් නිර්මාණය කරන සක්‍රීය පුරවැසි දේශපාලනයක් වෙනුවෙන් ජනතාව ආමන්ත්‍රණය කරන පාර්ශ්වයන්ට ඇති සැබෑ අභියෝගය වන්නේ මෙයයි.

# සන්දර්භය

2019 වසරේදී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරණය ජයගන්නේ මෙරට ඉතිහාසයේ ජනාධිපතිවරයෙක් ලබාගත් වැඩිම ඡන්ද සංඛ්‍යාව වන 69 ලක්ෂයක් ඡන්ද[4] හිමිකර ගනිමිනි.[5] අනතුරුව එළැඹි මහාමැතිවරණයේදී ඔහුගේ පක්ෂය වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පාර්ලිමේන්තු ආසන වලින් 2/3 කට වැඩි ගණනක් දිනාගැනීමට සමත්වූ අතර අනතුරුව 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා සිය විධායක බලය තවදුරටත් වර්ධනය කරගන්නට කටයුතු කරන ලදී. මේ අනුව ඔහු සහ ඔහුගේ පක්ෂයට 1977 දී පත්වූ ජේ.ආර්. ජයවර්ධනගේ රජය හිමිකරගෙන තිබූ බලය වැනිම වූ ශක්තිමත් බලයක් විධායකය හා ව්‍යවස්ථාදායකය තුළ හිමිව පැවතින. එම බලය තවදුරටත් ස්ථාවර ලෙස පෙනීගියේ ජනාධිපතිවරයාගේ ඡන්ද පදනම බොහෝ සෙයින්ම බහුතර සිංහල ජනවාර්ගික පදනමකින් සමන්විත වූ බැවිනි.[6] එසේ තිබියදී බලයට පත්ව වසර දෙකක් ගතවෙද්දී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා සහ ඔහුගේ රජයට එරෙහිව බලවත් ජනතා විරෝධයක් මතුවී එන්නට වූ අතර එකී විරෝධය මූලික වශයෙන් එල්ලවූයේ ඔහු සහ ඔහුගේ පක්ෂය වැඩි වශයෙන් ඡන්ද හිමිකරගත් රටේ දකුණේ බහුතර සිංහල ප්‍රදේශවලිනි.

කොළඹ නගරය හා පරිවාරයේ නගර මූලික කරගනිමින් රටේ විවිධ ස්ථානවල ක්‍රියාත්මක වූ උද්ඝෝෂණ 2022 මාර්තු 31 වන දින ජනාධිපතිවරයාගේ පුද්ගලික නිවස ආසන්නයේ පවත්වනු ලැබූ විරෝධතාව සමඟ නව අදියරකට පිවිසෙන ලදී. එතැන් සිට වැඩි ජවයකින් යුතුව දිනෙන් දින ඉහල ගිය උද්ඝෝෂණ ව්‍යාපාරය අප්‍රේල් 9 වන දින සිට ජූලි 22 දක්වා ගාලු මුවදොර පිටිය හා ඒ ආශ්‍රිත ජනාධිපති ලේකම් කාර්යාලය අවට භූමිය අත්පත් කරගනිමින් නිර්මාණය වූ 'අරගලභූමිය'[7] මූලික කරගනිමින් වඩ වඩා තීව්‍ර ලෙස ක්‍රියාත්මක විය. මේ කාලය තුළ මුලින් මුදල් අමාත්‍යවරයාටද, පසුව අග්‍රාමාත්‍යවරයා සහ කැබිනට් මණ්ඩලයටද ඉල්ලා අස්වීමට සිදුවිය. අවසානයේ ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, ජනාධිපති මන්දිරය සහ අග්‍රාමාත්‍ය නිල නිවස වූ අරලියගහ මන්දිරය ජනතාව විසින් අත්පත් කරගැනීමත් සමඟ ජනාධිපතිවරයා ඉල්ලා අස්වීම සිදුවිය. ශ්‍රී ලංකා ඉතිහාසයේ පැවති රජයන් බලයෙන් පහකිරීම සඳහා සන්නද්ධ කැරලි දෙකක් (1971 සහ 1987-89) ක්‍රියාත්මක වී ඇති අතර ඒ දෙකම රාජ්‍ය මර්දනය ඉදිරියේ අසාර්ථක විය.[8] නමුත් 2022 වසරේ සිදුවූ උද්ඝෝෂණ ව්‍යාපාරයේ කැපී පෙනෙන හා සුවිශේෂීම ලක්ෂණය වූයේ එය බෙහෙවින් සාමකාමී ජන නැගිටීමක් වීමත්[9], එයට පැවැති ආණ්ඩුව හා ජනාධිපතිවරයා පලවා හැරීමට හැකිවීමත් නිසාවෙනි.

නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව යමින් පාර්ලිමේන්තුවේ 2/3 ක බහුතරය හිමි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විසින් නව ජනාධිපතිවරයා ලෙස පාර්ලිමේන්තුවේ එක් අසුනක් පමණක් හිමි එක්සත් ජාතික පක්ෂයේ නායකයා වූ රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තුවේ බහුතර ඡන්දයෙන් ගෝඨාභය රාජපක්ෂගේ ඉතිරි ධූර කාලය සඳහා තෝරා පත්කර ගැනුනු අතර ඒ හරහා නැවතත් බලය අහිමිව සිටි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ආණ්ඩුවක් පිහිටුවා ගැනීමේ

හැකියාව ලැබින. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා ලෙස මහජන විරෝධතා ව්‍යාපාරය මර්ධනය කිරීමට කටයුතු කළේ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ඇතුලු සියලු මර්ධන නීති යොදාගනිමින් විරෝධය දැක්වීමට පමණක් නොව භාෂණයේ හා රැස්වීමේ නිදහසට ඇති මහජන අවකාශය පවා හකුලුවමිනි. මේ දැඩි මර්ධනීය වතාවරණය නිර්මාණය කිරීමට හැකිවීම ඊට පෙර ජනතා උද්ඝෝෂණය ඉදිරියේ විධායක බලය අක්‍රීයව තිබූ තත්ත්වය තුළ සිතීමට පවා නොහැකි තරමේ එකක් විය. වඩාත් පුදුම සහගත කාරණය වූයේ ජයග්‍රාහීව පැවැති උද්ඝෝෂණ ව්‍යාපාරයේ රළ පහර නව මර්ධනය හමුවේ වේගයෙන් බලාපොරොත්තු නොවූ ලෙස බැසයාමත්, ජනතාව වේගයෙන් අරගලය අතහැර යලි සාමාන්‍ය ජීවිතය වෙතට පිවිසීමත්ය. දැඩි මර්ධනය ඉදිරියේ පවා විවිධ මට්ටමින් විරෝධයන් ප්‍රකාශමාන වන නමුදු ඒවා අප්‍රේල්-ජූලි කාලයේ පැවැති ආකාරයේ දැවැන්ත සමූහ මහජන සහභාගීත්වයකින් යුතු හෝ තීව්‍රතාවයකින් යුතු ඒවා නොවේ.

## ප්‍රධාන නිරීක්ෂණ

පසුගිය මාස කිහිපය තුළ ශ්‍රී ලංකාවේ සිදුවූ මේ දේශපාලන පෙරලිය දෙස හැරී බැලීමේදී පෙනී යන ප්‍රධාන නිරීක්ෂණ දෙකක් අපට හඳුනාගත හැකිවිය. එනම්,

1. මෙරට නිදහසින් පසු පැවැති ප්‍රධාන දේශපාලන කඳවුරු දෙක අතර වෙනස වඩාත් පටු වී ඇත. ඇත්ත වශයෙන්ම 2019 දී 69 ලක්ෂයක ජනතාව විසින් ප්‍රතික්ෂේප කළ තැනැත්තාව, එකී මැතිවරණයේ ජයග්‍රාහී පක්ෂය විසින් රටේ විධායකයේ ප්‍රධානියා බවට පත්කරනු ලැබ ඇත. එනම් ජනතාව පක්ෂ වූ කණ්ඩායම විසින් ජනතාව ප්‍රතික්ෂේප කරනු ලැබූ තැනැත්තාව බලයට පත්කොට ඇත. මෙය මෙරට දේශපාලනය තුළ පෙර නොවූ සංසිද්ධියකි.

2. ජනතාව ලක්ෂ ගණනින් පාරට බැස විරෝධය දක්වනු ලැබූයේ ඊට වසර දෙකකට පෙර තමන් විසින් බහුතර ඡන්දයකින් බලයට පත් තැනැත්තා සහ ඔහුගේ පක්ෂයට එරෙහිවය. එකී විරෝධතා ක්‍රියාදාමය නිදහසින් පසු මෙරට ඉතිහාසයේ පෙර නොවූවිරූවකි. මැතිවරණයෙන් මෙපිට ජනතාව දේශපාලන ක්‍රියාවලිය වෙත මැදිහත්වෙමින් පාලනයේ තීරණාත්මක මර්මස්ථාන අත්පත් කරගනිමින් බලය සියතට ගන්නා ලදී. නමුත් එතැනින් ඔබ්බට ආණ්ඩුකරණය තුළ ජනතාව සිය බලය අභ්‍යාස කරනවා හෝ ඊට බරපතල ලෙස මැදිහත්වනු වෙනුවට බහුතර ජනතාව ඉතා පහසුවෙන්ව පෙර සිටි මැතිවරණ දේශපාලනයට පමණක් සීමා වූ තත්ත්වයට පත්ව ඇත.

මීළඟට අප ඉදිරියේ වූ ගැටලුව වූයේ මෙම නව අත්දැකීම් දෙක විසින් මෙරට අනාගත දේශපාලනයේ කවර ප්‍රතිඵලයක් ජනිත කරනු ඇතිද යන්නයි. ශ්‍රී ලංකාව තුළ පසුගිය මාස කිහිපයක කාළය තුළ සිදුවූ මේ සුවිශේෂී ක්‍රියාදාමය සම්බන්ධයෙන් විවිධ විශ්ලේෂණ, සාකච්ඡා, සංවාද මේ වන විට සිදුවෙමින් පවතී. නමුත් මේ බොහොමයක් සමාජයේ කැපී පෙනෙන දේශපාලනික හා මතවාදීමය වශයෙන් කිසියම් ඉහල ස්ථයකට සීමා වී ඇත. මේ තත්ත්වය තුළ මෙරට සාමාන්‍ය ජනයා මේ තත්ත්වය දකින්නේ කෙසේද යන්න කෙරෙහි අපගේ අවධානය යොමුවූයේ ඉහත කී දැවැන්ත දේශපාලන පෙරලියට පෙරමුණ ගත්තේද, අනාගතයේ පැවැත්වෙනු ඇති මැතිවරණයකදී තීරණාත්මකව මේ රටේ අනාගත දේශපාලනය සම්බන්ධයෙන් තීරණය කරනු ඇත්තේද ඔවුන් වන බැවිනි. ඔවුන් වෙතින් පළවන අදහස් ඇසුරින් මෙරටේ අනාගත දේශපාලනය සම්බන්ධයෙන් කවර ගම්‍යමානයන් හඳුනා ගැනීමට හැකිවනු ඇතිද යන්න සම්බන්ධයෙන් අපගේ අවධානය යොමු විය.

## ක්‍රියාවලිය

ඉහත කී අරමුණු සහිතව අහඹු ලෙස තෝරාගනු ලැබූ පිරිමින් 25 ක් සහ කාන්තාවන් 25 ක් සමඟ 2022 අගොස්තු සහ සැප්තැම්බර් මාස දෙක තුළ දීර්ඝ සම්මුඛ සාකච්ඡාවන්හි අපි නිරත වීමු. සම්මුඛ සාකච්ඡාවට ලක්කළ පිරිස වයස අවු. 22 සිට 78 දක්වා විවිධ වයස් මට්ටම්වලට අයත් වූ අතර වෘත්තීමය වශයෙන් ගොවීන්, ධීවරයින්, දෛනික වේතන ලබන කම්කරුවන්, රජයේ සේවකයින්, පුද්ගලික අංශයේ විවිධ මට්ටම්වල රැකියාවේ නියුතු පිරිස්, ලොතරැයි විකිණීම වැනි විවිධ සුලු වෙළඳාම්වල නිරත වන පිරිස්, විශ්‍රාමිකයින් (ගුරු, විදුහල්පති, ආරක්ෂක අංශ), සුලු කර්මාන්තකරුවන් යනාදී වශයෙන් විශාල විවිධත්වයකින් යුතු වූවෝ වූහ. මෙම සම්මුඛ සාකච්ඡා විනාඩි 45 සිට පැය 2 1/2 දක්වා දීර්ඝ වූ ඒවා විය. එම පිරිස තෝරාගනු ලැබූයේ ප්‍රදේශ 5 කිනි. එහිදී 2019 දී මැතිවරණයේ බහුතර බලයක් ලබාගත් ශ්‍රී ලංකාවේ සිංහල බහුතරයක් වෙසෙන සහ ගෝඨාභය රාජපක්ෂ හා ඔහුගේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට වඩාත් තීරණාත්මක වූ හා එකී මැතිවරණ ව්‍යාපාරය හා විවිධාකාරයෙන් සම්බන්ධිත ප්‍රදේශ 4ක් තෝරා ගැනුනි. එනම්,

**හම්බන්තොට දිස්ත්‍රික්කය -** මෙය රාජපක්ෂ පවුලේ සාම්ප්‍රදායික බල කඳවුර ලෙස සැලකෙන අතර 2019 ජනාධිපතිවරණයේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රකාශිත ඡන්ද වලින් 66.17% ක්[10] ද, 2020 මහාමැතිවරණයේදී ප්‍රකාශිත ඡන්දවලින් 75.1% ක්[11] ද ලබා ගැනීමට පිළිවෙලින් ගෝඨාභය රාජපක්ෂ සහ ඔහුගේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සමත් විය.

**කුරුණෑගල දිස්ත්‍රික්කය -** 2019 මැතිවරණයේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මෙම දිස්ත්‍රික්කයෙන් තරග කරනු ලැබිනි (මැතිවරණයෙන් පසු ඔහු අග්‍රාමාත්‍යවරයා ලෙස පත්කරනු ලැබිනි). ඔහුගේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ 2020 මහාමැතිවරණයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රකාශිත ඡන්ද වලින් 66.9% ක්[12] ලබාගත් අතර ඊට පෙර 2019 වසරේදී පැවැති ජනාධිපතිවරණයේදී ගෝඨාභය රාජපක්ෂ එම දිස්ත්‍රික්කයේ ප්‍රකාශිත ඡන්ද වලින් 66.92% ක්[13] ලබා ගන්නා ලදී.

**අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක -** මෙම දිස්ත්‍රික් දෙක සාම්ප්‍රදායිකව ශ්‍රී ලංකාවේ සිංහල ගොවි ජනතාව වැඩි වශයෙන් ජීවත්වන දිස්ත්‍රික්ක වන අතර ඡන්දවලදී ගැමි සිංහල ජනයා වෙත කෙරෙන ආමන්ත්‍රණවලදී මෙම බොහෝවිට මෙම දිස්ත්‍රික්ක ඉලක්ක කරණු ලබයි. 2019 ජනාධිපතිවරණයේදී ගෝඨාභය රාජපක්ෂගේ මැතිවරණ ව්‍යාපාරයේ පළමු ජනරැළිය අනුරාධපුර නගරයේ[14] පවත්වනු ලැබූ අතර මැතිවරණයෙන් තේරී පත්වීමෙන් පසු ඔහු ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දෙන ලද්දේ ද අනුරාධපුරයේ පිහිටි බෞද්ධයන්ගේ ප්‍රධාන පූජනීය ස්ථානයක් වූ රුවන්වැලි සෑ පරිශ්‍රයේදී ය.[15] 2019 ජනාධිපතිවරණයේ දී එම දිස්ත්‍රික්කයේ ප්‍රකාශිත ඡන්දවලින් 67.95% ක්[16] ලබාගැනීමට ගෝඨාභය රාජපක්ෂ සමත වූ අතර 2020 මහමැතිවරණයේදී ඔහුගේ පක්ෂය ප්‍රකාශිත ඡන්දවලින් 58.97% ක්[17] ලබා ගන්නා ලදී.

පොළොන්නරු දිස්ත්‍රික්කය හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන නියෝජනය කරන දිස්ත්‍රික්කය වන අතර (2015 දී රාජපක්ෂ පවුල් පාලනයට එරෙහිව යමින් විපක්ෂය හා එක්ව තරග වැද ජනාධිපති දූරයට පත්වූ) ඔහු මෙවර මහමැතිවරණයේදී රාජපක්ෂවරුන් සමඟ එක්ව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණින් එම දිස්ත්‍රික්කයෙන් තරග වැදුනි. 2019 ජනාධිපතිවරණයේ දී එම දිස්ත්‍රික්කයේ ප්‍රකාශිත ඡන්දවලින් 73.66% ක්[18] ලබාගැනීමට ගෝඨාභය රාජපක්ෂ සමත්වූ අතර 2020 මහමැතිවරණයේදී ඔහුගේ පක්ෂය ප්‍රකාශිත ඡන්දවලින් 53.01% ක්[19] ලබාගැනීමට සමත් විය.

මෙම අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙක විශේෂ වූ තවත් හේතුවක්වූයේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් ගනු ලැබූ වඩාත් විවේචනයට ලක්වූ තීරණයක් වූ රසායනික පොහොර තහනම නිසා වඩාත් බලපෑමට පත්වූ ගොවි ජනතාව වෙසෙන දිස්ත්‍රික්ක දෙකක් වීමයි.

ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ඡන්ද බල ප්‍රදේශය - සාමාන්‍යයෙන් ශ්‍රීලනිප හෝ ඒ සම්බන්ධ කඳවුරට මැතිවරණවලදී අවාසිදායක ප්‍රතිඵල ලැබෙන මෙම බලප්‍රදේශය තුළ 2019 පාස්කු ඉරිදා දින මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයට ලක්වූ කටුවාපිටිය දේවස්ථානය පිහිටා ඇත. මෙය කතෝලික ජනයා බහුතරයක් වෙසෙන ප්‍රදේශයකි. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මියගිය හා තුවාල ලැබූ බොහෝ දෙනෙකු මෙම ප්‍රදේශය හෝ ඊට තදාසන්න ප්‍රදේශවල අයවලුන් වෙති. 2019 ජනාධිපතිවරණයේ හා 2020 මහමැතිවරණයේ ජයග්‍රාහී පාර්ශ්වයේ ප්‍රධාන සටන් පාඨයක් වූයේ පාස්කු බෝම්බ ප්‍රහායන්ට වගකිව යුත්තන් නීතිය ඉදිරියට පමුණුවා දඬුවම් ලබාදෙන බවයි. 2019 ජනාධිපතිවරණයේදී මෙම ආසනයේ ප්‍රකාශිත ඡන්දවලින් 52.04% ක්[20] ලබාගැනීමට ගෝඨාභය රාජපක්ෂ සමත් වූ අතර 2020 මහමැතිවරණයේදී ඔහුගේ පක්ෂය එම ආසනයේ ප්‍රකාශිත ඡන්ද වලින් 38.23% ක්[21] ලබා ගන්නා ලදී.

ඉහත කී ප්‍රදේශ 4 ට අමතරව ගෝඨාභය රාජපක්ෂගෙන් පසු පත්වූ වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ ඡන්ද බල ප්‍රදේශය[22] වන කොළඹ දිස්ත්‍රකික්යේ මැද කොළඹ සහ සාම්ප්‍රදායිකව ශ්‍රීලනිප විරෝධී කඳවුරේ ප්‍රබල ආසනයක් ලෙස සැලකෙන එම දිස්ත්‍රික්කයේම බොරැල්ල ඡන්ද බලප්‍රදේශ තෝරාගනු ලැබිනි. 2019 ජනාධිපතිවරණයේදී ගෝඨාභය රාජපක්ෂට මැද කොළඹ හා බොරැල්ල ආසනවලින් හිමිකරගත හැකිවූයේ ප්‍රකාශිත ඡන්ද වලින් පිළිවෙලින් 16.39% ක්[23] සහ 41.76%[24] කි. 2020 මහමැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ මෙම ඡන්ද බලප්‍රදේශ 2 කින් ලබාගත්තේ ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් පිළිවෙලින් 18.93% ක්[25] සහ 38.67%[26]කි.

## සාම්ප්‍රදායික ප්‍රධාන දේශපාලන කඳවුරුවලට තවදුරටත් පැවැත්මක් තිබේද?

පශ්චාත් නිදහස් ශ්‍රී ලංකා ඉතිහාසය පුරාවට මෙරට නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණය වී ඇත්තේ එහි බලය හැමවිටම ප්‍රධාන කඳවුරු දෙකක් අතර

මාරුවෙන් මාරුවට හුවමාරු වීමයි. මෙම කඳවුරු මුලින් එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ලංකා සමසමාජ පක්ෂය (සමසමාජ), ලංකා කොමියුනිස්ට් පක්ෂය (කොප) විසින් ද, පසුව එජාප සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප), සමසමාජ, කොප සහාග විසින් ද නියෝජනය කරනු ලැබිනි. මේ කඳවුරු ජනතාව වෙත තමන්ව ඉදිරිපත් කරනු ලැබූයේ සෑම අතින්ම පාහේ එකිනෙකට පසමිතුරු කඳවුරු දෙකක් ලෙසිනි. 1970 මහමැතිවරණයේදී ශ්‍රීලනිප, සමසමාජ සහ කොප ඇතුලත් සමගි පෙරමුණ වෙනුවෙන් ශ්‍රීලනිප නායිකා සහ අග්‍රාමාත්‍ය ධූර අපේක්ෂිකාව වූ සිරිමාවෝ බණ්ඩාරණායක විසින් ජනතාව වෙත ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රකාශනයේ ඇය මෙසේ කියයි.

> "ධනපතිවාදය දිනෙන් දින දස ඇත විහිදුවන රැහැන් කපා දැමීමට එතුමා (*එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරණායක*) ඕනෑම වේලාවක සටනට සූදානම්ව සිටියේය. නහය විද රැහැන කොටකර ධනපති ආර්ථික ක්‍රමය සමාජවාදී කණුවෙහි බැද තබා මහජන ආර්ථික ක්‍රමයක් ගොඩනැගීම එතුමාගේ බලාපොරොත්තුව විය. එතුමා සිංහල භාෂාවේ වීරයා ය. අප මුතුන්මිත්තන් සිය දිවි දෙවැනිකොට රැක දී ඇති අසමසම දායාදයක් වූ රැකවරණය දුන් ශ්‍රේෂ්ඨ පුද්ගලයා එතුමාය. අධිරාජ්‍යවාදය නිසා දිරාපත් වූ භාෂාව හා ආගම පෝෂණය කරන අතර සුලු ජාතීන්ගේ භාෂාව හා සංස්කෘතිය ද අප විසින් පෝෂණය කරන්නෙමු." (බණ්ඩාරණායක 1970, 2)

ශ්‍රීලනිප ප්‍රමුඛ මෙම කඳවුර අධිරාජ්‍ය විරෝධී, වාමවාදී, සුභසාධනවාදී, සිංහල-බෞද්ධ, ග්‍රාමීය ඡන්ද පදනමක් සහිත, දේශීය සංස්කෘතිය රකින, පහල හා මධ්‍යම පාංතිකයින් වෙනුවෙන් කැපවුනු කඳවුරක් ලෙස හැමවිටම පාහේ නිරූපණය වී තිබේ.[27] එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ අනෙක් කඳවුර හැමවිටම පාහේ තමන්ව ජනතාව වෙත ප්‍රක්ෂේපනයකොට ඇත්තේ බටහිරට (ලෝකය යන අතට) පක්ෂපාත, ධනේශ්වර ආර්ථික සංවර්ධනය කෙරෙහි දිශානත වූ, ප්‍රායෝගික ප්‍රවේශයක් ගන්නා, ධනපතියන්ගේ ධාරාවක් ලෙසිනි. එම පක්ෂයට අනුව ඉතිහාසය පුරා එය කැපවී ඇත්තේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස් වෙළඳාම ඔස්සේ ආර්ථික සමෘද්ධිය ළඟා කරගැනීම, පුද්ගල සාර්ථකත්වය, බහුවාර්ගික සමගිය වෙනුවෙනි.[28] එජාප විරෝධී කඳවුර විසින් දිගින් දිගටම එයට අලවන ලේබලයට මෙම ලක්ෂණ මෙන්ම ශ්‍රීලනිප කඳවුර සිය ප්‍රචාරණ ව්‍යාපෘතිය තුළ ප්‍රවර්ධනය කරන ලක්ෂණවලට හාත්පසින් විරුද්ධ ලක්ෂණ (එනම් නාගරික/ ලුම්පන්, සිංහලයාට විරුද්ධ, දේශීය සංස්කෘතිය විනාශ කරන යනාදී වූ) අන්තර්ගත විය. ශ්‍රීලනිප කඳවුරේ හැමවිටම පුරෝගාමියා ලෙසින් නිරූපිත එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරණායකගේ දේශපාලනය පිළිබඳ එජාප කඳවුරේ ප්‍රතිචාරය වී ඇත්තේ ඔහු විසින් රට ප්‍රපාතය කරා ගෙනගිය බවත්, ඔහුගෙන් පසු ශ්‍රීලනිපය විසින් එකී ප්‍රතිපත්තියේම ගමන් කළ බවත්ය. ශ්‍රීලනිපය සම්බන්ධ එජාප කඳවුරේ විවේචනය බොහෝවිට එහි ආර්ථික ප්‍රතිපත්තිය හා එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වූවක් වී තිබේ.

> "1956 දී බලයට පත් බණ්ඩාරණායක මහතා සිය දේශපාලනික හා ආර්ථික අත්හදාබැලීම් වලින් ඉතා කෙටි කලක් තුළ රට ප්‍රපාතය කරා ගෙනාවේය. 1956 දී බණ්ඩාරණායක මහතා ආරම්භ කළ විනාශකාරී ප්‍රතිපත්තිය එහි අවසාන තාර්කික ප්‍රතිඵලය වෙත ගෙනයනු ලැබුවේ 1970-77 සිරිමා මැතිණියගේ ආණ්ඩුවයි. 1956 සිට පැවැති ශ්‍රීලනිප ආණ්ඩුවල කෙරුවාවල් පවතින දේවල් ආණ්ඩුවට පවරා ගැනීම මත පදනම් විය." (චන්ද්‍රප්‍රේම 1997, 137)

කෙසේවෙතත් ආර්ථික ප්‍රතිපත්තිය අතින් මෙම කඳවුරු දෙක අතර වූ වෙනස අවසන් කරමින් 1994 දී ශ්‍රීලනිප ය ද විවෘත ආර්ථිකය පිළිගන්නා ලදී. මේ නව තත්ත්වය සම්බන්ධයෙන් අදහස් දක්වන ලද සී.ඒ. චන්ද්‍රප්‍රේම වැනි එවකට එජාප කඳවුරේ හිතෛෂීන්ගේ අදහස වූයේ මේ සමඟ ශ්‍රී ලංකාවේද 'දියුණු ද්වි පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටවල මෙන්' මතවාදී වශයෙන් වෙනසක් නොවන (ඔහුගේම වචනයෙන් කියන්නේ නම් ධනවාදය හා සමාජවාදය අතර වන මාරාන්තික ද්වන්ධ යුද්ධයක ස්වරූපය ගත් සටන වෙනුවට) රට පාලනය කරන ආකාරයේ පමණක් වෙනසක් පවතින ආණ්ඩුකරණ ආකෘතියකට ශ්‍රී ලංකාවද පිවිසෙනු ඇති බවයි (1997, 124). කෙසේ නමුත් ආර්ථිකය සම්බන්ධයෙන් එකම ප්‍රතිපත්තියකට එළැඹුන ද එහි තමන්ගේ සුවිශේෂීතාවක් ලකුණු කිරීමට ශ්‍රීලනිප කඳවුර හැමවිටම උත්සාහ දරා තිබේ. ඔවුන් දිගින් දිගටම සිය ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වන ලද්දේ එජාප කඳවුරේ නග්න විවෘත ආර්ථිකය වෙනුවට ඊට මානුෂික මුහුණුවරක් සහිතව ක්‍රියාත්මක කරන්නක් ලෙසිනි.

> "අද ලොව පුරා ක්‍රියාත්මක වන්නා වූ තරගකාරී විවෘත ආර්ථික ක්‍රමයට මානවවාදී මුහුණුවරක් ලබා දෙන බව 1994 දී අප ප්‍රකාශ කළෙමු. එහි තේරුම විවෘත ආර්ථිකයේ එල

> ප්‍රයෝජන අතලොස්සකට නොව පොදු ජනතාවට ලබා දීමට කටයුතු කිරීමයි. වඩාත් පැහැදිළිව කිවහොත් විවෘත ආර්ථිකයේ එල ප්‍රයෝජන සමාජයේ පහළම මට්ටමේ දුගී දුප්පත් ජනකොටස්වලට ද ලැබෙන්නට සැලැස්වීමයි.'' (ශ්‍රීලනිප 2001, 10)

ආර්ථික ප්‍රතිපත්තිය එසේ වුව ද, මෙම කඳවුරු දෙක අතර බරපතල දෘෂ්ටිවාදී වෙනසක් හැමවිටම පාහේ සලකුණු කරමින් එජාප සතුරු කඳවුරට එරෙහි බරපතල වෙනසක්ම් සහිත කඳවුරක් ලෙස මතවාදී කලාපයේ පෙනී සිටීමට ශ්‍රීලනිප ප්‍රමුඛ කඳවුර 2020 අවසන් මහාමැතිවරණය දක්වාම සමත්ව තිබේ. ශ්‍රීලනිප කඳවුරේ ප්‍රබල මතවාදී ප්‍රකාශකයකු වූ ගුණදාස අමරසේකර වැනි අය බරපතල ලෙස මෙම වෙනස සලකුණු කිරීමට ඉතා බලපෑම් සහගත ලෙස දායක වී තිබේ. 2011 වසරේදී ඔහු මෙසේ ලියයි.

> "බණ්ඩාරණායක මහතාගේ ජයග්‍රහනය අප විසින් දැකගත යුත්තේ ධර්මපාල තුමා අපගේ ජාතික උරුමය සොයා ආරම්භ කළ ගමනේ ඊළඟ අවස්ථාව ලෙසයි. බණ්ඩාරණායක මහතාගේ අභාවයත් සමඟ අනාථ වූ ජනතාව බණ්ඩාරණායක මැතිණිය වටා රොක්වූයේ ඈ වෙතින් සිය සිංහල බෞද්ධ උරුමය සාක්ෂාත් කරගනු පිණිසය. සිය සංස්කෘතික පසුබිම මගින් ඒ උරුමය පිළිබඳ සවිඥ්ඥාණිකත්වයක් ලබා සිටි එතුමිය විසින් ඒ සඳහා මෙරට උන් මාක්ස්වාදීන් ද සහභාගි කරගන්නා ලදහ. ජේ. ආර්. ජයවර්ධන විසින් 17 වසරක කාළය තුළ සිංහල බෞද්ධ උරුමය විනාශ කරමින් ජාතික උරුමය-මානව හිතවාදී සමාජවාදී උරුමය පිළිබඳ කිසිදු අවබෝධයක් නැති කාපල්ලා- බීපල්ලා ආප්තය කරගත් නරුම පරපුරක් බිහිකිරීමයි. 2005 දී ජනතාව මහින්ද රාජපක්ෂ බලයට පත්කරගන්නේ සිය ජාතික උරුමය රැහුණීන් පහල වූ නායකයෙකු අතින්වත් ඉටුකරගත හැකි වේ යන ප්‍රාර්ථනය උඩයි. ඔහු සවැනි පරාක්‍රමබාහුගෙන් පසු රට එක්සේසත් කළ නරවරයා වශයෙන් හඳුන්වනු ලැබීම යුක්ති සහගත වෙයි." (අමරසේකර 2011, 17-18)

2019 ජනාධිපතිවරණය වන විට මෙම කඳවුරු අතර වෙනස බරපතල ලෙස සටහන්ව තිබිණ. 2015-2019 කාල වකවානුව තුළ එජාපයේ නායක රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා ලෙස කටයුතුකොට තිබීමත්, ඒ කාලය තුළ එජාප ප්‍රමුඛ රජයක් පැවතීමත් නිසා 2019 වන විට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ (ශ්‍රීලපොපෙ) ප්‍රමුඛ කඳවුරට[29] ඊට එරෙහිව විශාල විරෝධයක් ගොනු කිරීමට හැකිවී තිබිණි. පාස්කු ප්‍රහාරය මුල්කොට ගෙන එල්ල කරන ලද ජාතික ආරක්ෂාව සහතික කිරීමට අපොහොසත් වීම, සිංහල-බෞද්ධයින් නෙතකා හැරීම, දේශීයත්වය පිටුදැකීම යනාදී වූ ශ්‍රීලනිප කඳවුරේ සුපුරුදු සටන් පාඨ අතිශය තීව්‍ර ආකාරයකින් එජාප කඳවුර වෙත එල්ල කෙරුනු අතර එකී විවේචනයට ගොදුරු වූ ප්‍රකටම තනි චරිතය වූයේ අතිශය අසාර්ථක නායකයකු ලෙසින් සලකුණු කරනු ලැබ තිබූ රනිල් වික්‍රමසිංහ යි. ඒ අනුව රනිල් වික්‍රමසිංහ හා ඔහුගේ කඳවුර පරාජය කරමින් ගෝඨාභය රාජපක්ෂ හා ඔහුගේ ශ්‍රීලනිප (ශ්‍රීලපොපෙ) කඳවුරට දැවැන්ත මැතිවරණ ජයක් ජනතාව විසින් ලබාදෙන ලදී.

නමුත් වසර දෙකකට පසු ජනතා උද්ඝෝෂණ හමුවේ ශ්‍රීලපොපෙ විසින් නැවත බලයට ගෙන එනු ලැබූයේ තමන් විසින් චෝදනා නගනු ලැබ ජනතාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ රනිල් වික්‍රමසිංහ යි. අනතුරුව ඔහුගේ මූලිකත්වයෙන් ආණ්ඩුවක් පිහිටුවමින් ඔහුගේ පාලනය ඉදිරියට ගෙන යාමට එම පක්ෂය කටයුතු කරන ලදී. මේ අනුව ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට ඓතිහාසිකව එකිනෙකට ප්‍රතිපක්ෂව සිටි සතුරු බලවේග කඳවුරු දෙක කිසිදු ගැටලුවකින් තොරව එක්ව සිටී. දැන් දෙපිලට බෙදී මේ කඳවුරු දෙකට ඡන්දය ලබාදුන් ජනතාව මෙය දකින්නේ කෙසේද? මේ කඳවුරු දෙකට හෝ ඒ දෙක විසින් එකිනෙකට පසමිතුරු ලෙස ඉදිරිපත් කරනු ලැබූ මතවාදයන්ට ලාංකීය දේශපාලනය තුළ තවදුරටත් පැවැත්මක් තිබේද?

සම්මුඛ සාකච්ඡාවට ලක්කරනු ලැබූ 50 දෙනාගෙන් තවදුරටත් මෙම කඳවුරු දෙකෙහි වෙනස අවධාරනය කළ පිරිස 10 ක් පමණ විය. ඒ සියලුදෙනා තවදුරටත් එජාපය කඳවුරට (නිශ්චිතව රනිල් වික්‍රමසිංහට) හෝ ශ්‍රීලපොපෙ ට තමන් සහය පළකරන බව ප්‍රකාශිතවම කියා සිටි අයවළුන් වූහ. ඔවුන් කඳවුරු දෙකෙහි වෙනස්කම සලකුණු කළ කාරණාවන් පැහැදිලිව ලෙසම ඉහත ඉදිරිපත්කොට ඇති කරුණු (එකී කඳවුරු විසින් ඉතිහාසය පුරා තමන්ව නිරූපණය කළ ආකාරය) හා සමගාමී විය.

එජාපයට පක්ෂව අදහස් දැක්වූ පිරිස එහි සුවිශේෂීත්වය බෙහෙවින්ම ආර්ථිකමය එකක් ලෙස හුවා දක්වන ලදී. අනුරාධපුර ප්‍රදේශයේ එජාප හිතවත් ගොවියකු කියා සිටියේ නිදහසින් පසු ඉතිහාසය පුරාම සිදුවූයේ එජාපය රජයක් විසින් ආර්ථිකයේ කිසියම් වර්ධනයක් අත්පත් කරගත් පසු ශ්‍රීලනිප කඳවුර ජාතිය හා ආගම

දඩමීමා කරගනිමින් බලයට පත්ව එකී ආර්ථික සංවර්ධනය ආපසු හැරවීමට කටයුතු කිරීම බවයි. ඔහුට අනුව ශ්‍රිලනිප පාලනයන් තුළ ජනතාව නැවත ආර්ථික වශයෙන් අසීරුවට පත්වූ විට ඔවුන් හැමවිටම නැවත එජාප රජයන් බලයට පත්කරවා ඇත. නමුත් ශ්‍රිලනිපය නැවත නැවතත් හැමවිටම සිය පැරණි උපාය මාර්ගයම යොදාගනිමින් බලය ලබාගන්නා බැවින් එජාපයට කිසිදු තිරසාර ආර්ථික දියුණුවක් කරා මේ රට ගෙන යා නොහැකිව තිබේ.[30]

වනාතමුල්ල ප්‍රදේශයේ එජාප යට හිතවත්ව කරුණු දැක්වූ කාන්තාවක් කියා සිටියේ එජාප පාලනය් තුළ ආර්ථික ප්‍රතිලාභ එජාප හා එජාප නොවන සියලු දෙනාට හිමිවන නමුත් ශ්‍රිලනිප පාලන කාලවල ආර්ථික ප්‍රතිලාභ හිමිවන්නේ ඔවුන්ගේ ආධාරකරුවන්ට පමණක් බවයි.[31] ඇයට අනුව ප්‍රතිපත්තිමය වශයෙන් එකම ආර්ථික දැක්මක සිටිය ද, එය ක්‍රියාත්මක කිරීමේදී එජාප හා ශ්‍රිලනිප අතර වෙනස තවදුරටත් පවතී.

මීට ප්‍රතිපක්ෂ අදහසක සිටි කුරුණෑගල ප්‍රදේශයේ අයකු කියා සිටියේ 2015-19 කාලයේ රනිල් වික්‍රමසිංහ අගමැතිව සිටි යහපාලන රජය ආර්ථිකය හැසිරවූ අදූරදර්ශී ආකාරය වර්තමාන ආර්ථික අර්බුදයට මඟ පෑදූ බවයි.[32] එජාප ය ආර්ථිකය හැසිරවූ ආකාරය සම්බන්ධයෙන් විවේචනාත්මක වූ තවදුරටත් ශ්‍රිලපොපෙ වෙත සහය දක්වමින් අදහස් දැක්වූ හම්බන්තොට සූරියවැව ප්‍රදේශයේ සුළු ව්‍යාපාරිකයෙක් කියා සිටියේ කිසිදු එජාප පාලනයක් තුළ සිය ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් පියවර නොගත් බවත්, ඔවුන් යටිතල පහසුකම් නිර්මාණය කළේ මහා පරිමාන ව්‍යාපාරිකයින්ට පහසුකම් සැලසීම වෙනුවෙන් පමණක් බවයි. ඊට වෙනස්ව සාමාන්‍ය ගැමියන්ට අවශ්‍ය මහාමාර්ග හා බෝක්කු පවා ඉදිකළේ ශ්‍රිලනිප කඳවුරේ ආණ්ඩු විසින් ඔහු කියා සිටියේය.[33]

කෙසේ නමුත් එජාප යට එරෙහිව ශ්‍රිලනිප (අද ශ්‍රිලපොපෙ) වෙත සහය දක්වන ජනයා ඉදිරිපත් කළ තර්කයන් වැඩි වශයෙන් පදනම්ව තිබුණේ ආර්ථිකමය නොවන කාරණා සම්බන්ධයෙනි. ඔවුන් කියා සිටියේ වර්තමාන එකතුව අරගලය හේතුවෙන් ඇතිවූ දේශපාලන අරාජිකත්වයට විසඳුමක් ලෙස තාවකාලිකව ගනු ලැබූ පියවරක් මිස එය දීර්ඝ කාලීනව සාර්ථක වන්නක් නොවන බවයි.

> "එජාප කියන්නෙ රනිල්ම නෙවෙයි. ඒ පිටිපස්සෙ අධිරාජ්‍ය ගැති බලවේගයක් තිබෙනවා. ඒක පංතියක් නියෝජනය කරනවා. පොහොට්ටුවට ඡන්දය දෙන්නෙ ගම්වල සාමාන්‍ය පංතියෙ අය. යූඑන්පී එක සපෝර්ට් කරන්නෙ මධ්‍යම හා ඉහල පාංතික අයට. පක්ෂ දෙක උඩින් එකතු වුනාට පහලින් ලොකු පෑහීමක් බලාපොරොත්තු වෙන්න බෑ. මේක පංති දෙකක්. ලොකු මිනිස්සුයි- පොඩි මිනිස්සුයි."[34]

දේශපාලන කඳවුරු අතර වෙනසක් පවතින බව තවදුරටත් අවධාරනය කරමින් එජාප විරෝධී කඳවුරක් සලකුණු කළ අය කියා සිටියේ මේ අවස්ථාවේ පවා ආර්ථිකය සම්බන්ධයෙන් රනිල් වික්‍රමසිංහ කිසියම් තාවකාලික පැලැස්තරයක් ඉදිරිපත් කළහැකි නමුත් එතැනින් ඔබ්බෙහි දීර්ඝ කාලය තුළ මේ කඳවුරු දෙකෙහි නොගැලපීම[35] ඉදිරියට එනු ඇති බවයි.

කෙසේ නමුත් සම්මුඛ සාකච්ඡාවට ලක්කළ පිරිසගෙන් 4/5 ක් පමණම කියා සිටියේ මෙම සාම්ප්‍රදායික දේශපාලන කඳවුරු අතර වෙනසක් පවතින බව තමන් තවදුරටත් විශ්වාස නොකරන බවයි. ආර්ථික ප්‍රතිපත්තිය අතින් කිසිදු වෙනසක් නැති බව ඒ සියලුදෙනා අවධාරනය කළ අතර ශ්‍රිලනිප කඳවුර පැත්තෙන් කියැවෙන දේශීයත්වය-ජාතිකත්වය-සිංහල-බෞද්ධ-ගැමිකම වෙනුවෙන් ශ්‍රිලනිප කඳවුරේ පෙනී සිටීමේ අවංකභාවය ඔවුහු සැක කළහ.

> "රනිල්ගෙ තියෙන්නෙ පරගැති චින්තනය. බුලත්විට නැත්තං චුයිංගම් කන්න කිව්ව, වැව් ගොඩකරල බිල්ඩින් ගහන්න කිව්ව, අනිත් පැත්තෙ නායකයො ඒක තමන්ගෙ වාසියට හරවගෙන අපි තමයි දේශීයත්ය රකින වීරයො, අපි තමයි දේශයෙ භාරකාරයො කියල ගේම ගැහුව. එහෙම බැලුවම ජේආර්ලා රනිල්ලා මිනිස්සුන්ව ඇන්දුවට වඩා විශාල රැවටීමක් රාජපක්ෂලා කළේ. යූඑන්පිය වැඩේ පේන්නම කරනව. මේ අය වෙන කතාවක් කියල හංගල ඒ ගේම ම ගහනව. ඒක එහෙම වුනේ යූඑන්පී එක මිනිස්සුන්ගෙ බඩට කථා කරද්දි මහින්දල මිනිස්සුන්ගෙ චින්තනයටනෙ කථා කළේ, දේශීයත්වය-බෞද්ධකම කියල මිනිස්සුන්ට ආමන්ත්‍රණය කළා."[36]

වඩාත් විවේචනාත්මක වූ සමහරුන් කියා සිටියේ කඳවුරු දෙක අතර වෙනස ඒවා නියෝජනය කරන පක්ෂවල නම් අතර වෙනස පමණක් බවයි.

> “දෙගොල්ලොම කරන්නෙ අපිට කෙලවල ඒගොල්ලන්ගෙ වැඩේ අරගෙන යන එක. එකම බස් එකේ ඩ්‍රයිවර් කාලෙන් කාලෙට මාරු වෙනව, එච්චරයි. බණ්ඩාරණායක යූඑන්පී එක කඩාගෙන ගියෙත් අපිට තියෙන ආදරේකට නෙවෙයිනෙ, ඩී.එස්. අගමැතිකම එයාට නොදී ඩඩ්ලිට දෙන්න ගියේ නිසානෙ”- මීගමුව ප්‍රදේශයේ අයෙක්.[37]

> “මේක කාඩ් සෙල්ලමක්. හැමකෙනාම ඇවිත් එකම බූරු කුට්ටම අනනනව. කවුරුත් ඕකට කොල එකතු කලෙත් නෑ, තියෙන කොල අයින් කෙරුවෙත් නෑ. අපි චිත්‍රපටිය බලනව වගේ බලං ඉන්නව”.[38]

මෙසේ බහුතරයක් කඳවුරු දෙක නියෝජනය කරන පක්ෂ අතර වෙනසක් නැති බව කියා සිටියත්, ශ්‍රීලනිප ය නියෝජනය කරන කඳවුරේ අදහස් සම්බන්ධයෙන් වැඩි පිරිසක් තවමත් සිය මනාපය පළකර සිටියහ. ඔවුන්ට අනුව ඒවා දේශපාලනයේදී වැදගත් කරුණු වේ. ඔවුන්ට ඇති ගැටලුව වන්නේ ශ්‍රීලනිප කඳවුර විසින් තවදුරටත් ඒවා නියෝජනය නොකරන බව ඔවුන්ට ඒත්තු යාමයි. උදාහරණයක් ලෙස එක් තරුණ කාන්තාවක් කියා සිටියේ තමන් ශ්‍රීලපොපෙ පිළිබඳ විශාල ප්‍රතිරූපයක් මවාගෙන සිටියේ ගෝඨාභය-මහින්ද බලයට පත්වූවොත් 'බෞද්ධකමට- සිංහල ජාතියට මුල්තැන දීල, මුස්ලිම් බලය අඩු කරයි' යන විශ්වාසයෙන් යුතුව බවයි. නමුත් එම රජයෙන් එවැන්නක් ඉටු නොවූ බවත් මැතිවරණ දිනවල සිය ෆේස් බුක් ප්‍රොෆයිල් පින්තූරවල 'සමන් දෙවි හාමුදුරුවන්' මෙන් ගෝඨාභයගේ පින්තූර පළකරගෙන සිටි තමන්ට වසරකට වරක් ඒවා නැවත උඩට එනවිට ලජ්ජා හිතෙන්නේ ඔවුන් තමන්ට වංචා කළේය යන හැඟීම ඇතිවන බැවිනැයි ඇය තවදුරටත් පැවසුවාය.[39]

තවත් එවැනිම ශ්‍රීලනිප කඳවුර සම්බන්ධයෙන් වූ විශ්වාසයක් වූයේ ගැමිකම පිළිබඳ අදහසයි.

> “මහින්ද මහත්තයට ඕන වුනා කොළඹ වගේම දියුණු කරල එයාගෙ උපන් ගම එයාගෙ මිනිස්සු ඉන්න තැන එයාගෙ ජීවිතය හා බැඳුනු තැන දියුණු කරන්න. ගමේ මිනිස්සුන්ට තියෙනව තමන්ගෙ කම කියල හැඟීමක්. කතාවට කියන්නෙ නගරෙ මිනිස්සුන්ගෙ තෙතමනය අඩුයි ගමේ මිනිස්සුන්ට උණු වෙනව කියල. ඒක ඇත්ත. දැන් පේන්නැද්ද රනිල්, මොන තෙතෙමනයක්ද?”[40]

බොහෝ දෙනෙකුගේ අදහස වූයේ මුලින් මහින්ද රාජපක්ෂ විසින් එම අදහස් නියෝජනය කළ නමුත් පසුව ඔහු පාර වරද්දාගත් බවයි. තවත් සමහරුන්ට අනුව එය සිදුවූයේ ගෝඨාභයටය. බොහෝ දෙනෙකු කියා සිටියේ ශ්‍රීලනිප කඳවුර පැත්තෙන් සාමාන්‍යයෙන් නැගෙන බටහිර කුමන්ත්‍රණ පිළිබඳ අදහස ද අසත්‍යයක් නොවන බවයි. ඔවුන්ට අනුව මෙවර සිදුව ඇත්තේ එකී කුමන්ත්‍රණයට ශ්‍රීලනිප කඳවුරද ගොදුරු වීමයි.

> “බටහිර රටවල් ගෝඨටයි-බැසිල්ටයි කියන්න ඇති උඹලගෙ අයියට මේ රටේ පිලිගැනීමක් තියෙනව, ඒක පාවිච්චිකරල උඹල බලයට ඇවිල්ල මේ රට විනාස කරල වරෙල්ල කියල.”[41]

ශ්‍රීලනිප කඳවුර සාම්ප්‍රදායිකව ඉදිරිපත් කරන මතවාදයන් තවදුරටත් නියෝජනය කිරීමට එම කඳවුරට නොහැකි බව බහුතරයකගේ මතය වුව ලාංකීය දේශපාලනය තුළ එකී අදහස් වලට බලයක් පවතින බව ජනතා අදහස් වලින් නිරූපණය විය. ඔවුන්ට අනුව ඒවා දරාගෙන සිටීමේ ශරීරයක් ලෙස මහින්ද රාජපක්ෂ-ඔහුගේ පවුල හෝ ඔහුගේ ශ්‍රීලපොපෙට තවදුරටත් සුජාත හැකියාවක් නොමැත. නමුත් ඒ අදහස් තවදුරටත් වලංගු ලෙස සැලකිය යුතු පිරිසක් පිළිගන්නා බැවින් ඒවායේ අවංක නියෝජනයක් ලෙස තමන්ව නිරූපනය කළහැකි අයකුට හෝ පක්ෂකට එකී අදහස් නියෝජනය කරමින් දේශපාලනය කිරීමේ විභවතාව අහෝසි වී ගොස් නොමැත. එනම් සාම්ප්‍රදායික දේශපාලන කඳවුරු නියෝජනය කළ පක්ෂවලට තවදුරටත් එම අදහස් නියෝජනය කිරීමට ඇති හැකියාව අවම වී ඇති නමුත් එකී අදහස්- විශේෂයෙන් ශ්‍රීලනිප කඳවුර විසින් දරා සිටි - තවදුරටත් ශ්‍රී ලාංකීය සමාජය තුළ සැලකිය යුතු බලයක් දරා සිටී.

> “තමන්ගෙකම ගමේකම රටට තියෙන ආදරේ මිනිස්සුන්ගෙ හදවතට කථාකරන්න පුලුවන්කම තියෙන-මෙයාට දෙයක් කරන්න පුලුවන් වෙයි කියල මිනිස්සුන්ට ඒත්තු ගන්නන්න පුලුවන් කෙනෙක් ආවොත් එයාට හැමෝටම වඩා චාන්ස් එක තියෙනවා. ඔය පක්ෂ 2 න්ම ඇවිත් හරියන්නෙ නෑ. එයා

ස්වාධීනව හරි වෙනමම පක්ෂෙකින් හරි එන්න ඕන. ඔය දෙක ගැනම කලකිරිල තියෙන්නෙ."[42]

## ජනතාව බලය අභ්‍යාස කිරීමට ඉදිරිපත් නොවූයේ ඇයි?

අපගේ අවධානය යොමුවූ දෙවන කරුණ වූයේ මහා රළ පහරක් සේ නැඟී ආ විරෝධතා ව්‍යාපාරය, රටේ ඇතිවූ කිසියම් ආකාරයක දේශපාලන අරාජිකත්වය පිළිබඳ හැඟීම සහ රනිල් වික්‍රමසිංහගේ බලය පත්වීම (සහ ඔහු අනුගමනය කළ මර්ධනකාරී ප්‍රවේශය ඉදිරියේ) සමඟ එක්වරම පසුබැස ගියේ ඇයිද යන්නයි. අපගේ සම්මුඛ සාකච්ඡාවලදී මෙම කාලය පිළිබඳ ආවර්ජනයක් යෙදෙමින් ඒ පිළිබඳ අදහස් දැක්වීමටත්, ඒ අනුව වර්තමාන මොහොත පිළිබඳ ඔවුන්ගේ අදහස් දැක්වීමටත් සහභාගිකරුවන් උනන්දු කරවන ලදී.

සම්මුඛ සාකච්ඡාවට ලක්කරන ලද 50 දෙනාගෙන් අරගලය සම්බන්ධයෙන් පැහැදිලිවම විරුද්ධ ආස්ථානයක සිටි සංඛ්‍යාව 5 කට අඩු විය. අතිබහුතරයක් දෙනා අරගලකරුවන්ගේ ක්‍රියාකාරීත්වය හැම අතින්ම සාධාරණ හා විශිෂ්ඨ ක්‍රියාවක් බව කියා සිටියහ. කිහිප දෙනෙක් අදාල කාලය තුළ ගාලු මුවදොර උද්ඝෝෂණ භූමිය වෙත එක් වරක් හෝ ඊට වැඩි වාර ගණනක් පැමිණ තිබූ අතර එක් අයකු සති ගණනක් තිස්සේ ක්‍රියාත්මක වූ ප්‍රාදේශීය උද්ඝෝෂණ භූමියක් වෙනුවෙන් අඛණ්ඩව සිය දායකත්වය දක්වා තිබින. නමුත් වර්තමාන මොහොතේ අරගලයේ කාර්යභාරය සම්බන්ධයෙන් පැවතියේ මිශ්‍ර ප්‍රතිචාරයන් ය.

එහිදී එජාප සහ විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහට පක්ෂපාතීව අදහස් දැක්වූ කිහිප දෙනා (මේ සියලු දෙනා පිරිමින් වූ අතර එයින් එක් අයෙකු අනුරාධපුරයේ සිට සිය පවුලේ සාමාජිකයින් සමඟ අරගල භූමිය වෙත පැමිණ එහි රැයක් පහන්කොට තිබින) කියා සිටියේ අරගලයට ආරම්භයේ සාධාරණ හේතු පැවැති නමුත් අවසානයේ එය දේශපාලන අතකොළුවක් බවට පත්වූ බවයි.[43] එමෙන්ම ඔවුන් දිගින් දිගටම කියා සිටියේ තරුණයින්ට විරෝධය දැක්විය හැකිමුත් එතැනින් එහාට රටේ ආර්ථික අර්බුදය විසඳීම, විදේශ සම්බන්ධතා වැඩිදියුණු කිරීම, රටට ඩොලර් ගෙන ඒම වැනි ආණ්ඩුකරණ වගකීම් සම්බන්ධයෙන් ඔවුන්ට කිසිදු දැනුමක් නොමැති බවත්, එහිදී රනිල් වික්‍රමසිංහ හා ඔහුගේ සමීපතමයින් හැර වෙනත් සුදුස්සෙකු මේ වන විට නොමැති බවත්ය.[44] ඇත්ත වශයෙන්ම ඔවුන් අරගලකරුවන් සම්බන්ධයෙන් සම්බන්ධයෙන් කිසියම් ද්වේශයකින් පසුවන බවක් පෙනී යන ලදී. ඔවුන් වැඩි දෙනෙකු කියා සිටියේ අරගලයේ පසු අවස්ථාවන් වන විට එයට දෙමළ ඩයස්පෝරාව, බටහිර රටවල්, රාජ්‍ය නොවන සංවිධාන යනාදිය ආධාර කළ බවත්, එය ඔවුන්ගේ න්‍යායපත්‍රයේ උගුලට හසුවූ බවත්ය.[45]

අරගලකරුවන්ට සහය නොදක්වමින් අදහස් දැක්වූ තවදුරටත් ශ්‍රීලපොපෙ ට සහය දක්වන කිහිප දෙනෙකුද සිටි නමුත් ඔවුන් කිසිවකු අරගල භූමිය වෙත පැමිණ තිබුණේ නැත. එක් කාන්තාවක් පමණක් මැයි 9 වන දින මහින්ද රාජපක්ෂට සහය පළකරමින් අරලියගහ මන්දිරයට ගොස් තිබූ අතර තමන් අරගලකරුවන්ට පහරදීමට ගාලු මුවදොර පිටිය වෙත ගිය කණ්ඩායමට එක් නොවූ බව පැවසුවාය. ඔවුන් රනිල් වික්‍රමසිංහට සහය දක්වමින් අදහස් දැක්වූ පිරිස තරම් ද්වේශසහගත ලෙස අරගලකරුවන් සම්බන්ධයෙන් අදහස් නොදැක්වූ නමුත් ජනතා නැගිටීමට සාධාරණ හේතු ඇති බව පිළිගත් ඔවුන් නමුත් එතැනින් එහාට ගිය ආණ්ඩුකරණයක් සම්බන්ධයෙන් මැදිහත්වීමේ පරිණතභාවයක් එයට නැතැයි කියා සිටියහ.[46] එමෙන්ම දෙමළ ඩයස්පෝරා, බටහිර කුමන්ත්‍රණ හා 'එන්ජීඕ මගඩි' වැනි දේට එය ගොදුරු වූ බව[47] අඩු වැඩි වශයෙන් ඔවුන්ගේ අදහස් තුළ ද අන්තර්ගත විය.

සම්මුඛ සාකච්ඡාවට ලක්කළ පිරිසගෙන් 4/5 ක් පමණම ප්‍රධාන දේශපාලන කඳවුරු දෙකම සම්බන්ධයෙන් විචේචනාත්මක වූ අතර ඔවුහු අරගලය සම්බන්ධයෙන් ප්‍රශංසා මුඛයෙන් කථා කළහ. මෙයින් අතිබහුතරයක් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා සම්බන්ධයෙන් බලවත් අප්‍රසාදයක් පළකළ නමුත් ඔහුගේ පාලනයට එරෙහිවීමට ඉක්මන් වැඩි යැයි පැවසූහ. ඊට හේතු වශයෙන් ඔවුන් දැක්වූ කරුණු තුළ අන්තර්ගත වූයේ විවිධත්වයෙන් යුතු සංකීර්ණ අදහස් සමුච්ඡනයකි. ඔවුන් බහුතරයක් අරගලයේ නායකත්වය ගත්තේ විශ්වවිද්‍යාල සිසුන් බව කියා සිටි නමුත් එහි ප්‍රධාන කොටස්කරුවකු වූ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලණ්ඩලය හෝ අවම වශයෙන් එහි පොදු ව්‍යවහාරයේ පවතින කෙටි නම වන 'අන්තරය' යන්න පිළිබඳව (කිහිප දෙනෙකු හැරෙන්නට) පවා අසා තිබුණේ නැත.

"විශ්ව විද්‍යාල ළමයි නේද අරගලයට මූලික වුනේ. ඒ ළමයි ඒක කළේ අපි වෙනුවෙන්. අපිට යන්න බැරිවුනා. ඒ වුනාට අපි දන්නව ඒ ළමයි ගියේ අපි හැමෝම වෙනුවෙන් කියල."[48]

අරගලයට දේශපාලන පක්ෂවල මැදිහත්වීම සම්බන්ධයෙන් ඔවුන් තුළ එතරම් ප්‍රසාදයක් නොවීය. එමෙන්ම ජනතා විමුක්ති පෙරමුණ, සරත් ෆොන්සේකා වැනි චරිත සහ සමගි ජන බලවේගයට සම්බන්ධ පිරිස්වල සහභාගීත්වය පිළිබඳ ඔවුන් වෙතින් සඳහන් වූයේ කලාතුරකිනි. (මීළඟ ඡන්දයකදී ජවිපෙ වෙත ඡන්දය දෙන බව සම්මුඛ සාකච්ඡාවට ලක්කළ පිරිසෙන් 12 දෙනෙකු ඍජුවම කියා සිටි අතර මේ මොහොතේ තම ගම්වල එම පක්ෂය සම්බන්ධයෙන් පෙර නොවූ සහයක් ලැබෙමින් පවතින බව ඔවුහු කියා සිටියහ). 'අපි කියන්නෙ 225 ම එපා කියල' වැඩි දෙනෙකුගේ අදහස විය.

පාර්ලිමේන්තුව නියෝජනය නොකරන පක්ෂ හා බලවේගවල මැදිහත්වීම පිළිබඳ ඔවුන්ට එතරම් අවබෝධයක් නොවීය (පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ නම කිහිප දෙනෙකු අතින් කියැවුනු අතර සාකච්ඡාවට ලක්කළ එක් තැනැත්තියක් පමණක් දිගින් දිගටම එම පක්ෂයට ඡන්දය දුන් අයකු විය). කෙසේ නමුත් ඔවුන්ට අනුව මෙය පොදුවේ මෙරට දේශපාලනය පිළිබඳ අතෘප්තියට පත්වූ විශ්වවිද්‍යාල සිසුන් ප්‍රමුඛ තරුණයින්ගේ නැඟී සිටීමකි. පැවැති තත්ත්වයට එරෙහිව රජයට ඍජුව විරෝධය පළකිරීමෙන් එහා ගිය ආණ්ඩුකරණයට මැදිහත්වීමක් අරගලකරුවන් වෙතින් අපේක්ෂා කළේ සුලුතරයකි. සංඛ්‍යාත්මකව එය තිදෙනෙකු විය (50 න්). සෙසු පිරිසගේ අදහස වූයේ එය විරෝධයෙන් එහා ගිය බැරෑරුම් කාර්යයක් වන අතර එයට වඩා අත්දැකීම් සහිත පළපුරුදු හා බුද්ධිමත් අය (අරගලකරුවන්ගේ අදහස් ද ලබාගෙන) අවශ්‍ය බවයි. රනිල් වික්‍රමසිංහට දේශපාලන නායකයෙකු ලෙස ඒ බහුතරයක් දෙනා අකමැත්ත පළකළ නමුත් එවැනි හැකියාවක් ඇත්තේ ඔහුට බව බහුතරයක් විශ්වාස කළහ.

> "රනිල් හය වතාවක් ද කොහොද අගමැතිකම කරල අන්තිමට එක ආසනයකින් අමාරුවෙන් ගේම ගහල පාර්ලිමේන්තුව ආවෙ. කවදහරි මොන විදිහකින් හරි මේ රටේ ජනාධිපති වෙනව කියල පුද්ගලික හීනයක් තියාගෙන කොහොමහරි ඒක සැබෑ කරගත්ත මිනිහෙක්. ඒ අතින් මිනිහ ආදර්ශමත් කෙනෙක් අපි අකමැති වුනාට. හැබැයි මේ වෙලාවෙ පිටරටවලින් ආධාර ගන්න, ජාත්‍යන්තරයට කථා කරන්න, පාර්ලිමේන්තුව බැලන්ස් කරගෙන මහ බැංකුව ගොඩදාගන්න පුලුවන් මිනිහට තමා".[49]

තවත් අයෙකුට අනුව පාර්ලිමේන්තුවේ 225 ම හොරු නමුත් මේ අවස්ථාවෙන් 'ගොඩයාම' සඳහා සහභාගි කරගත හැකි සෑම පක්ෂයකම සිටින එතරම් චෝදනාවන්ට ලක්ව නොමැති 20 ක වැනි සුලු පිරිසකගේ එකතුවෙන් කැබිනට් මණ්ඩලයක් පත්කරගෙන[50] ඉදිරියට යා යුතුවේ. තවත් කිහිප දෙනෙකුම කීවේ දේශපාලඥයින් වෙනුවට විද්වතුන් අවශ්‍ය බවයි. මේ බහුතරයක් 2019 දී ශ්‍රීලපොපෙ වෙත ඡන්දය දුන් බව ප්‍රකාශිතවම පැවසූයෙන් වියත්මග එවන් තේරීමක් නොවේද යන්න විමසා සිටි විට ඔවුන් කියා සිටියේ එහි සිටි උගතුන්ගෙන් තමන්ට අවශ්‍ය කාර්යය ඉටු නොවූ බැවින් මෙවර වඩා නිවැරදිව සිය කාර්යය ඉටු කරන උගතුන් පිරිසක් අවශ්‍ය බවයි.

> "අරගලයට සම්බන්ධවුනු විශ්වවිද්‍යාල ශිෂ්‍යයො පිටිපස්සෙත් විශ්වවිද්‍යාල ආචාර්යවරු වගේ උගත්, රට ගැන හැඟීමක් තියෙන අය ඉන්න ඇතිනෙ. ඒ අය ඉස්සරහට ආව නං හරි".[51]

සම්මුඛ සාකච්ඡාවන්ට ලක්කළ පිරිස බහුතරය පැවැති පාලනය (පාර්ලිමේන්තුවේ 225 ද ඇතුලත්ව) විවේචනය කිරීම සහ අරගලයේ සාධාරණත්වය පිළිබඳ ඉතා පහසුවෙන් අදහස් දැක්වූ නමුත් ඔවුන් වැඩි දෙනෙකු බෙහෙවින් නිහඬ වූයේ ඇතිවූ දේශපාලන රික්තකය තුළ අරගලයේ සහ ජනතාවගේ භූමිකාව කුමක්දැයි යන්න පිළිබඳ සාකච්ඡාවට ගැනීමේදීය. 'පාර්ලිමේන්තුව ඇතුලෙම මේක විසඳගන්න වෙනව, ඊට පස්සෙ ඡන්දයක් තියල ඉක්මනට අලුත් පාර්ලිමේන්තුවක් පත්කරගන්න ඕන'[52] වැඩි දෙනෙකුගේ අදහස විය. අලුතින් පවත්වන ඡන්දයකට ද පැරණි 225 ම තරඟ කර ජයගනු ඇතිද යන්න සම්බන්ධයෙන් ඔවුන්ගේ පිළිතුරු කලින් 225 සම්බන්ධයෙන් ඔවුන් පළකළ විරෝධය හා බොහෝ සෙයින් නොගැලපුනි.

> "ඔව් ඉතිං කොච්චර කලත් ඔයින් වැඩි දෙනෙක් ආයෙත් පාර්ලිමේන්තු එනව. එක අතකින් ඒ ඔක්කොම නැතිකරගෙනත් බෑ. කාලයක් බලයෙ හිටපු අයගෙ අත්දැකීමුත් අවශ්‍යයි. හොරකං කරන එක නවත්තන්න ක්‍රමයක් හැදුවනං හරි. මොකද මේ ආර්ථික අර්බුදයට රට ඇදල දැම්මෙ උන්නෙ. උන්ටම තමයි පුලුවන් මේක ගොඩදාන්න. උං හොරකං කරපු සල්ලි ටිකක් දැම්මත් ඇති."[53]

ආර්ථික අර්බුදයෙන් හා මේ දේශපාලන සංස්කෘතිය විසින් ඇතිකළ දේශපාලන අර්බුදයෙන් රට

ගොඩගැනීම පිළිබඳ සාකච්ඡාවේදී බොහෝදෙනා එක්වරම නැවත වතාවක් සාම්ප්‍රදායික නායකත්වය, සමාජයේ බුද්ධිමතුන් යනාදීන් වෙත යොමුවීමට යෝජනා කළා මිස මෙතෙක් තීරණාත්මක ලෙස විරෝධතාවයේ යෙදෙමින් පාලකයින් පලවාහැරි පොදු මහජනතාව කෙරෙහි යොමුවීමට යෝජනා කළේ නැත. ඔවුන්ට අනුව සාමාන්‍ය ජනයාට කළහැක්කේ රටේ ප්‍රශ්ණ විසඳීම නොව දේශපාලඥයින් ලවා කෙසේ හෝ ප්‍රශ්ණ විසඳාගෙන තම සාමාන්‍ය ජන ජීවිතය ගෙන යාමයි. එමනිසා විරෝධය ඔස්සේ ඔවුන් අපේක්ෂා කරන්නේ දේශපාලඥයින් ලවා සිය අසීරුතාවන්ට විසඳුමක් ලබා ගැනීම මිස තමන්ගේ මැදිහත්වීමෙන් රට ගොඩනැංවීම නොවේ. ජනතාව මැදිහත්වී සිදුකරන දේශපාලන ක්‍රියාවලියක් තුළ දීර්ඝ අරාජික කාලයන් බිහිවිය හැකිය. ඔවුන්ට සිය සාමාන්‍ය ජීවිතය ගෙනයාම සඳහා ඉක්මනින් 'ස්ථාවර' රටක් අවශ්‍ය ය.

> "අපිට දැං එල්ලෙන්න අත්තක් නෑ, දැං මොකක් හරි අත්තක එල්ලෙන්න ඕනෙනේ ගෝඨාභය ගියා, කවුරුහරි මේක අරගෙන කරන්න එපායැ. නැත්තං රටක් නැනේ. කවුරුවත් ගත්තෙ නැත්තෙ කරගන්න බැරි නිසානේ. මොකෙක් හරි ස්ථාවර කරනකංනෙ අපි බලාගෙන ඉන්නෙ. නැත්තං අපි ගිහින් රට හදන්නයැ. අපි රස්සාව කරගන්න ඕන."[54]

මේ සියල්ල තුල කියැවුන අදහසක් වූයේ විරෝධයෙන් එහා ගිය සක්‍රීය පුරවැසි මැදිහත්වීමකට ඇති සූදානමකට වඩා නැවත වතාවක් ස්ථාපිත දේශපාලන පක්ෂ හා අධිකාරිය ඔස්සේ ගැටලු විසඳා ගැනීමට ජනතාවගේ ඇති කැමැත්තයි. අනෙක් අතට එවැනි දීර්ඝ කාලීන මැදිහත්වීමක් තමන්ට කළ හැක්කක් නොවන බවත්, තමන්ට වඩා දැනුම් තේරුම්, අත්දැකීම් ඇති ස්ථරයකට පමණක් එය කළ හැකිය යන අදහස ඔවුන්ගේ ප්‍රතිචාර තුළ ගැබ්ව පැවතිනි ඔවුන්ට අනුව ආර්ථිකය ගොඩ ගැනීම, ස්ථාපිත ආයතන පවත්වාගෙන යාම, කොටින්ම රට පාලනය යනු පාරට බැස උද්ඝෝෂණය කරනවා මෙන් ලෙහෙසි පහසු ඕනෑම අයෙකුට කළහැකි දෙයක් නොවේ. බොහෝ දෙනෙකු මේ පිළිබඳ කථාකිරීමේදී එය වර නැගුවේ තමන්ගේ කාරකත්වයෙන් තොර එකක් ලෙසිනි. අනෙක් අතට රටේ සිදුවිය යුත්තේ කවර වෙනස්කම්දැයි හෝ අනාගතයේ දේශපාලන නායකත්වයෙන් බලාපොරොත්තු වන්නේ කුමක්දැයි යන්න විමසූ විට දැනට සිටින දේශපාලඥයින් විසින් දෙන පොරොන්දුවලට වඩා වැඩි දෙයක් ඔවුන් බහුතරයකට සිතාගැනීමට නොහැකි විය. ඔවුන් බහුතරයකගේ වචනය වූයේ 'හොඳක් තමයි වෙන්න ඕන' යන්නයි. තමන්ට අදාලව ඒ හොඳ කුමක්ද යන්න පිළිබඳ පැහැදිලි අදහසක් කීමට බොහෝ දෙනෙකු අසමත් වූහ.

> "අපි ඕවා කරන්න උගත් මිනිස්සු නෙවෙයි. රට මෙහෙම වුනේ කොහොමද කියල අපිට කියල දෙන්න කියල අපි කියන්නෙ. අපිට දැන් කියන්න පුලුවන් ඔබ තුමාට ඔන්න කාලයක් දුන්න, දැන් මොනවද මේ කරන්නෙ කියල."[55]

> "කවුද වැරදි කරන්නැත්තෙ. මිනිස්සු ට්‍රයි කලා හොඳ දෙයක් වෙයි කියල. නමුත් ඇත්තටම මොකක්ද වෙච්ච වෙනස කියල දැං හිතෙනව. අරගලයේ අය හරි අලුත් තරුණ පිරිසක් ඇවිත් මේකට උත්තර දෙනවනං අපි කැමතියි. දැන් ඒ අයටත් උත්තරයක් නෑ වගෙ. ඉන්න අය කොහොම හරි ඇදගෙන යනව. මේ කවුරුත් ගැන පැහැදීමක් නෑ. ඡන්දෙකදි මිනිස්සු වෙනසක් කරන්න ඉඩ තියෙනව, ඒත් කවුද ඉන්නෙ."[56]

ජනතාවගේ පසුබටවීම පිළිබඳ සම්මුඛ සාකච්ඡාවට ලක්කළ ප්‍රාදේශීය සභා සභිකයකු කීවේ මෙවැන්නකි.

> "අපේ මිනිස්සු සභාවක අතක් උස්සන්න මැලි වෙන ජාතියක්. ගමේ රැස්වීමක වාර්තාව සම්මත කරන්න අත උස්සන්න කිව්වම 100 ක් ඉන්න තැන දෙන්නෙක් අත උස්සයි. අපි එතකොට කියනව විරුද්ධ අය ඉන්නව නං අත උස්සන්න කියල. එකෙක් උස්සන්නෙ නෑ. එතකොට විරෝධයක් නැති නිසා සියල්ලන් කැමති ලෙස සලකා සම්මතයි කියනව. ඉතිං මෙහෙම වුන් දේශපාලනට මැදිහත් වෙයි ද? අඩුගානෙ පුරුදු පක්ෂෙන් පිට ඡන්දයක් දෙයිද?"[57]

# ප්‍රධාන දේශපාලන පක්ෂ විසින් මහජනතාව සමඟ පවත්වාගෙන යනු ලබන අනුග්‍රාහක සම්බන්ධතාවය

මෙය සම්මුඛ සාකච්ඡාවට දී ගවේෂණය කිරීමට මුලින් අපේක්ෂා කළ සාධකයක් ලෙස හඳුනාගෙන නොතිබූ නමුත් අරගලයෙන් පසු අනාගත දේශපාලනයේ දිශාව පිළිබඳ සාකච්ඡාවේදී දිගින් දිගටම ජනතාව වෙතින් ප්‍රකාශ වූ කරුණක් විය. එය විවිධාකාරයෙන් විවිධ අය අතින් ප්‍රකාශ විය.

මේ මොහොතේ වියවුල් අවිනිශ්චිත බව, මර්ධනය සහ 'රට අරාජිකවීම වැලැක්වීම' යනාදී විවිධ අය විසින් දක්වනු ලැබූ හේතු මත අරගලයෙන් ජනතාව බැහැර වුවද, ඉදිරි මැතිවරණයකදී ජනතාව ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකටම (රනිල්ගේ එජාපය සහ ශ්‍රිලපොපෙ සහ මහින්ද පවුල සමඟ දේශපාලනය කළ පිරිස) පාඩමක් උගන්වනු ඇති බව බහුතර පිරිසක් කියා සිටියහ (ඔවුන්ගේ තේරීම් ලෙස ජවිපෙ, අරගලයෙන් මතුවන පිරිසක්, කිසිවෙකුට ඡන්දය නොදෙන යනාදී වශයෙන් විවිධ විය). නමුත් මැතිවරණ ක්‍රියාවලියකදී ජනතාව හැසිරෙන ආකාරය පිළිබඳ ඔවුන් සමඟ සාකච්ඡා කිරීමේදී වැඩි දෙනෙක් කියා සිටියේ මේ වන විට ප්‍රධාන පක්ෂවල දේශපාලඥයින් (විශේෂයෙන් ශ්‍රිලපොපෙ සහ ශ්‍රිලනිප) බොහෝ දුරට ගම් මට්ටමින් ක්‍රියාත්මක නොවන බවත් ඔවුන්ට සිය සුපුරුදු දේශපාලනය කිරීමට ඉඩ ලැබුණොත් ජනතාව එසේ ස්වාධීනව කටයුතු නොකරනු ඇති බවත්ය.

> "දැන් පොහොට්ටුවෙ අයට ගමට එන්න බෑ. ආවොත් මිනිස්සු ගහල පන්නනව. රනිල් හරහා උන් උත්සාහ කරන්නෙ ආපහු ගමට ඇවිත් දේශපාලනය කරන්න පුලුවන් තත්ත්වයක් හදාගන්න. කාලයක් යනකොට ඒක පුලුවන් වෙයි. හැබැයි එහෙම වුනොත් තත්ත්වය වෙනස් වෙනව. සල්ලි බෙදන්නයි, බඩු බෙදන්නයි ගන්නව. හෙංචයියො දාගෙන කැන්වසිං යනව කිය ගම් පුරා ඇවිද ඇවිද පොඩි පොඩි රැස්වීම් තිය තිය මොනව හරි දෙනව, දෙන්නං කියල පොරොන්දු වෙනව. එහෙම වුනොත් මිනිස්සුත් ඉතිං පරණ පුරුදු විදිහට ඡන්දෙ දෙයි."[58]

බොහෝ දෙනෙකු කියා සිටියේ ප්‍රධාන දේශපාලන පක්ෂ බිම් මට්ටමින් ක්‍රියාත්මක වන සුවිශේෂී ආකාරයක් ඇති බවයි. එක් අයෙකු කියා සිටියේ මැති ඇමතිවරුන් මැතිවරණ ජයග්‍රහණයෙන් පසු වසර 4 1/2 ක් පුරාවට සිය බලය, තනතුරු හා දේශපාලන සබඳතා භාවිතා කරමින් මුදල් ඉපයීමෙහි යෙදෙන බවත් අවසන් මාස කිහිපය තුළ නැවත සිය මැතිවරණ බලප්‍රදේශ වෙත පැමිණ උපයාගත් සුවිශාල ධනයෙන් කොටසක් ජනතාව වෙත බෙදමින් ඊළඟ වසර 4 1/2 සඳහා ඡන්ද මිළදී ගන්නා බවත්ය.[59] තවත් අයෙකුට අනුව මෙසේ වියදම් කරන්නේද වැඩි වශයෙන් ඔවුන්ගේ පුද්ගලික ධනය නොව ඔවුන්ගේ තනතුරු නිසා ඔවුන්ට පාලනය කිරීමට ලැබෙන ජනතාවගෙ ම මුදල්ය.[60]

ඔවුන් 'සල්ලි හා බඩු බෙදනවා' යනුවෙන් මෙය හැඳින්වුවද එය එහිදී සිදුවන්නේ ජනතාව වෙත ආධාර කරමින් ඔවුන් ඡන්දය ලබදෙනු ඇතැයි අපේක්ෂා කිරීමක් නොවේ. ඊට එහාගිය සුපරීක්ෂාකාරී අධීක්ෂණ යාන්ත්‍රණයක් එහිදී ඔවුන් සතු වේ. ඒ ප්‍රාදේශීය දේශපාලනඥයින් සහ ඔවුන් හරහා ගොඩනැගී ඇති දේශපාලන හා ව්‍යාපාරික හිතවත්කම් ඇතුලත් ජාලයන්ය. බොහෝවිට එහි කේන්ද්‍රය වන්නේ පක්ෂ ශාඛා සමිති වේ. ප්‍රාදේශීය සභා දේශපාලඥයින් විසින් මේවා මෙහෙයවනු ලබන අතර සමාජයේ සක්‍රීය විවිධ චරිත මේවා හා බැඳී කටයුතු කරති ප්‍රදේශයේ මරණාධාර සමිති, තරුණ සමිති, සුභසාධක සමිති, සමෘද්ධි සමිති යනාදී වූ විවිධාකාර එකතුන් හි මේ අය සක්‍රීයව ක්‍රියා කරති. මෙම සමිති මැතිවරණ නොමැති කාලවලදී ද සමාජ සුභසාධන අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වේ. මේ කාලය තුළ දේශපාලඥයින් වෙතින් කිසියම් කාර්යයක් කරවා ගැනීමට අවශ්‍ය කෙනෙකුට ඔවුන් වෙත ළඟා වියහැක්කේ මෙම සක්‍රීය සමාජ ක්‍රියාකාරීන් හරහා ය. ප්‍රාදේශීය දේශපාලඥයින් හරහා ඔවුන්ට යම් යම් ප්‍රතිලාභ ද හිමිවේ (උදාහරණයක් ලෙස ප්‍රාදේශීය සභා සංවර්ධන කටයුතුවල ටෙන්ඩර් වැනි). සමහරෙකු එවන් ප්‍රතිලාභයක් නොමැතිව පවා කැපවීමෙන් කටයුතු කරන්නේ මෙම පක්ෂ ශාඛා සමිති හරහා තමන්ට දේශපාලඥයින් වෙත සමීපවීමේ බලයක් ලැබෙන බැවිනි. එය සමාජයේ කැපී පෙනෙන චරිතයක් බවට පත්වෙමින් සිට ප්‍රජාව තුළ සුවිශේෂී අනන්‍යතාවක් ගොඩනංවා ගැනීමට අවස්ථාවකි.

මැතිවරණ කාලයක් පැමිණි විට දේශපාලඥයින් විසින් මෙම චරිත සුවිශේෂී ආකාරයකින් සක්‍රීය කරවනු ලබයි. කුඩා කණ්ඩායම් රැස්වීම් පැවැත්වීම (පොකට්

මීටින්), කැන්වසින් යාම සහ පෝස්ටර් ඇලවීම වැනි දේ ඔවුන් හරහා සංවිධානය කරනු ලබන අතර සිය ප්‍රදේශයේ පවුල් පිළිබඳ මනා අවබෝධයක් ඇති මේ පිරිස් තම පක්ෂයට ස්ථිර ඡන්ද මොනවාද සහ තම පක්ෂයට හරවා ගතහැකි ඡන්ද කවරේද යන්න පිළිබඳ අවබෝධයක් පසුවෙති. එමෙන්ම එක් එක් ප්‍රදේශයේ අදාල ස්ථානයන් වෙත ලබාදිය යුතු පොදු පහසුකම් සහ ඒ සඳහා වන ජනතා ඉල්ලීම් මොනවාද යන්න පිළිබඳ අවබෝධයක් ඇත. ඒ අනුව තමන් විසින් සංවිධානය කරන රැස්වීම්වලදී එවා ඉටු කරන බවට දේශපාලඥයින් හරහා ප්‍රතිඥා ලබාදීමට හෝ ඒවා ලඟි ලඟියේ ඉටුකරදීමට ඔවුහු සමත් වෙති. ආධාර බෙදීමේ කාර්යයන් ද බොහෝවිට සිදුවන්නේ මෙම රැස්වීම්වලදීය. කිසියම් මාවතකින් සිය පක්ෂයට ලැබෙන ඡන්ද ගණන ආසන්න වශයෙන් කීමට තරම් අවබෝධයක් ඔවුන් සතුයි රජයේ සම්පත් යොදාගෙන සිදුකරන විවිධ ඉදිකිරීම් හා පොදු පහසුකම් සැලසීම් සඳහා නිතර මුල්ගල් තැබීමේ, විවෘත කිරීමේ උත්සව සංවිධානය වන්නේ මෙම සංවිධාන ජාලය යාවත්කාලීන කරමින් පවත්වා ගනිමිනි.

"ඡන්දයක් ළං වුනාම ක්‍රීඩා සමිතියේ රැස්වීමක් තියනවා. සමිතිය කරනවුන් කොල්ලො 150 ක් විතර එකතු කරගන්නවා. ඇමති ඇවිත් රැස්වීමෙදි ක්‍රීඩා සමිතියට රු. 50,000 ක් විතර දෙනවා. ඡන්දෙන් දින්නම වොලිබෝල් කෝට් එකක් හරි මොකක් හරි හදල දෙන්නං කියල පොරොන්දු වෙනවා. කොල්ලො ඉතිං කැන්වසිං යනව, පොස්ටර් ගහන්න යනව. ඒ කාලෙට ප්‍රාදේශීය සභා මන්ත්‍රීලව ළඟින් ආශ්‍රය කරන්න ලැබෙනව. නිකං බොන්න ලැබෙනව. ඡන්දෙන් පස්සේ රජයේ සුලු සුලූ රස්සා දෙනකොට මේ ටික දෙනෙකුට රස්සා දෙක තුනක් හරි ලැබෙනව. ඉතිං උන් කොහොමහරි තමන්ගෙ පවුල්වල ඡන්ද අරගෙන දෙනව."[61]

එමෙන්ම ඡන්ද සමයන්හි ප්‍රධාන පක්ෂවල දේශපාලඥයින්ගේ පක්ෂ කාර්යාල හා ප්‍රාදේශීය නිවාස විශාල වශයෙන් ජනතාව පැමිණෙන ඔවුන්ට විවිධ දේ ලබාදෙන ස්ථාන බවට පත්වේ. මිගමුව ප්‍රදේශයේ එක් අයෙකු පැවසුවේ මැතිවරණය ආසන්න මාසයක පමණ කාලයක එම ප්‍රදේශයේ ප්‍රකට ඇමතිවරයෙකුගේ නිවසේ දෛනිකව ජනතාව වෙත සංග්‍රහ, මුදල් හා වෙනත් විවිධ ආකාරයෙන් වියදම් කෙරෙන මුදල මිලියනයකට වැඩි බවයි.[62] මෙහිදී ද ජනතාව දේශපාලඥයා හා මුණ ගස්වන්නේ හා එකී ආධාර බෙදීම් හා සංග්‍රහ සංවිධානය කරන්නේ ප්‍රාදේශීය දේශපාලඥයින් හා ඔවුන් විසින් මෙහෙයවන පක්ෂ ශාඛා සමිති නිලධාරීන් හා කලින් ආකාරයේ ප්‍රදේශයේ සක්‍රීය චරිත විසිනි.

එමෙන්ම ඡන්ද කාලයේදී ලැබෙන ප්‍රතිලාභ දේශපාලඥයින් වෙතින් ලබාගෙන තමන් කැමති පක්ෂයකට ඡන්දය දීමේ හැකියාවක් ද ජනතාවට නොමැත. 'ඇමති ඡන්ද ඉල්ලුවට අපිට ඡන්දෙ දෙන්න වෙන්නෙ ගමේ සංවිධායකට, මොකද මිනිහ තමයි හැම කාලෙම අපි එක්ක ඉන්නෙ, මොනව හරි කරල දෙනව නං මිනිහට තමයි පුලුවං, අනික වෙන කෙනෙකුට ඡන්දෙ දීල ගමේ මිනිහගෙ මූණ බලන්නෙ කොහොමද' එක් කාන්තාවකගේ ප්‍රතිචාරය විය.[63]

"අපේ ගමේ මේ පාරෙ ඡන්ද යන්නෙ කාටද කියල මේ ගමේ සංවිධායකයට හොඳ අවබෝධයක් තියෙනව. මේ හැම ගෙදරක්ම මොන පක්ෂයට ද ඡන්දය දෙන්නෙ කියල එයාල දන්නව. කොටින්ම කැන්වසින් යනකොට තමන්ට ඡන්දය නොදෙන පක්ෂෙක කෙනෙකුගෙ ගෙදරටවත් එන්නෙ නෑ. ඒ ඒ ගෙවල්වල මිනිස්සු පරම්පරාවෙන්ම මොන පක්ෂෙද කියල හංවඩු ගැහිල ඉන්නෙ. තමන්ට වැඩක් කරගන්න නං තමන්ගෙ පක්ෂෙ බලයට පත්වෙනකං ඉන්න වෙනව. තමන්ගෙ පවුලෙ පක්ෂෙට පිටින් ඡන්දයක් දුන්නත් වැඩක් නෑ කවුරුවත් පිළිග න්නෙ නෑ. එහෙම කරන්නව නං ලැජ්ජාව අතඇරල ඡන්දෙ කාලෙට අනිත් පක්ෂෙට බැහැල එළිපිටම වැඩ කරන්න වෙනව. එතකොට කථා අහගන්නත් වෙනව, ලැජ්ජ වෙන්නත් වෙනව."[64]

තවත් අයෙකු කීවේ තමන්ගේ පාරේ ඡන්ද වෙනත් අයෙකුට වැටුනොත් ඔවුන් එය දැනගන්නා බවයි. 'කොහොමද මන්ද, උන් ඒක දැනගන්නව'[65] ඔහු කීය. ඔහුට අනුව එක් එක් නිවසේ ඡන්ද හැසිරෙන ආකාරය ප්‍රදේශයේ නියෝජිතයා දන්නා බැවින් හා ඡන්දපොලේදී ඔවුන් විසින් තමන්ට ලැබෙන ඡන්ද ගණන් තබාගන්නා බැවින් අඩුවන ඡන්ද කාගේද යන්න ඔවුන්ට අනුමාන කළහැකිය. කෙසේ නමුත් තමන් ප්‍රතිලාභ ලැබූ පක්ෂයෙන් එපිටට යාමට තරම් ධෛර්යයක් බොහෝ අයට නොමැත. එහිදී බිය, ලැජ්ජාව, කෘතගුණ සැලකීම යනාදී වූ බලපෑම් සහගත හැඟීම් සිය ඡන්ද දායකයා තුළ නිර්මාණය කිරීමට ප්‍රධාන පක්ෂ යාන්ත්‍රණ සමත්ව තිබේ.

සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ ජනතාවගෙන් වැඩි පිරිසක් කියා සිටියේ ප්‍රධාන පක්ෂවල ගම් මට්ටමේ ක්‍රියාකාරීත්වය මේ වන විට බොහෝ සෙයින් ඇණහිට ඇති බවයි. ඔහුට අනුව එය අරගලයේ ප්‍රතිඵලයකි.

"අපේ ගම්වල පක්ෂවලට කඩේ යන වුන් දැන් ගෙවල් වලට වෙලා ඉන්නවී සද්ද නෑ. නමුත් රනිල් ඇවිත් අරගලේ කට්ටිය හිර කරන්න කරන්න දැං දැං ඉඳල හිටල ටික ටික එළියට බහිනව. මේ විදිහට අවුරුද්දක් ගියොත් උන් ආයෙ රඟන්න ගනීවි."[66]

## සමාලෝචනය

අරගලය, සමස්තයක් ලෙස ගත්කළ මෙරට ජනසමාජයේ චින්තනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිකර ඇති බව අප විසින් පවත්වනු ලැබූ සම්මුඛ සාකච්ඡාවලදී අනාවරණය විය. තෝරාගත් ස්ථාන කිහිපයක සිදුකරන ලද අහඹු සම්මුඛ සාකච්ඡා 50 ක අදහස සමස්ත ජනසමාජයේ මතය ලෙස සාමාන්‍යකරණය කළ නොහැකි නමුත් එකී අදහස් වල අන්තර්ගත වූ පොදු ගතිකයන් හා අදහස් විසින් ලාංකීය සමාජය පක්ෂ දේශපාලනය සමඟ ගණුදෙන කරන අකාරය මෙන්ම මෙරට අනාගත දේශපාලන හැරවුම් සම්බන්ධයෙන් වඩා ගැඹුරින් සිතා බැලිය යුතු ප්‍රවණතා පිළිබඳ යම් තරමකට හෝ ඉඟි සපයන්නේ යැයි අපි විශ්වාස කරමු.

අපගේ අවධානය යොමුවූ පළමු කාරණය වූ මෙරට සාම්ප්‍රදායික දේශපාලන කඳවුරු දෙක හා බැඳුනු අදහස් සම්බන්ධයෙන් අවධානය යොමු කළහොත් ඉතා පැහැදිලිවම පෙනීගිය කරුණ වූයේ ජාතිකවාදය- අපේ කම- සදාචාරය- සංස්කෘතිය- බටහිර විරෝධය- ගැමිකම යනාදිය (පොදුවේ ශ්‍රිලනිප/ ශ්‍රිලපොපෙ කඳවුර විසින් නියෝජනය කළ) තවදුරටත් දේශපාලනයේ වැදගත් සාධක බව බොහෝ දෙනෙකු විශ්වාස කරන බවයි. එහිදී අපගේ නිරීක්ෂණය වූයේ එකී අදහස් පද්ධතිය නියෝජනය කිරීමේ හැකියාව මේ වන විට මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ ශ්‍රිලපොපෙ විසින් අහිමි කරගෙන ඇති බවයි. නමුත් එජාප/ රනිල් වික්‍රමසිංහ පාලනයකට එරෙහිව ජනතාවට ආමන්ත්‍රණය කළහැකි සටන් පාඨ ලෙස මෙම අදහස් පද්ධතිය තවදුරටත් පවතී. එහිදී එකී අදහස් දරාගත හැකි ශරීරය බවට පත්වනු ඇත්තේ කවුරුන්ද යන්න තවම නොපැහැදිලිය. කිසියම් පක්ෂයක් හෝ නායකත්වයක් එහි නියෝජිතයා තමන් බවට පත්කරවාගෙන එය බලය සඳහා වන උපායමාර්ගයක් බවට හරවාගැනීමේ ඉඩ ලාංකීය සමාජයළ තවදුරටත් පවතින බව අපගේ නිරීක්ෂණය යි.

අනෙක් අතට ප්‍රධාන කඳවුරු දෙකම සම්බන්ධයෙන් ජනතාවගේ බරපතල කලකිරීමක් පවතී. එවන් තත්ත්වයක් තුළ ජනතාව පෙරට වෙනස්ව සිය ඡන්දය භාවිතා කිරීමේ ඉඩක් පවතී. දැනටමත් සාම්ප්‍රදායික ප්‍රධාන පක්ෂ විවේචනය කරමින් ජවිපෙ වෙත ඇතිවී ඇති ආකර්ෂණය සම්මුඛ සාකච්ඡාවන්හිදී ද නිරූපණය විය. නමුත් එහිදී පෙනීගිය ප්‍රධාන කාරණය වූයේ සාම්ප්‍රදායික දේශපාලන පක්ෂවලින් වෙනස්ව මැතිවරණ දේශපාලනය තුළ ජනතාව කටයුතු කිරීම වලකාලන ප්‍රධාන සාධකය ස්ථාපිතව ඇති අනුග්‍රාහක දේශපාලනය බවයි. ප්‍රධාන පක්ෂවල බිම් මට්ටමේ දේශපාලන ක්‍රියාකාරීත්වය දුර්වලව ඇති මේ මොහොතේ එය දුබලව ඇති නමුත් කාලයත් සමඟ එය නැවත බලවත් වනු ඇති බව ජනතාවගේ අදහසයි. රනිල් වික්‍රමසිංහගේ පාලනය තුළ නැවත එය ශක්තිමත් වන බවට දැනටමත් නිරීක්ෂණය වෙමින් තිබේ. එය ධනය, රාජ්‍ය බලය, ජනතා ධනය හැසිරවීමේ හැකියාව, ප්‍රාදේශීය සබඳතා, ප්‍රාදේශීය ප්‍රභූත්වය යනාදිය සමඟ බැඳී ඇත්තකි. ඊට අභියෝග කිරීමෙන් තොරව සාම්ප්‍රදායික නොවන දේශපාලන බලවේගයකට මැතිවරණ දේශපාලනය තුළ බලවත් ජයග්‍රහණයක් අත්කර ගතහැකි යැයි සිතිය නොහැක.

මෑතකදී පවත්වන ලද දේශනයකදී නිර්මාල් රංජිත් දේවසිරි නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන 'ස්ථාවරත්වය' (පක්ෂ දෙකක් අතර සුමට ලෙස ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ හරහා බලය මාරුවෙන් මාරුවට හිමිවීම) කෙරෙහි බලපෑ සාධක ඉදිරිපත් කර සිටින ලදී. ඒ අතින් ප්‍රධාන සාධක කිහිපයක් ලෙස ඔහු ඉදිරිපත් කළේ දේශපාලන ක්‍රියාවලිය තුළ ප්‍රභූ ආධිපත්‍යය, දේශපාලන පක්ෂ පදනම් කරගත් සමතුලිත පද්ධතිය, ප්‍රධාන දේශපාලන පක්ෂ හා බැඳුනු දේශපාලන සාම්ප්‍රදායිකත්වය සහ මැතිවරණ දේශපාලනය තුළ පවත්නා නව-ප්‍රවේණිදාස සබඳතා ජාලයයි (දේවසිරි, 2022).

අපගේ සාකච්ඡාවලදී අනාවරනය වූ කරුණු අනුව පවත්නා සාම්ප්‍රදායික දේශපාලන පක්ෂවලින් පිටතට ඡන්දය ප්‍රකාශ කිරීම වලකන යාන්ත්‍රණය ලෙසටත්, දේශපාලනය තුළ සක්‍රීය පුරවැසි භූමිකාව වලකන සාධක ලෙසත් මෙම සාධක අඩු වැඩි වශයෙන් හමුවිනි. අරගලය යනු මෙම සාධක අභියෝගයට

ලක්කරනු ලැබූ ක්‍රියාවලියකි. නමුත් ජනතා අදහස් තුළ ප්‍රකාශවූයේ වර්තමානයේ නැවත සිදුවෙමින් පවත්නා ක්‍රියාවලිය තුළ එකී සාධක යළි බලවත් වෙමින් පවතින බවකි. මේ මොහොතේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකට විකල්පය ලෙස මැතිවරණ දේශපාලනය තුළ සාර්ථකත්වයක් අපේක්ෂා කරන පක්ෂ වෙත මේ මොහොතේ ඇති ප්‍රධාන අභියෝගය වන්නේ මෙයයි. හරිනි අමරසේකරට අනුව 2015 මැතිවරණයේදී ද ඉහල බලපොරොත්තු තබාගෙන සිටි ජනතා විමුක්ති පෙරමුණට (ජවිපෙ) ආසන 6 කින් සෑහීමට පත්වීමට සිදුවූයේ ජනතාව අපේක්ෂා කරන හා පුරුදුවී සිටින අනුග්‍රාහක දේශපාලන අපේක්ෂාවන් ජවිපෙ වෙතින් ඉටු නොවන බව ඔවුන්ට වැටහී ගිය බැවිනි (අමරසූරිය 2021, 1-22). ඇයට අනුව අනුග්‍රාහක-සේවාදායක සම්බන්ධය (*patron-client relationship*) ලංකා දේශපාලනය තුළ අතිශය තීරණාත්මකය.

> "සමාජ ආරක්ෂණය සහ සුභසාධක පියවර වේගයෙන් අහෝසි වී යමින් පවත්නා තත්ත්වයක් තුළ සම්පත් වෙත ප්‍රවේශය ලබාගනු පිණිස ප්‍රභූ සම්බන්ධකම් පැවතීම කවරදාකටත් වඩා වැදගත් දෙයක් බවට පත්ව ඇත. සීමිත වී ඇති රජයේ රැකියාවක් ලබාගැනීම, ප්‍රසිද්ධ පාසලකට දරුවකු ඇතුලත් කරගැනීම, රජයේ රෝහලක පෝලිම පැන ප්‍රතිකාර ලබා ගැනීම, අත්‍යාවශ්‍ය බලපත්‍රයක් ලබාගැනීම හෝ සරළවම නීතිය නවා ගැනීමේ හැකියාව තීරණය වන්නේ වැදගත් සම්බන්ධතා හදාග ැනීම තුළිනි." (අමරසූරිය 2021, 13)

අරගලය හේතුකොටගෙන ප්‍රධාන දේශපාලන පක්ෂ විසින් නඩත්තු කරන අනුග්‍රාහක-සේවාදායක සම්බන්ධතා ජාලය දුර්වල වී ගිය නමුත් මේ වන විට එය නැවත ස්ථාපිත වෙමින් පවතින බව ජනතාවගේ හැඟීමයි. මේ මේ අනුව මෙවර ද ප්‍රධාන දේශපාලන පක්ෂවලට අභියෝග කරන කවර දේශපාලන ව්‍යාපාරයකට වුව මෙරට දේශපාලනයේ අනුග්‍රාහක-සේවාදායක සම්බන්ධය ජයගනීමේ අභියෝගයට මුහුණ දීමට සිදුවේ.

පැවැති පාලනය අභියෝගයට ලක්කරමින් ප්‍රවාහයක් ලෙස නැඟී ආ අරගලය කැබිනට් මණ්ඩලය ඉල්ලා අස්වීමෙන් ඇරඹී ගෝඨාභ රාජපක්ෂගේ ධූරය හැරයාමෙන් උච්ඡස්ථානයට පත්වූ දේශපාලන අරාජිකත්වය පිළිබඳ හැඟීමත් සමඟ කිසියම් ආකාරයට දියාරු වී ගොස් තිබේ. නොඑසේනම් එහි තීව්‍රතාව අඩුවී තිබේ. පැවැති පාලනයට එරෙහි වූ නමුත් අලුතින් ඇතිවිය යුතු දේශපාලන සැකස්මක් වෙත මැදිහත්වීමේ සූදානමක් ජනතාව වෙත නොපෙනේ. ඔවුන් ඊට තමන් සුදුසු යැයි නොසිතන්නේ ඊට අවශ්‍ය පරිණතබව, දැනුම, හැකියාව ඇත්තේ තමන්ට වඩා උගත්, බලවත, දේශපාලනය ගැන දන්නා අයට යැයි ඔවුන් විශ්වාස කරන බැවිනි. එහිදී කෙතරම් විවේචනයට ලක්කළත් ඔවුන් තවමත් විශ්වාස කරන්නේ සාම්ප්‍රදායික දේශපාලන නායකයින් කෙරෙහියි රාජ්‍ය, ආර්ථිකය, මහ බැංකුව, විදේශ සබඳතා යනාදිය සම්බන්ධයෙන් තීරණ ගතහැක්කේ හා අදාල ආයතන පද්ධතිය සමඟ ගණුදෙනු කළහැක්කේ ඔවුන්ට බව බොහෝ දෙනාගේ විශ්වාසය යි. මේ වූ කලී දේශපාලනය යනු ප්‍රභූන්ගේ රාජකාරියක් ලෙස දකින දැක්මේ ප්‍රකාශමානවීමකි. විරෝධය දැක්වීමෙන් එහාට ගිය බලය සමඟ ගණුදෙනු කිරීම හා ඊට මැදිහත්වීම (මැතිවරණවලදී ඡන්දය දීම හැර) සම්බන්ධයෙන් ජනයාගේ සූදානම අවමය. මෙම ප්‍රභූ ගැති චින්තනයට අභියෝග කළහැක්කේ පහල මට්ටමේ සිට දේශපාලන ආයතන සමඟ සක්‍රීයව ගණුදෙනු කරමින් බලය අභ්‍යාස කරන සක්‍රීය පුරවැසියකු නිර්මාණය කිරීමෙනි. පාර්ලිමේන්තු දේශපාලනයෙන් ඔබ්බට දේශපාලන බලය අභ්‍යාසය කරන ජනතාවක් නිර්මාණය කරන සක්‍රීය පුරවැසි දේශපාලනයක් වෙනුවෙන් ජනතාව ආමන්ත්‍රණය කරන පාර්ශ්වයන්ට ඇති සැබෑ අභියෝගය වන්නේ මෙයයි. මෙය විවිධ තලවල විවිධ ආකාරයෙන් මැදිහත්වෙමින් අභ්‍යාස කළයුතු සංකීර්ණ නව්‍ය දේශපාලන ප්‍රවේශයක් හෙවත් ලොක්කන්ගේ දේශපාලනය සොක්කන් අතට ගන්නා අභියෝගාත්මක හා දර්ඝ කාලීන ක්‍රියාවලියකි.

## පසු සටහන්

[1] ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ ඔහුගේ පාලනයට එරෙහි උද්ඝෝෂණ ක්‍රමයෙන් වර්ධනය වී 2022 අප්‍රේල් 09 වන දින සිට ගාලුමුදදොර පිටියේ අඛණ්ඩ උද්ඝෝෂණ ව්‍යාපාරයක් බවට පත්විය. එකී උද්ඝෝෂණ භූමිය ඔවුන් විසින් 'ගෝඨාගෝගම' ලෙස නම් කරන ලදී. එතැන් සිට මෙම උද්ඝෝෂණ ව්‍යාපාරයට පොදු ව්‍යවහාරයේ මෙන්ම උද්ඝෝෂකයින් විසින් ද 'අරගලය' යන නම භාවිතා කරනු ලැබූ අතර උද්ඝෝෂකයින් හැඳින්වීමට අරගලකරුවන් යන යෙදුම පොදුවේ භාවිතා විය. දිනෙන් දින තීව්‍ර වෙමින් මාස තුනක පමණ කාලයක් අරගල භූමිය ක්‍රියාත්මක වූ අතර එය අනුකරණය කරමින් දිවයිනේ විවිධ ප්‍රදේශවල මෙබඳු උද්ඝෝෂණ ව්‍යාපාර ('ගෝඨාගෝගම්' හෙවත් අරගල භූමීන්) මීට අඩු තීව්‍රතාවයකින් යුතුව ඇරඹිනි. මෙහි 'අරගලය' යනුවෙන් හඳුන්වනු ලබන්නේ මෙකී සමස්ත විරෝධතා ක්‍රියාදාමය වන අතර විරෝධතාකරුවන් හැඳින්වීමට මෙහිදී උද්ඝෝෂකයින් යන යොදුම මෙන්ම පොදු ව්‍යවහාරයේ පවතින අරගලකරුවන් යන යෙදුමද යොදාගනු ලබයි.

[2] ක්ෂේත්‍රයේ සම්මුඛ සාකච්ඡා සංවිධානය කිරීම සඳහා එම්. කේ. ජයතිස්ස, අතුල දිසානායක, රන්ජන් ප්‍රනාන්දු, ප්‍රදීපා සුදර්ශනී, රසිකා බාලසූරිය, අජිත්, ලහිරු මදුෂංක විසින් ලබාදුන් සහයට කතුවරුන්ගේ විශේෂ ස්තුතිය හිමිවේ. එමෙන්ම මෙම රචනය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරමින් එය සංවර්ධනය කිරීමට උපකාර කළ නීතිය හා සමාජ භාරයේ විධායක අධ්‍යක්ෂිකා ආචාර්ය සකුන්තලා කදිර්ගාමර් සහ නීතිය හා සමාජ භාරයේ වැඩසටහන් හා මෙහෙයුම් අධ්‍යක්ෂක සඳුන් තුඩුගල වෙත ද පර්යේෂකයින්ගේ ස්තුතිය හිමිවේ.

[3] මෙරට පශ්චාත් නිදහස් දේශපාලන ඉතිහාසය පුරා එජාපය මහ ශ්‍රීලනිප එකිනෙකට ප්‍රතිපක්ෂ කඳවුරු දෙකක් ලෙස පැවත තිබේ. නමුත් 2015 දී ශ්‍රීලනිප ප්‍රධාන ලේකම් වූ මෛත්‍රීපාල සිරිසේන එපාප මූලික සන්ධානයේ ජනාධිපති අපේක්ෂක ලෙස ඉදිරිපත් විය. අනතුරුව ශ්‍රීලනිප බහුතරයක් විසින් මහින්ද රාජපක්ෂගේ නායකත්වයෙන් යුතු ශ්‍රීලපොපෙ පිහිටුවාගනු ලැබූ අතර එය එජාපයේ ප්‍රධාන විරුද්ධවාදයා බවට පත්විය. ශ්‍රීලිනිප ආධාරකරුවන් බහුතරයකගේ සහය ශ්‍රීලපොපෙ වෙත හිමිවූ අතර එම පක්ෂය තමන්ව නිරූපනය කරනු ලැබූයේ ශ්‍රීලනිප උරුමය ඉදිරියට ගෙන යන බලවේගය ලෙසය.

[4] https://elections.gov.lk/web/wp-content/uploads/election-results/presidential-elections/pre2019/PRE_2019_All_Island_Result.pdf

[5] 1994 දී චන්ද්‍රිකා බණ්ඩාරණායක ප්‍රතිශතාත්මකව මීට වඩා විශාල ඡන්ද ප්‍රතිශතයක් (64%) ලබාගත් නමුත් මෙය ශ්‍රී ලංකා මැතිවරණ ඉතිහාමයේ අපේක්ෂකයෙකු ලබාගත් සංඛ්‍යාත්මකව වැඩිම ඡන්ද සංඛ්‍යාව විය (ප්‍රතිශතාත්මකව 52.25%) විය.

[6] ගෝඨාභය රාජපක්ෂ සිය දිවුරුම් දීමෙන් පසු සිදුකළ පළමු ජාතිය ඇමතීමේදී මෙන්ම නිදහස් දින වැනි වැදගත් අවස්ථාවල සිදුකළ ජාතිය ඇමතීම්වලදී ද තමන්ගේ සිංහල බෞද්ධ ජන පදනම පිළිබඳ මෙන්ම තමන් සිංහල බෞද්ධ නායකයෙකු බවද නිරන්තරයෙන් සඳහන් කරන ලදී. https://timesofindia.indiatimes.com/world/south-asia/i-am-the-leader-that-you-searched-for-prez-gotabaya-rajapaksa-tell-lankans-on-independence-day/articleshow/80688206.cms

[7] ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ ඔහුගේ පාලනයට එරෙහි උද්ඝෝෂණ ක්‍රමයෙන් වර්ධනය වී 2022 අප්‍රේල් 09 වන දින සිට ගාලුමුදදොර පිටියේ අඛණ්ඩ උද්ඝෝෂණ ව්‍යාපාරයක් බවට පත්විය. එකී උද්ඝෝෂණ භූමිය ඔවුන් විසින් 'ගෝඨාගෝගම' ලෙස නම් කරන ලදී. එතැන් සිට මෙම උද්ඝෝෂණ ව්‍යාපාරයට පොදු ව්‍යවහාරයේ මෙන්ම උද්ඝෝෂකයින් විසින්ද 'අරගලය' යන නම භාවිතා කරනු ලැබූ අතර උද්ඝෝෂකයින් හැඳින්වීමට අරගලකරුවන් යන යෙදුම පොදුවේ භාවිතා විය. දිනෙන් දින තීව්‍ර වෙමින් මාස තුනක පමණ කාලයක් අරගල භූමිය ක්‍රියාත්මක වූ අතර එය අනුකරණය කරමින් දිවයිනේ විවිධ ප්‍රදේශවල මෙබඳු උද්ඝෝෂණ ව්‍යාපාර ('ගෝඨාගෝගම්' හෙවත් අරගල භූමීන්) මීට අඩු තීව්‍රතාවයකින් යුතුව ඇරඹින. මෙහි 'අරගලය' යනුවෙන් හඳුන්වනු ලබන්නේ මෙකී සමස්ථ විරෝධතා ක්‍රියාදාමය වන අතර විරෝධතාකරුවන් හැඳින්වීමට මෙහිදී උද්ඝෝෂකයින් යන යොදුම මෙන්ම පොදු ව්‍යවහාරයේ පවතින අරගලකරුවන් යන යෙදුමද යොදාගනු ලබයි.

[8] උතුරේ සන්නද්ධ අරගලය පැවැති රජය පෙරලා දමා ආණ්ඩු බලය ලබාගැනීමේ උත්සාහයක් නොව ශ්‍රී ලංකා රාජ්‍යයට එරෙහිව නව රාජ්‍යයක් බිහිකරලීම සඳහා වූ අරගලයක් විය.

[9] අවස්ථා දෙකකදී හැරුනුවිට මාස ගණනක් පුරා දික්ගැසුනු මෙම උද්ඝෝෂණ ව්‍යාපාරයට ප්‍රචණ්ඩකාරීව හැසිරුනේය යන චෝදනාව (වර්තමාන ජනාධිපතිවරයා සහ ඔහුගේ රජය විසින් නිරන්තරයෙන් චෝදනා කරන ලෙස) එල්ල කළ නොහැකියි එහි පළමු සිදුවීම 2022 මාර්තු 31 වන දින ගෝඨාභය රාජපක්ෂගේ පුද්ගලික නිවස සමීපයේ සිදුකළ උද්ඝෝෂණයකදී බස් රථයක් ගිනි තැබීමේ සිදුවීමක් වන අතර එය උපක්‍රමික ලෙස රජයට පක්ෂපාතී පිරිස් විසින්ම සිදුකරන ලද්දක් බවටද චෝදනා එල්ල විය. දෙවන සිදුවීම වන්නේ 2022 මැයි 9 වන දින අරලියගහ මන්දිරයේ සිට පැමිණි සමහර ශ්‍රීලපොපෙ මන්ත්‍රීවරුන් විසින් පොළඹවන ලද මැර කණ්ඩායම් විසින් ගාලුමුවදොර අරගල භූමියේ සිටි පිරිස් වෙත පහර දීමෙන් පසු එකී ප්‍රහරයට පැමිණි පිරිස් වෙත ජනතාව විසින් පහරදීම සහ එදින සහ පසුදින තුළ දිවයිනේ විවිධ ප්‍රදේශවල රාජපක්ෂ පවුලේ සහ ශ්‍රීලපොපෙ මන්ත්‍රීවරුන්ගේ නිවාස ඇතුලු දේපලට සිදුකරන ලද පහරදීම් සහ ගිනි තැබීමය. නමුත් එම දින දෙකින් පසුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ධූරයෙන් පලවා හරිනු ලැබූ 2022 ජූලි 9 දින දක්වා සහ ඉන් අනතුරුව අත්පත් කරගත් රාජ්‍ය දේපල නැවත භාරදී උද්ඝෝෂකයින් ඉවත් වන දින තෙක් කිසිදු අවස්ථාවක සැලකිය යුතු මට්ටමක කිසිදු ප්‍රචණ්ඩකාරී සිදුවීමක් සිදුනොවුනි.

[10] https://elections.gov.lk/web/wp-content/uploads/election-results/presidential-elections/pre2019/PRE_2019_Hambantota_Final%20District%20Result.pdf

[11] https://elections.gov.lk/web/wp-content/uploads/election-results/parliamentary-elections/HambantotaV2.pdf

[12] https://elections.gov.lk/web/wp-content/uploads/election-results/parliamentary-elections/KurunegalaV2.pdf

[13] https://elections.gov.lk/web/wp-content/uploads/election-results/presidential-elections/pre2019/PRE_2019_Kurunegala_Final%20District%20Result.pdf

[14] https://www.newsfirst.lk/2019/10/09/slpp-presidential-candidate-gotabaya-rajapaksas-inaugural-rally-at-anuradhapura/

[15] https://foreignpolicy.com/2019/11/19/sri-lanka-new-strongman-president-gotabaya-rajapaksa-election/

[16] https://elections.gov.lk/web/wp-content/uploads/election-results/presidential-elections/pre2019/PRE_2019_Anuradhapura_Final%20District%20Result.pdf

[17] https://elections.gov.lk/web/wp-content/uploads/election-results/parliamentary-elections/Anuradhapura_V2.pdf

[18] https://elections.gov.lk/web/wp-content/uploads/election-results/presidential-elections/pre2019/PRE_2019_Polonnaruwa_Final%20District%20Result.pdf

[19] https://elections.gov.lk/web/wp-content/uploads/election-results/parliamentary-elections/Polonnaruwa_V2.pdf

[20] https://elections.gov.lk/web/wp-content/uploads/election-results/presidential-elections/pre2019/PRE_2019_Gampaha_Final%20District%20Result.pdf

[21] https://elections.gov.lk/web/wp-content/uploads/election-results/parliamentary-elections/Gampaha_Negombo.pdf

[22] 1994 වසරේ සිට රනිල් වික්‍රමසිංහ මැතිවරණවලට තරග කොට ඇත්තේ මැද කොළඹ ආසනයෙනි.

[23] https://elections.gov.lk/web/wp-content/uploads/election-results/presidential-elections/pre2019/PRE_2019_Colombo_Final%20District%20Result.pdf

[24] එම.

[25] https://elections.gov.lk/web/wp-content/uploads/election-results/parliamentary-elections/Colombo_ColCentral.pdf

[26] https://elections.gov.lk/web/wp-content/uploads/election-results/parliamentary-elections/Colombo_Borella.pdf

[27] 1970, 1994, 2001, 2005, 2019 එම පක්ෂයේ මැතිවරණ ප්‍රකාශ සහ අපේක්ෂකයින් විසින් ප්‍රකාශයට පත්කරනු ලැබූ අත්පත්‍රිකා තුළ මෙම අදහස් අන්තර්ග විය.

[28] United National Party, http://www.unp.lk/about_party.html (accessed on November 8, 2022).

[29] මේ වන විට මෛත්‍රීපාල සිරිසේනගේ නායකත්වයෙන් යුතු ශ්‍රිලනිපය දුර්වලව සිටි අතර එම මතවාදය හා ජන පදනම තමන් සතුකර ගැනීමට හිටපු ශ්‍රිලනිප නායක මහින්ද රාජපක්ෂ හා ඔහුගේ පවුලේ අය විසින් මෙහෙයවනු ලැබූ නව පක්ෂයක් වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සමත්ව තිබිනි. ශ්‍රීලනිප සමග සිටි සියලුම පක්ෂ පාහේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හා එක්වූ අතර 2020 මහමැතිවරණය වන විට දුර්වලව සිටි ශ්‍රීලනිප ද එම කඳවුර හා එක්විය.

[30] එප්පාවල ප්‍රදේශයේ ගොවියෙක්, 2022 අගෝස්තු 16 සම්මුඛ සාකච්ඡාව.

[31] වනාතමුල්ල ප්‍රදේශයේ ගෘහණියක්, 2022 සැප්තැම්බර් 3 සම්මුඛ සාකච්ඡාව.

[32] කුරුණෑගල ප්‍රදේශයේ රජයේ සේවකයෙක්, 2022 අගෝස්තු 2 සම්මුඛ සාකච්ඡාව.

[33] සූරියවැව ප්‍රදේශයේ සුළු ව්‍යාපාරිකයෙක්, 2022 අගෝස්තු 9 සම්මුඛ සාකච්ඡාව.

[34] කුරුණෑගල ප්‍රදේශායේ විශ්‍රාමික විදුහල්පතිවරයෙක්, 2022 අගෝස්තු 3 සම්මුඛ සාකච්ඡාව.

[35] මීගමුව මුන්නක්කරය ප්‍රදේශයේ කාන්තාවක්, 2022 අගෝස්තු 26 සම්මුඛ සාකච්ඡාව.

[36] සූරියවැව ප්‍රදේශයේ අයෙක්, 2022 අගෝස්තු 10 සම්මුඛ සාකච්ඡාව.

[37] මීගමුව ප්‍රදේශයේ ධීවර කාර්මිකයෙක්□ 2022 අගෝස්තු 25 සම්මුඛ සාකච්ඡාව.

[38] හම්බන්තොට ප්‍රදේශයේ අයෙක්, 2022 අගෝස්තු 9 සම්මුඛ සාකච්ඡාව.

[39] කොළඹ ප්‍රදේශයේ කාන්තාවක්, 2022 සැප්තැම්බර් 18 සම්මුඛ සාකච්ඡාව.

[40] සහස්පුර ප්‍රදේශයේ කාන්තාවක්, 2022 සැප්තැම්බර් 3 සම්මුඛ සාකච්ඡාව.

[41] අනුරාධපුර ප්‍රදේශයේ ගොවියෙක්, 2022 2022 අගෝස්තු 18 සම්මුඛ සාකච්ඡාව.

[42] මීගමුව ප්‍රදේශයේ කාන්තාවක්, 2022 අගෝස්තු 22 සම්මුඛ සාකච්ඡාව.

[43] අනුරාධපුර ප්‍රදේශයේ විශ්‍රාමික හමුදා නිලධාරියෙක්, 2022 අගෝස්තු 16 සම්මුඛ සාකච්ඡාව.

[44] එප්පාවල ප්‍රදේශයේ ගොවි නායකයෙක්, 2022 අගෝස්තු 17 සම්මුඛ සාකච්ඡාව.

[45] මීගමුව ප්‍රදේශයේ බෝට්ටු නිපදවන්නෙක්, 2022 අගෝස්තු 25 දින සම්මුඛ සාකච්ඡාව.

[46] හම්බන්තොට ප්‍රදේශයේ ගොවියෙක්, 2022 අගෝස්තු 9 සම්මුඛ සාකච්ඡාව.

[47] පොලොන්නරුව ප්‍රදේශයේ කාන්තාවක්, 2022 සැප්තැම්බර් 6 දින සම්මුඛ සාකච්ඡාව.

[48] මීගමුව ප්‍රදේශයේ ස්වයං රැකියාවක නියුතු කාන්තාවක්, 2022 අගෝස්තු 25 සම්මුඛ සාකච්ඡාව.

[49] සහස්පුර ප්‍රදේශයේ තරුණයෙක්, 2022 සැප්තැම්බර් 18 සම්මුඛ සාකච්ඡාව.

[50] කුරුණෑගල ප්‍රදේශයේ කාන්තාවක්, 2022 අගෝස්තු 4 සම්මුඛ සාකච්ඡාව.

[51] හිඟුරක්ගොඩ ප්‍රදේශයේ කාන්තාවක්, 2022 සැප්තැම්බර් 6 සම්මුඛ සාකච්ඡාව.

[52] හම්බන්තොට ප්‍රදේශයේ ගොවියෙක්, 2022 අගෝස්තු 8 සම්මුඛ සාකච්ඡාව.

[53] බොරැල්ල ප්‍රදේශයේ අයෙක්, 2022 සැප්තැම්බර් 18 සම්මුඛ සාකච්ඡාව).

[54] අනුරාධපුර ප්‍රදේශයේ අයෙක්, 2022 අගෝස්තු 16 සම්මුඛ සාකච්ඡාව).

[55] මීගමුව ප්‍රදේශයේ කාන්තාවක්, 2022 අගෝස්තු 26 සම්මුඛ සාකච්ඡාව.

[56] වනාතමුල්ල ප්‍රදේශයේ තරුණියක්, 2022 සැප්තැම්බර් සම්මුඛ සාකච්ඡාව.

[57] මීගමුව ප්‍රදේශයේ ප්‍රාදේශීය සභා සභිකයෙක්, 2022 අගෝස්තු 26 සම්මුඛ සාකච්ඡාව.

[58] මීගමුව ප්‍රදේශයේ අයෙක්, 2022 අගෝස්තු 25 සම්මුඛ සාකච්ඡාව.

[59] කුරුණෑගල ප්‍රදේශයේ අයෙක්, 2022 අගෝස්තු 3 සම්මුඛ සාකච්ඡාව.

[60] අනුරාධපුර ප්‍රදේශයේ අයෙක්, 2022 අගෝස්තු 17 සම්මුඛ සාකච්ඡාව.

[61] මීගමුව ප්‍රදේශයේ ප්‍රදේශීය සභා සභිකයෙක්, 2022 අගෝස්තු 26 සම්මුඛ සාකච්ඡාව.

[62] මීගමුව ප්‍රදේශයේ ධීවර ව්‍යාපාරිකයෙක්, 2022 අගෝස්තු 25 සම්මුඛ සාකච්ඡාව.

[63] පොලොන්නරුව ප්‍රදේශයේ කාන්තාවක්, 2022 සැප්තැම්බර් 6 සම්මුඛ සාකච්ඡාව.

[64] සූරියවැව ප්‍රදේශයේ තරුණයෙක්, 2022 අගෝස්තු 10 සම්මුඛ සාකච්ඡාව.

[65] හම්බන්තොට ප්‍රදේශයේ පෙදරේරු කාර්මිකයෙක් ණී 2022 අගෝස්තු 9 සම්මුඛ සාකච්ඡාවී

[66] පොළොන්නරුව ප්‍රදේශයේ ගොවියෙක්□ 2022 සැප්තැම්බර් 6 සම්මුඛ සාකච්ඡාවී

## ආශ්‍රිත ග්‍රන්ථ


අමරසේකර, ගුණදාස. *කවන්ධයට හිසක්.* බොරලැස්ගමුවඃ විසිදුනු ප්‍රකාශකයෝ, 2011.

Amarasuriya, Harini. "Elite Politics and Dissent in Sri Lanka". *The South Asianist Vol. 4, No. 1,* Edinburgh: University of Edinburgh, 2021, 1-22.

*මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රතිපත්ති ප්‍රකාශය,* කොළඹඃ ශ්‍රිලනිප, 2001.

බණ්ඩාරණායක, සිරිමාවෝ. *සියලු ඡන්ද දායකයින් වෙතටයි,* කොළඹඃ ශ්‍රිලනිප, 1970.

ඡන්ද්‍රප්‍රේම, සී. ඒ. කොලපාට සමාජය, කොළඹඃ *කර්තෘ ප්‍රකාශන,* 1997.

Dewasiri, Nirmal Ranjith. "Roots of the Present Political Instability in Sri Lanka." *Lecture. National Centre for Advanced Studies,* Colombo, November 2, 2022.

# මාර්ගගත අවකාශයේ දී අරගලය: සමාජ මාධ්‍යවල දේශපාලන භූමිකාව පිළිබඳ දළ සටහනක්

*ලාරා විජේසූරිය[*] සහ සමල් විමුක්ති හේමචන්ද්‍ර[**]*

*ලේඛකයින් අරගලය සම්බන්ධ ඔවුන්ගේ පෞද්ගලික අත්දැකීම් සහ අරගලය සමග සක්‍රීයව සම්බන්ධ වීම මත පදනම් ව මාර්ගගතව අරගලය හැඩගැස්වීමේදී සමාජ මාධ්‍ය විසින් ඉටු කරන ලද දේශපාලන භූමිකාව පිළිබඳ සංක්ෂිප්තයක් / දළ සටහනක් මෙම ලිපිය මගින් සපයා දෙයි.*

## හැඳින්වීම

2022 මාර්තු/අප්‍රේල් මාසවල දී පුපුරා ගිය පුළුල් විරෝධතාවයන්ට විශාල පිරිසක් සහභාගි වූහ. ඔවුහු ශාරීරිකව සහ/හෝ සමාජ මාධ්‍ය හරහා තම විරෝධතා දැක්වූහ. පසුගිය කාලයේ ඇති වූ අනෙකුත් විරෝධතා හා සසඳන විට මෙම විරෝධතාවලට සැලකිය යුතු සහයෝගයක් ලැබුණු අතර, වැඩි කල් නොගොස් කොළඹ - ගාලු මුවදොර සහ අවට ප්‍රදේශය කේන්ද්‍ර කර ගත් විරෝධතා පිළිබඳ සඳහන් කිරීම සඳහා 'අරගලය' යන සිංහල වචනය සහ 'පෝරාට්ටම්' යන දෙමළ වචන විශේෂයෙන් භාවිත විය. ඉංග්‍රීසි බසින් කැපිටල් අකුර යෙදූ Aragalaya යන වචනය බොහෝ අරුත් දනවන යෙදුමක් බවට වේගයෙන් පත් විය.

මෙම රචනයේ කතුවරුන් අරගලයට සක්‍රීයව සහභාගී වී, ගෝඨාගෝගම සහ පිටකෝට්ටේ විරෝධතාවල නියැලෙමින්, පවතින දේශපාලන ක්‍රමයට එරෙහිව අන්තර්ජාල වේදිකා හරහා විරුද්ධත්වය ප්‍රකාශ කිරීම වැනි විරෝධතා සම්බන්ධයෙන් ඔවුන් ලද පෞද්ගලික අත්දැකීම් ඇසුරෙන් මෙම රචනය ලියවී ඇත.

අප්‍රේල් මාසයේ මැද භාගය වන විට මොරටුව-කොටුව (මාර්ග අංක 100) බස්රථවල කොන්දොස්තරවරුන් කෑගසමින් සිටියේ එම මාර්ගය - 'දෙහිවල - බම්බලපිටිය - කොල්ලුපිටිය - අරගලය' යනුවෙනි. මෙයින් පිළිබිඹු වූයේ භෞතික අවකාශයන් ලෙස අරගලයට සහ ගෝඨාගෝගමට (ගෝඨා ගෙදර යන්න ගම) ලැබුණු පිළිගැනීමයි.

අරගලයේ භාවිත වූ '225 ම එපා', 'මේ හැප්පුනේ වැරදි පරම්පරාව එක්කයි' සහ 'අවුරුදු 74ක සාපය අවසන් කරමු' වැනි ජනප්‍රිය සටන් පාඨ හරහා හුදෙක් පාලකයින් මාරු කිරීමකට වඩා නිදහස, සමානාත්මතාවය සහ යුක්තිය සහිත පරමාදර්ශී සමාජයක් බිහිකිරීමට ඉල්ලා සිටින ලදී. අරගලය අදහසක් බවට පරිවර්තනය විය.

---

[*] ලාරා විජේසූරිය කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ උපාධිධාරිනියකි.

[**] සමල් විමුක්ති හේමචන්ද්‍ර කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ කථිකාචාර්යෙකි (පරිවාස).

*මෙම ලිපිය පරිවර්තනය කිරීමේදී රිවිදු ද සොයිසා දැක්වූ සහයෝගයට අපි කෘතඥපූර්වක වන්නෙමු.*

අරගලය දෛනික සිදුවීමක් බවට ද පත් විය. අප මහමග යන විට "කපුටු කාක් කාක් කාක්, බැසිල් බැසිල් බැසිල් බැසිල්" යන රිද්මයට වාහන නළා හඬ ඇසුණු අතර, අපගේ සමාජ මාධ්‍ය ගිණුම්වලට ඇතුළු වන විට, සමාජ මාධ්‍ය සංග්‍රහ (newsfeeds) විරෝධතා පිළිබඳ ප්‍රවෘත්ති සහ අදහස් වලින් පිරී තිබුණි. බොහෝ දෙනෙකුට අරගලය තම ජීවිතයේ ආවේණික අංගයක් බවට පත් විය.

ලොව වටා මෑත කාලීනව සිදු වූ ජනතා විරෝධතාවල මෙන් ම,අරගලය තුළ ද සමාජ මාධ්‍ය සක්‍රීයව භාවිත විය. එසැණින් සම්බන්ධවීමේ හැකියාව සහ එසැණින් තොරතුරු ලැබීමේ හැකියාව සහිත මෙම ඩිජිටල් යුගයේ ජීවත් වන අපගෙන් බොහෝ දෙනෙකුට, සමාජ මාධ්‍යවල සිදුවන දේ සහ සැබෑ ජීවිතයේ සිදුවන දේ අතර පැහැදිලි රේඛාවක් ඇඳ වෙන් කිරීම ඇතැම්විටක දුෂ්කර ය. විටෙක සමාජ මාධ්‍යවල ඇතිවන කතිකාවත් සැබෑ ජීවිතයේ දී ක්‍රියාවට නැංවේ. ඇතැම්විටක, සැබෑ ජීවිතයේ සිදුවීම් පටිගත කර සමාජ මාධ්‍යවල තත්‍ය කාලීනව විකාශනය වේ.

මෙම පිටාර ගැලීම අරගලය ආශ්‍රිතව ද සනිටුහන් විය. විරෝධතාකරුවෝ සෑමවිට ම පාහේ දුරකථනය අතැතිව, දිග හැරෙන සිදුවීම් පටිගත කරමින් හෝ වෙනත් තැනක සිදුවන්නේ කුමක්දැයි සොයා බැලීමට උත්සාහ කරමින් පසු වූහ. ඇතැම්විටක, අරගලයේ සිටින තාක්ෂණික දැනුමැති තරුණ තරුණියන් විශාල ප්‍රතිශතයක් නිසා සමාජ මාධ්‍ය සහ සැබෑ ජීවිතය අතර සීමාවන් එන්න එන්නම බොඳ වූවා විය හැක. මාර්ගගත අවකාශයේ (online) අරගලය සහ මාර්ගගත නොවූ භෞතික අවකාශයේ (offline) අරගලය වෙන්කර හඳුනාගැනීමට රේඛාවක් ඇඳීම අපට තීරණාත්මක ලෙසින් ම අපහසු ය. සැබෑ ජීවිතයේ ප්‍රශ්න අන්තර්ජාලය හරහා අනුකරනය කරන ලද අතර, අරගලයේ අත්දැකීම් වැඩි කිරීමට සමාජ මාධ්‍ය භාවිත කරන ලදී. එනිසා, විරෝධතාවල දී සමාජ මාධ්‍යවල ගතික භූමිකාව පිළිබඳ අපගේ අවබෝධය, සමාජ මාධ්‍ය විරෝධතා සම්බන්ධයෙන් හුදු මෙවලමක් ලෙස පිළිබඳව වූ සාම්ප්‍රදායික අවබෝධයෙන් වෙනස් වේ. (වැලෙන්සුවේලා, අරියගාද, සහ ෂර්මන් 2012; ජ්‍රීලන්, මැක් ඉල්වේන් සහ ක්ලාර්ක් 2016)1 එකී මායිමේ අස්ථාවර ස්වභාවය මෙම රචනයෙන් පිළිබිඹු කරයි.

අප විසින් මේ රචනය රචනා කිරීමේදී ඇතැම් නිරීක්ෂණ අප විසින් අවධාරණය කරන අතර විරෝධතා සම්බන්ධයෙන් අප පුද්ගලිකව ලැබූ අත්දැකීම් ඇසුරින් කරුණු උකහා ගන්නෙමු. තවද, අප නිරාවරණය වූයේ විරෝධතා සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ජාලාවල සිංහලෙන් සහ යම් ප්‍රමාණයකට ඉංග්‍රීසි භාෂාවෙන් සිදු ඇතැම් කතිකාවන්ට පමණක් බව අපි සටහන් කරමු. දෙමළ කතා කිරීමට සහ තේරුම් ගැනීමට අපට වූ නොහැකියාව හේතුවෙන් දෙමළ භාෂාවෙන් වූ සමාජ මාධ්‍ය කතිකාවන් නිරීක්ෂණය කිරීමට අපට නොහැකි විය.

අරගලයෙහි සමාජ මාධ්‍ය භාවිතයට සෘජුව ම සම්බන්ධ වන ඇතැම් (මාර්ගගත සහ මාර්ගගත නොවන) පැතිකඩ පවතී. පුරවැසි මාධ්‍ය කලාවේ පුළුල් භාවිතය, පුද්ගලයින් බලමුළු ගැන්වීමේ දී සමාජ මාධ්‍යවල භූමිකාව සහ සමාජ මාධ්‍ය හරහා ශක්තිමත් කරන ලද සහ ප්‍රකාශ කරන ලද බලාධිකාරියට එරෙහි ප්‍රතිරෝධය මේවාට ඇතුළත් ය. මෙම රචනය මඟින් අරගලයේ පුළුල් විෂය පථය තුළ මෙම පැතිකඩ සමාලෝචනය කෙරෙන අතර විරෝධතාකරුවන් සමාජ මාධ්‍ය භාවිත කළ (සහ සමාජ මාධ්‍ය විසින් භාවිතයට ලක් වූ) ආකාරය තේරුම් ගැනීමට උත්සාහ කරයි.

## පුරවැසි මාධ්‍ය කලාව

සමාජ මාධ්‍ය සහ අරගලය ඒකාබද්ධ වී විචිත්‍රවත් පුරවැසි මාධ්‍ය කලාවක් බිහි කළේ ය. සමාජ මාධ්‍ය හරහා, ඉහළ පෙළේ මාධ්‍ය සාමාජිකයින් (එනම්, සම්ප්‍රදායික මාධ්‍ය තුළ ස්ථාපිත සහ පිළිගත් මාධ්‍යවේදීන්) නොවන පුද්ගලයින්ට හඬක් ලබා දෙයි. සාම්ප්‍රදායික මාධ්‍ය වෙත ප්‍රවේශය නොමැති වීම හේතුවෙන් සීමාවන්ට ලක් නොවී තම අදහස් ප්‍රකාශ කිරීමට, පුද්ගලයින් බලමුළු ගැන්වීමට සහ සිදුවීම් පිළිබඳව දැනුවත් කිරීමට සමාජ මාධ්‍ය හරහා සාමාන්‍ය පුද්ගලයින්ට අවකාශය ලබා දෙයි. සාමාන්‍ය ජනතාව සමාජ මාධ්‍යකලාවේදීන් බවට පත්වන අතර සංස්කාරකවරුන්ට සහ ආයතනික ධුරාවලියට බැඳී සිටින සම්ප්‍රදායික මාධ්‍ය කලාවේදීන් මුහුණ දෙන බාධකවලින් ඔවුන් බැඳී නොමැත.

අරගලයේ සන්දර්භය තුළ පුරවැසි මාධ්‍යවේදයේ කාර්යභාරය සාකච්ඡා කිරීමේ දී, මෙම රචනය මඟින් බිම් මට්ටමේ සිදුවීම් ආවරණය කිරීම, පුළුල් ලෙස අදහස් හුවමාරු කර ගැනීම සහ එය නිර්මාණය කිරීම සහ/හෝ පිළිගත් නායකයින් හඳුනා ගැනීම සම්බන්ධයෙන් පුරවැසි මාධ්‍යවේදයේ බලපෑම සමාලෝචනය කෙරේ.

# නායකයින් ලෙස පෙනුණු අය පිළිගැනීමට ලක් කිරීම

ලාරා: අප්‍රේල් මස මුල දී මම විශ්වවිද්‍යාලයේ පැවති විරෝධතාවයකට සම්බන්ධ වුණා. මගේ යාලුවෙක් ඒ ගැන කියපු නිසා මම එකතු වුනා, පුවරු හදාගෙන මම නියමිත වෙලාවට මගේ පන්තියේ කීප දෙනෙක් එක්ක එළියට ගියා. එතනට ගියාට පස්සෙ, ශිෂ්‍ය සංගම්වල පිරිමි ළමයින් අප හිටගන ඉන්න ඕන තැන ගැන කියන්නට පටන් ගත් නිසා මේක සිය කැමැත්තෙන් කරන විරෝධතාවයකට වඩා ශිෂ්‍ය සංගම් විසින් සංවිධානය කරන ලද විරෝධතාවක් ද කියලා අපි කල්පනා කළා. විරෝධතා සංවිධානය කළේ කවුද කියන එකට වඩා අපගේ විරෝධතා වැදගත් බව අපි තීරණය කළා වුණත්, විරෝධතා ව්‍යාපාර තුළ සිටින *නායකයින් ලෙස පෙනුණු අය* ගැන කතා කරන්න මෙම සිදුවීම මට ප්‍රයෝජනවත් ප්‍රවේශයක් ලබා දෙනවා. ස්වකීය කැමැත්තෙන් විරෝධතා දක්වන පුද්ගලයන්ට එහෙම කරන්න බොහෝ වෙලාවට විවිධ චේතනා තියනවා. විරෝධතා විවිධ මට්ටම්වල දී ස්වභාවිකව ම ඇතිවෙන්න පුළුවන් වගේ ම, ඒක පටන් ගන්න නායකයෙකු අවශ්‍ය නැහැ. ඇත්ත වශයෙන් ම, නායකයෙක් නැතිව විරෝධතා සිදුකිරීමට නොහැකියි යන අදහස ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සම්ප්‍රදායික දේශපාලන ව්‍යාපාර පිළිබඳ අදහස් මත පදනම් වී තිබිය හැකි වැරදි මතයක් (සිල්කි 2020).

ලාරාගේ අත්දැකීම දේශපාලන විරෝධතා සන්දර්භය තුළ නායකත්වය පිළිබඳ සම්ප්‍රදායික සංකල්ප සහ අරගලයේ විරෝධතාකරුවන් අතර ඇති ආතතිය විදහා දක්වයි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ ශිෂ්‍ය සංගම් විසින් සාම්ප්‍රදායික නායකයින්ගේ භූමිකාව භාර ගන්නා අතර, සිසුන් කෙරෙහි තම අධිකාරී බලය පවත්වා ගැනීම සඳහා බලය යෙදවීම සම්බන්ධයෙන් ඔවුන්ට චෝදනා එල්ල වී ඇත. නමුත්, අරගලය තුළ පක්ෂ හෝ සංගම් භේදයක් නොමැති, අප වැනි පුද්ගලයින් ස්වේච්ඡාවෙන් විරෝධය පළකරමින්, අරගලය ආරම්භයේ දී ම සාම්ප්‍රදායික නායකත්ව රාමුව පසෙක ලා විරෝධය දැක්වීමේ සහ ක්‍රියාවන් උත්ප්‍රේරක කිරීමේ පුද්ගල බලය සමාජ මාධ්‍ය හරහා මුදා හරින ලදී.

බෙනට් විසින් පෙන්වා දුන් පරිදි, "සමාජ තාක්ෂණය භාවිතයේ ව්‍යාප්තිය පුද්ගලයන්ට සාමූහික ක්‍රියාකාරීත්වයේ වැදගත් උත්ප්‍රේරක බවට පත්වීමට හැකියාව ලබා දෙයි." (බෙනට් 2012, 22) මෙහිදී, සාම්ප්‍රදායික මාධ්‍ය තුළ ඔවුන්ට ලබා නොදෙන අන්දමේ නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට වේදිකාවක් සමාජ මාධ්‍ය හරහා පුද්ගලයින්ට ලබා දෙයි. මෙයින් තවත් පුද්ගලයින් සමග පුද්ගලික ජාලයක් නිර්මාණය කෙරේ. එම නිසා බෙනට් ප්‍රකාශ කරන්නේ, "පුද්ගලයන් ස්වකීය විශ්වයන්ගේ කේන්ද්‍රයේ සිටිය ද, සර්ව සම්පූර්ණ සන්නිවේදන තාක්ෂණවල සමාජ ජාලකරණ හැකියාවට ස්තුති වන්නට එම විශ්වයන් ඉතා විශාල විය හැකි' බවයි. (බෙනට් 2012, 22). අරගල ව්‍යාපාරයේ මුල් දිනවල විරෝධතා සංවිධානය කිරීමට හෝ ප්‍රකාශ කිරීමට සමාජ මාධ්‍ය භාවිත කරනු ලැබුවේ සාම්ප්‍රදායික දේශපාලන හෝ සිවිල් සමාජ නායකයන් නොව අහඹු පුද්ගලයන් විසින් බව අරගලය නිරීක්ෂණය කළ අපට දක්නට ලැබිණි. ඒ අතරට යූටියුබ්කරුවන් සහ අපගේ මිතුරන් හෝ විශ්ව විද්‍යාල සගයන් ඇතුළත් විය. පෙර මෙම සමාජ මාධ්‍ය පෞරුෂයන්, එනම් රැට්ටා හෝ මෝටිවේෂන් අප්පච්චි, නිර්පාක්ෂික චරිත ලෙස සලකනු ලැබී ය. කිසියම් දේශපාලන කණ්ඩායමක් සමග අනන්‍ය වීමට මැලිකමක් දක්වන පිරිස්වලට පවා අරගලය සමගින් එක්වීමට මෙමගින් පොළඹවන ලද අතර, එමගින් අරගලයට නිර්පාක්ෂික ලක්ෂණ ලබා දුන්නේ ය.

නායකයෙකු නොමැති ව්‍යාපාරයක බලය සම්ප්‍රදායික දේශපාලන බල රාමු වලට වඩා වෙනස් ලෙස ව්‍යුහගත වේ. වෙනත් වචන වලින් කිවහොත්, සාම්ප්‍රදායික දේශපාලන පක්ෂවල අප දකින පරිදි, බලය විශේෂිත පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් වටා සංකේන්ද්‍රණය නොවේ; ඒ වෙනුවට අරගලයට හිමිකම් පෑ සෑම පුද්ගලයෙක් වෙත ම බලය විකේන්ද්‍රණය වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, බලධාරීන් විරෝධතාකරුවන් සමග සාකච්ඡා කිරීමට කැමැත්තෙන් සිටිය ද, මෙම සාකච්ඡා පැවැත්වීම සඳහා අනුරූප 'නායකයෙකු' සැමවිට ම සිටියේ නැත (කුරුවිට 2022). බොහෝ විට, සම්ප්‍රදායික අධිකාරිය ඇතැම් පුද්ගලයින් හෝ කණ්ඩායම් නායකයින් ලෙස වරදවා හඳුනාගෙන සමස්ත විරෝධතාවය වෙනුවෙන් කතා කිරීමට හෝ පාලනය කිරීමට ඔවුන්ට නොහැකි බව නොදැන ඔවුන් සමග සාකච්ඡා පවත්වයි. එවිට, ඊළඟ පියවර වන්නේ විරෝධතාකරුවන්ගෙන් බොහෝ දෙනෙක් (නමුත් බොහෝ විට සියල්ලන් ම නොවේ) පිළිගත් සමහර පුද්ගලයින් නායකයින්ගේ භූමිකාව භාර ගැනීමයි. අරගලය තුළ සිදුවූයේ මෙය යැයි අපි සිතන්නෙමු.

මෙම පුද්ගලයින් අතරින් ඇතැමෙක් නායකත්ව භූමිකාව ඉතා උනන්දුවෙන් භාර ගන්නා අතර, (පිරිමි) නායකයින් සෙවීමට සමාජයේ ඇති නැඹුරුව නිසා, මෙම "නායකයන්" මුල් සංවිධායකයින් සහ බලාධිකාරය සහිත පුද්ගලයින් ලෙස තවදුරටත් ඔවුන් ප්‍රක්ෂේපණය කෙරේ. මෙය මට්ටම් කිහිපයකින් ගැටලු සහගත වේ- සාම්ප්‍රදායික සමාජය තුළ පවතින බල ව්‍යුහයන් එයින් ප්‍රතිනිෂ්පාදනය කිරීමක් වන අතර, මෙම පුද්ගලයන්ව වේදිකාවක් මතට ඔසවා තබයි (ගෝශාල් සහ ජයසිංහ 2022). අරගලයට සහභාගි වූ අය බිම් මට්ටමේ සංවිධානය වීම එහි ලා නිරූපණය කළ භූමිකාවේ වැදගත්කම සහ ප්‍රමාණය දැන සිටිය ද, "මහා මිනිසා" න්‍යාය, "පිළිගත් නායකයින්" මතකයේ ඉතිරිවන චරිත වන බව සහතික කරයි (සිල්කි 2020). බොහෝවිට මෙම නායකයින් මාර්ගගත සහ මාර්ගගත නොවන අවකාශයේ ක්ෂණිකව හඳුනාගත හැකි අය වේ. විරෝධතා ව්‍යාපාරයේ වඩාත් ම සාර්ථක ජනමත හසුරුවන්නන් වූයේ සමාජ මාධ්‍ය සහ අන්තර්ජාල අවකාශය ස්වකීය (සහ ව්‍යාපාරයේ) වාසිය සඳහා භාවිත කිරීමට සමත් වූ අයයි.

සමාජ මාධ්‍යවල පුරවැසි මාධ්‍ය කලාව නිසැකව ම මෙම සමස්ත ක්‍රියාවලිය වේගවත් කරයි, මන්ද ශාරීරිකව සහභාගි නොවූ අය බොහෝ විට ඇතැම් පුද්ගලයින්ගේ සමාජ මාධ්‍යවල සජීවී විකාශයන් හරහා දිග හැරෙන සිදුවීම් නිරීක්ෂණය කළහ. සාම්ප්‍රදායික රාජ්‍ය මාධ්‍ය "පැහැදිලිව ම පක්ෂග්‍රාහී" ලෙස සලකනු ලැබූ අතර, රාජ්‍ය නොවන සාම්ප්‍රදායික මාධ්‍යවලට ද මෙම ක්‍රියාවලියේ යම් යම් අභිප්‍රායන් සහ පක්ෂපාතීකම් පැවතුණි (ඉස්මයිල්, ටොරෝසියන් සහ ටුලී 2019).

පුද්ගලයින්ට ඔවුන්ගේ සිත්ගත් ප්‍රියතම ක්‍රියාකාරීන් සිටි අතර වඩාත් ක්‍රියාකාරී අවස්ථාවන්හි දී ඔවුන්ගේ සමාජ මාධ්‍ය වැඩි දෙනෙක් විසින් සමීපව නිරීක්ෂණය කිරීම හේතුවෙන් මෙම අවධානය නායකයින් ලෙස එම ක්‍රියාකාරීන්ගේ ප්‍රතිරූපය ඉහළ නැංවී ය. ජාත්‍යන්තර මාධ්‍ය ද මෙම ක්‍රියාකාරීන් හඳුනාගෙන ඔවුන්ට ව්‍යාපාරයේ නායකයින් ලෙස ආවරණය සහ පිළිගැනීම ලබා දුන්නේ ය.

සමල්: 2022 ජුලි 9 වෙනිදා, ජනාධිපති රාජපක්ෂට ඉල්ලා අස්වීම ප්‍රකාශ කරන්න බල කළ දිනයේ, මම කිලෝමීටර් 20ක් පා ගමනින් ගිහිල්ලා දවල් 1 ට පමණ ගෝඨාගේගමට ළඟා වන විටත් මුළු ගාලුමුවදොර පිටිය ම එක කොනක සිට අනෙක් කොන දක්වා ම, රට වටෙන් ම ආව (තවමත් පැමිණෙමින් සිටි) විරෝධතාකරුවන්ගෙන් පිරිල තිබුණා. සවස පහට පමණ 'අරගලයේ නායකයන්ගේ' මාධ්‍ය හමුවක් පැවැත්වුණා. නායකයින් 30-40 ක් එහි සිටියා, ඔවුන්ගෙන් වැඩි දෙනෙක් වාඩි වී සිටි අතර අනෙක් අය පිටුපස සිටගෙන සිටියා. මාධ්‍ය සාකච්ඡාව නරඹන විට මෙම නායකයින් සහ විරෝධතාකරුවන් අතර විශාල දුරස් වීමක් මා දුටුවා. මේ නායකයෝ කවුද කියලා කිසිම උද්ඝෝෂකයෙක් දන්නේ නැහැ කියලා මම තවත් මිතුරෙකුට විහිළුවට කිව්වා. මෙයින් මම අදහස් කරන්නෙ සාම්ප්‍රදායික විරෝධතාවක දී විරෝධතාකරුවන්ට තමන්ගෙ නායකයා(න්) හඳුනාගත හැකි නමුත්, මෙහි දී එකම සමාජ මාධ්‍ය ජාලයේ සිටින අයට හැර විරෝධතාකරුවන්ට අරගලයේ නායකයින් හඳුනා ගැනීමට නොහැකි වූ බවයි.

## බිම් මට්ටමේ දී සිදුවීම් ආවරණය

බිම් මට්ටමේ සිදුවීම් සමාජ මාධ්‍ය හරහා ආවරණය කිරීම ඉතා සාර්ථකව සිදුවිය. සාම්ප්‍රදායික මාධ්‍ය එම ස්ථානයට පැමිණීමට සහ සිදුවීම් ආවරණය කිරීමට යම් කාලයක් ගත වූ අතර, විරෝධතාකරුවන් ඔවුන්ගේ කැමරා දුරකථන සමඟ සාමාන්‍යයෙන් එම ස්ථානයේ ම සිටි බැවින් සිදුවන දේ පිළිබඳ ඡායාරූප සහ වීඩියෝ වේගයෙන් උඩුගත කිරීමට ඔවුන්ට හැකි විය. පුරවැසි මාධ්‍යවේදීන් හා සසඳන විට සාම්ප්‍රදායික මාධ්‍ය යම් තරමක ආරක්ෂාවක් භුක්ති විඳිති, මැයි මස 6 වෙනිදා පාර්ලිමේන්තුවෙන් පිටත කඳුළු ගෑස් ප්‍රහාර එල්ල වූ විරෝධතාවයේ දී සාම්ප්‍රදායික මාධ්‍ය නාලිකාවල කැමරාකරුවන් නිසි මුහුණු ආවරණවලින් සැරසී පැමිණි අතර පුරවැසි මාධ්‍යවේදීන් වූ සෙසු අපට අපගේ කමිස ජලයෙන් පොඟවා මුහුණු ආවරණය කරගැනීමට සිදු විය. එබැවින්, පුරවැසි මාධ්‍යවේදීන් විසින් ග්‍රහණය කරන ලද දර්ශන මඟින් ලබා දෙන්නේ සාම්ප්‍රදායික මාධ්‍ය බොහෝ දුරට ආරක්ෂා කර ඇති මෙන් ම ග්‍රහණය කර ගැනීමට නොහැකි අවදානම් සහගත හැඟීමකි.

පුරවැසි මාධ්‍ය කලාවේ තවත් වාසියක් නම් කැමරා දුරකථන ඇති පුද්ගලයින් සෑම තැනක ම සිටීමයි (ඩි හාන් සහ තවත් අය 2020). ක්‍රියාකාරීන් අත්අඩංගුවට ගත් අවස්ථාවල දී මෙය ප්‍රයෝජනවත් විය. ඔවුන් රැගෙන යන වේලාව සහ රැගෙන යන්නේ කොතැනකට ද යන වග සහ ඔවුන් රඳවාගෙන සිටියේ කොතැන ද යන්න සොයා ගැනීමට විවිධ

පුද්ගලයින්ට එයින් හැකිවිය. මෙම ක්‍රියාකාරීන්ගෙන් බොහෝ දෙනෙක් සාමාන්‍යයෙන් ඔවුන්ව නිදහස් කර ගැනීමට ගතවන කාලයට වඩා බොහෝ ඉක්මණින් (හානියකින් තොරව) නිදහස් කර ගැනීමට හැකි වූයේ ඔවුන් රැගෙන ගියේ කෙසේ ද, කවදා ද සහ කොතැනකට ද යන්න බොහෝ දෙනා දැන සිටි බැවිනි. පුරවැසි මාධ්‍යවේදයට පින් සිදුවන්නට අතුරුදහන්වීම් 21 වන සියවස තුළ තවදුරටත් සිදු කළ නොහැකි බවට විහිළුවක් අප අතර තිබුණි.

> **සමල්**: මම 2022 ජූලි 22 වැනිදා පාන්දර 2ට පමණ චිත්‍රපටියක් නරඹලා අවසන් කළා. නින්දට යාමට කලින් පුරුද්දක් වෙලා තිබුණු විදියට අරගලය ගැන අලුත් ම යාවත්කාලීන කිරීම් ලබා ගන්න මගෙ WhatsApp සහ Facebook ගිණුම් පරීක්ෂා කළා. ගෝඨාගෝගම විරෝධතාකරුවන්ට එරෙහිව පොලිසිය අමානුෂික ප්‍රහාරයක් එල්ල කර තියනව දැකලා මම කම්පා වුනා. මම Xposure News සහ සෙසු විරෝධතාකරුවන් විසින් පලකරල තිබුණු Facebook සජීවී වීඩියෝ නැරඹීමට පටන් ගත්තා. විරෝධතාකරුවන්ගේ ආරක්ෂාව ගැන මට අතිශයින් කණගාටුවක් සහ බියක් ඇති වුණා. අරගලයේ දී මට හමුවුණු සහ සමීප බැඳීමක් ඇති සහෝදර විරෝධතාකරුවන්ට පහර දෙන විට මගේ නිවසේ සුවපහසු ලෙස රැඳී සිටීම ගැන මට වරදකාරි හැඟීමක් ඇති වුණා. ඒත් පොලිසියෙන් ගුටිකන්න බය නිසා මම ගෙදරින් ගියේ නැහැ.

රූපවාහිනී නාලිකා කිහිපයක් හැරුණු විට අනෙක් ඒවා අරගලය නොපෙනෙන්නාක් සේ සිටීමට හෝ ඒ සම්බන්ධයෙන් අවමන් සහගත ප්‍රතිරූපයක් සැපයීමට කටයුතු කළහ. ගෝඨාගෝගම පොලිස් වැටලීම සිදු වූයේ අලුයම කාලයේ වන අතර, එය සියලුම රූපවාහිනී නාලිකා සහ ගුවන් විදුලි නාලිකා බහුතරයක් වසා ඇති වේලාවකි. නමුත් සමාජ මාධ්‍ය මඟින් සමල් එම වැටලීම සජීවීව නරඹමින් සිටියේ විරෝධතාකරුවෙකුගේ දෘෂ්ටි කෝණයෙන්, එනම් ගෝඨාගෝගම දී එය අත්විඳින්නාක් මෙනි. එක්සත් රාජධානියේ වෙසෙන අපේ මිත්‍රයෙක් ද සමල්ගේ අත්දැකීමට මුහුණ දුන්නා ය. රටවල් අතර වේලාවේ වෙනස හේතුවෙන් මෙම පොලිස් වැටලීම සිදුවන විට ඇයට රාත්‍රී කාලය උදා වී තිබුණි. විරෝධතාකරුවන් රාජ්‍ය ම්ලේච්ඡත්වයෙන් බේරා නොගැනීම සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ දේශපාලනඥයන්ගෙන් තමන් Twitter ඔස්සේ පිළිතුරු ඉල්ලා සිටි බව ඇය අපට පැවසුවා ය. මේ ආකාරයට රට පුරා සහ ලොව පුරා අරගලයට සහයෝගය දැක් වූ පුද්ගලයින් සමාජ මාධ්‍ය විසින් සම්බන්ධ කරන ලදී.

කෙසේ වෙතත්, පුරවැසි මාධ්‍ය කලාවේ ද අඩුපාඩු පවතී. කීර්තිමත් මාධ්‍යවේදීන් සංවේදී කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ පමණට වඩා හැඟීම්බර භාෂාවක් භාවිත කිරීමෙන් වැළකීමටත්, ඔවුන්ගේ පුද්ගලික ප්‍රතිචාර වාර්තාකරණය සමගින් ඒකාබද්ධ නොකර සිටීමට පුහුණුව ලැබූවන් වුවත්, පුරවැසි මාධ්‍යවේදීන් ඒ සම්බන්ධයෙන් පුහුණුව ලැබූවන් නොවේ. අරගල සන්දර්භය තුළ භීතියට තුඩු දෙන සාවද්‍ය තොරතුරු වාර්තා කිරීම අඩු වුව ද, පුරවැසියන් විසින් කරුණු වැරදි ලෙස නිරූපණය කර පුවත් වාර්තා කළ අවස්ථා බොහෝ ය. නිදසුනක් වශයෙන්, මැයි මස 9 වැනි දින, මහින්ද රාජපක්ෂගේ ආධාරකරුවන් පුස්තකාලය විනාශ කළ බවට ශීර්ෂ පාඨයක් සහිතව, ගෝඨාගෝගම පුස්තකාලයේ පොත් බිම විසිරී ඇති පින්තූරයක් සංසරණය විය. මැයි මස 9 වන දින පුස්තකාලයට අත තැබීමක් සිදු නොකළ බැවින් මෙය අසත්‍ය විය. ප්‍රහාරයක් යැයි උපකල්පනය කර, විරෝධතාකරුවන් කඩිමුඩියේ පොත් ආරක්ෂිත ස්ථානයකට ගෙන යාමට උත්සාහ කළ අතර, පුස්තකාලයේ පින්තූරය ගනු ලැබුවේ එම අවස්ථාවේ දී ය. කෙසේ වෙතත් පුස්තකාලයට එල්ල වූ ප්‍රහාරය පිළිබඳ අසත්‍ය පුවත සමාජ මාධ්‍ය ප්‍රජාව අතර වේගයෙන් ප්‍රචාරය විය. එසේම පසුගිය ජූලි 13 වැනිදා රජය විසින් ගෝඨාගෝගමට ඉහළ අහසේ පහතින් හෙලිකොප්ටරයක් යවන විට එය වීඩියෝගත කර නිරායුධ විරෝධතාකරුවන්ට වෙඩි තැබීමට සැරසෙන බව වාර්තා කළේ ය. නිසැකව ම එවැනි බියක් සිත්වල ඇති වුව ද හෙලිකොප්ටරයක් විසින් වෙඩි තැබීමක් සිදු කළේ නැත. කෙසේ වෙතත්, එම ස්ථානයේ නොසිටි බොහෝ දෙනෙක් එය එසේ සිදු වූ බව විශ්වාස කළහ. සමාජ මාධ්‍ය වෙත නිරන්තරයෙන් වීඩියෝ සහ පෝස්ට් උඩුගත කරන බොහෝ ක්‍රියාකාරීන් අරගලයේ යෙදී සිටින්නන් මුහුණ දෙන ගැටලු අවධාරණය කිරීමට ඉතා හැඟීම්බර භාෂාවක් සහ ක්‍රියාවන් භාවිත කළහ. සමහර ක්‍රියාකාරීන්, මේ මොහොතේ ආතතිය තුළ, ප්‍රචණ්ඩත්වය සහ පළිගැනීම් වෙනුවෙන් පෙනී සිටි අතර, මෙය අභියෝගයක් විය.

# දැනුවත් සහ නොදැනුවත් මත සඳහා විවෘත අවකාශ

සමාජ මාධ්‍ය යනු ස්වකීය පුද්ගලික අදහස් ලෝකය සමග බෙදා ගැනීමට තමන් ආරක්ෂිත යැයි පුද්ගලයින්ට දැනෙන සහ ඒ සඳහා ඔවුන් සවිබල ගන්වන්නා වූ අවකාශයකි. සමාජයේ ඇතැම් කොටස්වල එනම්, නිශ්චිත මට්ටමේ අධ්‍යාපනයක්, පුහුණුවක් සහ සමාජ ප්‍රාග්ධනයක් ඇති සාමාජිකයින්ගේ, හඬ ප්‍රතිනිෂ්පාදනය කරන සාම්ප්‍රදායික මාධ්‍ය, තොරතුරු සහ වරප්‍රසාද ආරක්ෂා කරන්නෙකු ලෙස සැලකේ. කෙසේ වෙතත්, සමාජ මාධ්‍ය හරහා ඕනෑම අයෙකුගේ සහ සෑම කෙනෙකුගේ ම හඬ ප්‍රතිනිෂ්පාදනය කළ හැකි ය. ඉහත සාකච්ඡා කළ පරිදි, ඇතැම් පුරවැසියන් අන් අයට වඩා විශ්වාසදායක යැයි හෝ වඩා ජනප්‍රිය යැයි සලකනු ලැබුවත් වර්තමාන සිදුවීම් ආදිය පිළිබඳව තමන්ගේ මතය බෙදා ගැනීමට ඕනෑම පුරවැසියෙකුට ම හැකියාව ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කරුණු හෝ නිසි විශ්ලේෂණ මගින් පිටුබලය නොලැබූ බොහෝ මත සහ අදහස් මතු වී ඒවාට ප්‍රචාරයක් සහ පිළිගැනීමක් ලැබුණි. මෙය මාර්ගගත සහ මාර්ගගත නොවන අවකාශය තුළ ප්‍රතිවිරෝධතා කෝප ගැන්වීමට හේතු විය. විරෝධතා දක්වන විවිධ පුරවැසි කණ්ඩායම් අන් අයගේ අදහස් සම්බන්ධයෙන් අමනාප වූ විට, සමාජ මාධ්‍යවල සහ භෞතිකව ගැටුම් උත්සන්න වූ අතර එය විරෝධතාවලට අහිතකර ලෙස බලපෑවේ ය. සමාජ මාධ්‍යවල සීමාවන් ද පැහැදිලි ය. තොරතුරු සහ අදහස් හුවමාරු කර ගැනීම සඳහා ඉන් අවකාශයක් නිර්මාණය කරන නමුත් සිතා බැලීම, විශ්ලේෂණය සහ විවාදය ඉන් උත්තේජනයක් නොකරයි. එය අදහස්වල ඇති සියුම් වෙනස්කම් සහ සංකීර්ණතාවය පහසුවෙන් මග හැරී යා හැකි අවකාශයක් නිර්මාණය කරයි. මෙය ප්‍රශ්න සහ යථාර්ථය අනවශ්‍ය ලෙස ද්විමය නිරූපණය කිරීමකට තුඩු දෙන අතර, තවදුරටත් සමාජ හා දේශපාලන බෙදීම් ඇති කරයි.

පුද්ගලයින් පරිගණක හෝ දුරකථන තිරයක මුහුණත හරහා අන් අය සමඟ සම්බන්ධ වන විට, අනෙක් අන්තයේ මිනිසෙකු සිටින බව අමතක කිරීම පහසු වන අතර, සැබෑ ජීවිතයේ දී සිදුවනවාට වඩා වේගයෙන් වාද විවාද වර්ධනය වීමට ඉඩ සලසයි. අරගලයේ සමාජ මාධ්‍ය අවකාශය තුළ මෙය කතිකාවන් කිහිපයක් හරහා සිදු වූ අතර, එමගින් බහුවිධ පැතිකඩ පවතින තර්ක අඩු වී ධ්‍රැවීකරණය වූ කඳවුරු දෙකක් ඇති වන තෙක් පරිණාමය විය. අරගලය සම්බන්ධයෙන් වූ එක් කතිකාවක එක් පාර්ශ්වයක් විරෝධතා භූමියෙහි අද්විතීය බව හා පෙර නොවූ විරූ බව පිළිබඳ ආඩම්බරයෙන් ප්‍රකාශ කරද් දී, අනෙක් පාර්ශ්වය මේ සියලු ප්‍රකාශයන් බැහැර කළේ වෙනත් එවැනි ම විරෝධතා කෙරෙහි අවධානය යොමු කරමිනි. 'ඔබ (එනම්, ජනාධිපතිවරයා, රජය, ඕනෑම බලධාරි චරිතයක් ලෙස මෙය කියවිය හැකි ය) මේ හැප්පුනේ (මේ සඳහා ආචාරශීලීබවින් මීට වඩා අඩු වචනයක් ද යෙදිය හැක) වැරදි පරම්පරාව සමග යි' යනුවෙන් පුවරු ප්‍රදර්ශනය කළ විරෝධතාකරුවන්ව පැරණි පරම්පරාවල විරෝධතාකරුවන්ට මුහුණ දෙන්නට වූ බාධක පෙන්වා දුන් අනෙකුත් විරෝධතාකරුවන් විසින් සමාජ මාධ්‍ය ඔස්සේ විවේචනයට ලක් කරන ලදී.

සමාජ මාධ්‍ය අන්තර්ක්‍රියාවලට ම සුවිශේෂී වූ සීමාවන් ඇත. වචන ගණන සහ සටහනේ දිග අනුව, ඉන් ලබාදෙන පණිවුඩයේ ස්වරයෙහි සහ ගැඹුරෙහි ද, විශ්ලේෂණයේ ද සූක්ෂ්මතාවය නැති වී යාමක් සිදු විය හැක. තිරය මත පදනම් වූ අන්තර්ක්‍රියා තුළ බොහෝ විට මනුෂ්‍යත්වය සිඳී යන අතර නොඉවසීම ප්‍රකෝප කරවන අහිතකර කියුම් අතරේ වැදගත් දෙබස් සහ වාද විවාද පැටලී යයි. දෘෂ්ටීන් සහ අත්දැකීම්වල වෙනස්කම් පිළිබඳ ඵලදායි සංවාදයක් විය හැකිව තිබුණ ද ඒ වෙනුවට පුද්ගලයන් සහ කණ්ඩායම්වල ධ්‍රැවීකරණයට තවදුරටත් දායක වූ විනාශකාරී තර්කයක් බවට එය පත් විය. රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ සිසුන් වූ අපට අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය වටා ඇති කතිකාවත වඩාත් තදින් දැනුණි. සමාජ මාධ්‍යවල මෙම ශිෂ්‍ය සංවිධානය එක්කෝ වීරයන් ලෙස පිළිබිඹු වූ අතර, නැතහොත් ඔවුන් අවමානයට ලක් විය. මාර්ගගත නොවන භෞතික අවකාශය තුළ ඔවුන්ගේ භූමිකාවේ යථාර්ථය සහ එහි වූ සංකීර්ණ වූත් බහුවිධ වූත් මුහුණත් ද, තත්ත්වය ද නිවැරදිව හා අපක්ෂපාතීව පිළිබිඹු වූයේ නැත. නමුත් සමාජ මාධ්‍ය සංස්කෘතිය සහ මාර්ගගත අවකාශයන් සාමකාමී, ආවර්ජනාත්මක සහ නිර්මාණාත්මක සාකච්ඡාවක් සහ එකඟ නොවීමේ එකඟතාවයක් සඳහා යොමු වී නොමැත.

## බලමුළු ගැන්වීම

සංකේත භාවිතා කරමින් පණිවුඩය තව දුරටත් ව්‍යාප්ත කිරීමට කටයුතු කළ අරගලය, සමාජ මාධ්‍ය පරිකල්පනීය අන්දමින් භාවිත කළේ ය. ඇතැම් හැෂ්ටැග් බහුලව භාවිතා කිරීම ඔවුහු ඉතා පරිපූර්ණ ලෙස සිදුකළහ (ෆ්‍රීලන්, මැක් ඉල්වේන් සහ ක්ලාර්ක්

2016). මාර්ගගත අවකාශය තුළ ප්‍රසිද්ධිය සහ පිළිගැනීම ලබන විරෝධතා ව්‍යාපාර ඒ සමගින් ම ඊට විරුද්ධ වන අයගේ අවධානය ඒ වෙත යොමුකරවා ගනිති (ෆ්‍රීලන්, මැක් ඉල්වේන් සහ ක්ලාර්ක් 2016). අරගලය සම්බන්ධයෙන් ගත් කල, මෙය සමාජ මාධ්‍ය තුළ මෙන් ම විවිධ කඳවුරුවලට අයත් අරගලයේ භෞතික අවකාශයෙන් ද පැහැදිලි විය.

ඔවුන් විවිධ ආකාරවලින් බලමුළු ගැන්වීමේ අදහසින්, පුද්ගලයින් සමඟ සන්නිවේදනය කිරීමේ මාධ්‍යයක් ලෙස සමාජ මාධ්‍ය පුළුල් ලෙස භාවිත කරනු ලැබිණි. ඇතැම් විටක නිශ්චිත වේලාවක සහ දිනයක සංවිධානය කරන ලද විරෝධතාවක් පිළිබඳ පුවතක් සහිත සරල පණිවිඩයක් හෝ පෝස්ටරයක් පුළුල් ලෙස සංචරණය වූ අතර බොහෝදෙනා අතර ඒවා පැතිර ගියෝ ය (තුෆෙකි සහ විල්සන් 2012). පණිවිඩ යැවීමේ යෙදුම් (apps) මත විරෝධතා කණ්ඩායම් නිර්මාණය කරන ලද අතර, බොත්තමක් ඔබන පමාවෙන් ඔවුන් බලමුළු ගැන්වීමට හැකි විය. මේවායින් ඇතැම් කණ්ඩායම් හන්දියේ පැවැත් වූ විරෝධතා වල දී හමු වූ අසල්වැසියන් එකතු කර සාදන ලද සරල WhatsApp සමූහ වූ අතර ඇතැම් ඒවා නිරීක්ෂණ සහ තහනම් කිරීම්වලට යටත් නොවන විකල්ප වේදිකා භාවිත කරමින් තෝරාගත් කණ්ඩායම් විසින් සාදගත් ඒවා විය. මෙම තෝරාගත් කණ්ඩායම්වලට සම්බන්ධ වීමට නම්, දැනටමත් සමූහයේ සිටින විශ්වාසවන්ත පුද්ගලයෙකු විසින් නිර්දේශ කළ යුතු විය. මෙසේ බලමුළු ගැන්වීම සඳහා හොඳම නිදර්ශනය වූයේ කඩිමුඩියේ පනවන ලද ඇඳිරි නීතිය මෙන් ම, පොදු ප්‍රවාහන සේවාවල හිඟය ද නොතකා, දහස් සංඛ්‍යාත ජනතාවක් ජූලි මස 9 වැනි දින කොළඹ රැස් වූ ජනකායට එක් වූ ආකාරයයි. ඊට දින කිහිපයකට පෙර සමාජ මාධ්‍යවල විවිධ භාෂාවලින් විවිධ පෝස්ටර් සංසරණය වූ අතර, ඒවා සියල්ලෙහි ම දිනය සහ 'රටම කොළඹට' යන සටන් පාඨය ඇතුළත් විය. රටේ පැවති තත්ත්වයට විරෝධය දක්වන පුද්ගලයින් සහ කණ්ඩායම් සඳහා සම්බන්ධ වීමට ස්ථානයක් පෝස්ටර්වල ආරම්භකයින් විසින් ලබා දුන්නේ ය (පෝල් සහ ඩිහික් 2018).[2] විරෝධතාවයට එක්වීමේ තීරණය තනි තනිව ගත් නමුත් එම තීරණය මත දස දහස් ගණනක් එකට එක් වූහ.

**සමල්** - මම ගෝඨාගෝගම මහජන සරසවිය පවත්වාගෙන ගිය කණ්ඩායමේ සාමාජිකයෙක් වන අතර, එහි බොහෝ සාමාජිකයන් නුගේගොඩට ආසන්නව ජීවත් වෙනවා. ජූලි 9 වැනිදා හෝමාගම සිට පැමිණෙන විරෝධතා පාගමනට එක්වන නුගේගොඩ හන්දියේ විරෝධතාව සංවිධානය කරන ජනතාවට සහාය දැක්වීමට මහජන සරසවිය ලෙස අපි තීරණය කළා. ඉතින් අපි නුගේගොඩ උද්ඝෝෂණයේ සංවිධායකයෙක් කියලා හිතපු කෙනෙක්ව සම්බන්ධ කරගෙන අපි සහයෝගය දෙන්න කැමති බව ඇයට දැනුම් දුන්නා. ඇය අපට අවශ්‍ය තොරතුරු ලබා දුන් අතර, අපි ත්‍රෛභාෂා පෝස්ටර් නිර්මාණය කරලා මහජන සරසවියේ Facebook පිටුවේ පළ කළා. පෝස්ටර් තුන දළ වශයෙන් 2000 කට ආසන්න ප්‍රමාණයකට ළඟා වෙලා තිබුණා. අපි ජූලි 9 වෙනිදා නුගේගොඩට එනකොටත් සෙනග 500-1000ක් විතර හිටියා. මේ අය ආවෙ අපේ Facebook පෝස්ට් නිසා නෙමෙයි කියන එක හොඳටම පැහැදිලියි මොකද අප නොදන්න සංවිධායකවරුන් ගණනාවක් මේ වෙනුවෙන් වැඩ කළා. ඒ වගේම අපි පෙළපාලි යද්දී එක සාමාජිකයෙක් විනාඩි 17ක Facebook සජීවී වීඩියෝවක් මඟින් පාගමන සහ අරගලය ගැන විස්තරයක් ලබාදුන්නා.[3] මේ වීඩියෝව 500කට ආසන්න පිරිසක් වෙත ළඟා වෙලා තිබුණා.

**ලාරා**: සමහර වෙලාවට, ඒකරාශී වීම් වෙනස් ආකාරයකින් සිදු වුන. එනම් මහජන මතය නිශ්චිත පැත්තකට සංවිධානය කිරීමට එකිනෙකා සමඟ පින්තූර සහ වීඩියෝ බෙදා ගත්තා. පසුගිය අප්‍රේල් 19 වැනිදා රඹුක්කන වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන්, පොලිසිය විරෝධතාකරුවන්ට වෙඩි තියලා එක් කෙනෙක් ඝාතනය කළ බව ආරංචි වන විට මම සිටියේ ගෝඨාගෝගමේ. අපි කට්ටියක් ජංගම දුරකථනයක් වටා එකතු වෙලා ඒ වීඩියෝ එක බැලුවා. ඒක බලන්න කලින් ඒ පිරිසේ අය ප්‍රසන්න හා ප්‍රීතිමත් හැඟීමෙන් හිටියත් ඒ විඩීයෝව බලලා ඉවර වුණු ගමන් ඉතා ඉක්මණින් කෝපයට සහ කලබලයට පත් වුන. ඒ කාලයේ දී අවිහිංසාව සඳහා වූ කැපවීම බලවත් වෙලා තිබුණු හින්දා විරෝධතාකරුවන් සියල්ලෝ ම ඉටිපන්දම් දල්වා රඹුක්කන සිදුවීමට විරෝධය පාන්න රැස් වුවා. සමාජ මාධ්‍ය හරහා වීඩියෝවක් බෙදාගැනීම මඟින් සමූහයක් තුළක්ෂණිකව වෙන්න පුළුවන් බලමුළු ගැන්වීම සහ මනෝභාවයේ වෙනස් වීම මෙයින් හොඳින් පෙන්නුම් කරනවා.

ක්ෂණික බලමුළු ගැන්වීම සඳහා තවත් උදාහරණයක් වන්නේ මැයි මස 9 වන දින මහින්ද රාජපක්ෂගේ ආධාරකරුවන් විසින් ගෝඨාගෝගමට එල්ල කළ ප්‍රහාරයෙන් සුළු මොහොතකට පසු ගෝඨාගෝගමට ජනතාව පැමිණීමයි. සමාජ මාධ්‍ය තුළ අරගලයේ ප්‍රමුඛ මුහුණක් වූ ඩිලාන් සේනානායක Facebook හි මිනිත්තු 90 ක දීර්ඝ සජීවී වීඩියෝවක් හරහා ප්‍රහාරය පිළිබඳ සවිස්තරාත්මක යාවත්කාලීන කිරීමක් කළේ ය. එම සජීවී වීඩියෝව නැරඹූ පිරිස කොපමණ දැයි නිශ්චිතව නොදන්නා නමුත් ඔහුගේ සජීවී වීඩියෝව හරහා සැලකිය යුතු පිරිසකට මෙම ප්‍රහාරය පිළිබඳ පුවත අසන්නට ලැබුණු බව නම් සහතික ය. ප්‍රහාරය සජීවීව විකාශය කළේ එක් රූපවාහිනී නාලිකාවක් පමණි. එහෙත් අවට ප්‍රදේශවල ජනතාව විරෝධතාකරුවන් සහ විරෝධතා භූමිය ආරක්ෂා කිරීමට ගෝඨාගෝගම වෙත දිව ආහ. මෙම ලිපිය ලියන අවස්ථාව වන විට මෙම වීඩියෝවට නැරඹීම් මිලියන 2.2 ක්, ප්‍රතිචාර 11,400 ක් සහ අදහස් 45,000 ක් ලැබී ඇත. මේ නයින් බලන කළ, ක්ෂණිකව සහ සැලසුම් සහගතව පුද්ගලයින් බලමුළු ගැන්වීමේ දී සමාජ මාධ්‍ය වැදගත් කාර්යභාරයක් ඉටු කළේ ය.

## හැෂ්ටැග්වල බලය

අරගලය සමාජ මාධ්‍ය තුළ ඇතැම් හැෂ්ටැග් ද භාවිතා කළේ ය. ප්‍රධාන අරගලයට සම්බන්ධ වීමට සහ ඇතැම් විටක, ඔවුන්ගේ ම අදහස් සහ පෝස්ටු සඳහා ආකර්ෂණය ලබා ගැනීමට විරෝධතාකරුවෝ මෙම #gotagohome හැෂ්ටැග් භාවිත කළහ. නූතන විරෝධතා ව්‍යාපාරවල බොහෝ විට වඩාත් දෘශ්‍යමාන ලෙස එම ව්‍යාපාරය සංකේතවත් කරන සාධකය හැෂ්ටැග් වේ (ග්‍රීලන්, මැක් ඉල්වේන් සහ ක්ලාර්ක් 2016). මෙහිදී අරගලය තුළ ප්‍රමුඛතම හැෂ්ටැගය වූයේ #gotagohome හෝ එහි ප්‍රභේද විය හැකි ය. ඉහත සාකච්ඡා කළ පරිදි, මාර්ගගත අවකාශය සහ මාර්ගගත නොවන භෞතික අවකාශය අතර වෙනස හඳුනාග ැනීම ක්‍රමක්‍රමයෙන් දුෂ්කර වී තිබීම සංකීර්ණ තත්වයකි. එනම් අපි මාර්ගගත අවකාශයේ සහ මාර්ගගත නොවන අවකාශයේ යන දෙකෙහි ම හැෂ්ටැග් භාවිත කිරීමට පුරුදු වී සිටිමු. මාර්ගගත අවකාශය සහ මාර්ගගත නොවන භෞතික අවකාශය අතර ඇති මේ අන්තර් හුවමාරු කරගැනීම් අරගලය තුළ විරෝධතාකරුවන්ට අනෙකුත් විරෝධතාකරුවන් අරගලය සමඟ තිබෙන සම්බන්ධතාවයන් පිළිබඳ පැහැදිලි අදහසක් ලබා දුන් අතර, විරෝධතාකරුවන්ට ඔවුන්ගේ අනන්‍යතාවය ශක්තිමත් කිරීමට සහ ඔවුන්ගේ සහභාගීත්වය ප්‍රසිද්ධියේ කිරීමට හැකි විය.

අරගලය හා සම්බන්ධ හැෂ්ටැග් මුලින් අරගලයේ ම සන්දර්භය තුළ භාවි; වූ අතර තවත් සමහරු අරගලයට සම්බන්ධ නොවන සමාජ මාධ්‍ය අන්තර්ගතයන් සඳහා අවධානය ලබා ගැනීමට ඒවා භාවි; කිරීමට පටන් ගත්හ. ඇතැම් ඇඳුම් සාප්පු අරගලය තේමා කරගත් විලාසිතා සාප්පු කවුළුවල ප්‍රදර්ශනය කළ අතර, ඇතැම් වාණිජමය බලවේ. ඔවුන්ගේ සමාජ මාධ්‍යව, අවධානය ඉහළ නැංවීමට ඒවා යොදා ගත්හ.

හැෂ්ටැග් භාවිතයේ වාර ගණන පිළිබඳ අධ්‍යයන ද සිත්ගන්නා කරුණකී මන්ද ඒවා හරහා අරගලයේ වර්ධනයන් සොයා ගත හැකි බැවිණි. මැයි මස 9 වන දින ප්‍රහාර සිදුවෙමින් තිබිය දී, පුරවැසි මාධ්‍යවේදීන් #attackonGGG වැනි හැෂ්ටැග් භාවිත කරමින් ප්‍රහාරයේ වීඩියෝ සලකුණු කිරීමට පටන් ගත්හ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ධූරයෙන් ඉල්ලා අස්වීමෙන් පසු #gotagohome යන හැෂ්ටැගය අනවශ්‍ය වූ අතර, ඇතැම්හු එය #ranilgohome (කෙසේ වෙතත්, එය කලින් හැෂ්ටැගය තරම් ආකර්ශනීය හෝ ජනප්‍රිය නොවී ය) ලෙස ආදේශ කළහ. අපි මෙම ලිපිය ලියන මොහොතෙ 2022 නොවැම්බර් 2 වනදා සිදු වීමට නියමිත විරෝධතාවට සම්බන්ධව Twitter හි ප්‍රචලිත වී ඇති හැෂ්ටැගය වන්නේ #aragalaya සහ #econiccrisislka ය. මෙම අවසාන හැෂ්ටැගය වසර ආරම්භයේ සිට ම ප්‍රධාන හැෂ්ටැගයක් වූ අතර, එය දැනට අරගලයට අදාළව ඉතුරු වී ඇති එකම හැෂ්ටැගය වන්නට පුළුවන් බවට උපකල්පනය කිරීම සාධාරණ බව පෙනේ.

## ප්‍රතිචාර

අරගලයේ මුල් දිනවල, එනම් අප්‍රේල් මස මුල දී දීප ව්‍යාප්ත විරෝධතා සැලසුමකට රජය ප්‍රතිචාර දැක්වූයේ සියලු ආකාරයේ සමාජ මාධ්‍ය කෙටි කාලයකට අවහිර කිරීමෙනි. මෙය ශ්‍රී ලංකාව තුළ අලුත් වර්ධනයක් නොවූ අතර, 2018 දී සහ 2019 දී වාර්ගික කෝලාහල සහ සමාජ මාධ්‍ය කටකතා අතර පැහැදිලි සම්බන්ධයක් තිබූ අතර රජය එම තත්ත්වයන් තුළ ද දැඩි සමාජ මාධ්‍ය තහනමක් පැනවී ය. කෙසේ වෙතත්, මෙවර මෙම තහනම අසාධාරණ බව බොහෝ දෙනෙකුට හැඟුණු අතර, ඔවුන් VPN හරහා සමාජ මාධ්‍ය වෙත පැමිණුනහ. සමාජ මාධ්‍ය තහනම මග හැරීමේ මෙම උත්සාහයේ අනපේක්ෂිත බලපෑමක් වූයේ අරගලය හා සම්බන්ධ හැෂ්ටැග් බොහෝ රටවල 'ජනප්‍රිය මාතෘකා' (trending) බවට පත් වීමයි. අප්‍රේල් සහ මැයි මාස මුළුල්ලේ ම ගෝඨාගෝගම සිටි විරෝධතාකරුවන්ට අන්තර්ජාල සම්බන්ධතාව පිළිබඳ

ගැටළු ඇති විය. මෙයට හේතුව වන්නට ඇත්තේ එම ස්ථානය අසල ඇති සන්නිවේදන කුළුණුවලට මුහුණ දීමට සිදු වූ දැවැන්ත තදබදයයි. කෙසේ වෙතත්, බිම් මට්ටමින් පැතිර ගිය කටකථාව වූයේ රජය සිතාමතාම සංඥා අවුල් කරන බවයි. සම්බන්ධතාවය පිළිබඳ අදහස අරගලයට ඉතා සමීප දෙයක් වූ අතර, ගෝඨාගෝගම වඩාත්ම සංකේතාත්මක අවකාශයක් බවට පත් වූ ගෝඨාගෝගම පුස්තකාලය ආරම්භ වූයේ ද පුද්ගලයින්ට නොකඩවා සම්බන්ධතාවය පවත්වාගැනීමේ අරමුණ පූර්වකල්පනය කරමින් පිහිට වූ දූරකථන ආරෝපණ මධ්‍යස්ථානයේ සිටිද්දී තමතමන්ගේ දූරකථනය ආරෝපණය වනතෙක් කියවන්නට තැබූ තනි පොත් රාක්කයකිනි.

අරගලයට දැක් වූ ප්‍රතිචාර විවිධාකාර විය. වැඩි කල් නොගොස් සමාජ මාධ්‍ය වෙත ප්‍රවේශ වීමට සහ අන්තර්ගතය පළ කිරීමට බාධා මතු විය. විරෝධතාකරුවන් එකිනෙකා අතර ප්‍රතිවිරෝධතා සහ එකඟ නොවීම් ද ඇතිවුණි (පෝල් සහ ඩිහික් 2018).[4] මෙයට අමතරව අරගලයට එරෙහිව විරෝධතාකරුවන් නොවන අයගෙන් ප්‍රතිරෝධයක් ද එල්ල විය. මෙය විශේෂයෙන් ම සිදු වූයේ ප්‍රචණ්ඩත්වයන් වලින් පසුවය. පසුගිය මැයි මස 9 වැනිදා ගෝඨාගෝගමට එල්ල වූ සැලසුම් සහගත ප්‍රහාරයෙන් පසු කෝපයට පත් ජනතාව කලහකාරීන් ප්‍රවාහනය කළ බස් රථවලට ගිනි තබා කලහකරුවන්ට ද පහර දුන්හ. අරගලයට සහභාගි නොවන අය මෙම ප්‍රචණ්ඩත්වය සාපරාධී බව කියා සිටිමින් විරෝධතා සමාජ වෙනසක් සඳහා වලංගු ව්‍යාපාරයක් නොවන බවට සාක්ෂියක් ලෙස එය ඉදිරිපත් කළහ. සමහර විරෝධතාකරුවන් ද මෙම ප්‍රචණ්ඩ හැසිරීම 'අපේ අරගලය නොවේ' යැයි පවසමින් ප්‍රචණ්ඩත්වයේ යෙදෙන්නන්ගෙන් ඈත් වීමට පටන් ගත්හ. මෙම ස්ථාවරය බොහෝ අය විසින් ඉදිරිපත් කරන ලද අවිහිංසාව පිළිබඳ පරමාදර්ශයන් විසින් පෙළඹවූවක් විය හැකි වුව ද, සහභාගි නොවන මහජනතාව සහ පොදුවේ බාහිර ලෝකය ඉදිරියේ යුක්ති සහගතව සිටීමට ඇති ආශාව සමග ද එය සම්බන්ධ විය හැකි ය.

## සමාජ මාධ්‍ය හරහා බලාධිකාරියට ප්‍රතිරෝධය දැක්වීම

සමාජ මාධ්‍ය අරගලය තුළ භූමිකාවක් ඉටු කළ තුන්වන ආකාරය වූයේ බලාධිකාරියට එරෙහිව ප්‍රතිරෝධය දැක්වීමයි. ශ්‍රී ලාංකීය දේශපාලනයේ පසුගිය වසර කිහිපය හා බැඳුණු, පැහැදිලි සහ සොයා ගත හැකි ඉතිහාසයක් ඇති අංග අරගලය තුළ නිතර භාවිත වීම සිත්ගන්නා කරුණකි. මෙම කොටස මගින් බලාධිකාරිය එකහෙළාම ප්‍රතික්ෂේප කිරීම වෙනුවෙන් මීම් (memes) භාවිතය සහ අරගලයෙහි සන්දර්භය තුළ ස්ථාන නැවත නම් කිරීම යොදා ගත් ආකාරය සලකා බලයි.

## මීම් භාවිතයට නිදහස

> ලාරා- මට පොඩි කාලෙ දි කියලා තිබ්බෙ ප්‍රසිද්ධ ස්ථානවල දේශපාලන විහිළු කරන්න එපා කියලයි. ඒත් පසුගිය අවුරුදු දෙක ඇතුළත තමයි මට මුලින් ම අහන්න ලැබුනෙ බස් එකේ යන අය ආණ්ඩුව ගැන විහිළු කරනවා. ඇත්ත වශයෙන්ම, මීට කලින් වුණත් රජය විවෘතව විවේචනය කළ අය සිටියා වුණත් ඔවුන් ඒක කළේ ඉතාම බැරෑරුම් විදිහට.

නිදහසින් පසු පුවත්පත්වල දේශපාලන කාටූන් ප්‍රධාන අංගයක් වී තිබේ. නමුත් ඒවා තුළ බලයේ සිටින අයව සමච්චලයට ලක් කිරීමේ සංකල්පය ඉහළ පෙළේ මාධ්‍යවේදීන්ගේ වපසරිය තුළ පවතින බවක් පෙනෙන්නට තිබුණි. මෙම මාධ්‍යවේදීන් ප්‍රභූ පැළැන්තියෙහි ස්වකීය සාමාජිකත්වය ද නොතකා, ඔවුන්ගේ විවේචනාත්මක විවරණ හේතුවෙන් 2015 ට පෙර වසරවල දී විවිධ පීඩාවන්ගේ ඉලක්ක බවට පත් වූහ. මේ නිසා, විවේචන සිදු කිරීමේ දී සිදු විය හැකි ප්‍රතිවිපාක ඉතා බරපතල විය හැකි බැවින් සාමාන්‍ය පුද්ගලයින් ප්‍රසිද්ධියේ දේශපාලන විවේචන සිදු කිරීමේ දී ප්‍රවේශම් වීමේ නැඹුරුතාවයක් තිබේ. කෙසේ වෙතත්, මෑත වසරවල දී, විශේෂයෙන් 2015 මැතිවරණයෙන් පසුව, දේශපාලන විවේචන වඩාත් දෘශ්‍යමාන සහ නිරන්තරයෙන් සිදුවන්නක් බවට පත් වී තිබේ. විශේෂයෙන්ම, අන්තර්ජාලයට සහ සමාජ මාධ්‍ය අවකාශයන්ට වැඩි ප්‍රවේශයක් ලැබීමත් සමග මෙම අවකාශයන් තුළ ඇති වූ නිර්නාමිකභාවය සහ 2015 මැතිවරණයෙන් පසු මාධ්‍ය නිදහසේ සංසන්දනාත්මක වැඩිවීමත් සමග ද දේශපාලන විවේචන වඩාත් දෘශ්‍යමාන සහ නිරන්තරයෙන් සිදුවන්නක් බවට පත් වී තිබේ. ඒ සමගින් මීම් (meme), දේශපාලන සන්නිවේදනයේ සහ දේශපාලන විවේචනයේ ප්‍රධාන මෙවලමක් බවට පත්විය. මීම්, හාස්‍යය තුළින්, පුද්ගලයින්ට සිතන්නට පෙළඹ වූ අතර, ඒවා සමාජ මාධ්‍ය භාවිත කරන ජනතාව අතර ප්‍රචලිත වීමට අතිශයින් උදව් විය (භාරතී, 2021). සමාජ මාධ්‍ය හරහා වූ මෙම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස

ඉක්මනින් මාර්ගගත නොවන භෞතික ලෝකය වෙතට පරිවර්තනය වූ අතර ප්‍රසිද්ධියේ, සමහර විට පොලිස් නිලධාරීන් සහ වෙනත් බලාධිකාරීන් ඉදිරියේ පවා විහිළු කිරීම සඳහා ආරක්ෂිත බවක් පුද්ගලයින්ට දැනුණි. හැෂ්ටැග් මෙන්ම, මේ වසරේ බෙදාගත් සහ බෙදා හරින ලද මීම් දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රවල වර්ධනයන් පිළිබඳ අවබෝධයක් ලබා දෙයි.

## බලාධිකාරී-විරෝධී හාස්‍ය

පුරවැසියන් බලාධිකාරිය පිළිබඳ සමච්චල් කරන විට, එකී බලාධිකාරී චරිතවලට ද වැරදීම් සිදුවිය හැකි බව ඔවුන් හඳුනා ගනී. මෙම බලාධිකාරී චරිත සමච්චල් කිරීම් හරහා, එක් අතකින් ඔවුන්ව ඔසවා තබා ඇති විශේෂ වේදිකාවලින් මහ පොළොවට ගෙන එනු ලබන අතර, ඔවුන් ව සුපිරි චරිත නොව මනුෂ්‍යයින් බවට නැවතත් පත් කිරීම සිදු කරයි (වර්ඩෙරි 1999). මාර්ගගත සහ මාර්ගගත නොවන අවකාශ තුළ ඇතැම් චරිත සමච්චලයට ලක් කිරීමෙන් බලාධිකාරිය ප්‍රතික්ෂේප කිරීමක් විය. බොහෝ දුරට, අරගලය තුළ භාවිත කළ වඩාත්ම හඳුනාගත හැකි සමච්චලයවූයේ 'කපුටු කාක් කාක්' තාලයට මෝටර් රථ රියදුරන් නළා වාදනය කිරීම දැක්විය හැක. මෙසේ වාදනය කිරීම 2022 ජූලි මාසයෙන් පසු රජයේ මර්දනය අතරතුර පුද්ගලයින්ව අත්අඩංගුවට ගැනීමට ද හේතු විය. පොලිසියේ බලාධිකාරයට සහ අනෙක් බලාධිකාරයන්ගේ නියෝජිතයින් ප්‍රතික්ෂේප කිරීම මෙම බලධාරීන් සමඟ මහජනතාවගේ ඍජු අන්තර්ක්‍රියා වලදී මෙන් ම, මීම් හරහා ද සිදුවනු නිරීක්ෂණය විය. නිදසුනක් වශයෙන්, ගෝඨාගෝගම වැසියන් විරෝධතා භූමියේ සිදු වූ සොරකමක් පිළිබඳ විමර්ශනය කිරීම නවත්වන ලෙස පොලිසියෙන් ඉල්ලා සිටි අතර, එය ඔවුන්ගේ ගම තුළ බැවින් සිදු වූ බැවින් ඔවුන් විසින් ම ඒ ගැන කටයුතු කරන බව ඔවුහු කියා සිටියහ.

බලාධිකාරියට යොමුවූ මෙම සමච්චලය ගීත සහ මීම් හරහා සමහර අවස්ථාවලදී 2019 දී රාජපක්ෂට ඡන්දය දුන් '69 ලක්ෂය' දක්වා ව්‍යාප්ත විය. මෙම ඡන්දදායකයින් පහසු ඉලක්ක වූ අතර රාජපක්ෂ තෝරා පත් කර ගැනීමේ දී ඔවුන්ගේ අදූරදර්ශී බව පිළිබඳ මීම් නිර්මාණය කරන්නන් ඔවුන්ට දොස් පැවරූහ. රාජපක්ෂ ඡන්ද පදනමේ බහුතරයක් පැමිණෙන්නේ තම අවශ්‍යතා අනෙකුත් පක්ෂ විසින් නොසලකන බව විශ්වාස කළ ජන ප්‍රජාවකිනි. සිය ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද අයිතිය ක්‍රියාත්මක කිරීමේ දී, ඔවුන් ඡන්දය දුන්නේ තම අවශ්‍යතා සඳහා හොඳින් ම සේවය කරන අපේක්ෂකයාට ය. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ජාතිකවාදී බලමුළු ගැන්වීම ද සමාජ ආර්ථික පන්තියේ රේඛා ඔස්සේ ඒකාබද්ධ වේ. එබැවින්, මෙම පුද්ගලයින් සමච්චලයට ලක් කිරීම සහ විසුළුවට පාත්‍ර කිරීම පන්ති මත පදනම් වූ ක්‍රියාවක් ලෙස අර්ථ දැක්විය හැකි ය.

සමච්චල් කිරීම ප්‍රතිරෝධය දක්වන ආකාරයක් ලෙස හඳුනාගෙන ඇත. එය පීඩිත කණ්ඩායම්වල සහ පන්තිවල ආයුධය ලෙස ද හඳුනාගෙන ඇත (ස්කොට් 1985). බලයේ සිටින අයට එරෙහිව ප්‍රතිරෝධය ප්‍රකාශ කිරීම නීත්‍යානුකූල වන අතර, බලය දරන්නන් විවේචනයේ සහ සමච්චල් කිරීමේ නීත්‍යානුකූල ඉලක්කයන් වේ. නමුත් සමච්චල් කිරීමට ලක්වන අය එම සමච්චලය කරන අයට වඩා අඩු බලයක් ඇති අය නම් ඔවුන් ව සමච්චලයට ලක් නොකළ යුතු ය. දේශපාලන පෙරළියක දී සමාජ තත්ත්වය සහ සමාජ තනතුරු වෙනස් වන බව අපි මතක තබා ගනිමු.

## ස්ථාන නැවත නම් කිරීම

ස්ථාන නාම යනු සමාජ, ආර්ථික සහ දේශපාලන වෙනස්කම් පිළිබඳ තොරතුරු මූලාශ්‍ර වේ (බ්ලොක් 2006). ස්ථානයක් නැවත නම් කිරීම යනු එය නැවත අත්පත් කර ගැනීමකි (හෝ විකල්පයක් ලෙස, එයට පැරණි හිමිකම් පෑමක් සිදු කිරීමකි). පශ්චාත් යටත් විජිත යුගයේ දී යටත්විජිතවාදී නාම වෙනුවට ජාතිකවාදීන්ගේ නාමස්ථාන නාම සම්බන්ධයෙන් ආදේශ කිරීමේ ආරාවුල්වලින් මෙය පැහැදිලි වේ. කොළඹ නගරයේ යටත් විජිත උරුමය පිළිබිඹු කිරීමේ සිට ඊට වෙනස්ව පශ්චාත් යටත් විජිත සහ 'ජාතික' ඉතිහාසයක් පිළිබිඹු කිරීම දක්වා ස්ථාන නාමවල වෙනස්කමක් පසුගිය දශකයක පමණ කාලය තුළ දැකිය හැක. ස්ථානවල නම් අරභයා ඇති වූ මෙම අරගලය දිවයිනේ උතුරු නැගෙනහිර ප්‍රදේශවලට ද ව්‍යාප්ත වී ඇත. බලයේ නව භාරකරුවන් අවකාශයක් නැවත නම් කිරීමට තම බලය ක්‍රියාත්මක කරන විට. ඒ අවකාශයට හෝ භූමියට ඇති පැරණි හිමිකම් කීම් මකා දැමීමටත්, ඔවුන් වැදගත් යැයි සලකන අදහස් සහ විශ්වාසයන් ස්ථාපනය කිරීමටත් හැකියාව ලබා දෙයි (පාම්බර්ගර් 2012). ස්ථානවල නම් වෙනස් කිරීම සාමාන්‍යයෙන් බලාධිකාරීන් විසින් සිදු කරන අතර, අරගලයට සම්බන්ධ විරෝධතාකරුවන් ස්ථානවල නම් වෙනස් කිරීමේ අයිතිය තමන් වෙත පවරා ගැනීමෙන් අදහස් කළේ යම් යම් අවකාශයන් සඳහා රජය විසින් කරන හිමිකම් කීම ප්‍රතික්ෂේප කිරීමයි.

ගාලු මුවදොර ප්‍රදේශය සාමූහිකව ගෝඨාගෝගම ලෙස හඳුන්වනු ලැබූ අතර, ඇතැමුන් Google සිතියම්වල ද එම ස්ථානය නැවත නම් කරනු ලැබීය. අරලියගහ මන්දිරයෙන් පිටත පිහිටුවා තිබූ විරෝධතා කඳවුර 'මයිනාගෝගම'[5] ලෙස හැඳින් වූ අතර, කෙටි කලක් පැවති පාර්ලිමේන්තුව අසල වූ විරෝධතා කලාපය 'හොරුගෝගම'[6] විය. ජනතාව නිල නාම ප්‍රතික්ෂේප කරමින් මෙම නම් වලින් මෙම ස්ථාන හැඳින්වීමට පටන් ගත්හ.

# නිගමනය

වචනාර්ථයෙන් ගත් කල මාර්ගගත ලෝකය වෙත අපගේ ඇඟිලිතුඩුවලින් ප්‍රවේශ විය හැකි සමාජයක අතථ්‍ය (virtual) ලෝකය සහ සැබෑ ලෝකය අතර පැහැදිලි වෙනසක් නොමැත. මේ දෙක අතර වෙනස හඳුනා ගැනීමට සම්මතයක් ලෙස අපට පාවිච්චි කළ හැකි ක්‍රමයක් නොමැත. අරගලයේ සමාජ මාධ්‍ය ප්‍රවණතා දේශපාලන සාකච්ඡාව සහ දේශපාලන ක්‍රියාව පුරා විහිදී යයි. මෙම දේශපාලන පිටාර ගැලීම, විවිධ ස්ථරවල, විවිධ ස්ථානවල සහ පෙර නොවූ විරූ ලෙස විශාල මහජන පිරිසක් අතර සිදුවෙමින් පවතින සිදුවීම් ආවරණය කිරීම, බලමුළු ගැන්වීම සහ බලාධිකාරියට ප්‍රතිරෝධය දැක්වීම විරෝධතා ව්‍යාපාරයට ප්‍රබල බලපෑමක් ඇති කරති. සිදුවෙමින් පවතින සිදුවීම් සමඟ විරෝධතාකරුවන්ට ඉතා සමීප බවක් සමාජ මාධ්‍ය විසින් නිර්මාණය කර ඇත.

පුරවැසි මාධ්‍යවේදීන්ගේ එසේත් නැතිනම් බොහෝ විට කැමරා දුරකථනයක් අතැති පුද්ගලයින්ගේ ආගමනය රාජ්‍යයට සහ බලාධිකාරියට අභියෝග කරන අතර, විරෝධතා අතරතුර ඒවාගෙන් පුරවැසියන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමට සහ එසේ කළහොත් ඒවායින් බේරීමට ඇති ඉඩකඩ අඩු කරයි. සමාජ මාධ්‍ය ද විරෝධතා ව්‍යාපාරවලට බිම් මට්ටමේ සිට වර්ධනය වීමට ඉඩ සලස්වන අතර බහුවිධ පුද්ගලයන් එතුළ නායකත්ව භූමිකා භාර ගනිති. මෙමඟින් නායකත්වය පිළිබඳ සම්ප්‍රදායික සංකල්ප අභියෝග ලක් කෙරී ඇත.

සමාජ මාධ්‍ය ද්විත්ව භූමිකාවක් ඉටු කරයි. සාම්ප්‍රදායික මාධ්‍ය මෙන්, එය එහි පුළුල් භාවිතය හරහා සන්නිවේදන මාධ්‍යයක් ලෙස ක්‍රියා කරන අතර ම ඉක්මණින් සහ වැඩි මුදලක් නොයොදවා පුද්ගලයින් දහස් ගණනක් බලමුළු ගැන්වීමේ හැකියාව ඊට ඇත. මෙම බලමුළු ගැන්වීම ද පුද්ගල කැමැත්ත සහ තීරණය මත රඳා පවතී. උද්යෝගය ඇතිකිරීම සහ එය නොකඩවා පවත්වාගෙන යෑම මගින් ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමට සමාජ මාධ්‍ය හරහා විරෝධතාකරුවන්ට මෙවලම් සපයයි. මෙය සිදු කරනු ලබන්නේ සරල හැෂ්ටැග් මෙන් ම වඩාත් සංකීර්ණ තාක්ෂණික සාධක භාවිත කිරීමෙනි, එමඟින් ශක්තිමත් මෙවලම් සහ විරෝධතා අවකාශ නිර්මාණය කරයි.

සමාජ මාධ්‍ය බලාධිකාරයට එරෙහි ව අක්‍රීය ප්‍රතිරෝධයන් සඳහා වේදිකාවක් ලෙස ද ක්‍රියා කරයි. මීම් බෙදාගැනීම, දේශපාලන මතය නිදහසේ ප්‍රකාශ කිරීම සහ ස්ථාන නැවත නම් කිරීම/නැවත ලබා ගැනීම හරහා සමාජ මාධ්‍ය ප්‍රතිරෝධයේ අඩවියක් බවට පත්වේ.

මාර්ගගත අවකාශය යනු මාර්ගගත නොවන භෞතික අවකාශයට විකල්පයක් වශයෙන් සහ ඉන් වෙන්ව පවතින අවකාශයක් වශයෙන් සැලකීම වැරදි මතයකි. එම මතය පදනම් වී ඇත්තේ පුද්ගලයන් අවකාශයන් දෙක සමග සම්බන්ධ වන ආකාරය, සහ වර්තමාන ලෝකයේ විරෝධතා ව්‍යාපාරවල ස්වභාවය පිළිබඳ ඇති මූලික වැරදි වැටහීමක් මත ය. වර්තමාන සමාජය තුළ, බොහෝ දෙනෙක්ට සමාජ මාධ්‍ය වෙත යම් ආකාරයක ප්‍රවේශයක් ඇති අතර, ඔවුන් මාර්ගගත සහ මාර්ගගත නොවන යන අවකාශයන් දෙකෙහි ම හැසිරෙති. මෙම රචනය එක් නොබෙදුණු අරගලයක් පිහිටුවීම සඳහා එකට එකතු වන මාර්ගගත සහ මාර්ගගත නොවන ක්‍රියාකාරකම් ලෙස විරෝධතා ක්‍රියාකාරකම් නිරූපණය කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. මෙම ප්‍රයත්නයේ දී, මෙම රචනය, මාර්ගගත සහ මාර්ගගත නොවන විවිධ අවකාශයන් හරහා, අතථ්‍ය අවකාශය තුළ, වඩා හොඳ දේශපාලන පර්යායක් සඳහා අරගල කරන පුරවැසියන්ගේ චිත්තවේගීය අවකාශයන් තුළ සැරිසරා තිබේ.

## සටහන්

[1] සමාජ මාධ්‍ය යනු හුදෙක් සන්නිවේදන මාධ්‍යයක් නොව විරෝධතා සඳහා වන අවකාශයක්ය යන අදහස මෑත සාහිත්‍යයේ ගවේෂණය කරයි.

[2] Poell, Thomas සහ Jose van Dijck විසින් පැහැදිලි කරන ලද පරිදි සමාජ මාධ්‍ය විරෝධතා ව්‍යාපාරවල 'සම්බන්ධක නායකයින්' විසින් සාමාන්‍යයෙන් ඉටු කරන කාර්යභාරය මෙයයි 2018.

[3] https://www.facebook.com/PeoplesUniversityGGG/videos/565501075181279

[4] Poell and van Dijck, 2018 ට අනුව෴ විමධ්‍යගත සමාජ මාධ්‍ය විරෝධතා සන්දර්භයක් තුළ නායකත්වයේ ක්‍රියාකාරකම් පැහැදිලි වන සෑම අවස්ථාවක ම ප්‍රතිඵලයක් විය හැකි ය.

[5] මයිනා යනු අරගලය විරෝධතාකරුවන් විසින් මහින්ද රාජපක්ෂ මහතාට ලබා දී තිබූ නමයි.

[6] හොරා යනු හොර හෝ හොරු යන අරුත් ගන්වන සිංහල වචනයෙන් අදහස් වන්නේ පාර්ලිමේන්තුව හොරුන්ගේ ගමක් යන අරගල මතයයි.

# ගෝඨාගෝගම මහජන සරසවිය: විකල්ප බුද්ධිමය අවකාශයක් අත්හදා බැලීමක්

*සමල් විමුක්ති හේමචන්ද්‍ර**

*මේ ලිපියෙන්, අරගලය පසුබිමෙහි ගෝඨා ගෝ ගම මහජන සරසවියේ ගමන්මග සොයා යයි. එම විශ්වවිද්‍යාලයේ ආරම්භක සාමාජිකයකු වූ මෙම කතුවරයාගේ දෘෂ්ටිකෝණයෙන් සම්පාදිත මෙම ලිපියෙහි සමානාත්මතාවාදී සමාජයක් සඳහා සටන් කරන කුඩා කණ්ඩායමක කැපවීම හා වෙහෙස පිළිබඳව විස්තරයක් සපයාදෙයි.*

## හැඳින්වීම

'ගෝඨාගෝගම මහජන සරසවිය' යනු ශ්‍රී ලාංකේය ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ අති දැවැන්තම ජනතා නැඟීටීම වන අරගලය/පෝරාට්ටම් සඳහා අප ලබා දුන් දායකත්වය යි. අරගලයෙහි දැවැන්තබාවය සැලකිල්ලට ගත් විට, මෙම මහජන සරසවිය සිස්ටම් වෙනසක් සහ තම දරුවන්ට සහ තරුණ පරම්පරාවන්ට වඩා හොඳ අනාගතයක් ඉල්ලා සිටි මහා ජන සාගරයට එකතු වූ දිය බිඳුවක් විය. මෙම ලිපිය අරගලය සන්දර්භය තුළ මහජන සරසවියෙහි ගමන් මඟ විස්තර කිරීමට උත්සහ දරයි. මම මෙම විශ්වවිද්‍යාලයේ ආරම්භක සාමාජිකයෙකු වන අතර මෙම ලිපිය මාගේ දෘෂ්ටිකෝණයෙන් මහජන සරසවිය දකිනු ලබන්නකි. අරගලයේ සමස්ත කතාව ලිවිය නොහැක්කා සේ ම, මෙම ලිපියෙන් මහජන සරසවියේ සමස්ත කතාව අන්තර්ගත නොවන බවත්, මම එහි සියලු ම සාමාජිකයින් වෙනුවෙන් පෙනී නො සිටින බවත් මවිසින් අවධාරණය කළ යුතුය. එහෙත්, එය ශ්‍රී ලංකාව වඩා හොඳ තැනක් බවට පත් කිරීමට අවැසි. කුඩා පිරිසකගේ ශ්‍රම දායකත්වය පිළිබඳ වාර්තාවක් සපයා දෙයි.

ගෝඨාගෝගම මහජන සරසවිය ගෝඨාගෝගම පරිශ්‍රයේ පිහිටි ගෝඨාගෝගම පුස්තකාලයට යාබද ව 2022 අප්‍රේල් 16 වැනි දින ආරම්භ කරන ලදී. ආරම්භයේ දී මහජන සරසවි කණ්ඩායම 11 දෙනෙකුගෙන් සමන්විත විය. පසුව, පුද්ගලික හේතු මත සහ මහජන සරසවියේ සැසි සඳහා සමහර කථිකයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් ඇති වූ නො එකඟතා මත දෙදෙනෙකු කණ්ඩායමෙන් ඉවත් වූ අතර, මහජන සරසවියේ ක්‍රියාකාරකම් දැකීමෙන් පසු ව තවත් හත්දෙනෙතක් එයට ස්වේච්ඡාවෙන් එක් වූහ. 2022 මැයි මස 12 වැනි දින ඇති වූ අයහපත් කාලගුණය හේතුවෙන් මහජන සරසවිය පිහිටි කූඩාරම සම්පූර්ණයෙන් ම විනාශ වූ අතර, හිතවතුන්ගේ සහයෝගය ඇති ව පෙරට වඩා හොඳ ව්‍යුහයක් ඉදිකර මැයි මස 16 වැනි දින එය නැවත

* සමල් විමුක්ති හේමචන්ද්‍ර කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ කථිකාචාර්යෙකි (පරිවාස)

*මෙම ලිපිය පරිවර්තනය කිරීමේදී කසුන් මහේෂාන් බංඩාර දැක්වූ සහයෝගයට අපි කෘතඥපූර්වක වන්නෙමු*

ආරම්භ කරන ලදී. මහජන සරසවිය ආරම්භයේ සිට 2022 අගෝස්තු 12 වන දින ගෝඨාගෝගම විසුරුවා හැරීම දක්වා වූ කාලය තුළ දේශපාලනය, සංස්කෘතිය, නීතිය සහ ක්‍රීඩා ඇතුළු මාතෘකා රාශියක් යටතේ සැසි 53ක් පවත්වන ලදී. එම සැසි 53 අතරින් සැසි 36ක් මහජන සරසවිය විසින් සංවිධානය කරන ලද අතර, ඉතිරි සැසි අරගලයට දායක වීමට කැමති වෙනත් සංවිධාන විසින් සංවිධානය කරන ලදී.

මෙම ලිපිය තුළ මහජන සරසවිය පිළිබඳ අදහස ඇති වූ ආකාරය පළමු ව සාකච්ඡා කරනු ලැබෙන අතර එහි දී මෙම අදහස එක් පුද්ගලයෙකුගේ මනසෙහි ඇති වූවක් නොවන බවත්, එය විවිධ පුද්ගලයින්ගේ සහ කණ්ඩායම්වල ක්‍රියාවන් තුළින් පැන නැඟුණු අදහසක් බවත් පෙන්වා දෙයි. දෙවනු ව, මහජන සරසවිය ක්‍රියාත්මක වූ ආකාරය පැහැදිලි කර දෙයි. අවසාන වශයෙන්, මහජන සරසවියෙන් සිදු වූ බලපෑම සහ අරගලය සමග මහජන සරසවියට තිබූ සම්බන්ධතාව පිළිබඳ ව විවේචනාත්මක ඇගයීමක් මෙමඟින් සිදු කරයි.

## මහජන සරසවියේ මූලාරම්භය - එය නිර්මාණය කිරීමට මඟ පෑදූ කතා පිළිබඳ සාරාංශය

විදේශගත ව සිටීම හේතුවෙන් අරගලයට භෞතික ව සහභාගි වී සහාය වීමට නො හැකි වූ, එහෙත් අරගලයට උපකාර කිරීමට අවශ්‍ය වූ සෞම්‍යා අමරසිංහගේ මිතුරන් පිරිසක් අරගලය වෙනුවෙන් ඇයට සුදුසු යැයි සිතන ඕනෑම කාර්යයක් කිරීම සඳහා රු. 58,000ක මුදලක් එවා තිබුණි. ඇයට මුලින් අවශ්‍ය වී තිබුණේ එම මුදලින් විරෝධතාකරුවන් සඳහා ජල බෝතල් සහ ආහාර වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීමට යි. අප මෙම මුදල් එක වරක් පමණක් සිදු කළ හැකි ක්‍රියාවක් සඳහා නොව, අපට බුද්ධිමය සාකච්ඡාවල නිරත විය හැකි අවකාශයක් වන මහජන සරසවියක් පිහිටුවීම සඳහා ආයෝජනය කළ හැකි යැයි මම ඇයට යෝජනා කළෙමි. ඇය එම යෝජනාවට එකඟ වූ අතර, පසුව අපි අපේ අදහස් හා සමාන අදහස් ඇති මිතුරු ක්‍රියාකාරීන් සමඟ මෙම අදහස කතා කළෙමු. අපගේ මහජන සරසවි කණ්ඩායම ගොඩනැඟුණේ ඒ අයුරිනි. ගෝඨාගෝගම මහජන සරසවිය පිළිබඳ දන්න අය විසින් මා මෙම ව්‍යාපෘතියේ 'නායකයා' ලෙස සලකනු ලබන බව මට තේරුම් ගොස් ඇතත්, ගෝඨාගෝගම මහජන සරසවිය ගොඩනැගීමට තනි පුද්ගලයෙකුගේ උත්සාහයකට වඩා බොහෝ පුද්ගලයින්ගේ සහ කණ්ඩායම්වල අදහස් සහ දායකත්වයන් ද ඉවහල් වූයේ ය යන්න මම එකල දැරූ අදහස ම, මෙම ලිපියේ ඉදිරි ඡේදවල දී ඔබට දැක ගත හැකි ය.

"මහජන සරසවිය" යන යෙදුම මට මුලින් ම අසන්නට ලැබුණේ නිර්මාල් දේවසිරිගෙනි. ඒ වසර කිහිපයකට පෙර, ආන්තිකකරණය කරනු ලැබූ ප්‍රජාවක් ජීවත් වූ ස්ථානයක් වන වේයන්ගොඩ ප්‍රදේශයේ සුසාන භූමියක් අසල මහජන සරසවියක් ස්ථාපිත කළ යුතු බවට ඔහු 2016-17 කාලයේ දී මට යෝජනා කළේ ය. එහෙත් එකල අපිට එම අදහස ක්‍රියාවට නැංවීමට නො හැකි විය. නමුත් මෙම අදහස ගෝඨාගෝගම පිහිටුවීමට පෙර 2022 අප්‍රේල් මස 8 වැනි දින නිදහස් චතුරශ්‍රයේ පැවති 'teach out' වැඩසටහන අතරතුර නැවතත් මට මතක් විය. Hashtag Generation සහ Delete Nothing යන සංවිධාන විසින් මෙම 'teach out' වැඩසටහන සංවිධානය කර තිබුණි. එහිදී සාකච්ඡා දෙකක් සිදු කරන ලද අතර, ඉන් එක් සාකච්ඡාවක් මගින් විධායක ජනාධිපති ක්‍රමය සහ ආර්ථික අර්බුදය පිළිබඳ මූලික දළ විශ්ලේෂණයක් සපයා දීම කෙරෙහි ද, අනෙක් සාකච්ඡාව මගින් 20 වැනි සියවසේ ශ්‍රී ලංකාවේ විරෝධතා පිළිබඳ ඓතිහාසික පර්යාවලෝකනයක් ලබා දීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන ලදී. මම කිසි දිනෙක විරෝධතා භූමියක් තුළ බුද්ධිමය සාකච්ඡාවකට සහභාගීවී නො තිබූ නිසා මෙය මට ප්‍රබෝධමත් අත්දැකීමක් වූ අතර, එම සාකච්ඡා දෙකේ දීම ජනතාව ඒ කෙරෙහි දැක් වූ සක්‍රීය මැදිහත් වීම් මා අකර්ශනීය කරන ලදිමි. එම සාකච්ඡා දෙකටම භාෂා තුනෙන් ම සවන්දීමේ සහ සම්බන්ධ වීමේ පහසුකම් සලසා තිබුණ ද, ඒ තුළ ප්‍රභූ පිරිස කෙරෙහි යම් නැඹුරුවක් තිබූ බව මට හැඟුණි. එනම් එම සාකච්ඡා මූලිකව ම ඉංග්‍රීසි භාෂාවෙන් සිදු වූ බැවින් සිංහල කථිකයෙකු ලෙස සාකච්ඡාවට සම්බන්ධ වීමට මට එම අවකාශය ඉඩ ලබා නො දුණි. 2022 අප්‍රේල් 12 වැනි දින සවස පැවති නිර්මාල් දේවසිරිගේ දේශනය අතරතුර දී ඇති වූ මහජන සරසවිය අදහස ගෝඨාගෝගම මහජන සරසවිය බිහිවීමට ආසන්නතම හේතුව විය. මුල දී එම සාකච්ඡාව ගෝඨාගෝගම තුළ වෙනත් ස්ථානයක පැවැත්වීමට සැලසුම් කර තිබුණද, විරෝධතාකරුවන්ගේ ඝෝෂාව සහ වෙනත් ක්‍රියාකාරකම් හේතුවෙන් එය බණ්ඩාරනායක පිළිරුව අසලට රැගෙන යන ලදී. එමෙන්ම සම්පූර්ණ කථාව ම පවත්වන ලද්දේ දැඩි වර්ෂාව මධ්‍යයේ ය. එවැනි සියලු බාධා මධ්‍යයෙහි වුව ද එම කථාව සහ සාකච්ඡාව පැය දෙකකට ආසන්න කාලයක් පුරා පැවැත් වුණි. බුද්ධිමය සංවාද සඳහා අපට ගෝඨාගෝගම තුළ නිශ්චිත අවකාශයක් තිබිය යුතු බවට මට ඒත්තු ගියේ මේ අවස්ථාවේ දී ය. ගෝඨාගෝගම තුළ පුස්තකාලය පිහිටුවීම මහජන සරසවියක් පිහිටුවීමේ අදහසට උත්තේජනයක් විය. මෙම පුස්තකාල පාඨකයින්ට

තමන් කියවන දෙය සහ තමන්ට මේ මොහොතේ අත්දකින දේ [මහජන නැගිටීම] පිළිබඳව සාකච්ඡා කිරීමට හා විවාද කිරීමට අවකාශයක් නිර්මාණය කිරීම කාලෝචිත මැදිහත්වීමක් ලෙස මම දුටුවෙමි. මම ඉහත දැක්වූ සිදුවීම් මඟින් අවධාරණය කළ යුතු වන්නේ, ඕනෑම අයෙකුට නිදහසේ තම අදහස් හා මත ප්‍රකාශ කිරීමට හැකි දැනුම බෙදා ගැනීමේ අවකාශයක් වන මහජන සරසවියක් පිළිබඳ අදහස මගේ සිතෙහි පමණක් ඇති වූවක් නොවන බව ය. අරගලය දියත් කිරීමට බොහෝ කලකට පෙර සිට ම අපගේ දේශපාලන ක්‍රියාකාරීන් අතර මෙම අදහස සංසරණය වූ අතර එය සැබෑ වූයේ අරගලය අතරතුර සිදු වූ, ඉහත කී අනෙකුත් මේ හා සමාන ක්‍රියාකාරකම්වල ශක්‍යතා සහ දුර්වලතා නිරීක්ෂණය කිරීමෙන් පසුවය. ඒ වන විට ගෝඨාගෝගම මහජන පුස්තකාලය කුඩාවට පිහිටුවා තිබූ අතර, ඉන් අනතුරුව එළඹි මාසවලදී. එය විශාල වශයෙන් වර්ධනය වූ අතර, පුස්තකාලය සහ මහජන සරසවිය නිසා ගෝඨාගෝගම පරිශ්‍රය තුළ මෙම අවකාශය අතිශයින් ක්‍රියාකාරී වූ අතර සෑම තරාතිරමකම ජනතාව පොත්පත් කියවීමට හා සාකච්ඡා කිරීමට පැමිණියහ.

මහජන සරසවි කණ්ඩායම පිහිටුවා ගැනීමෙන් පසු අපි සාමූහිකව එක්ව මහජන සරසවියේ අරමුණු සහ අරගලය තුළ එහි ක්‍රියාකාරිත්වය කෙසේ විය යුතු ද යන්න පිළිබඳ දැක්වෙන ලියවිල්ලක් (මැන්ඩේටයක්) සකස් කළෙමු. අපි ජනතා විශ්වවිද්‍යාලයෙහි අරමුණු ලෙස පහත සඳහන් අරමුණු තුන අවධාරණය කළෙමු.

1. ගෝඨාගෝගම තුළ ඇති විවිධ දේශපාලන, සමාජ, ආර්ථික අදහස් එක් තැනකට කැටි කර, එම අදහස් හා මත එකට ගැටෙන වේදිකාවක් නිර්මාණය කිරීම.

2. 2022 මාර්තු 31 වැනි දින සිට ගොඩනැගෙමින් පවතින අලුත් ශ්‍රී ලංකාවේ අනාගතය පරිකල්පනය කිරීම.

3. නිදහස සහ සමානාත්මතාවය මත පදනම් වූ විකල්ප බුද්ධිමය අවකාශයක් අත්හදා බැලීම.

ගෝඨාගෝගම පිහිටුවීමේ දී, දේශපාලන මතවාද, ජනවාර්ගිකත්වය සහ ලිංගික දිශානතිය අනුව විවිධත්වයකින් යුත් පිරිසක් රැස් ව සිටි බව අපට නිරීක්ෂණය විය. මෙම කණ්ඩායම්වලට එකට එක්වී ඔවුන්ගේ අදහස් හා අවශ්‍යතාවයන් පිළිබඳ සාකච්ඡා කිරීමට අවකාශයක් නො තිබුණි. එබැවින්, මහජන සරසවි අවකාශය විවිධ මාතෘකා පිළිබඳව අදහස් සහ මත සාකච්ඡා කිරීම සඳහා ජනතාව එක්රැස්වන ස්ථානයක් ලෙස භාවිත කිරීම පළමුවන අරමුණ විය. දෙවෙනි අරමුණ වූයේ මහජන සරසවිය අනාගතය මූලික කරගත යුතු බවයි. එනම් මහජන සරසවිය ශ්‍රී ලංකාව සඳහා විකල්ප අනාගතයක් දැකිය හැකි අවකාශයක් වීමට අපේක්ෂා කළේය. සහභාගීත්වයේ දී හා සාකච්ඡාවේ දී නිදහස සහ සමානාත්මතාවය සහතික කරන විකල්ප බුද්ධිමය අවකාශයක් අත්හදා බැලීම අවසාන අරමුණ විය. අපේ කණ්ඩායමේ බහුතරය සම්ප්‍රදායික විශ්වවිද්‍යාල පද්ධතියෙන් පැමිණි අය වන අතර, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල පවතින ධුරාවලි ව්‍යුහය පිළිබඳ ව අපි දැඩි ලෙස විවේචනාත්මක වූයෙමු. එබැවින් පරමාදර්ශී බුද්ධිමය අවකාශයක් යැයි අප විසින් විශ්වාස කරන ලද දෙය ප්‍රායෝගිකව ක්‍රියාවෙහි යෙදීමට ගෝඨාගෝගම අවකාශය අපට කදිම අවස්ථාවක් විය.

අපි අපගේ අරමුණු සකස් කර අවසන් වූ පසු, අපගේ ඊළඟ අභියෝගය වූයේ එම අදහස් සැබෑ කර ගැනීම ය. අප සතුව තිබූ මුදල් මෙහිදී ප්‍රමාණවත් නොවන බව අප දැන සිටි අතර, මෙවැනි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පූර්ව අත්දැකීමක් නො තිබූ නිසා මුදල් එකතු කරගන්නේ කෙසේදැයි අපි දැන නො සිටියෙමු. එබැවින් මේ කර්තව්‍යයට උදව් ලබා ගැනීම සඳහා මගේ පාසල් මිතුරෙකු අපි අප්‍රේල් 14 වැනි දින හමු වුනෙමු. ඔහු ශ්‍රී ලංකාවේ විවිධ ජනවර්ග අතර සාමය ප්‍රවර්ධනය කිරීම සඳහා එකට එක්වී සිටින තරුණයින්, වෘත්තීයවේදී කණ්ඩායම් සහ උනන්දුවක් දක්වන පුද්ගලයින්ගෙන් සමන්විත Rise Up Sri Lanka නැමැති සංවිධානයේ සාමාජිකයෙකු වූ අතර ඔවුන්ට ගේට් සීරෝ (Gate Zero) ප්‍රදේශය ආසන්නයේ මුහුද දෙසට වන්නට කුඩාරම් දෙකක් තිබුණි. ඔහු අපගේ අදහස ඉතා අගය කළ අතර, එම කුඩාරම් දෙකෙන් එකක් අප වෙත ඒ මොහොතේ දී ම පිරිනැමුවේය. අපි එම කුඩාරම ගෝඨාගෝගම මහජන පුස්තකාලය අසළට ගෙන ගියෙමු. එම ස්ථානයේ කුඩාරම ස්ථාපිත කිරීමේ ක්‍රියාව සුන්දර අත්දැකීමක් විය. මම ශාන්ත ජෝන් ගිලන්රථ බලකාය භාවිත කළ කුඩාරමෙන් තාවකාලිකව ඉල්ලා ගත් ලොකු මිටියක් භාවිත කළ අතර, පුස්තකාලයේ කාර්ය මණ්ඩලය කුඩාරම ඉදිකිරීමට අපට උදව් කළහ. සහයෝගීතාව, සාමූහික ප්‍රයත්නය සහ බෙදාහදා ගැනීම ගෝඨාගෝගම පණගැන්වූ අත්‍යාවශ්‍ය අංගයන් වූ අතර, අපි සියලු දෙනා එකිනෙකාව නො හඳුනන්නන් වූ නමුත්, අපි අපගේ පොදු විප්ලවීය සාරය තුළින් එකිනෙකා සමග සම්බන්ධ වී සිටි බැවින් ඒවා මෙම මහජන සරසවිය ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය තුළින් මනාව පිළිබිඹු විය. Rise Up සංවිධානයේ මිතුරා අපට ඔහුගේ වෙනත් මිතුරෙකු හඳුන්වා දුන් අතර, ඔහු මහජන සරසවියට

අවශ්‍ය පුටු සහ ලිපි ද්‍රව්‍ය වැනි දේ ලබා දෙන ලදී. එබැවින් ගෝඨාගෝගම මහජන සරසවිය යනු එක් පුද්ගලයෙකුගේ ව්‍යාපෘතියක් නොව, එකිනෙකාව නො හඳුනන, එහෙත් අදහස් සාකච්ඡා කිරීම හා වාදවිවාද කිරීම හරහා අරගලයට සහාය වීමට කැමති පුද්ගලයින්ගේ සාමූහික ප්‍රයත්නයක් විය.

## ගෝඨාගෝගම මහජන සරසවියේ ක්‍රියාකාරීත්වය

අප්‍රේල් 16 වැනි දින අපි උත්කර්ෂවත් ලෙස මහජන සරසවිය විවෘත කළෙමු (මහජන සරසවියේ ආරම්භක සැසිය, යූටියුබ්,2022). ඉහළ පිළිගැනීමක් ඇති විද්වතුන් සහ දේශපාලන ක්‍රියාකාරිකයින් වන මහාචාර්ය ජයදේව උයන්ගොඩ, ආචාර්ය ජානකී ජයවර්ධන සහ ආචාර්ය ප්‍රභා මනුරත්න සහ යාපනයේ තරුණ දේශපාලන ක්‍රියාකාරිකයෙකු වන බෙනිස්ලෝස් තුෂාන් ආරම්භක දේශන පැවැත්වූහ. මහාචාර්ය උයන්ගොඩ විසින් පවත්වන ලද සම්පූර්ණ කතාව සිරස ටී.වී. රූපවාහිනී නාලිකාව ඔස්සේ විකාශය විය (ඩයස්, පැතිකඩ 2022.04.19). ඔහුගේ කථාවේ දී ඔහු සිදු කළ "මම මෙතැනට [ගෝඨාගෝගමට] එන්නේ ඔබට [පුරවැසියන්ට] ඉගැන්වීමට නොව, ඔබගෙන් ඉගෙන ගැනීමටයි" යන ප්‍රකාශය ශාස්ත්‍රීය කවයන් තුළ බොහෝ දෙනා අතර ජනප්‍රිය විය. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි මෙම ජනතා නැගී සිටීම කෙතරම් වැදගත් වන්නේ ද යන්න ඔහු පෙන්වා දුන්නේය. මේ වන විට මෙම කථාවේ යූටියුබ් වීඩියෝව නැරඹුම් 19,000 ක් දක්වා ළඟා වී ඇති අතර, එම වීඩියෝවේ ප්‍රතිචාර කොටසේ ඇති ධනාත්මක ප්‍රතිපෝෂණවලින් මෙම කතාව මඟින් ඇතිකර තිබෙන බලපෑමේ ප්‍රබලත්වය පෙන්නුම් කරයි. මෙම කථාව විරෝධතාකරුවන් තුළ ඇති කර තිබෙන බලපෑම ඇගයීමට ලක් කරමින් රන්සිරිමල් නැමති බ්ලොග් රචකයෙක් මෙම කතාව පදනම් කරගෙන පැදි පෙළක් ද රචනා කළේය (රන්සිරිමල්, 2022). ආචාර්ය මනුරත්න මහජන සරසවිය පිළිබඳ අදහස ජාත්‍යන්තර සන්දර්භයක් තුළ තබමින් සිවිල් අධ්‍යාපනය සඳහා විකල්ප බුද්ධිමය අවකාශයන් තිබීමේ වැදගත්කම පැහැදිලි කළා ය. ආචාර්ය ජයවර්ධනගේ කතාවේදී ඇය රාජ්‍ය අධ්‍යාපනයේ සීමාවන්ට එරෙහිව මහජන සරසවියක් පැවතීමේ වැදගත්කම අවධාරණය කළා ය. අවසාන වශයෙන්, තුෂාන් සුළු ජාතීන් සහ මෙම ජනතා නැගිටීම අතර ඇති සම්බන්ධය පිළිබඳව සාකච්ඡා කළේය. අරගලය තුළ සුළු ජාතීන් දක්නට නොමැති බවට සිංහල ප්‍රජාවේ ඇතැම් කොටස්වලින් එල්ල වූ විවේචනවලට පිළිතුරු දෙමින් ඔහු පෙන්වා දුන්නේ රාජ්‍ය මර්දනය සියලු ජන කොටස්වලට සමමිතිකව බෙදී නොමැති බවත්, එය මෙම අරගලය තුළ සුළු ජාතීන්ගේ භූමිකාව තීරණය කර ඇති බවත් ය.

සමාරම්භක උත්සවයේ දී මහාචාර්ය උයන්ගොඩ පැවැත් වූ කථාව මගින් මාධ්‍ය සහ ජනතාව අතර අරගලය පිළිබඳ ධනාත්මක හැඟීමක් ඇති කළේය. මාධ්‍ය ස්වකීය ප්‍රවෘත්ති තුළින් අරගලය සඳහා ලබා දුන් මාධ්‍ය ආවරණය නිසා මහජන සරසවිය පිහිටුවීම මගින් සැබෑ විකල්පීය ජනතා අවකාශයක් ලෙස ගෝඨාගෝගමට පැවති නීත්‍යානුකූලභාවය වර්ධනය විය. උදාහරණයක් ලෙස, ගෝඨාගෝගමට එල්ල වූ බොහෝ විවේචන දේශපාලනය පිළිබඳ ඇති සාම්ප්‍රදායික අවබෝධය නිසා වන්නක් විය. එනම් මෙම අවකාශය නිර්පාක්ෂික අවකාශයක් ලෙස ප්‍රකාශ කිරීම හේතුවෙන් විරෝධතාකරුවන් එහි රැඳී සිටින්නේ දේශපාලනය සඳහා නොවේ නම් ඔවුන් එහි සිටිනවා විය යුත්තේ විනෝද වීමට යැයි විවේචන එල්ල වන්නට විය. මෙවැනි විවේචන නිරන්තරයෙන් ම විරෝධතාකරුවන් වෙත එල්ල විය. චන්දිමා ජයසේනගේ "නිර්පාක්ෂික මිනිසුන්ගේ දේශපාලන භාවිතාව කොයිබට ද?" යන ලිපියෙන් මෙම විවේචනය මනාව පිළිබිඹු වන අතර, ගෝඨාගෝගම පැවති සැණකෙළි වාතාවරණය හේතුවෙන් ඇය එහි දේශපාලන දිශානතිය විවේචනය කළාය. එහෙත් එම ලිපිය තුළම අවිහිංසාවාදී ලෙස බල ව්‍යාපෘතිවලට අභියෝග කිරීම පිණිස දැනුමෙන් පුද්ගලයින් ව සන්නද්ධ කිරීම සඳහා වන වැදගත් දේශපාලන කවුළුවක් ලෙස මහජන සරසවිය ඇය පිළිගන්නීය (ජයසේන, 2022). මහජන සරසවිය පිහිටුවා දින කිහිපයක් ඇතුළත එය ගෝඨාගෝගම තුළ ස්ථාවර අංගයක් බවට පත් විය. ගෝඨගෝගම පිළිබඳව පළ වූ බොහෝ ප්‍රවෘත්ති ලිපිවල මහජන සරසවිය පිළිබඳ ධනාත්මක ආකාරයකින් සඳහන් කර ඇත.

පෙර කොටසෙහි සඳහන් කළ පරිදි, මහජන සරසවියේ සැසි ආකාර දෙකකින් සංවිධානය කරන ලදී. එනම් මහජන සරසවිය විසින් සංවිධානය කරන ලද සැසි එක් ආකාරයක් වූ අතර, අනෙකුත් සංවිධානවලට සහ පුද්ගලයින්ට ද ක්‍රියා කිරීමට අවකාශයක් නිර්මාණය කර දීම අනෙක් ආකාරය විය. මහජන සරසවිය විසින් සැසි සංවිධානය කළ විට මාතෘකාවක් සහ කථිකයින් තෝරා ගැනීමේ ප්‍රධාන නිර්ණායක වූයේ ගෝඨාගෝගම අවකාශයට එම සැසිවල ඇති අදාළත්වයයි. උදාහරණයක් ලෙස, මහජන සරසවියේ පළමු සැසි දෙක වෙන්කරන ලද්දේ අරගලය බිහිවීමට ආසන්නතම හේතුව වූ ආර්ථික අර්බුදය අවබෝධ කර ගැනීම සඳහා ය

(කුරුවිට 2022). ගෝඨාගෝගම යනු 'සැණකෙළියක්' යැයි එල්ල වූ විවේචන ඉලක්ක කර ගනිමින් අපි අරගලය අභිවහනයක් (performance) ලෙස දැකිය හැකි ආකාරය පිළිබඳ සැසියක් සංවිධානය කළෙමු. ප්‍රකට නළුවෙක් සහ නාට්‍ය න්‍යායාචාර්යවරයෙක් වන මහාචාර්ය සෞම්‍ය ලියනගේ විසින් මෙම සැසිය මෙහෙයවන ලද අතර, ඔහු දේශපාලන ක්‍රියාව තුළ පවතින අභිවහනයෙහි වටිනාකම පෙන්වා දුන්නේ ය (ලියනගේ 2022). එක් අවස්ථාවක දී, ගෝඨාගෝගම විරෝධතාකරුවන් අතරින් එක් කණ්ඩායමක් තමන් අනෙක් අයට වඩා 'කැපකිරීම්' කර ඇති බව පවසමින් ඔවුන් අනෙක් විරෝධතාකරුවන්ට වඩා ඉහළින් සිටීමට උත්සාහ කළහ. මෙය ගෝඨාගෝගමෙහි පැවති සාමූහිකත්වයේ සාරයට පටහැනි වූ බැවින්, මෙම අයිතිවාසිකම් කියා පෑම සම්බන්ධයෙන් සහ කැපකිරීමේ අදහස තුළ පවතින අදේශපාලනික ස්වභාවය පෙන්වා දීම පිණිස සැසියක් සංවිධානය කරන ලදී (පෙරේරා 2022). රැඩිකල් දේශපාලනයේ කැපී පෙනෙන චරිතයක් වන කල්‍යානන්ද පෙරේරා විසින් මෙම සැසිය මෙහෙයවන ලද අතර, ඔහු පෙන්වා දුන්නේ අප 'කැපකිරීම' යන වචනය භාවිත කරන විට, අප අරගලයේ කොටස්කරුවෙකු වෙනවාට වඩා වැඩි වටිනාකමක් අප කළ කැපකිරීම් වල පවතින බවට අප විශ්වාස කරන බවත්, එය මෙම අරගලයේ ආචාර ධර්මයන්ට පටහැනි බවත් ය.

රැඩිකල් දේශපාලනයේ තවත් ප්‍රමුඛ ක්‍රියාකාරිකයෙකු වන විදර්ශන කන්නන්ගර, "'සිස්ටම් චේන්ජ්' කියන්නෙ මොකද්ද?" යන්න පිළිබඳව සාකච්ඡා කළ අතර, සිස්ටම් චේන්ජ් එසේත් නැතිනම් ක්‍රම වෙනසක් යන්න අරගලයෙහි ප්‍රධාන ඉල්ලීමක් විය (කන්නංගර 2022). එමෙන්ම, යුද්ධයෙන් විපතට පත් වූවන් අනුස්මරණය කිරීම සඳහා මහජන සරසවිය මැයි මස 18 වැනි දින සැසි දෙකක් පැවැත්වීය (හනීෆා සහ සුමෙන්තිරරාජ් 2022, මුණසිංහ සහ අනු 2022). ගෝඨාගෝගම සිටි සිංහල ජාතිකවාදී පිරිස් මෙම අනුස්මරණ දිනය එල්.ටී.ටී.ඊ. සංවිධානයට එරෙහි යුද ජයග්‍රහණය සැමරීමක් ලෙස සැලකූ බැවින් එම සමරු දිනය සම්බන්ධයෙන් පරස්පර විරෝධී අදහස් ඇති වී තිබුණි. මෙම සැමරුම සුළුතර කණ්ඩායම්වල, විශේෂයෙන් ම දෙමළ ප්‍රජාවගේ සහභාගීත්වයෙන් තොරව පැවති අතර, අපි මීට පෙර මෙම දිනයේ කළාක් මෙන් යුද්ධයේ ප්‍රචණ්ඩත්වය සහ ජයග්‍රහණ සැමරුම් පිටුපස ඇති ජාතිකවාදී දේශපාලනය ඉස්මතු කර පෙන්වීමට අවශ්‍ය විය. යුද්ධයේ ප්‍රචණ්ඩත්වය ඉස්මතු කර දැක්වීම වෙනුවට, මෙම සැසි දෙකෙහිදී කවීකයෝ අනුස්මරණය කිරීමේ ක්‍රියාවලිය පෙන්වා දෙමින්, අනුස්මරණය කිරීමේ අයිතිය තිබෙන්නේ කාටද යන්න හරහා අනුස්මරණය තුළ පවතින දේශපාලනය ඉස්මතු කර පෙන්වූහ. නිර්මානී ලියනගේ ජනතා අවකාශයක් ලෙස ගොඨාගෝගමෙහි ඇති වැදගත්කම පිළිබඳව සැසියක් පැවැත් වූ අතර, එහිදී ඇය අරගලය සඳහා ගෝඨාගෝගම අවකාශය කෙතරම් අත්‍යාවශ්‍ය වී ඇත් ද යන්න අවධාරණය කළාය (ලියනගේ 2022). මේ හැරෙන්නට ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය (පීරිස් 2022 ජූනි 10), අරගලය අවබෝධ කර ගැනීම සඳහා නව දේශපාලන භාෂාවක අවශ්‍යතාවය (පෙරේරා 2022), වත්මන් සෞඛ්‍ය අර්බුදය (අමරසිංහ සහ මාරසිංහ, 2022), ජනතා අරගලවල සංකීර්ණත්වය (හේමචන්ද්‍ර 2022) සහ සාමූහික අනන්‍යතාවල ඉතිහාසය (ෂුබර්ට් 2022) පිළිබඳව ද සාකච්ඡා පවත්වන ලදී.

අරගලයට සක්‍රීයව දායක වීමට අවශ්‍ය වූ අනෙකුත් කණ්ඩායම් ද මහජන සරසවියෙහි සැසි පැවැත්වූහ. ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන, මහාචාර්ය නිර්මාල් දේවසිරි, සුමිත් චාමින්ද වැනි මහජන බුද්ධිමතුන්, ගෝඨාගෝගම විරෝධතාකරුවන් වූ ලහිරු වීරසේකර, ඉෂාර ජයසේන, පීටර් ද අල්මේදා වැනි ප්‍රමුඛ පෙළේ විරෝධතාකරුවන් සහ මාක්ස් පාසල, Hype Sri Lanka and Sisterhood Initiative වැනි තරුණ සහ දේශපාලන කණ්ඩායම් ද විවිධ මාතෘකා ඔස්සේ සැසි පැවැත්වූහ. වර්තමාන අර්බුදයේ සිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ වැනි දේශපාලන මාතෘකා සහ ශ්‍රී ලංකාවේ මුස්ලිම් කාන්තාවක් වීම හේතුවෙන් මුහුණ දෙන්නට සිදු වන තත්ත්වයන් දක්වා වූ පුළුල් පරාසයකට අයත් මාතෘකා ඔස්සේ මෙම සාකච්ඡා සිදු කරන ලදී.

මීට අමතරව, මහජන සරසවි අවකාශය පොත් එළිදැක්වීම් දෙකක් සඳහා පහසුකම් සැලසුවේය. එකක් වූයේ මහජන විමර්ශන කමිටුවේ අන්තර්වාර වාර්තාව වූණු ධම්මික පැණිය නම් කෘතිය වූ අතර අනෙක වන්නේ ආර්ථික අර්බුදයට ජනතා විසඳුමක් නම් කුඩා පොතයි. ෆැබ් ලංකා පදනම විසින් ත්‍රිමාණ මුද්‍රණ තාක්ෂණය පිළිබඳව සජීවී නිරූපණයක් සිදු කරන ලද අතර, සමාජ සහ සහයෝගීතා ආර්ථිකයක් නිර්මාණය කිරීම මගින් ශ්‍රී ලංකාව "නිර්මාණකරුවන්ගේ සමාජයක්" බවට පරිවර්තනය කිරීම සඳහා Industry 4.0 තාක්ෂණයන් භාවිත කළ හැකි ආකාරය පිළිබඳ සැසියක් පවත්වන ලදී (හෙට්ටිආරච්චි සහ තවත් අය, 2022). මහජන සරසවිය ගෝඨාගෝගම දැනුම හුවමාරු කර ගැනීමේ ප්‍රධාන අවකාශයක් ලෙස පිළිගැනීමට ලක්කරමින් එම ආයතනය මහජන සරසවිය සඳහා ශබ්ද විකාශන පද්ධතියක් ද පරිත්‍යාග කළේය.

මහජන සරසවියේ ක්‍රියාකාරකම් භෞතික අවකාශයට පමණක් සීමා වූයේ නැත. අපි zoom තාක්ෂණය ඔස්සේ සාකච්ඡා පැවැත් වූ අතර ගෝඨාගෝගම

මහජන සරසවියේ ෆේස්බුක් පිටුවෙන් ඒවා සජීවීව විකාශය කළෙමු. ආහාර අර්බුදය සහ විසඳුම් (දන්දෙණිය තවත් 2022) සහ බලශක්ති අර්බුදය සහ විසඳුම් (මහජන සරසවිය, ගෝඨාගෝගම වීඩියෝ, 4 ජූනි 2022) පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා සැසි දෙකක් පවත්වන ලදී. තවද, විවිධ පුරවැසි සභා ආකෘති පිළිබඳ සැසියක් අපි පුරවැසි සභාව (People's Forum) සමඟ එක්ව සංවිධානය කළෙමු (මොරාන් සහ ෆිර්දවුස් 2022). ඒවාට අමතරව, අපි විවිධ පුද්ගලයින් සහ කණ්ඩායම්වල ක්‍රියාකාරකම් වෙනුවෙන් අපගේ අතථ්‍ය අවකාශය (virtual space) විවෘත කළෙමු. කළුබෝවිල ආනන්ද හිමියෝ පුරවැසි අරගලයේ ගමන් මග පිළිබඳ සැසිවාර දෙකක් සංවිධානය කළ අතර, Hype Sri Lanka සංවිධානය ශ්‍රී ලංකාවේ ක්‍රමානුකූල සංවර්ධනය පිළිබඳ තරුණයින් විසින් හඳුන්වා දෙන ලද ජනතා යෝජනාවක් ඉදිරිපත් කරල ලදී.

මහජන සරසවිය ජූලි 9 වැනි දින සිදු වූ ජනතා නැගිසිටීමට සක්‍රියව දායක විය. අපගේ සාමාජිකයින්ගෙන් වැඩිදෙනෙක් නුගේගොඩ මංසන්ධියට ආසන්නව පදිංචිව සිටි නිසා හෝමාගම සිට පැමිණෙන රැළිය සමඟ ඒකාබද්ධ වන නුගේගොඩ රැළියේ සංවිධායකයින්ට සහාය දැක්වීමට අපි තීරණය කළෙමු. රැළියට සහභාගී වීමට ජූලි 9 වැනිදා පෙරවරු 9.30ට නුගේගොඩ මංසන්ධියට එක්වන ලෙස ජනතාවට දැනුම් දීම සඳහා අපි මහජන සරසවියේ ෆේස්බුක් පිටුව භාවිතා කළෙමු. අපි භාෂා තුනෙන් ම ඒ පිළිබඳව දැන්වීම් පළ කළ අතර, පුද්ගලයින් 2,000ක් පමණ දෙනාට එම දැන්වීම් ලැබී තිබුණි. මෙම රැළිය ෆේස්බුක් ඔස්සේ සජීවී ව විකාශය වූ අතර, එය 500ක පමණ පිරිසක් කරා ළඟා වී තිබුණි (මහජන සරසවිය, ගෝඨාගෝගම වීඩියෝ, 9 ජූලි 2022).

මේ මොහොතේ අපි නිරතව සිටින කාර්ය වන්නේ ගෝඨාගෝගම අරගලයේ මතකය සංරක්ෂණය කිරීම යි. ඒ අනුව, අපි විරෝධතාකරුවන් 10-15ක කණ්ඩායමක් එක්රැස් කොට ඔවුන්ගේ මතකය හරහා 2022 අප්‍රේල් 9 සිට අගෝස්තු 13 දක්වා ගෝඨාගෝගම අවකාශයේ විකාශනය සිතියම් ගත කරමින් සිටිමු. අනෙක් ක්‍රියාකාරකම වන්නේ මහජන සරසවිය විසින් සංවිධානය කරන ලද සැසි කෘතියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමයි.

## මහජන සරසවියේ බලපෑම

ගෝඨාගෝගම මහජන සරසවියේ බලපෑම සංඛ්‍යා දත්ත විශ්ලේෂණයකින් මැනිය නො හැක. එබැවින්, මම මෙහි පෙර සඳහන් කර ඇති අරමුණු තුනට අදාළව මහජන සරසවියේ බලපෑම විවේචනාත්මක ඇගයීමක් සිදු කරමි. මහජන සරසවියේ පළමු අරමුණ එනම් ගෝඨාගෝගම තුළ සාකච්ඡාවට බඳුන් වූ විවිධ අදහස් එක තැනකට ගෙන ඒම වූ නමුත්, අපි අපගේ එම අපේක්ෂාව කරා ළඟා වූයේ යැයි මම නො සිතමි. අපි ගෝඨාගෝගම පරිශ්‍රයේ සිටින විවිධ කණ්ඩායම් සමඟ මුහුණට මුහුණ හමු වී සාකච්ඡා සැසි පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද, අපිට සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට හැකි වූයේ සමාජවාදී තරුණ සංගමයේ එරංග ගුණසේකර සමග පමණි (ගුණසේකර 2022). කෙසේ වෙතත්, අපි ගෝඨාගෝගමට ක්‍රියාකාරීව සහභාගී වූ බිහිරි ප්‍රජාව සමග සැසියක් පැවැත්වීමට සත්කාරකත්වය සැපයූවෙමු. සංඥා භාෂා පරිවර්තකයෙකුගේ සේවාව ලබා ගෙන, බිහිරි ප්‍රජාවේ සාමාජිකයින්, ප්‍රජාවක් ලෙස තමන් මුහුණ දී සිටින ගැටලු සහ අරගලය තමන්ට අදහස් ප්‍රකාශ කිරීමට අවකාශය ලබා දුන් ආකාරය පිළිබඳව ප්‍රකාශ කළහ. අනාගත ශ්‍රී ලංකාවේ අනාගතය පරිකල්පනය කිරීම යන අපගේ දෙවැනි අරමුණ සලකා බැලීමේ දී, මෙම අරමුණ සෘජුව ආමන්ත්‍රණය කරන ප්‍රමාණවත් ක්‍රියාකාරකම් ප්‍රමාණයක් අප විසින් සිදු කර ඇතැයි මම විශ්වාස නො කරමි. කෙසේ වෙතත්, අපි සාකච්ඡා කළ දේශපාලනය, නීතිය සහ ආර්ථිකය වැනි තේමා අනාගතවාදී නැඹුරුවක් සහිත ප්‍රතිසංස්කරණ යෝජනා කෙරිණි. වෙනත් විදියකට කියන්නේ නම්, එම සැසි මගින් දැනට පවතින ව්‍යුහයන්හි පවතින ගැටළු සහ එම ව්‍යුහ ප්‍රතිසංස්කරණය කළ යුතු ආකාරය පෙන්වා දෙන ලදී.

මගේ මතය අනුව, මහජන සරසවිය එහි තුන්වන අරමුණ වන විකල්ප බුද්ධිමය අවකාශයක් ගොඩ නැංවීම විශිෂ්ට ලෙස සපුරා ගත්තේ ය. සාම්ප්‍රදායික රාජ්‍ය විශ්වවිද්‍යාල ව්‍යුහයේ ධුරාවලි ස්වභාවය අපි සෘජුව ම අත්විඳ ඇති හෙයින්, සමානාත්මතාවය සහ නිදහස සහතික කළ අවකාශයක් අත්හදා බැලීමට අපට අවශ්‍ය විය. මෙම අරමුණ විවිධ ස්තර හරහා අපි සපුරා ගෙන ඇත්තෙමු. මෙහිදී එක් ස්තරයක් වන්නේ මහජන සරසවි සැසිවල ව්‍යුහය යි. අපිට එල්ල වූ එක් විවේචනයක් වන්නේ කථිකයෙක් ඉදිරියට පැමිණ දේශනයක් පවත්වන සම්ප්‍රදායික මාදිලියේ විශ්වවිද්‍යාලයක් ම අප විසින් ගෝඨාගෝගම ද පිහිටුවා තිබේ යන්න යි. කෙසේ වෙතත්, සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල පරිසරයක් තුළ මෙන් නොව, මෙහි සැසිවලට සහභාගී වූවන් (අක්‍රීය සිසුන් මෙන් නොව) දේශකයන් සහ අනෙකුත් සහභාගී වූ අය සමඟ ඉතා උද්යෝගයෙන් සිය අදහස් බෙදා හදා ගන්නා ලදී. එබැවින් මෙම විවේචනය නිවැරදි නිරීක්ෂණය නොවන බව මගේ අදහසයි. බොහෝ අවස්ථාවලදී කථිකයින් ඔවුන්ගේ තේමා පිළිබඳව කෙටි දේශනයක්

පැවැත් වූ අතර, සාකච්ඡාව සඳහා අවශ්‍ය තරම් කාලය තිබුණි. සාකච්ඡාවල දී සෑම අදහසකටම ගරු කළ අතර, කිසිවෙකු ඔවුන්ගේ විවිධත්වය මත නො සලකා හරිනු ලැබුවේ නැත.

සමානාත්මතාවය සහ නිදහස ප්‍රකාශ වූ තවත් ස්තරයක් ලෙස කථිකයින් තෝරා ගැනීම දැක්විය හැක. කථිකයින් තෝරාගැනීමේ දී, අපි විවිධ කථිකයන්ට ඉඩ ලබා දීමට උත්සාහ කළෙමු. උදාහරණයක් ලෙස, මහජන සරසවි කණ්ඩායම ධනවාදී. විරෝධී ප්‍රවණතා ඇති බෙහෝදෙනෙකුගෙන් සමන්විත වූවත් අපි ලිබරල්වාදී දේශපාලනයට නැඹුරු වූ පුද්ගලයින්ට ද සැසිවලට ආරාධනා කළෙමු. තවද බොහෝ කථිකයින් සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල පසුබිමෙන් පැමිණි අය වූ බැවින් කථිකයින් තෝරා ගැනීමේදී විශ්වවිද්‍යාල සුදුසුකම් කෙරෙහි පක්ෂපාතීත්වයක් තිබුණේ යැයි කෙනෙක්ට තර්ක කළ හැකිය. වෙනත් වචනවලින් කිවහොත්, බොහෝ කථිකයන්ට ආචාර්ය උපාධි සහ ශාස්ත්‍රපති උපාධි වැනි ශාස්ත්‍රීය සුදුසුකම් තිබුණි. කෙසේ වෙතත්, ඔවුන්ට ශාස්ත්‍රීය සුදුසුකම් තිබුණ ද, ඔවුන් ශාස්ත්‍රීය තනතුරු දැරුව ද, ඔවුන්ව තෝරා ගනු ලැබුවේ එම සුදුසුකම් නිසා නොව, ඔවුන් විවිධ දේශපාලන, ආර්ථික හා සමාජයීය ක්ෂේත්‍රවල ක්‍රියාධරයින් වූ බැවින් ගෝඨාගෝගමෙහි සිදුවෙමින් පැවති සාකච්ඡාවලට ඔවුන්ට දායක විය හැකි බවට තිබූ විශ්වාසය නිසාය. එසේම, ශාස්ත්‍රීය සුදුසුකම් නොමැති, එහෙත් දේශපාලන ක්‍රියාකාරිකයින් ලෙස දීර්ඝ කාලයක් කටයුතු කිරීම හේතුවෙන් බුද්ධිමය සංවාදයක නිරතවීමට හැකි කථිකයින්ට ද අපි ආරාධනා කළෙමු. මහජන සරසවියට පැමිණි කථිකයින්ට ප්‍රජා නායකයින්, සරණාගතයින්, විදේශික ජනමාධ්‍යවේදීන්, ජාත්‍යන්තරව පිළිගත් විද්වතුන්, දේශීය විද්වතුන්, වෘත්තිකයින් සහ ක්‍රියාකාරීන් ද ඇතුළත් වූ බැවින් එම කථිකයින් ලැයිස්තුව විවිධත්වයෙන් යුක්ත විය.

සමානාත්මතාවය සහ නිදහස ප්‍රකාශ වූ තුන්වන ස්තරය වූයේ සහභාගි වූ පිරිසයි. මහජන සරසවිය විවෘත අවකාශයක් වූ අතර ඕනෑම අයෙකුට තමන් කැමති පරිදි එයට සහභාගී වීමට හා පිටව යාමට නිදහස තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස නිශ්චිත සහභාගිවන්නන් පිරිසක් නො සිටි අතර, උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට එයට සහභාගී විය හැකි විය. එසේම එහිදී පංතිය, ආගම, වාර්ගිකත්වය හෝ ලිංගික දිශානතිය හේතුවෙන් වෙනස් කොට සැලකීමක් සිදු නොවීය. මහජන සරසවි අවකාශයට කුඩා ළමයින් ව පවා සාදරයෙන් පිළිගනු ලැබීය. මහජන සරසවි කණ්ඩායම සෑම විටම සහභාගිවන්නගේ සෑම අදහසකට, මතයකට හෝ විවේචනයකට ම ඉඩ සැලසීමට උත්සාහ කළේය. ඇතැම් විට, සහභාගිවන්නන්ගේ සක්‍රීය සම්බන්ධවීම හේතුවෙන් සාකච්ඡා මාතෘකාවෙන් බැහැරවීම සහ විවිධ දිශාවන් ඔස්සේ ගමන් කිරීම සිදු වියි උදාහරණයක් ලෙස, රමිඳු පෙරේරාගේ සැසියේ දී, මූලික සාකච්ඡාව රුසියානු විප්ලවය පිළිබඳ වූ නමුත් එයට පැමිණ සිටි පිරිස අතරින් මතු වූ අදහස් දැක්වීමක් හේතුවෙන් එම සාකච්ඡාව මූලික සාකච්ඡාවෙන් බැහැරට ගොස් අරගලයෙහි සීමාවන් පිළිබඳ අතිරේක පැය දෙකක සාකච්ඡාවක් දක්වා දීර්ඝ වූයේ ය.

සමානාත්මතාවය සහ නිදහස ප්‍රකාශ වූ අවසාන ස්තරය වූයේ විවිධ ජනවාර්ගික කණ්ඩායම්වලට අවස්ථාව සලසා දීමයි. මහජන සරසවි කණ්ඩායමේ බහුතරයක් දෙනා සිංහල ප්‍රජාවේ අය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස දෙමළ භාෂාව කතා කරන ප්‍රජාවන් මහජන සරසවි ක්‍රියාකාරකම්වලට සම්බන්ධ කර ගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතා අපට තිබිණි. උදාහරණයක් ලෙස, අපිට නිරන්තරයෙන් සිංහල-දෙමළ භාෂා පරිවර්තකයින් සොයා ගැනීමට නො හැකි වූ බැවින් සැසිවාර බොහොමයක් සිංහල භාෂාවෙන් පමණක් පවත්වන ලදී. කෙසේ වෙතත්, සැසි කිහිපයක් දෙමළ භාෂාවෙන් පැවැත්වීමට, නැතහොත් දෙමළ භාෂාවට පරිවර්තනය කර දීමට හෝ දෙමළ භාෂාවෙන් සාරාංශයක් සැපයීමට අපට හැකි විය. අපගේ අභ්‍යන්තර සාකච්ඡාවලදී ද දෙමළ භාෂා පහසුකම් සැලසීමට නො හැකි වීමේ ප්‍රශ්නය පිළිබඳව මහජන සරසවි කණ්ඩායම සාකච්ඡා කළ අතර, හැකි සෑම අවස්ථාවක ම දෙමළ භාෂාවෙන් සාකච්ඡා පැවැත්වීමට අපි උපරිමයෙන් උත්සාහ කළෙමු.

මහජන සරසවියේ සමස්ත බලපෑම තක්සේරු කිරීමේ දී, අරගලයෙහි විශාලත්වයට සාපේක්ෂව එහි බලපෑම අඩු මට්ටමක පැවති බව මම පවසමි. කෙසේ වෙතත්, අරගලය සාර්ථක ජනතා නැගී සිටීමක් බවට පත් වූයේ බොහෝ කුඩා කණ්ඩායම් මගින් ඇති කළ කුඩා බලපෑම්වල එකතුව නිසාය. මහජන සරසවිය අරගලය පුරාවටම සැසි පැවැත්වූයේය. ඒ හේතුවෙන් මහජන සරසවියේ ක්‍රියාකාරකම් සඳහා නිත්‍ය සහභාගිවන්නන් පිරිසක් ගොඩනැගෙන්නට විය. මෙය ගෝඨාගෝගමෙහි පැවැත්මට අත්‍යාවශ්‍ය දෙයක් වූයේ, විවිධ හේතු නිසා ජනතාවගේ පැමිණීම අඩු වීම නිසා ගෝඨාගෝගම පාළුවට ගිය කාල පරිච්ඡේදවලත් මහජන සරසවියේ ක්‍රියාකාරකම් නිසා ගෝඨාගෝගම අවකාශය ජීවමානව පැවතිමට හැකි විය. Hashtag Generation සංවිධානය විසින් සංවිධානය කරන ලද සාකච්ඡාවකදී මෙය පිළිගැනීමට ලක් කරන ලද අතර, එහිදී ගෝඨාගෝගම අවකාශය පාළුවට ගොස් තිබූ අවස්ථාවලදී පවා මහජන සරසවිය ස්වකීය කාර්යය අත්හැර නො දැමීමේ අධිෂ්ඨානය

සහිත ව සිටීම එක් කවීකයෙකු විසින් අගය කරන ලදී (හැෂ්ටැග් ජෙනරේෂන් 2022). එපමණක් නොව, අරගලයේ අවසාන අදියර වන විට මහජන සරසවියේ ජනප්‍රියත්වය අනෙකුත් ප්‍රාදේශීය ගෝඨාගෝගම අවකාශයන් කරා ද ළඟා වීමට පටන් ගත්තේ ය. උදාහරණයක් ලෙස, ජූලි 8 වැනි දින වෙයන්ගොඩ ගෝඨාගෝගම පරිශ්‍රයේ දී සැසියක් පැවැත්වීමට අපට ආරාධනාවක් ලැබුණු අතර අපි එය ඉටු කළෙමු.

## නිගමනය

මහජන සරසවිය පිළිබඳ මෙම ස්වයං ආවර්ජනාත්මක ලිපිය ලිවීම මට පහසු කාර්යයක් නොවීය. එයට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ අරගලයෙහි විශාලත්වය සහ මහජන සරසවියෙහි සහ එහි ක්‍රියාකාරකම්වල කුඩා බව දැකීමෙන් ඇති වූ ආතතිකාරී තත්ත්වයයි. කෙසේ වෙතත්, ඉහත සඳහන් කළ පරිදි, අරගලය කුඩා කණ්ඩායම් සහ පුද්ගලයින්ගේ කුඩා ක්‍රියාකාරකම්වල දැවැන්ත සහයෝගීතාවයක් විය. මහජන සරසවියට මෙයට වඩා යමක් කිරීමට හැකියාව තිබුණි යැයි මට නිතරම සිතුණි. නමුත්, මෙම ලිපිය ලියන අතරතුර දී මම මහජන සරසවි කණ්ඩායමේ සාමූහික ප්‍රයත්නය අගය කිරීමට පටන් ගත්තෙමි. මන්ද ගෝඨාගෝගම තුළ සැසියක් පැවැත්වීම කිසිසේත්ම පහසු කාර්යයක් නො වූ බැවිනි. අපි සියලු දෙනාම පූර්ණ කාලීන රැකියාවල හෝ අධ්‍යයන කටයුතුවල නිරතව සිටි අය වූ බැවින් විරෝධතා පැවැත්වෙන ස්ථානවල නිරතුරුවම රැඳී සිටිය නො හැකි විය. තේමාවක් පිළිබඳ අවසන් තීරණය ගැනීම, දිනයක් සහ කථිකයෙක් තෝරා ගැනීම, ෆේස්බුක් ප්‍රචාරක දැන්වීම් නිර්මාණය කිරීම, පෙර පවත්වන ලද සැසිවල ඡායාරූප මහජන සරසවියේ ෆේස්බුක් පිටුවට උඩුගත කිරීම වැනි කාර්යයන්හි සිට ශබ්ද විකාශන පද්ධතිය ගෝඨාගෝගමට ගෙන ඒම, සැසියකට පෙර මහජන සරසවි අවකාශය පිරිසිදු කොට සකස් කිරීම, ෆේස්බුක් සජීවී විකාශය සිදු කිරීම සහ සාකච්ඡාවට සම්බන්ධවීම දක්වා වූ විවිධ කාර්යයන් සඳහා ඉමහත් අධිෂ්ඨානයක් සහ උත්සාහයක් අවශ්‍ය විය. අධික වර්ෂාවන් ඇද වැටීම හේතුවෙන් විටින් විට අපගේ භූමිය ජලයෙන් යට වූ නිසා කාලගුණය ද ඇතැම් විට අපගේ අධිෂ්ඨානය පරීක්ෂාවට ලක් කෙරිණි. මෙවැනි දුෂ්කරතා සියල්ල මධ්‍යයෙහි වුවත්, අපගේ මූලික ප්‍රතිපත්තිය වූ සෑම අදහසකටම ගරු කරන අවකාශයක් නිර්මාණය කිරීම වෙනුවෙන් කැපවී සිටීමට ගෝඨාගෝගම මහජන සරසවිය වන අපි සමත් වුණෙමු. මා වඩාත් මවිතයට පත් කළ දෙය නම්, අපි සතුව පැවති ධෛර්යයි, එනම් ඇලන් බදියුගේ වචනයෙන් කියනවා නම්, අධෛර්යමත් නොවී සිටීමට ඇති හැකියාවයි (බදියු 2008).

### ආශ්‍රිත ලිපි


අමරසිංහ සහ මාරසිංහ, ශ්‍රී ලංකාවේ වත්මන් සෞඛ්‍ය අර්බුදය, ගෝඨාගෝගම මහජන සරසවිය, 2022 අප්‍රේල් 24, https://www.youtube.com/watch?v=6E7AqX-U – අවසන් වරට ප්‍රවේශ වූ දිනය:2022.12.12.

විරෝධතා ව්‍යාපාර පිළිබඳ ධනාත්මක වෘතාන්ත විශ්ලේෂණය කිරීම, හැෂ්ටැග් ජෙනරේෂන්, 2022, https://www.facebook.com/hashtaggenerationsl/videos/5156098587828209

බදියු, ඇලන්. 2008'The Meaning of Sarokozy, Verso: නිව් යෝර්ක්, 71-76.

ඩයස් අශෝක, 2022, "මේ අරගලයට නායකත්වය දීමේ කතිකාව වැදගත් ද, පැතිකඩ, https://www.youtube.com/watch?v=MQ2aHiqfngs&t=2s

ගුණසේකර, එරංග. 2022. "අරගලයේ දිශානතිය." ගෝඨාගෝගම මහජන සරසවිය, ෆේස්බුක් වීඩියෝ. 2022 මැයි 04. https://www.facebook.com/watch/live/?ref=watch_permalink&v=1358046191274233

හැෂ්ටැග් ජෙනරේෂන්□ වීඩියෝ□ 2022□ "□විරෝධතා ව්‍යාපාර පිළිබඳ ධනාත්මක වෘතාන්ත විශ්ලේෂණය කිරීම්"□2022 සැප්තැම්බර් 2□ 2□32 - 3□30යඑඑචි඀ඨඨඅඅඅගජේජැඉදදනග ජදපඨයීයජ්ටටැබැර්එසදඛ්කරඨඩසාැදිඨ5156098587828209

හෙට්ටිආරච්චි□ චමෝද්□ හසිත අබේවර්ධන□ අනුරාධ රණසිංහ□ වර්ෂි දන්දෙණිය□ දමිත් කේතක□ ඉඳුනිල් හිත්තැටිය සහ පත්මි එගොඩවත්තී 2022 "ආහාර අර්බුදය සහ විසඳුම්! - Food crisis & Solutions! – ."

හේමචන්ද්‍ර, සමල් විමුක්ති, 2022. "අරගලයේ බහුවිධ ඉතිහාසයන්: 71 කැරැල්ල ඇසුරින්." ෆේස්බුක්, ගෝඨාගෝගම මහජන සරසවිය, වීඩියෝ. 2022 ජූනි 6, https://www.facebook.com/watch/live/?ref=watch_permalink&v=485921306643789

ජයසේන, චන්දිමා. 2022. "නිර්පාක්ෂික මිනිසුන්ගේ දේශපාලන භාවිතය කොයිබටද?" 2022.04.17, ladyleader.lk, https://ladyleader.lk/life-style/7016-2022-04-16-18-47-51

කන්නන්ගර, විදර්ශන (කන්නන්ගර, වී.) 2022. "සිස්ටම් චේන්ජ් එකක් කියන්නේ මොකක්ද?" (What is a system change?). https://www.facebook.com/watch/live/?ref=watch_permalink&v=438828210911111

කුරුවිට. කුසල්. 2022. 'මහජන සරසවිය: ධනුෂ්ක ගෙහාන් පතිරණ සහ නිර්මාල් රංජිත් දේවසිරි, 1 කොටස." 2022 අප්‍රේල්. https://www.youtube.com/watch?v=1waRTiZx8qA

ලියනගේ, නිර්මාණි. 2022. "ගෝඨාගෝගම සමාජ අවකාශයක් ලෙස කියවීම පිළිබඳ නිර්මාණි ලියනගේ සමග කළ සාකච්ඡාව."

ෆේස්බුක්, ගෝඨාගෝගම මහජන සරසවිය, වීඩියෝ. 2022 මැයි 3. https://www.facebook.com/watch/live/?ref=watch_permalink&v=2116241735212392

හනීෆා, ෆාරා සහ එස්තර් සුරෙන්තිරරාජ්. 2022. "මතකය සහ ස්මරණය / Memory and Memorialization, ගෝඨාගෝගම මහජන සරසවිය, youtube, 2022. https://www.youtube.com/watch?v=eKDrVL4rlZ0"

මොරාන්, අසුසෙනා සහ එම්. ෆිරිදවුස් "පුරවැසියන් රැස්වීමේ ආකෘති අවබෝධකර ගැනීම.", ගෝඨාගෝගම මහජන සරසවිය, ෆෙස්බුක් වීඩියෝ. 2022 ජූලි 29. https://www.facebook.com/watch/live/?ref=watch_permalink&v=1299596333905692

"ගෝඨාගෝගම මහජන සරසවියේ ආරම්භක සැසිය" යූ-ටියුබ්, 2022, https://www.youtube.com/watch?v=xmehPDYnXPA

පීරිස්, ප්‍රදීප්. 2022. "වර්තමාන අර්බුදයේ දේශපාලන පදනමඃ පුරවැසියන් ඡන්ද දායකයින් බවට පරිවර්තනය කිරීම", මුණසිංහ, විදුර සහ සිවලිංගම් ෆේස්බුක්, ගෝඨාගෝගම ජනතා විශ්වවිද්‍යාලය, වීඩියෝ, 2022 ජූනි 10, https://www.facebook.com/watch/live/?ref=watch_permalink&v=695412048412379

පෙරේරා, නිහාල්, 2022. "නව අරගලය සහ පැරණි දේශපාලන භාෂාව යන තේමාව යටතේ නිහාල් පෙරේරා විසින් සිදු කරනු ලබන සාකච්ඡාව." ෆේස්බුක්, ගෝඨාගෝගම මහජන සරසවිය, වීඩියෝ, 2022 ජූනි 18, https://www.facebook.com/watch/live/?ref=watch_permalink&v=559196489245133

ගෝඨාගෝගම මහජන සරසවිය, ෆේස්බුක් වීඩියෝ. 2022. "ජනතා අරගලයේ දිගුකාලීන පැවැත්ම සඳහා 4.0 කාර්මික තාක්ෂණය යොදා ගනිමින් සහයෝගීතා ආර්ථිකයක් ගොඩ නගන්නේ කෙසේද?", 2022 මැයි 25, https://www.facebook.com/watch/live/?ref=watch_permalink&v=694591421803893

ගෝඨාගෝගම මහජන සරසවිය, ෆේස්බුක් වීඩියෝ, 2022, "බලශක්ති අර්බුදය සහ විසඳුම් (විදුලි) 2022 ජූනි 19, https://www.facebook.com/watch/live/?ref=watch_permalink&v=1101580457461319

ගෝඨාගෝගම මහජන සරසවිය, ෆේස්බුක් වීඩියෝ, 2022, "ජන අරගලය නුගේගොඩ සිට ගෝල්ෆේස් අරගල භූමිය දක්වා", 2022 ජූලි 09, https://www.facebook.com/watch/live/?ref=watch_permalink&v=565501075181279

ගෝඨාගෝගම මහජන සරසවිය, වීඩියෝ, ෆේස්බුක්, 2022 ජූනි 04. https://www.facebook.com/watch/live/?ref=watch_permalink&v=1089084645320661

පෙරේරා, කල්‍යානන්ද, "දුක් විඳීම, කැප කිරීම සහ අරගලය", ගෝඨාගෝගම මහජන සරසවිය, වීඩියෝ, ෆේස්බුක්, https://www.facebook.com/watch/live/?ref=watch_permalink&v=1158281981686740

"ස්මරණයේ අයිතිය ඇත්තේ කාටද?" ගෝඨාගෝගම මහජන සරසවිය. https://www.youtube.com/watch?v=ElDjXwrea9E.

රත්සිරිමල්, 2022. "ගාලුමුවදොර මහජන සරසවිය ගෝල්ෆේස් ජනතා විශ්වවිද්‍යාලය, බ්ලොග්ස්පොට්, 2022.04.20, https://lokuakuru.blogspot.com/2022/04/blog-post.html

ෂුබර්ට්, ඇන්ඩි. 2022, "ශ්‍රී ලංකාවේ සාමූහික අනන්‍යතාවයන් පිළිබඳ ඉතිහාසයක්", ගෝඨාගෝගම මහජන සරසවිය, 2022, යූටියුබ් https://www.youtube.com/watch?v=omRzeJ0f1ko

මුණසිංහ, විදුර සහ සිවලිංගම් අනු. 2022.

# ජනතා අරගලයේ කාන්තාවෝ

*ස්වස්තිකා අරුළිංගම්* සහ මරීසා ද සිල්වා***

*ජනතා අරගලයේ කාන්තාවන්ගේ භූමිකාව සහ තමන්ගේ හඬ ඇසෙන්නට සැලැස්වීමේදී ඔවුන් මුහුණ දෙන අභියෝග සම්බන්ධයෙන් කතුවරියෝ සාකච්ඡා කරති.*

## මිරිහානේ උද්ඝෝෂණය

2022 මාර්තු 31 වැනි දින, එවකට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ මිරිහාන ප්‍රදේශයේ පිහිටි නිවස අසලට කුඩා පිරිසක් රැස්වූහ. දීර්ඝ විදුලි කප්පාදුවට සහ ඉන්ධන හිගයට එරෙහිව විරෝධය පළ කළ මිරිහාන ප්‍රදේශයේ අසල්වැසියන් හිටි අඩියේ එක්ව පැවැත් වූ රැස්වීමක් ලෙස මෙම විරෝධතාවය පෙනෙන්නට තිබුණි. සාමකාමී ජනතා උද්ඝෝෂණයක් ලෙස ආරම්භ වූ එය නොබෝ වේලාවකින් නීතිය ක්‍රියාත්මක කරන පාර්ශවයන් විසින් උසිගන්වන ලද ප්‍රචණ්ඩත්වයක් දක්වා පුපුරා ගියේ ය.

මිරිහානේ විරෝධතාවය ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තේරී පත් වූ ජනාධිපතිවරයෙකු බලයෙන් නෙරපා හැරීමට තුඩු දුන් ඓතිහාසික ජනතා ව්‍යාපාරයේ සන්ධිස්ථානයක් ලෙස බොහෝ දෙනා සලකති. මිරිහානේ විරෝධතාවය අතරතුර දී, මාධ්‍යවේදියෙක්, මේ වන විට සුප්‍රකට ඡායාරූපයක් වී තිබෙන, එක් අතකින් ළදරුවෙකු වඩාගෙන, අනෙක් අත ඉහළට ඔසවා විරෝධය පළකරමින් සිටින කාන්තාවකගේ රුව කැමරාවට හසුකර ගත්තේ ය. මෙම ඡායාරූපය ගාලු මුවදොර අත්පත් කර ගැනීමට මග පෑදූ ප්‍රතිවිරෝධයේ සහ අරගලයේ මුල් කාලීන සංකේතවලින් එකක් බවට පත් විය.

## අරගලය, පෝරාට්ටම් | Struggle යන කවර නමකින් හැඳින්වුව ද - ජනතා විරෝධය

2022 මාර්තු සිට ජූලි දක්වා වූ කාලය අතරතුර, අසල්වැසියන්ගේ කුඩා වීදි විරෝධතාවයක් ලෙස ආරම්භ වූ දෙය, ආහාර පිසීමට අවශ්‍ය ගෑස්, ඉන්ධන සහ විදුලිය හිගය හේතුවෙන් තම දෛනික ජීවිතය පවත්වාගෙන යාමට නොහැකි වීමෙන් කලකිරීමට පත් වූ ප්‍රජාවන් අතරට පැතිරී ගොස්, අවසානයේ, ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයෙක්, අග්‍රාමාත්‍යවරයෙක් සහ අමාත්‍ය මණ්ඩලයක් පෙරළා දැමීම දක්වා දික්ගැස්සුණු ඓතිහාසික සිදුවීමක් බවට වර්ධනය විය. සංවිධානය නොවූ සිය දහස් ගණනක් පුද්ගලයින්

* ස්වස්තිකා අරුළිංගම් නීතිඥවරියක් සහ වෘත්තීය සමිති ක්‍රියාකාරිනියක් වේ අරගලයට සහභාගීවන්නියක් ද වූ ඇය, ගාලුමුවදොර අත්පත්කර ගනු ලැබීම අතරතුර දී සහ ඉන් පසුව රජය විසින් හිංසාවට ලක්කරන ලද පුද්ගලයින්ව ආරක්ෂා කිරීමෙහි නිරත වූවා ය.

**මරීසා ද සිල්වා ක්‍රියාකාරිනියක් වන අතර, ඇය ප්‍රධාන වශයෙන් ම උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල යුද්ධයෙන් පීඩාවට පත් දෙමළ ප්‍රජාවන් සමග එක්ව හමුදාකරණය, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පුද්ගලයින් රඳවා ගැනීම, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සහ කතා කිරීමේ සහ රැස්වීමේ නිදහස වැනි කරුණු සම්බන්ධයෙන් කටයුතු කර ඇත. ඇය ත්‍රස්ත විරෝධී නීති, එනම් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ ප්‍රති-ත්‍රස්ත පනත, අහෝසි කිරීම, කම්කරු හා වතු කම්කරු අයිතිවාසිකම්, ක්ෂුද්‍ර මූල්‍ය ණය අහෝසි කිරීම වැනි ගැටළු සහ අනෙකුත් පීඩිත ප්‍රජාවන් සම්බන්ධයෙන් කටයුතු කරන කාන්තා ක්‍රියාකාරිනියන්ගේ වාමාංශික, කාන්තා සංසදයක් වන විමුක්ති ව්‍යාපාරයේ සාමාජිකාවක් වේ.

සහ ජන කණ්ඩායම් එවකට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට ඉල්ලා අස්වන ලෙස බලකිරීමේ ඒකායන අරමුණ ඇතිව, කොළඹ නගරයේ මිල අධික වාණිජ දේපළ රැසක් ආසන්නයේ පිහිටා ඇති ප්‍රමුඛතම පොදු අවකාශයක් වන ගාලු මුවදොර භූමිය අත්පත් කර ගත්හ. "ගෝඨා ගෝ හොම්" යන පාඨය රට පුරා රැව් පිළිරැව් දුන් අතර, ගාලු මුවදොර අත්පත් කර ගත් භූමිය "ගෝඨා ගෝ ගම" ලෙස නම් කරන ලදී. මෙම භූමිය අත්පත් කර ගැනීමේ ව්‍යාපාරයේ මුල් දිනවල දී, එයට සහභාගී වූ විරෝධතාකරුවන් ප්‍රධාන වශයෙන් ම කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල ජීවත් වූ ඉහළ මධ්‍යම පන්තියේ පහළ මට්ටමේ නාගරික වැසියන් විය. කෙසේ වෙතත්, දින ගණන් ගතවී යත් ම, විවිධ පන්තිවලට, ජන වර්ගවලට, ස්ත්‍රීපුරුෂ සමාජභාවයන්ට සහ ලිංගික දිශානතීන්ට අයත් පුද්ගලයින් ක්‍රමයෙන් ගෝඨා ගෝ හෝම් ව්‍යාපාරයට ආකර්ෂණය වූහ. ශ්‍රී ලාංකීය දේශපාලනයට ආවේණික වූ සියලු සීමා කිරීම් මධ්‍යයේ ගාලු මුවදොර පරිශ්‍රය, දේශපාලන හඬක් නැගීමේ අවස්ථාව ප්‍රතික්ෂේප කරනු ලැබ සහ විරෝධතා ස්ථාන වලින් බැහැර කරනු ලැබ සිටි සමාජ කණ්ඩායම් සඳහා අවකාශය විවර කළේ ය. මෙම විරෝධතා ව්‍යාපාරයේ සුවිශේෂී ලක්ෂණය වූයේ එය සියලු කණ්ඩායම් අන්තර්ගත වූ, අවිහිංසාවාදී විරෝධතාවයක් වීම යි. විරෝධතාකරුවෝ එය "ආදරයේ අරගලය" ලෙස සාඩම්බරයෙන් හැඳින්වූහ. බලයේ සිටි ජනාධිපතිවරයාගෙන් පසුව ඔහුගේ ස්ථානය ලබා ගැනීමට වෙනත් අයෙකු හෝ දේශපාලන නායකත්වයක් පෙළ නොගැසී සිටිය ද, ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත් වූ ජනාධිපතිවරයාට ඉල්ලා අස්වන ලෙස බලකර සිටි මෙම විරෝධතාවය, හිටි අඩියේ සංවිධානය වූ ජනතා ව්‍යාපාරයක් විය. ජනතාව මෙම විරෝධතා ව්‍යාපාරය වැළඳ ගැනීමට සහ විරෝධතාකරුවන් අතර මෙවැනි විවිධත්වයක් පැවතීමට බලපෑ මූලිකත ම හේතුව වූයේ එය පොදුවේ පක්ෂ දේශපාලනයට සම්බන්ධ නොවූ ව්‍යාපාරයක් වීමයි.

## දේශපාලන ව්‍යාපාර තුළ කාන්තාවන් බැහැර කරන ව්‍යුහයන්

ශ්‍රී ලංකාවේ පවතින බහුවිධ සමාජ, ව්‍යුහාත්මක සහ ආර්ථික බාධක හේතුවෙන් උද්ඝෝෂණ සහ විරෝධතා ව්‍යාපාරවල ප්‍රධානත්වය ගනු ලැබුවේ පිරිමින් විසිනි. දරුවන්ට රැකවරණය සපයන්නියන් ලෙස සලකනු ලබන කාන්තාවන් වෙත, සාමාන්‍යයෙන් ගෘහපාලනය සහ ගෙදරදොර දෛනික වැඩකටයුතු ඉටු කිරීමේ බර සම්පූර්ණයෙන් ම පැවරෙන අතර, ඔවුන්ව දේශපාලන ක්ෂේත්‍රයෙන් බැහැර කෙරේ. එබැවින්, වාමාංශික ව්‍යාපාර ආධිපත්‍යය දරන වඩාත් ප්‍රගතිශීලී අවකාශ තුළ පවා, තම සහකාරිය, සහෝදරිය හෝ මව නිවසේ හැර දමා, ඔවුන් ගෙදරදොර වැඩ කටයුතු ඉටු කරමින් සිටිය යුතු යැයි අපේක්ෂාවෙන් පිරිමින් දේශපාලන අවකාශයන්හි ඉදිරියෙන් ම සිටිනු බොහෝ විට දැකගත හැකි ය.

දේශපාලන අවකාශ තුළ මෙවැනි ප්‍රශ්න මතු කළ විට, කතුවරුන්ට ඔවුන්ගේ පිරිමි සගයින්ගෙන් ලැබුණේ තමන් ආරක්ෂා වන ආකාරයේ ප්‍රතිචාර විය. 'කාන්තාවන් සහභාගීවීම කවුරුත් අවහිර කර නැහැ' සහ "අපට අවශ්‍ය කරන්නේ කාන්තාවන් වැඩි වැඩියෙන් දේශපාලනයට පැමිණීමයි" යනුවෙන් පිරිමි තරයේ පවසති. එමෙන් ම, "සාකච්ඡාවලට එන ලෙස අපි කාන්තාවන්ගෙන් කොතෙක් ඉල්ලා සිටියත් ඔවුන් දේශපාලනය ගැන උනන්දුවක් දක්වන්නේ නැහැ" යනුවෙන් ඔවුන් පවසනු ඇත. ඇත්ත වශයෙන් ම, මෙවැනි ප්‍රකාශ සිදු කරන පිරිමින් ම තමන්ගේ ගෙදර දොර වගකීම් කාන්තාවන් මත පැටවීම උපහාසාත්මක ය. තවද, කාන්තාවන්ව දේශපාලන රැස්වීම්වල දී කථා කිරීමෙන් බැහැර කර තැබීම පිණිස ඒ පුද්ගලයින් ම, "ඇයට දේශපාලනය ගැන ප්‍රමාණවත් තරම් උනන්දුවක් නැහැ", "ඇය ප්‍රසිද්ධ වේදිකාවේ කථා කළ හැකි කථිකයෙක් නොවෙයි", "ඇයට එවැනි වේදිකාවක් සපයා දීමට තරම් ඇය සිදු කර ඇත්තේ කුමක් ද" වැනි ප්‍රකාශ කරනු ඇත. කාන්තාවකට රැස්වීමක දී කතා කිරීමට ඉඩ ලැබෙන දුර්ලභ අවස්ථාවල දී පවා, ඇය එහි අවසාන කථිකයන් කිහිප දෙනාගෙන් එක් අයෙකු වන අතර, බොහෝ විට, විෂමලිංගික පිරිමින්ගෙන් පමණක් සමන්විත මණ්ඩලයක කතා කරන එකම කාන්තාව ද ඇය වනු ඇත.

විරෝධතා ව්‍යාපාර තුළ තමන්ට හිමි විය යුතු දේශපාලන අවකාශයට හිමිකම් කීමට කාන්තාවන් කරන අරගලය කටුනායක ප්‍රදේශය කේන්ද්‍රකර ගනිමින් පිහිටුවා ඇති 'ස්ටෑන්ඩ්අප්' නැමති ව්‍යාපාරයේ අශිලා දන්දෙණිය විසින් පහත පරිදි සාරාංශ කරන ලදී. ඇය මෙසේ පැවසුවා ය;

> "සෑම ප්‍රසිද්ධ රැස්වීමක ම පළමු සටන වෙන්නෙ කථා කිරීමට මයික්‍රෆෝනය ලබා ගැනීම. අපි සෙනග මැදින් තල්ලු කරගෙන ගිහින් මයික් එක අතට අරගෙන කතා කරන්න හදනකොට අපේ ශක්තියෙන් බාගයක් ඉවර වෙලා. අන්තිමට අපි මයික් එක අතට ගත්තහම, අපි මුලින් ම කියන්න ඕනැ දේ මොකක්ද කියන එක අමතක වෙන තරමට අපට මහන්සියි, අපි වෙහෙසට පත් වෙලා. ඒකේ ප්‍රතිඵලයක් විදියට අපි අවිශ්වාසයෙන් යුතුව කථා කරනව වගේ දැනෙන්න ගන්නවා, අපේ කටහඬ වෙව්ලනවා"

දේශපාලන අවකාශයන් තුළ හුදෙක් තම හඬ අන් අයට ඇසීමට සැලැස්වීම සඳහා අවස්ථාවක් ලබා ගැනීමට පවා කාන්තාවන්ට දැරීමට සිදු වන බලවත් පරිශ්‍රමය පිළිබඳව මෙම ප්‍රකාශයෙන් මනාව කියාපායි. ප්‍රගතිශීලී වාමාංශික ව්‍යාපාර සහ අවකාශ තුළ පවා 'කාන්තාවන් ඔවුන්ගේ ස්ථානයේ තබා තැබීම පිණිස' ඒකාබද්ධ වන ව්‍යුහාත්මක ප්‍රතිරෝධයන් සහ අවිඥානික ප්‍රයත්නයන් පවතින බව මෙවැනි අදහස් මගින් ඉස්මතු කර පෙන්වයි.

## අරගලයේ දී සමාජ හා සංස්කෘතික බාධාක බිඳ දැමූ කාන්තාවෝ

කෙසේ වෙතත්, එයම අරමුණු කර නොගත්තත්, 'අරගලයෙන්' දේශපාලන ව්‍යාපාර තුළ ඇතුළත් මෙම පීතෘමූලික ව්‍යුහාත්මක බාධකවලින් ඇතැම් ඒවා ආමන්ත්‍රණය කරන ලදී. 'අරගලය' සහ අවිහිංසාවාදී ආකාරයට පොදු අවකාශ අත්පත් කර ගෙන සිටීම මාස කිහිපයක් පුරා පැවති බැවින් තමන්ට නිදහස ඇති කාලවේලාවක පැමිණ විරෝධතාවලට දායකවීමට කාන්තාවන්ට හැකියාව ලැබුණ අතර, ඔවුන්ට මෙම ඓතිහාසික අරගලයට සම්බන්ධ වී සිටීමට හැකි වන පරිදි ඔවුන් අත්පත් කර ගෙන සිටි පරිශ්‍රය තුළ ළමා රැකවරණ ස්ථාන පවා නිර්මාණය කරගන්නා ලදී. මහමග දී සිදුවන හිරිහැර සහ තමන්ගේ ශාරීරික ආරක්ෂාව පිළිබඳ අනෙකුත් කරුණු ගෙනහැර දක්වමින් අන් අවස්ථාවල දී රාත්‍රී කාලයේ පැවැත්වෙන අවස්ථාවලට සහභාගීවීමෙන් වැළකී සිටි තරුණියෝ පවා විශාල වශයෙන් අරගලයට සහභාගි වූහ. අරගලය පැවති කාලය තුළ, විශේෂයෙන් ම රාත්‍රී කාලයේ සහ හිමිදිරි පාන්දර පවා තමන්ට මාර්ග වඩාත් ආරක්ෂිත වූ බව ඇතැම් කාන්තාවෝ නිරීක්ෂණය කළහ.

2022 මාර්තු 31 වැනි දින මිරිහානේ පැවති විරෝධතාවය කාන්තාවන්ට තම දරුවන් ද රැගෙන පැමිණිය හැකි අවකාශයක් විය. මධ්‍යම පාන්තික කාන්තාවෝ කිහිප දෙනෙක් සිතාමතා ම ළදරුවන් ඇතුළුව තම දරුවන් ද එම විරෝධතා පාගමනට රැගෙන ඒමට තීරණය කළහ. අරගලයට පැමිණි මව්වරුන් කිහිප දෙනෙකුගේ ම පුළුල් දේශපාලන හැඟීම වූයේ: "මේ අරගලය අපේ දරුවන්ට යහපත් අනාගතයක් උදා කර දීම සඳහායි; එනිසා, අපේ දරුවන් වෙනුවෙන් අප කරන සටන ඔවුන් දැක ගත යුතුයි"යන්නයි. අත්පත් කර ගෙන සිටි පරිශ්‍රය ආරක්ෂිත අවකාශයක් බව කාන්තාවෝ සහතික කළහ. සිදු වෙමින් පැවති මෙම වෙනස්වීම් පිළිබඳවත්, ළමයින්ගේ සහභාගීත්වය හරහා, අරගලයට සහභාගීවීමට අකමැත්තෙන් සිටි පුද්ගලයින්ට පවා නිර්භයව අරගල භූමියට පැමිණිය හැකි ආරක්ෂිත අවකාශයක් නිර්මාණය වන ආකාරය පිළිබඳවත් රජය දැනුවත්ව සිටි බව කතුවරුන්ගේ විශ්වාසයයි.

විරෝධතාකරුවන්ට එරෙහිව රජය දියත් කළ මර්දනයෙහි කොටසක් ලෙස දෙමාපියන්ව සහ ඔවුන්ගේ ළමයින්ව ක්‍රමානුකූලව ඉලක්ක කරන මෙන් නීතිය ක්‍රියාත්මක කරන පාර්ශ්වයන්ට උපදෙස් දී තිබූ බව ඉතා පැහැදිලි වූ අතර, ඔක්තෝබර් 09 වැනි දින ගාලු මුවදොර පරිශ්‍රයේ පැවති අනුස්මරණ උත්සවයක දී පොලිසිය අනුගමනය කළේ එම උපදෙස් ය. පොලිසිය අමානුෂික ලෙස දරුවන් තම දෙමව්පියන්ගෙන් වෙන් කරන අයුරු දැක්වෙන ඡායාරූප මාධ්‍ය හරහා ප්‍රචාරය විය. රාජ්‍ය යාන්ත්‍රණයෙහි කොටස්කරුවෙක් වූ ජාතික රෝහලේ අධ්‍යක්ෂවරයා ද දෙමව්පියන්ට අවවාද කරමින්, විරෝධතාවලට දරුවන් රැගෙන ඒමෙන් වළකින ලෙසට උපදෙස් දුන්නේ ය. රජය, රජයේ හිතවතුන් සහ එහි අනුගාමිකයින් විරෝධතා දක්වන මව්පියන් විසින් 'මිනිස් පලිහක්' ලෙස දරුවන්ව යොදා ගන්නේ ය යන අදහස සිතාමතාම මාධ්‍ය සහ සමාජ මාධ්‍ය තුළ රෝපණය කළහ. එහෙයින්, ඔක්තෝබර් 09 වැනිදා සාමකාමී විරෝධතාකරුවන්ට එල්ල වූ ප්‍රහාරය විරෝධතා ව්‍යාපාරය තුළ කාන්තාවන් සඳහා වූ අවකාශය වසා දැමීම පිණිස රජය විසින් ගනු ලැබූ තීරණාත්මක පියවරක් ලෙස සලකන ලදී.

කාන්තා ශ්‍රමය, කාන්තා කම්කරු අරගල සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වැනි මාතෘකා ආමන්ත්‍රණය කරමින් එම මාතෘකා ඔස්සේ සාකච්ඡා සිදුකිරීමට අවකාශ 'අරගලයෙන්' නිර්මාණය කර දුනි. මෙම විෂයයන් සහ සාකච්ඡා සඳහා විශාල කාන්තා සහභාගීත්වයක් ලැබුණි. උදාහරණයක් ලෙස, විමුක්ති ව්‍යාපාරයෙන් (ස්ත්‍රීවාදී වාමාංශික කාන්තා කණ්ඩායමක්) සංවිධානය කළ සාකච්ඡාවක් මගින් කාන්තා ශ්‍රමය ඓතිහාසික වශයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයේ කොඳු නාරටිය වී තිබෙන බව ද, රාජපක්ෂවරු විසින් කොල්ලකන ලද සහ අහිමි කරන ලද ධනය වැඩ කරන කාන්තාවන්ගේ ලේ, දහඩිය සහ කඳුළු වල ප්‍රතිඵලයක් ලෙස උපයා ගන්නා ලද ධනය බව ද. ඉස්මතු කර පෙන්වන ලදී. සාම්ප්‍රදායික දේශපාලන අවකාශයන් තුළ 'ජාතික වැදගත්කමකින්' යුතු ප්‍රශ්න පිරිමින්ට ඉතිරි කර, කාන්තාවන්ට 'ළමා රැකවරණය' වැනි ගෙදරදොර කාරණා පමණක් සාකච්ඡා කිරීමට ආරාධනා කරන ලද්දේ නම්, අරගලය තුළ එම තත්ත්වය උඩුයටිකුරු කෙරිනි. කාන්තාවන්ට බලපාන ප්‍රශ්න, ජාතික ප්‍රශ්න බවට පත් කරවන ලද අතර, ඒ අනුව ජාතික ආරක්ෂාව, ප්‍රජාතන්ත්‍රවාදය හා පාලනය, සහ අනෙකුත් ජාතික ප්‍රශ්න කාන්තාවන්ගේ ද

ප්‍රශ්න බවට පත් කරවන ලදී. ඒ සමගින්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන ලෙස ඉල්ලා කාන්තාවන් විසින් පාගමන් මෙහෙයවනු දැකීම අසාමාන්‍ය දෙයක් නොවී යි විමුක්ති ද සිල්වා වැනි ක්‍රියාකාරීන් ටවුන් හෝල් ස්වරූපයේ රැස්වීම්වල දී (ජනතාව විසින් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සපයන රැස්වීම්) සීමාකාරී සංකල්ප අභියෝගයට ලක් කරමින් "ගෝඨා ගෝ ගම" යනු ස්ථානයක් නොවන බවත්, එය ජනතා ව්‍යාපාරයක් බවත් ප්‍රකාශ කිරීම සුලභ සිදුවීමක් විය. "ඔවුන් අපට පහර දෙන විට මුළු රටම අපව ආරක්ෂා කරන්න පැමිණියා. ඒක කවදාවත් අමතක කරන්න එපා!" නූර් නූරා වැනි ක්‍රියාකාරීන් විරෝධතා පාගමන්වල ඉදිරිපෙළේ සිට පොලිසියට අභියෝග කරමින්, "ඔබට ලැජ්ජාවක් නැද් ද? අපි සටන් කරන්නේ ඔබේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන්!" යනුවෙන් පවසනු දැකීම විරල දර්ශනයක් නොවී ය.

රජයෙන් පුරුෂයින් ඉලක්ක කර ගන්නා විට, කාන්තාවෝ විරෝධතාවල පෙරමුණට පැමිණියහ. මෙය ලොව පුරා විරෝධතා ව්‍යාපාරවල පොදු ලක්ෂණයක් වන අතර, ශ්‍රී ලංකාවේ විරෝධතාවල දී ද මෙය සිදු විය. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලට සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීම්වලට එරෙහිව ද, අත්පත් කරගෙන සිටින ඉඩම් නිදහස් කරන ලෙස ඉල්ලා සිටිමින් ද පැවැත්වූ විරෝධතා ව්‍යාපාරවලට කාන්තාවෝ නායකත්වය දුන්හ. එලෙස ම ගාලු මුවදොර දී ද බොහෝවිට කාන්තාවන් පොලිසියට අභියෝග කරමින් ඉදිරිපෙළෙහි සිට ගත්හ. මෙම කාන්තාවෝ පොලිසිය වැනි රාජ්‍ය ව්‍යුහයන්ට ආවේණික වූ පුරුෂාධිපත්‍යයෙන් ප්‍රයෝජන ගත්හ. බැටන් පොල්ලෙන් පිරිමින්ට පහර දී ඔවුන් විශාල සංඛ්‍යාවක් මෙල්ල කර අත්අඩංගුවට ගැනීම හුරු පිරිමි පොලිස් නිලධාරීන්, කාන්තා විරෝධතාකාරියන් විශාල සංඛ්‍යාවක් සම්බන්ධයෙන් කටයුතු කළයුතු වන්නේ කෙසේදැයි දැන සිටියේ නැත. කාන්තා විරෝධතාකාරියන් රාත්‍රිය පහන් වනතුරු පොලිස් සිරමැදිරිවල රඳවා තබා ගැනීමට අවශ්‍ය ඉඩකඩ සපයාගැනීම වැනි ප්‍රායෝගිකව උභතෝකෝටික ගැටලු විසඳා ගැනීමට පොලිසියට බලවත් පරිශ්‍රමයක් දරන්නට වියි එමෙන් ම, මධ්‍යම පාන්තික කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය යොදා ගැනීමට පොලිසිය බියපත්වූ බවක්, නැත හොත් චකිතයක් දැක්වූ බවක් පෙනෙන්නට තිබුණි, ගාලු මුවදොර පරිශ්‍රය අත්පත්කර ගැනීමෙන් පසුව ද මෙම සියලු ආතතීන් දක්නට ලැබුණු අතර, පසුව රජය විසින් ම එම අත්පත් කර ගැනීම ප්‍රචණ්ඩ ලෙස මර්දනය කරන ලදී.

## අරගලයේ දී කාන්තාවන්ට අඛණ්ඩව මුහුණ දීමට සිදු වූ අභියෝග

ගාලු මුවදොර වාඩිලාගෙන සිටීමේ විරෝධතා ව්‍යාපාරය තුළ කාන්තාවන් සාම්ප්‍රදායික දේශපාලන ව්‍යුහයන්ට අභියෝග කළ ද, ඔවුන්ට සංස්කෘතික හා සමාජ ව්‍යුහයන්ට ද, පිරිමි විරෝධතාකරුවන්ගේ උදාසීනත්වයට ද අඛණ්ඩව මුහුණ දීමට සිදු වියි අඛණ්ඩව පැවතුණු මෙම බාධා, මෙම අවකාශ තුළ ඔවුන්ගේ පූර්ණ දායකත්වය ලබා දීමෙන් කාන්තාවන් වැළක්වූයේ ය. උදාහරණයක් ලෙස, සවස් වරුවේ රැස්වීම් ආරම්භ වී පසු දින උදෑසන දක්වා එම රැස්වීම් පැවති අවස්ථාවලදී පැය කිහිපයක් ගතවන විට කාන්තා සහභාගීත්වය ක්‍රමයෙන් අඩු විය. එබැවින්, බොහෝ විට මෙම රැස්වීම්වල අවසන් තීරණවලට එළඹෙන අවස්ථාව වන විට, කාන්තා හඬ හෝ ඔවුන්ගේ එකඟත්වය එහි නොතිබුණි. ඉඳහිට, පිරිමි බලකොටුවලට පමණක් වරප්‍රසාද දීම වැනි ක්‍රියා කාන්තාවන් සහ සංක්‍රාන්ති කාන්තාවන් විසින් අභියෝගයට ලක් කරන ලද අතර, එහිදී ඔවුහු "රාත්‍රී අටට අපි යම් දෙයක් තීරණය කළා; ඒ තීරණය පාන්දර දෙක වන විට වෙනස් වූණේ කොහොම ද? ඒක කාගේ තීරණයක් ද?" යනුවෙන් අසමින් රැස්වීම්වලට බාධා කළහී ඇතමුන් මෙය දුටුවේ ක්‍රියාකාරකම්වල ප්‍රගතියට බාධාකිරීමක් ලෙසයි. නමුත් සැබැවින් ම එය දේශපාලන අවකාශ තුළ කාන්තාවන් බැහැර කරනු ලබන ව්‍යුහයන්ට සහ පරිචයන්ට, එනම් පිරිමින් විසින් - අයුක්තියට එරෙහිව විරෝධය දක්වන පිරිමින් විසින් පවා - නිවැරදි යැයි සලකනු ලබන ව්‍යුහයන්ට සහ පරිචයන්ට කළ අභියෝගයක් විය.

විරෝධතා ව්‍යාපාරවල සහ දේශපාලන අවකාශයන්හි කාන්තා සහභාගිත්වය සහ නායකත්වය නිර්වචනය කරන සහ සීමා කරන ඇතැම් සම්ප්‍රදායික අදහස් වලින් ඇත් වන අවකාශයක් බවට අරගලය පත්වෙමින් තිබුණ ද, එයට සහභාගී වූ සෑම කාන්තාවකට ම ඒ සම්බන්ධයෙන් එක හා සමාන අත්දැකීමක් ලැබී තිබුණේ නැත. පිරිමින්ගෙන් සිදුවන හිරිහැර සහ තර්ජනාත්මක හැසිරීම් පිළිබඳ සංක්‍රාන්ති කාන්තාවෝ පැමිණිලි කළහ. මෙම සිදුවීම් වූයේ ප්‍රථම ප්‍රසිද්ධ අභිමානවත් පා ගමන (ප්‍රයිඩ් පැරේඩ්) ඉතා වර්ණවත් ලෙස, අලංකාරයෙන් යුතුව කොළඹ දී පැවැත්වීමට සංවිධානය කරමින් තිබිය දී ය. කම්කරු පන්තියේ කාන්තාවන්ට සුපුරුදු ලෙස ඔවුන්ගේ රැකියාවල නිරත වීමට සිදු වී තිබූ බැවින් ඔවුන්ට සිය කර්මාන්තශාලාවලින් හෝ වතුවලින් පිටව යාමට නොහැකි විය. වෘත්තීය සමිති එම සේවකයින්ව හර්තාලයකට කැඳවා තිබූ අවස්ථාවල දී පවා වර්ජනවලට සහභාගි නොවන

ලෙස කර්මාන්තශාලාවලින් කාන්තාවන්ට තර්ජනය කරන ලද බවට වාර්තා විය.

## ශ්‍රී ලංකාව තුළ අන්තර්කරණය වූ පොදුජන දේශපාලන ක්‍රියාවාදය සඳහා මාර්ගයක් වශයෙන් අරගලය/පෝරාට්ටම්

දරාගත නොහැකි ආර්ථික දුෂ්කරතාවලින් සහනයක් ඉල්ලමින් කාන්තාවක් තම දරුවා ද දෑතින් වඩාගෙන මිරිහානට පැමිණීමෙන් ආරම්භ වූ ඒ ගමන, ශ්‍රී ලංකාවේ විශාලතම අවිහිංසාවාදී විරෝධතා ව්‍යාපාරවලින් එකක් බවට පත් වූ අතර, මූලික වශයෙන් එමගින් සාක්ෂාත් කර ගැනීමට අරමුණු කරගත් දේ අවම වශයෙන් ප්‍රතිපත්තිමය ලෙස හෝ සාක්ෂාත් කර ගන්නට හැකි විය. ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත් වූ විධායක ජනාධිපතිවරයා ක්‍රමයෙන් රට ආර්ථික අර්බුදයක් කරා ඇද දමන අන්දමින් සිදු කළ ක්‍රියා හේතු කරගෙන ඔහුව ප්‍රතික්ෂේප කරමින් ඔහුව "ගෙදර යැවීම" එම අරමුණ විය. ඔහුගේ අසාර්ථකත්වය හේතුවෙන් ඔහු කෙරෙහි තිබූ ජනතා විශ්වාසය ද, රට පාලනය කිරීම සඳහා ඔහුට ලබා තිබූ ජනවරම ද අහිමි වියි දේශපාලනයට පිවිස තමන්ගේ දේශපාලන ක්‍රියාවාදය ප්‍රකාශ කිරීමට කාන්තාවන්ට දිගින් දිගට ම බාධා පැවතිය ද, කාන්තාවන් විසින් තමන්ගේ ම අවකාශයක් නිර්මාණය කරගනිමින් විරෝධතා ව්‍යාපාරයක් ජයග්‍රහණය කරා මෙහෙය වූ ආකාරය විදහා පාන අරගලය, මෙරට සහ මෙම කලාපය මුළුල්ලේ දේශපාලන ව්‍යාපාරවල දෑස් විවර කරන්නක් විය.

# අරගලය - ශ්‍රී ලංකාවේ ජනතා අරගලයඃ විරෝධතා කලාව ඔස්සේ විරෝධතාවයේ කලාව ප්‍රකාශ කිරීම්

*සකුන ගමගේ*[1]

*අරගලය නොහොත් ජනතා විරෝධතාවල වඩාත්ම අවධානයට පාත්‍රවූ ලක්ෂණ අතරට ජනතාව සමගින් සම්බන්ධ වීම සඳහා සමාජ මාධ්‍ය (නව මාධ්‍ය) භාවිතය මෙන්ම විවිධාකාර කලාවන් භාවිතය සුවිශේෂී විය. ශ්‍රී ලාංකික ජනතාව අතරේ නිල නොවන සමාජ ගිවිසුමක් පුළුල් කරමින්, රජයට එරෙහිව විරෝධතා දක්වන්නට ඔවුන් උනන්දු කිරීම සඳහා සමාජ මාධ්‍ය වැදගත් භූමිකාවක් නිරූපණය කළේය.*

*චිත්‍ර, සංගීතය, නාට්‍ය, වේදිකාව, සිනමාව, දෘශ්‍ය කලා සහ ඡායාරූපකරණය, කවි හා සාහිත්‍යය යනාදි විවිධාකාර කලාවන් ද භාවිතා කෙරුනු අතර, ප්‍රතිරෝධය ප්‍රකාශ කිරීමට සහ නිර්මාණශීලී විකල්ප ප්‍රකාශන හරහා ජනතාව එක් රැස් කර මෙහෙයවන්නට ඒවා වඩාත් සක්‍රිය භූමිකාවක් නිරූපණය කළේය.*

## පසුබිම




*01 වෙනි ඡායාරූපයඃ ශ්‍රී ලාංකාවේ ජනතාවකොළඹ 01 වැතම් වීදියෙන් ජනාධිපති නිල නිවසට ඇතුළු වීමට උත්සාහ කිරීම (ගමගේ 2022).*

[1] නීතිය හා සමාජ භාරයේ පර්යේෂක - සකුණ එම් ගමගේ යනු ශ්‍රී ලංකා නීති සහ සමාජ භාරයේ පර්යේෂකවරයෙකි. ඔහු සමාජ වාර්තා ඡායාරූප ශිල්පියෙකු මෙන් ම සමාජ ක්‍රියාකාරිකයෙකු ද වේ. දෘශ්‍ය මානව විද්‍යාව, ජාත්‍යන්තර සබඳතා සහ ගෝලීය දේශපාලනය, සමාජ ව්‍යාපාරයන්, සමාජ හා දේශපාලන ප්‍රතිරෝධතා, දෘශ්‍ය ප්‍රතිරෝධතා, දෘශ්‍ය ගෝලීය දේශපාලනය, සංස්කෘතික මානව විද්‍යාව, කම්කරු අයිතිවාසිකම්, ගෝලීය ආරක්ෂාව, භූ දේශපාලනය, පාරිසරික ආරක්ෂාව, ආන්තිකකරණය, උපාශ්‍රිත අධ්‍යයනයන්, කලාව, සිනමාව, මාධ්‍ය සහ නව මාධ්‍ය, ඡායාරූපකරණය සහ කාව්‍ය ශාස්ත්‍රය, සංස්කෘතික ජනවාර්ගික විද්‍යාව යන ක්ෂේත්‍රයන්ට අදාළව පර්යේෂණ පැවැත්වීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වයි.

දේශීය වශයෙන් 'අරගලය' (සිංහල භාෂාවෙන්) සහ'පෝරාට්ටම්' (දෙමළ භාෂාවෙන්) නමින් හැඳින්වුණු මහජන විරෝධතා ව්‍යාපාරයක් ඔස්සේ ශ්‍රී ලංකාවේ ජනතා අරගලය ප්‍රකාශවිය. එය මෙරට සිදු වූමින් පෙර මුහුණ නොදුන් ආකාරයේ ආර්ථික කඩා වැටීමට සහ දේශපාලන ව්‍යාකූලත්වයටජනතාව දැක්වූ ප්‍රතිචාරයවිය.රටේ තැන තැන හටගත් පුද්ගල විරෝධතා සහ කුඩා කණ්ඩායම් ලෙසින් දැක්වූ විරෝධතා සමග එක්වූජනතා ව්‍යාපාර කිහිපයක් වර්ධනය වී,ක්‍රමයෙන් ශක්තිමත් වෙමින්, ඉතා පුළුල් ජනතා විරෝධතා ව්‍යාපාරයක් ලෙස ඒකරාශී විය. රට පුරානිර්මාණය වූ මෙම ජනතා විරෝධතා සහ පෙළපාලි රැල්ලට සම්බන්ධ වූ ශ්‍රී ලාංකික ඩයස්පෝරාව ද එතෙර විවිධ රටවල සිට සිය විරෝධතාවන් පවත්වනුලැබීමෙන් මෙම විරෝධතාවයන්හි දෘශ්‍ය මානයන්තව තවත් පුළුල් විය. අර්බුදයට බලපෑ හේතු දීර්ඝකාලීනව නිදන්ගතව පැවති ඒවා වූ නමුත්,2020 වර්ෂයේ දී කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන් හටගත් ආර්ථික පීඩනයන් සමගඒවා දැඩි ලෙස ඉස්මතුවන්නට පටන් ගැනුනි.



*02 වෙනි ඡායාරූපය: 'ගාලු මුවදොර අත්පත් කර ගනිමු' විරෝධතා ව්‍යාපාරය. ජනතා අරගලයේ පළමු දිනය. (ගමගේ, 'ගාලු මුවදොර අත්පත් කර ගනිමු' ව්‍යාපාරය 2022)*



*03 වෙනිඡායාරූපය: ගෑස් සිලින්ඩර විරෝධතාවය. කොළඹ 11, ආමර් වීදිය මංසන්ධියේ දී ද්‍රව ගෑස් නොමැති වීම හේතුවෙන්අපේක්ෂාභංගත්වයට පත් විරෝධතාකරුවෝමග හරස් කර වසා දමති.(ගමගේ,ගෑස් සිලින්ඩර් විරෝධතාවය 2022)*



*04 වෙනිඡායාරූපය: ඉවසිලිමත් ගෘහවාසීන්- කිරුළපන මංසන්ධියේ දී කුඩා දැරියක්සහ ඇයගේ මව ඉවසීමෙන් යුතුවද්‍රව පෙට්‍රෝලියම් වායුව (එල්.පී. ගෑස්)මිලදී ගැනීම සඳහා රැඳී සිටිති.ශ්‍රී ලංකාවේ කොළඹ අගනගරයේඅනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය හිඟය මධ්‍යයෙහි ගෑස් සිලින්ඩර හිඟය,(ගමගේ,අර්බුදයට මුහුණදෙන කුඩා දැරිය සහ මව, 2022)*



*05 වන ඡායාරූපය: ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය වඩාත් නරක තත්ත්වයට පත්වීමත් සමගරියදුරන් මුළු රාත්‍රිය පුරා ඉන්ධන මිලදී ගැනීම සඳහා පෝළිම්වල රැඳී සිටීම. (ගමගේ, පෙට්‍රල් පෝළිම, කැළණිය,2022).*



*06 වෙනිඡායාරූපය: අපේක්ෂා බිඳ වැටුණු සමයක,අපේක්ෂා බිඳ වැටුණු ජීවිත.ත්‍රීරෝද රථ රියදුරෙක්, ඔහුගේ බිරිඳ සහ අවුරුදු දෙකක් වයසැති දියණිය මුළු රාත්‍රිය පුරා පෙට්‍රල් පෝළිමේ නවත්වා තිබූත්‍රීරෝද රථය තුළවකුටු වී නිදා ගැනීම (ගමගේ, පෙට්‍රල් පෝළිම, කැලණිය, 2022).*

ජනතාව මත තිබූ ආර්ථික පීඩනයන් 2020 වර්ෂයේ සිට ඉහළ යමින් පැවතුණි. වසංගතය පාලනය කිරීම සඳහා රජය විසින් අනුගමනය කරන ලද කුරිරු ක්‍රමවේදවල සහ හදිසියේ ම රසායනික පොහොර භාවිතය තහනම් කිරීමට හා බදු අඩු කිරීමට ගත් අදුරදර්ශී ආර්ථික ප්‍රතිපත්තිවල සංයෝජනයක් සමග අධික දූෂණය හා රාජ්‍ය මුදල් අවභාවිතය මෙම අර්බුදය නිර්මාණය වීමට හේතු විය. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිත කඩා වැටුණු අතර, ඩොලරය සඳහා කෘත්‍රිම විනිමය අනුපාතිකයක් පවත්වාගෙන යාමටමහබැංකුව ගත් තීරණ සංක්‍රමණික ශ්‍රමිකයින්සහ අපනයනකරුවන් ස්වකීය ඉපැයීම් බැංකු පද්ධතිය හරහා ප්‍රේෂණය කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු විය.මෙලෙස නිර්මාණය වූ විදේශ විනිමය අර්බුදය හේතුවෙන් රජයට අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම දුෂ්කර වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඉන්ධන,ගෑස්, ආහාර සහ ඖෂධ ආදියෙහි හිඟයක් ඇති වී,ප්‍රවාහනය සහ විදුලි සැපයුම වැනි පොදු සේවාවන් සඳහා අධික ඉල්ලුමක් ඇති විය. ඒකාධිපතිවාදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ ඔහුගේ රජය මෙම ගැටලු පිළිබඳ පොදුසංවාදයන්ට කැමැත්තක් නොදැක්වීය. ජනතාව ඉන්ධන, ගෑස් සහ ආහාර ලබා ගැනීම සඳහා පැය ගණන්, ඇතැම්විට දින ගණන්, පෝලිම්වල රැඳී සිටීම මගින් ඔවුන් මත ඇති ආර්ථික පීඩනය කොතෙක්ද යන්න පැහැදිලිව ප්‍රත්‍යක්ෂ විය. ජනතාව අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ඔවුන්ගේ කාලයෙන් වැඩි කොටසක් පෝලිම්වල ගත කිරීම හේතුවෙන් අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම් අඩාල විය. අවසානයේ දී මෙම පීඩනයන් මහමගට බැස රජයට විරුද්ධව උද්ඝෝෂණය කිරීමට ජනතාව පෙළඹවීය.

ආර්ථික අර්බුදයට තිබූ විරෝධය විද්‍යමාන වූ පළමු විරෝධතාවය 2022 මාර්තු 01වෙනි දින කොහුවල නගරයෙන් ආරම්භ විය. එහිදී විරෝධතාකරුවන් ඔවුන්ගේ දුක්ගැනවිලි කියාපාන විවිධ සටන් පාඨ සහිත පුවරු ප්‍රදර්ශනය කරමින්, ඉටි පන්දම් දල්වාගෙන විරෝධතාවයක් පැවැත්වූහ. විදුලි කප්පාදුව සහ අත්‍යාවශ්‍ය ද්‍රව්‍යවල හිඟය හේතුවෙන් දැඩි ලෙස පීඩාවට පත්ව සිටි ශ්‍රී ලාංකික ජනතාව සියගණනක් දෙනා රට තුළ පවතින මෙම බොහෝ ගැටලු වලට විසඳුම් ලබා දෙන ලෙස සහ එසේ නොමැති නම් ඉල්ලා අස්වන්න යනුවෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට බලකරමින් 2022 මාර්තු 31 වැනි දින ජනාධිපතිවරයාගේ මිරිහානේ පිහිටි පෞද්ගලික නිවස අසලට රැස්වීමත් සමගමෙම විරෝධතාවයන්හි ආකෘතියේ ප්‍රධාන වෙනසක් සිදු විය(කළම්බු පේජ්, 2022). මෙම මිරිහාන විරෝධතාවය ශ්‍රී ලංකා ආරක්ෂක අංශ විසින් සාහසික ලෙස මර්දනය කරන ලද අතර, එහිදී මාධ්‍යවේදීහු, සිවිල් වැසියන් මෙන් ම ආරක්ෂක අංශ සාමාජිකයින් ද ඇතුළුව ආසන්න වශයෙන් පුද්ගලයින් 50 දෙනෙකු පමණ තුවාල ලැබූහ. (නිවුස්ෆර්ස්ට්, 2022). මෙම සිදුවීම විරෝධතා ව්‍යාපාරය ශක්තිමත් කිරීමට හේතු වූ අතර, ඇඳිරි නීතිය සහ වෙනත් මර්දන උපක්‍රම යොදා ගනිමින් එය මැඩ පැවැත්වීමට රජය දැරූ ප්‍රයත්න නොතකා ශ්‍රී ලාංකික සමාජයේ විවිධ සමාජ පන්තීන්ගෙන් විශාල ජන ගඟක් විරෝධතාවයට එක් වූහ.




*07 වෙනි ඡායාරූපය: ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය උග්‍ර වීමත් සමග, කොහුවල මංසන්ධියේ දී විරෝධතාකරුවෝ ඔවුන්ගේ දුක්ගැනවිලි කියාපාන විවිධ සටන් පාඨ සහිත පුවරු ප්‍රදර්ශනය කරමින්, ඉටි පන්දම් දල්වාගෙන විරෝධතාවයක් පැවැත්වූහ.අවට නාගරික ප්‍රදේශ (ගමගේ, ඉටිපන්දම් දල්වාගෙන පැවැත්වූ විරෝධතාවය, කොහුවල, 2022).*

මිරිහාන විරෝධතාවයෙන් පසුව,මෙම විරෝධතා ව්‍යාපාරය හිටපු ජනපති ගෝඨාභය රාජපක්ෂ ඉල්ලා අස්විය යුතු බවට අඛණ්ඩව හඬ නගමින් බල කර සිටියේය. “#Go Home Gota” (ගෝඨා ගෙදර යන්න) යන හැස් ටැගය විරෝධතා කරුවන්ගේ ප්‍රධාන ම සටන් පාඨය විය. පැය ගණනාවක් විදුලිය කැපීම, සහ ගෘහස්ථගෑස්, ප්‍රවාහනය පහසුකම් සහ ආහාර හිඟවීමෙහි ප්‍රතිඵලයක් ලෙස මහජනතාවගේ අපේක්ෂාභංගත්වය උච්ඡතම තත්ත්වය පත් විය. 2022 අප්‍රේල් මස 09 වෙනි දින ගාලු මුවදොර පිටියට රැස් වූ ජනතාව මුහුදු සුළඟේ සුවය විඳීමට මිනිසුන් එක්රැස් වූ එම පොදු ස්ථානය උද්ඝෝෂණ භූමියක් බවට පරිවර්තනය කළහ. උපහාසයට කරුණ නම්, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ධූරයට පත්වූ විගස,2019 නොවැම්බර් මාසයේ දී, මෙම භූමියේ කොටසක් උද්ඝෝෂණ සඳහා වෙන් කර දී තිබීම යි.



*08 වෙනි ඡායාරූපය: ජනතා අරගලයේ පළමු දිනය. ජනතාව එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරණායක පිළිරුව වටා රැස්විය. (ගමගේ, ගාලු මුවදොර අත්පත් කර ගනිමු ව්‍යාපාරය, 2022)*

අප්‍රේල් 09 වෙනිදායින් පසුව,විරෝධතාකරුවන් විසින් ගනු ලැබූ නව පියවර ගණනාවක් නිසාවිරෝධතා ව්‍යාපාරය වඩාත් ශක්තිමත් විය. විශේෂයෙන් ම,අරගලය විරෝධතා ව්‍යාපාරය විසින්අලුතින්උද්ඝෝෂණස්ථාන ස්ථාපනය කිරීම හා ව්‍යාප්ත කිරීම ආරම්භ කළේය.ගාලු මුවදොර පිටිය කේන්ද්‍ර කර ගනිමින් කොළඹ නගර මධ්‍යයෙහි පිහිටුවා ගත්මෙම විරෝධතා ස්ථානය "ගෝඨාගෝගම"යනුවෙන් නම් කරන ලදී. ශ්‍රී ලංකාවේ මෙම ජනතා ව්‍යාපාරය "ගාලු මුවදොර අත්පත් කර ගනිමු" ව්‍යාපාරය ලෙස ද හඳුන්වා ගනිමින් තව තවත් පුළුල් විය. 2022 ජූලි 9 වෙනි දින අති දැවැන්ත විරෝධතාවයක් පවත්වනලද අතර, 2022 ජූලි 14 වෙනි දින ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ධූරයෙන් ඉල්ලා අස්වන තෙක් ම සහ ඉන් පසුවත් එහි ප්‍රබලත්වය පවත්වාගෙන ගියේය.




*09 වෙනි ඡායාරූපය: ගාල්ලේ ගෝඨාගෝගම විරෝධතාවය (ගමගේ, ගෝඨාගෝගම, ගාල්ල, 2022).*

මිනිසුන් සමග සම්බන්ධ වීම සඳහා සමාජ මාධ්‍ය (නව මාධ්‍ය) මෙන් ම විවිධ කලා මාධ්‍යයන් භාවිත කිරීම මෙම අරගලයේ, එනම් ජනතා අරගලයේ, වඩාත් ම කැපී පෙනෙන ලක්ෂණ වලින් එකක් විය. ශ්‍රී ලංකාවේ ජනතාව රජයට විරුද්ධව නැගී සිටීමට පොළඹවමින්, ඔවුන් අතර අවිධිමත් සමාජ ගිවිසුමක් නිර්මාණය කරව්‍යාප්ත කිරීමට සමාජ මාධ්‍ය විශාල කාර්යභාරයක් ඉටු කළේය. සිතුවම්, සංගීතය, නාට්‍ය හා රංගන, සිනමාව, නිරූපණ දෘශ්‍ය කලා සහ ඡායාරූපකරණය, පද්‍ය හා සාහිත්‍යයද ඇතුළුව විවිධ කලා මාධ්‍යයන් ද භාවිත කරන ලද අතර, වෛකල්පික කලාත්මක ප්‍රකාශනයහරහා ජනතා විරෝධය ප්‍රකාශ කිරීම සහ ජනතාව ඒකරාශි කිරීම සඳහා එම කලා මාධ්‍යඉතා සක්‍රීය භූමිකාවක් ඉටු කළේය.

## දේශපාලන ව්‍යාපාරයන්හි කලාව සහ සෞන්දර්ය



*10 වෙනි ඡායාරූපය: අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු මූලස්ථානයේ දී යුධ හමුදා පොලීසිය සමගමත ගැටුම. අත්තනෝමතික අත්තඩංගුවට ගැනීම් වලට එරෙහිව කලාත්මක විරෝධතාවයක් (ගමගේ, විරෝධතා ස්වරූප, 2022)*

දේශපාලනමය සමාජ ක්‍රියාකාරීත්වයන්, විරෝධය පළකිරීම් සහ ජනතා අරගල මෙමම විරෝධතා දැක්වීමේ ප්‍රබල මෙවලම් වේ. ජනතාව ඒකරාශීවීම මගින් අපගේ ලෝකයේ සංසන්දනාත්මක, ධනාත්මක වෙනසක් නිර්මාණය කිරීමට හැකියාව ඇති බලයක් උත්පාදනය කළේය. අවිහිංසාවාදී විරෝධතාවයේ එක් ස්වරූපයක්ලෙස කලාව යොදා ගෙන ඇති අතර, එයට ගැඹුරු අරුතක් ප්‍රකාශ කිරීමට, ශක්තිය ගැබ් කිරීමට සහ එයින් ලබා දෙන විරෝධතාවයේ පණිවිඩය ඔස්සේ ජනතාව ඒකරාශී කිරීමට හැකියාව ඇත. විවිධ කලා මාධ්‍යයන්ට විවිධ ආකාර වලින් ජනතාව ආමන්ත්‍රණය කරමින් එකිනෙකා සමග සම්බන්ධ කිරීමේහැකියාවක්

ඇත. කලාව යනු සුන්දර සහ සුවිශේෂී ප්‍රකාශන මාධ්‍යයකි. එය වෙනසක් නිර්මාණය කිරීමට, එකමුතුකම ඇති කිරීමට සහ විරෝධයපළ කිරීම සඳහා අවශ්‍ය ධෛර්යය සහ අධිෂ්ඨාන ශක්තිය ඇති කිරීමට යොදා ගත හැක. පොදු පණිවිඩයක් ඔස්සේ ජනතාව වෙත සමීප වී ඔවුන් එකිනෙකා සම්බන්ධ කිරීමට හැකි බලයක් නිර්මාණය කිරීමට කලාවට ශක්තිය ඇති අතර, එය ජනතා අපේක්ෂාවන් සහ ඉල්ලීම් නිරූපණය කර සවිස්තරාත්මකව සන්නිවේදනය කරය. කලාව බහුආංශිකය. එය ප්‍රචාරණය සහ දුස්වෘත්තාන්ත ගොඩනැගීම සඳහා දයොදා ගත හැක. නමුත් එය අසදෘශ්‍ය, විචාරාත්මක, චිත්තවේගීය ලෙස ග්‍රහණය කර ගන්නා, නිර්භය මාධ්‍යයක් ද වේ. එය පීඩිතයන්ට ඔවුන්ගේ සියලු චිත්තවේගයන්,එනම් ඔවුන්ගේ ශෝකය, අධිෂ්ඨානය, අපේක්ෂාභංගත්වය, වේදනාව සහ සහයෝගීතාවය ප්‍රකාශ කිරීම සඳහා මාර්ගයක් සපයා දෙයි. කලාව ප්‍රමුඛස්ථානයේ තිබෙන සාකච්ඡා සහස්ථාපිත වී තිබෙන බල ව්‍යුහයන් සමග අන්තර්-සම්බන්ධිත වන විට එහි ප්‍රතිඵල බොහෝ විට විප්ලවීය වේ.එය ප්‍රසිද්ධ මතයන්ට, විශ්වාස පද්ධතීන්ට සහ බලධාරීන්ට අභියෝග කරන අතර, සමාජ ක්‍රියාකාරිත්වය සඳහා යොදා ගත හැකි ප්‍රබල මෙවලමක් බවට පත් වෙයි. (සිං, 2021).

දේශපාලනය සඳහා ඇති සෞන්දර්යාත්මක සුවිශේෂී ප්‍රවේශය නව්‍යතා ප්‍රවේශයක් නොවේ. ඇලෙක්සැන්ඩර් ගොට්ලියෙබ් බෝම්ගාටන් Aesthetica නම් වූඔහුගේ ග්‍රන්ථයෙහි ඉන්ද්‍රියගෝචර දැනුම නැමති සුවිශේෂී ආකාරයේ දැනුමක් නිර්වචනය කිරීම සඳහා "සෞන්දර්ය" යන යෙදුම භාවිත කළේය (Sonderegger) Kleesattel, 2021, p. 108). ඉමැනුවෙල් කාන්ට්ගේ 'විනිශ්චයෙහි විචාරය'(Critique of Judgment) නැමති කෘතියෙහිපළමු කොටස සුන්දරත්වය සහ කලාව පිළිබඳ ප්‍රශ්න සඳහා සම්පූර්ණයෙන් වෙන්කර ඇත. කාන්ට් එක් අතකින් සුන්දරත්වය පිළිබඳ ප්‍රශ්න සහ අනෙක් අතින් න්‍යායාත්මක හා ප්‍රායෝගික ප්‍රශ්න අතර දැඩි බෙදුම් රේඛා ඇඳීම මගින් එය ආරම්භ කරයි (එම, පි. 109). වෝල්ටර් බෙන්ජමින් The Work of Art in the Age of Mechanical Reproduction' (1936) නැමති ස්වකීය කෘතිය හරහා නූතන යුගයේ තාක්ෂණයේ සම්ප්‍රාප්තියත් සමග කලාවේ සිදු වූ වෙනස්කම් පිළිබඳ පොදු ඉතිහාසයක් මතුකර දෙයි. ඔහුගේ අවබෝධයන්ට අනුව, සෑම මානව සංවේදී දෘෂ්ටි කෝණයක්ම සම්පූර්ණයෙන්ම ජීව විද්‍යාත්මක හෝ ස්වභාවික නොවන අතර ඒවා ඓතිහාසික ද වේ. සමාජ වෙනස්කම් වේවා, තාක්ෂණික වෙනස්කම් වේවා, 'මනුෂ්‍ය වර්ගයාගේ සමස්ත පැවැත්මේ ක්‍රමයට' බලපාන වෙනස්කම් මිනිසුන් ඒ වෙනස දකින ආකාරය කෙරෙහි බලපායි. තාක්ෂණය භාවිතා කරමින් කලාව යාන්ත්‍රිකව ප්‍රතිනිෂ්පාදනය කිරීම තුළින් කලාවෙහි තිබෙන රැස්ප්‍රභාව (aura) නැතිවී යාම පිළිබඳව බෙන්ජමින් අදහස් දක්වා ඇත. බෙන්ජමින් සඳහන් කරන ආකරයට,එම රැස්ප්‍රභාව (aura) මගින් ප්‍රතිනිෂ්පාදනය නොකරන ලද කලා නිර්මාණයක නව්‍යතාව සහ අව්‍යාජත්වය නිරූපණය කරයි. සිතුවමක රැස්ප්‍රභාවක් ඇති නමුත් ඡායාරූපයකඑසේ නැත. ඡායාරූපයක් යනු රූපයක රූපයක් වන අතර නමුත් සිතුවමක් යනු සම්පූර්ණයෙන් ම මුල් පිටපත එලෙසින්ම පැවතීමයි (බෙන්ජමින් 1936, 238).

කලාව යන සංකල්පය ඓතිහාසික වාර්තාවක් ලෙස හා මනුෂ්‍යයාගේ දුක් වේදනාවෙහි ස්ථිර භාෂාව ලෙසතියඩෝර් ඇඩෝර්නෝ "සෞන්දර්යය" නැමති කෘතියෙහි ප්‍රකාශ කර ඇත (Ortland, Eberhard; Hoban, Wieland; Adorno, Theodor W; 2017). දේශපාලනයේ සෞන්දර්යාත්මක දැක්ම ප්‍රධාන වශයෙන් ම දෘෂ්ඨිවාදයට සහ ජනප්‍රිය සංස්කෘතියට සම්බන්ධ වේ. දේශපාලනයේ පරිධියෙහි කලාව සහ සෞන්දර්යය ප්‍රධාන ධාරාව සහ විකල්පය ලෙස ප්‍රධාන දෘෂ්ටිකෝණ දෙකකින් සමන්විත වේ. මෙම දෘෂ්ටිකෝණයන් රාජ්‍යයක බලයෙහිහරයට සහ රජයේ ප්‍රචාරක යාන්ත්‍රණයට සාපේක්ෂ වේ. ඇන්ටෝනියෝ ග්‍රාම්ස්චි මෙම සම්බන්ධතාවය එක් සමාජ පන්තියක් අනෙක් පන්තිවලට වඩා ප්‍රමුඛත්වයක් දක්වන (ධනේශ්වර ආධිපත්‍ය) ඔහුගේ "සංස්කෘතික ආධිපත්‍යය" නැමති සංකල්පය මගින් පෙන්වා දෙයි. මෙයින් දේශපාලන සහ ආර්ථික පාලනය අදහස් කෙරෙන අතර ම, ධනේශ්වර පන්තිය ඔවුන්ගේ සාරධර්ම සහ සම්මතයන් රාජ්‍යයෙහි සිටින සෑම පුද්ගලයෙකුගේ ම, විශේෂයෙන් එයට යටත් ලෙස සලකනු ලබන පුද්ගලයින්ගේ "සාමාන්‍ය අවබෝධයේ" සාරධර්ම බවට පත් වන ලෙස ඒවා ප්‍රචාරණය කරන ලද "ආධිපත්‍යවාදී සංස්කෘතිය"ද අදහස් කෙරෙයි. කම්කරු පන්තියේ (සහ අනෙකුත් පන්තිවල) ජනතාව තමන්ගේ යහපත ධනේශ්වර පන්තියේ යහපත සමග සමානව හඳුනාගන්නා ලද අතර, පවතින තත්ත්වයෙහි පෙරලියක් ඇති කරනවාට වඩා එය පවත්වාගෙන යාමට සහාය වූහ. සංස්කෘතික ආධිපත්‍යයෙහි සන්දර්භය තුළ (හෝ ප්‍රකාශනයෙහි) පෙළඹවීම, කැමැත්ත සහ දරුණු බලය යොදා ගැනීම අතර පැහැදිලි සම්බන්ධතාවයක් ඇත (ග්‍රාම්ස්චි, 1971). කලාව මගින් පාලක ප්‍රභූ පැළන්තියට අනුබද්ධ ජනප්‍රිය සංස්කෘතියක් නිර්මාණය කර, එහි මතවාදී බල පදනම ව්‍යාප්ත කරයි.එම කාලයට සහ අවකාශයට අදාළව වන විකල්ප කතිකාවන් හරහා එම ලෝක සම්මතයට අභියෝග කිරීම, වඩා විශාල ප්‍රජාවන් අතර පවතින සමාජ සංවිධාන මුහුණ දෙන සැබෑ යථාර්ථයන් පුළුල් කිරීම සඳහා පීඩිතයින්ට ඉතා වැදගත් වේ.

කලාව යන සංකල්පය ඓතිහාසික වාර්තාවක් ලෙස හා මනුෂ්‍යයාගේ දුක් වේදනාවෙහි ස්ථිර භාෂාව ලෙස තියඩෝර් ඇඩෝර්නෝ "සෞන්දර්යය" නැමති කෘතියෙහි ප්‍රකාශ කර ඇත (ඕර්ට්ලන්ඩ්, එබර්හාර්ඩ්ත හෝබන් වීලන්ඩ්; ඇඩෝර්නෝ තියඩෝර් ඩබ්ලිව්. 2017). දේශපාලනයේ සෞන්දර්යාත්මක දැක්ම ප්‍රධාන වශයෙන් ම දෘෂ්ටිවාදයට සහ ජනප්‍රිය සංස්කෘතියට සම්බන්ධ වේ. දේශපාලනයේ පර්යන්තවල කලාව සහ සෞන්දර්යය ප්‍රධාන ධාරාව සහ විකල්පය ලෙස ප්‍රධාන දෘෂ්ටිකෝණ දෙකකින් සමන්විත වේ. මෙම දෘෂ්ටිකෝණයන් රාජ්‍යයක බලයෙහි හරයට සහ රජයේ ප්‍රචාරක යාන්ත්‍රණයට සාපේක්ෂ වේ. ඇන්ටෝනියෝ ග්‍රමස්චි මෙම සම්බන්ධතාවය එක් සමාජ පන්තියක් අනෙක් පන්තිවලට වඩා ප්‍රමුඛත්වයක් දක්වන (ධනේශ්වර ආධිපත්‍ය) ඔහුගේ "සංස්කෘතික ආධිපත්‍යය" නැමති සංකල්පය මගින් පෙන්වා දෙයි. මෙයින් දේශපාලන සහ ආර්ථික පාලනය අදහස් කෙරෙන අතර ම, ධනේෂ්වරයින් ඔවුන්ගේ සාරධර්ම සහ සම්මතයන් රාජ්‍යයෙහි සිටින සෑම පුද්ගලයෙකුගේ ම, විශේෂයෙන් එයට යටත් ලෙස සලකනු ලබන පුද්ගලයින්ගේ "සාමාන්‍ය අවබෝධයේ" සාරධර්ම බවට පත් වන ලෙස ඒවා ප්‍රචාරණය කරන ලද "ආධිපත්‍යවාදී සංස්කෘතිය" ද අදහස් කෙරෙයි. කම්කරු පන්තියේ (සහ අනෙකුත් පන්තිවල) ජනතාව තමන්ගේ යහපත ධනේශ්වර පන්තියේ යහපත සමග සමානව හඳුනාගන්නා ලද අතර, පවතින තත්ත්වයෙහි පෙරලියක් ඇති කරනවාට වඩා එය පවත්වාගෙන යාමට සහාය වූහ. සංස්කෘතික ආධිපත්‍යයෙහි සන්දර්භය තුළ (හෝ ප්‍රකාශනයෙහි) පෙළඹවීම, කැමැත්ත සහ දරුණු බලය යොදා ගැනීම අතර පැහැදිලි සම්බන්ධතාවයක් ඇත (ග්‍රාම්ස්චි, 1971). කලාව මගින් පාලක ප්‍රභූ පැළන්තියට අනුබද්ධ ජනප්‍රිය සංස්කෘතියක් නිර්මාණය කර, එහි මතවාදී බල පදනම ව්‍යාප්ත කරයි. එම කාලයට සහ අවකාශයට අදාළව වන විකල්ප කතිකාවන් හරහා එම ලෝක සම්මතයට අභියෝග කිරීම, වඩා විශාල ප්‍රජාවන් අතර පවතින සමාජ සංවිධානය මුහුණ දෙන සැබෑ යථාර්ථයන් පුළුල් කිරීම සඳහා පීඩිතයින්ට ඉතා වැදගත් වේ.




*11 ඡායාරූපය: නිර්මාණශීලී විරෝධතාකරුවා ( ගමගේ, නිර්මාණශීලී විරෝධතාකරවා,2022)*




*12 වෙනි ඡායාරූපය: බෞද්ධ භික්ෂුවක්විරෝධතා පණිවිඩයක් ප්‍රදර්ශනය කිරීම සඳහා කුඩය භාවිත කිරීම (ගමගේ, භික්ෂු විරෝධතාකරු, 2022)*

සෞන්දර්ය යන්නෙන්සිතුවම් කලාවේ සිට සංගීතය, පද්‍ය, ඡායාරූපකරණය සහ චිත්‍රපටය දක්වා වන සියලු කලා ශානරයන් පමණක් නොව,එයින් පහසුකම් සලසනදෘෂ්ටීන් සහ අවබෝධයන් දඅදහස් කෙරෙයි. මෙම අර්ථයෙන් ගත් කල,"සෞන්දර්ය දේශපාලනය" යනු අවධානය දේශපාලන ගැටුම් සහ උභතෝකෝටිකයන්ගෙන් ඉවතට ගෙන, අලුත් ආකාර වලින් ආවර්ජනය කිරීමට, දැකීමට, ඇසීමට සහ දැනීමට ඇති හැකියාවයි. මෙම සෞන්දර්යමය සංවේදීතාවයේ මූලික ම අංගයක් වන්නේ පවතින බුද්ධිවාදී ආකෘති වලින් ඔබ්බෙහි දේශපාලනය පිළිබඳ අපගේ අවබෝධය පුළුල් කර ගැනීම සහ දේශපාලනයේ චිත්තවේග විසින් ඉටු කරනු ලබන ප්‍රධාන භූමිකාව හඳුනා ගැනීමයි. සැබැවින්ම දේශපාලනයට වඩා චිත්තවේග කාවැදී තිබෙන ක්ෂේත්‍ර අල්ප ය (Bleiker, 2018). චිත්තවේග, දේශපාලනය තුළ සහ සමාජයේ ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. එය පුද්ගලයින් දේශපාලන ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර සහ ප්‍රතික්‍රියා දක්වන ආකාරය නැවත හැඩගස්වයි. උදාහරණයක් ලෙස, මිරිහාන විරෝධතාවය අතරතුර "මව සහ දරුවා" ඡායාරූපය ශ්‍රී ලංකාවේ ජනතා අරගලයේ සංකේතය බවට පත්විය. රජයේ හමුදාවන් විසින් විරෝධතාකරුවන්ව කෲර ලෙස මර්ධනය කිරීම මෙන් ම රට තුළ පවතින පුළුල්තත්ත්වය මෙම ඡායාරූපය කෙරෙහිසහකම්පනය සහිත හැඟීම් ජනිත කළේය. එම කෝන්තෙරුම්ගැනීම් රජයට විරුද්ධව ජනතාව ඒකරාශි වීමට පෙළඹවූ අතර, 2022 අප්‍රේල් මාසය මුල් භාගයේ සිටමමෙම මහජන අරගලය පිළිගත් විරෝධතා ව්‍යාපාරයක් ලෙස ස්ථාපනය කරමින් මෙම සන්දර්භය තුළඑම පොදු ස්ථානයන් අත්පත් කර ගෙන සිටීම නීත්‍යානුකූල කරන ලදී.


## කලාව සහ දේශපාලනය අතර පවතින ගෝලීය සම්බන්ධතාවය විස්තර කිරීම

කලාව සහ දේශපාලනය අතර පවතින චිකිත්සීය සම්බන්ධය සමග පරස්පරයන් නිරූපණය කිරීම පිණිස දේශපාලන හා සමාජ ව්‍යාපාරවල විවිධ ආකාර වලින් කලාව යොදා ගෙන ඇති අවස්ථා ලෝක ඉතිහාසයේ තිබේ. 1918 වර්ෂයෙන් පසුව ඇමරිකාවේ නිව් යෝර්ක් නුවර ඇති වූ නව නීග්‍රෝ ව්‍යාපාරය, හාර්ලම් පුනරුද සමයේ දී අප්‍රිකානු සංක්‍රමණිකයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කිරීම සඳහා සාහිත්‍යමය මැදිහත්වීම් යොදා ගත් හර්බට් හැරිසන්ගේ කෘති මෙන්ම හාර්ලම් පුනරුද සමයේ දී විරෝධය ප්‍රකාශ කිරීමේ ස්වරූපයක් ලෙසසංගීතය, නාට්‍ය සහ රංග කලා යොදා ගැනීම මෙයට උදාහරණ ලෙස දැක්විය හැක.

එලෙසින් ම, රබීන්ද්‍රනාත් තාගෝර් ඉන්දියාවේ නිදහස් අරගලයට සමගාමීව වඩාත් ධනාත්මක ජාතිකවාදයක් ප්‍රවර්ධනය කිරීම පිණිස ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය, සංගීතය, සිතුවම්, නාට්‍ය සහ රංග කලායොදා ගත්තේය. සදාත් හසන් මන්තෝ වැනි ලේඛකයින් ඉන්දීය නිදහස් අරගලයට සමගාමීව,ඉන්දියානු උප මහාද්වීපය ඉන්දියාව හා පකිස්තානය ලෙස බෙදා වෙන් කිරීමේදී සිදු වූ දේශපාලන හා සමාජ අසාධාරණයන් පදනම් කරගෙන,එම අසාධාරණයන් පිළිබඳව දැනුවත් කිරීම සහ ඒවාට විරෝධය දැක්වීම සඳහා කෙටිකතා සහ නවකතා ලීවේය. රිත්වික් ඝටක්, ගෞතම් ඝෝස්, දීපා මේතා ඇතුළු අනෙකුත් චිත්‍රපට අධ්‍යක්ෂවරුන් ඉන්දියාව, පකිස්තානය සහ බංගලිදේශය බෙදා වෙන් කිරීමේ දී සිදු වූ ප්‍රචණ්ඩත්වය, ම්ලේච්ඡත්වය සහ අයුක්තිය මෙන් ම එම කාලය තුළ දී සහ බේදීම නිසා අවතැන් වූ පවුල් වලට එය අඛණ්ඩව ගැටලුඑවක් වී ඇති නිසා අද පවා මිනිසුන් අත්විඳින ශෝකය ඉස්මතු කර පෙන්වීමටලඑම බෙදා වෙන් කිරීම් පදනම් කර ගනිමින් චිත්‍රපට නිර්මාණය කර ඇත.

ප්‍රතිවිරෝධතා හෙළිදරව් කිරීම පිණිස ලතින් ඇමරිකාවේ ද භාවිතා වූ ප්‍රබල ආයුධය කලාවයි. ඔගස්ටෝ පිනෝචේ විසින් 1973 දී චිලී ජනරජයේ සැල්වදෝර් ඇලෙන්ඩේගේ රජය පෙරළා දැමූ අතර වික්ටර් හාරා වැනි කලාකරුවන් සංගීතය හා ගීත හරහා ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවන්ට විරෝධය පළ කළහ. මෙම විරෝධතා ඔහුගේ මරණයට පවා හේතු විය. පැබ්ලෝ නෙරූඩා වැනි ලේඛකයින් හා කවියන් චිලියේ හමුදා ජුන්ටාව මර්දනය කරන ලෙස ඉල්ලා සිදු කළ විවේචනාත්මක මැදිහත්වීම ද කැපී පෙනේ. 1960 දශකයේ දී පීට් සීගර්, ජෝන් බේස්, බොබ් ඩිලාන්, ඇතුළු අනෙකුත් කලාකරුවන්ගේ ගීත මගින් ජාතිවාදය, යුද්ධය සහ හමුදා-කාර්මික සම්මිශ්‍රණයට එරෙහිව තවදුරටත් විරෝධතා දැක්වූ අතර, එමගින් දේශපාලන විරෝධයේ ඇමරිකානු කලාත්මක සම්ප්‍රදායක් පවත්වාගෙන යන ලදී. වියට්නාම යුද විරෝධී ව්‍යාපාරයේ දී ජෝන් ලෙනන් ගේ සංගීතමය මැදිහත්වීම සහ 2013 වර්ෂයේ සිට 'කළු ජීවිත ද වැදගත් වේ' නැමති ව්‍යාපාරය (Black lives matters movement) වෙත අවධානය යොමු කිරීමට භාවිතා කරන ලද බිත්ති මත ඇඳිසිතුවම් හෝ ඇඹීම් (Murals) කලාත්මක විරෝධතා පිළිබඳ තවත් උදාහරණ වේ. බොබ් මාර්ලිගේ කැරලිකාර ගීත ලොව පුරා පීඩිත ජනයා ක්‍රමානුකූලව අමානුෂිකකරණයට ලක්කිරීමට එරෙහි ප්‍රතිරෝධය ප්‍රබල ලෙසප්‍රකාශ


කිරීමක් විය. 1960 දශකයේ සිට 1990 දශකය දක්වා දකුණු අප්‍රිකාවේ පැවති වර්ණභේදවාදී විමුක්ති අරගලය වාර්ගිකපීඩාකාරී සහ අධිකාරීවාදී පාලන තන්ත්‍රයක් තුළ සංස්කෘතියේ (විශේෂයෙන් කලාවේ සහ සාහිත්‍යයේ) භූමිකාව පිළිබඳ බොහෝ චින්තන ගුරු කුලයන් නිර්මාණය කළේය. රාජ්‍යයේ වාර්ගික,




*13 වෙනි ඡායාරූපය: ජන්තු මන්තු, ඉන්දියාව. රජයේ ප්‍රතිපත්ති සහ දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වූ මූල්‍යමය බර දරාගත නොහැකිව සියදිවි හානි කරගත් ගොවීන්ගේ හිස් කබල් යොදා ගනිමින් ගොවීහු විරෝධතාවයක නිරත වූහ. (ගමගේ, ගොවි විරෝධතාවය, 2017)*

සංස්කෘතික සහ දේශපාලන ප්‍රතිපත්ති විවේචනය කරන වර්ණභේදවාදී ව්‍යාපාරය පැවති කාලයේ නිර්මාණය කරන ලද බොහෝ කලාවන් 'විරෝධතා කලාව' ('Protest Art') හෙවත් 'ප්‍රතිරෝධයේ කලාව'. (Resistance Art) ලෙස හඳුන්වන ලදි. (SAHO 2011).

යුගොස්ලෝවියානු යුද්ධවලට සහ "අරාබි වසන්ත" සමයේ ඊජිප්තුවේ මෙන් ම මැද පෙරදිග අනෙකුත් රටවලට ද විරෝධය ප්‍රකාශ කිරීම සඳහා විරෝධතා කලාව බිහි විය. ඉතාමත් මෑතක දී,ශ්‍රී ලංකාවට වඩාත් සමීප වූ ඉන්දියාවේ පුරවැසි පනත සංශෝධනය කිරීමට එරෙහිව සිදු කරන ලදවිරෝධතා සහ ගොවීන්ගේ අරගල විරෝධතාවයන් තවත් උත්සන්න කරන ලදී. එමෙන්ම, 22 හැවිරිදි ඉරාන ජාතික ශිෂ්‍යයාවක් වන මාසා අමිනි සිය හිජාබය ලිහිල්ව පැළඳ සිටි බව පවසමින් අත්අඩංගුවට ගනු ලැබීමෙන් පසු පොලිස් අත්අඩංගුවේ සිටිය දී මිය යාම 2022 වර්ෂයේ සිට ඉරානයේ රජයට එරෙහි විරෝධතා නිර්මාණය වීමට හේතු විය. කලාව මගින් මෙම සියලු සිද්ධීන් ග්‍රහණය කර ගෙන පුළුල් ලෙස ප්‍රචාරණය කර ඇත. මේ ආකාරයට විවිධ ස්වරූප වලින් විරෝධතා දැක්වීමේ ප්‍රබල මෙවලමක් ලෙස කලාවේ ශක්තිය මනාව තහවුරු වී ඇත.




*14 වෙනි ඡායාරූපයඃ ඉන්දියාවේ නවදිල්ලි නුවර ජමියා මිලියා ඉස්ලාමියා විශ්වවිද්‍යාලයේ කාන්තාවන් ඉන්දියාවේ පුරවැසි සංශෝධන පනතට, ජාතික පුරවැසි ලේඛනයට සහ ජාතික ජනගහන ලේඛනයට එරෙහිව විරෝධතාවයේ නිරත වීම (ගමගේ, ඉන්දියාවේනව දිල්ලියේ ජාතික පුරවැසි ලේඛනයට එරෙහි විරෝධතාකරුවන්, 2019)*

## ශ්‍රී ලංකාවේ ජනතා අරගලය - දේශපාලනයේ සෞන්දර්යාත්මක හැරවුම සහ සෞන්දර්යයේ දේශපාලනය




*15 වෙනි ඡායාරූපයඃ රංගන ශිල්පී ජෙහාන් අප්පුහාමි "ජනතා පරමාධිපත්‍ය" නැමති සටන් පාඨය තමසිරුරේ ලියා ප්‍රදර්ශනය කරමින්. ජනතා අරගලයේ පළමු වෙනි දිනයේ දී ලබාගත් ඡායාරූපයකි. (ගමගේ, ජනතා පරමාධිපත්‍ය, 2022)*

ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය පුරාවටම කලාව භාවිත කර ඇත්තේ ප්‍රකාශනය සහ විරෝධය පළ කිරීමේ මාධ්‍යයක් වශයෙනි. 1971 දශකයේ පැවති තරුණයින්ගේ කැරැල්ලේ දී මෙන් ම 1980 දශකයේපැවති තරුණයින්ගේ දෙවැනි කැරැල්ලේදී ද සාහිත්‍යමය සහ සංගීතමය මැදිහත් වීම් රාශියක් සිදුවිය. උදාහරණයක් ලෙස, 1970 දශකයේ දී සිනමාවේදී ධර්මසේන පතිරාජ ඔහුගේ සිංහල චිත්‍රපට වන "බඹරු ඇවිත්" සහ "අහස් ගව්ව" මෙන් ම දෙමළ චිත්‍රපටයක් වන "පොන්මනි" වැනි චිත්‍රපට මගින් ශ්‍රී ලංකාවේ චිත්‍රපට කලාව දේශපාලන මාවතකට යොමු කළ අතර එම සියළු චිත්‍රපට හරහා ප්‍රධාන සමාජ සහ දේශපාලන ගැටළු අනාවරණය කළේය. 1980 දශකය අග භාගයේදී "පවන" නැමැති ගීත එකතුව ගායන කළ නන්දා මාලනී වැනි සංගීතඥයින් ද විරෝධතාවන්ට දායකත්වය ලබාදුන් අතර එම ගීත එකතුව 1980 දශකය අග භාගයේ දී බිහි වූ කැරැල්ල අතරතුර තරුණයින් ඒ සඳහා පොළඹවන ලදි. ප්‍රේමසිරි කේමදාස සහ ගුණදාස කපුගේ යන සංගීතඥයින්ගේ සංගීතය, දේශපාලන සංගීතයක ස්වරූපයට දැඩි සේ රූපාන්තරණය වී ඇති අතර, මෙම කාලයේ දී චන්ද්‍රකුමාර වික්‍රමරත්නගේ විකල්ප පද්‍ය සහ සාහිත්‍යය ප්‍රසිද්ධියට පත් විය.

ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය කේන්ද්‍ර කර ගත් සිවිල් යුද්ධය සිංහල සහ දෙමළ ප්‍රජාවන් අතර දේශපාලන ගැටුම් මත පදනම් වූවක් විය. සිංහල සහ දෙමළයන සමාජයන් දෙකෙහි ම යුක්තිය ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් ලෙස කලාව ඉදිරියට පැමිණ ද. පාක්‍යනාදන් අහිලන් සහ චෙරන් රුද්‍රමූර්ති වැනි දෙමළ ලේඛකයින් පද්‍ය සහ සාහිත්‍යය ඔස්සේ සාහිත්‍යය සහ දේශපාලන සංවාදය යන දෙකට ම සුවිශේෂී දායකත්වයක් ලබා දුන් අතර,රත්න ශ්‍රී විජේසිංහ, මංජුල වෙඩිවර්ධන සහ රෝහිත භාෂණ අබේවර්ධන යන සිංහල ලේඛකයින් ද පසුගිය දශක කිහිපය තුළදී සුවිශේෂී දායකත්වයක් උතුරේ සිවිල් යුද්ධය වෙනුවෙන් ලබා දුන්හ. පශ්චාත් සිවිල් යුධ සමයේ දී ද ශ්‍රී ලංකාවේ විරෝධතා සහ සටන් කිරීමේ කලාවේ හාසමාජ ක්‍රියාකාරිත්වයේ සැලකිය යුතු ඉහළ යාමක් නිරීක්ෂණ වී ඇත. චන්ද්‍රගුප්ත තේනුවර සහ ජගත් වීරසිංහ යනු තම කලා නිර්මාණයන් ඔස්සේ යුද්ධයට සහ ප්‍රචණ්ඩත්වයට එරෙහිව හඬනගමින් රටට බලපා ඇති නොවිසඳුණු ප්‍රශ්න ඉස්මතු කළචිත්‍රශිල්පීන් දෙදෙනෙකි.



*16 වෙනි ඡායාරූපය: යුද්ධයේ දී අතුරුදහන් වූ තම පුතුගේ ඡායාරූපයක් අතැතිව සිටින පියෙක්. ගාලුමුවදොර පිටියේ විරෝධතාවයේ 50 වැනි දින ලබා ගත් ඡායාරූපයකි (ගමගේ, පියකුගේ දොම්නස, 2022)*

2022 ජනතා විරෝධතා ව්‍යාපාරය (අරගලය/පෝරාට්ටම්) ජනතාව මත පැටවුණු අධික ආර්ථික පීඩනයේ ප්‍රතිඵලයකි.මුලදී, කොළඹ සහ ඒ අවට ප්‍රදේශ වල තැන් තැන්වල හිටිඅඩියේ පවත්වන ලද කුඩා විරෝධතා සහ ප්‍රතිවිරෝධ වලින් අරගලය ආරම්භ විය. මෙහිදී ජනතා විරෝධතා ව්‍යාපාරය (අරගලය)විමධ්‍යගත වී තිබීම එහි කැපී පෙනෙන ලක්ෂණයක් වියගළුය නිතැතින් ම ප්‍රාදේශීයවවිමධ්‍යගත වී තිබුණි. විවිධාකාරයේ උනන්දුවක් දක්වන කණ්ඩායම් සහ පාර්ශවකරුවෝ මතවාදීමය,මූල්‍යමය සහ දේශපාලනමය සහයෝගය ලබා දෙමින් අරගලයට දායක වූහ. 2022 වර්ෂයේ අප්‍රේල් 09 වෙනි දිනෙන් පසුව එය ගාලුමුවදොර පිටියේ ගෝඨාගෝගම ලෙසස්ථාවර වෙමින්"අත්පත්කරගැනීමේ" ව්‍යාපාරයක් බවට පත් විය. එය ශ්‍රී ලංකාවේ මුල්බැස ගෙන තිබූ අත්තනෝමතික දේශපාලනය ඇතුළු දිගු කාලීන සමාජ,දේශපාලන හා ආර්ථික ගැටලු පිළිබඳ ඔවුන්ගේ දුක්ගැනවිලි මෙන් ම ඇතිවූ ආර්ථිකව්‍යාකූලත්වය පිළිබඳ ඔවුන්ගේ අපේක්ෂාභංගත්වය ප්‍රකාශ කළ හැකි භූමියක් බවට පත්විය.එමෙන් ම, එය රටේ යුද්ධයෙන් විපතට පත්වූවන් සහ අතුරුදහන් වූවන් සම්බන්ධ ගැටළු, මාධ්‍ය නිදහසට එරෙහි ක්‍රියාමාර්ග, පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ වින්දිතයින්ට යුක්තිය ඉල්ලා සිටීම, ගොවීන් දිළින්දන් බවට පත් වීම, පාරිසරික ගැටලු සහ LGBTQ ප්‍රජාවගේ අයිතිවාසිකම් ඇතුළු අනෙකුත් දුක්ගැනවිලි ප්‍රකාශනය කිරීම සඳහා දොරටු

විවර කර දුන්නේය. මෙම සියලු ගැටලු ජනතා විරෝධතා ව්‍යාපාරයේ මූලික අංගබවට පත්විය.

2022 ජනතා විරෝධතා ව්‍යාපාරය (අරගලය/පෝරාට්ටම්) ජනතාව මත පැටවුණු අධික ආර්ථික පීඩනයේ ප්‍රතිඵලයකි. මුලදී, කොළඹ සහ ඒ අවට ප්‍රදේශ වල තැන් තැන්වල හිටිඅඩියේ පවත්වන ලද කුඩා විරෝධතා සහ ප්‍රතිවිරෝධ වලින් අරගලය ආරම්භය විය. ජනතා විරෝධතා ව්‍යාපාරය (අරගලය) විමධ්‍යගත වී තිබීම එහි කැපී පෙනෙන ලක්ෂණයක් විය; එය නිතැතින් ම විමධ්‍යගත වී තිබුණි. විවිධාකාරයේ උනන්දුවක් දක්වන කණ්ඩායම් සහ පාර්ශවකරුවන් මතවාදීමය, මූල්‍යමය යුද්ධයෙන් විපතට පත්වූවන් සහ අතුරුදහන් වූවන් සම්බන්ධ ගැටළු, මාධ්‍ය නිදහසට එරෙහි ක්‍රියාමාර්ග, පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ වින්දිතයින්ට යුක්තිය ඉල්ලා සිටීම, ගොවීන් දිළින්දන් බවට පත් වීම, පාරිසරික ගැටලු සහ බයර්මූ ප්‍රජාවගේ අයිතිවාසිකම් ඇතුළු අනෙකුත් දුක්ගැනවිලි ප්‍රකාශනය කිරීම සඳහා දොරටු විවර කර දුන්නේය. මෙම සියලු ගැටලු ජනතා විරෝධතා ව්‍යාපාරයේ මූලික අංග බවට පත්විය.

මෙම විරෝධතා ව්‍යාපාරය ආරම්භයේ සිටම "ජන අරගලයේ කලාකරුවෝ එකමුතුව" (Artists of the People's Struggle) නම් වූ වැඩසටහන හරහා ජනතාවගේ




*17 වෙනි ඡායාරූපයඃ 2022 අප්‍රේල් මාසයේදී පැවති ජනතා ව්‍යාපාරයේ කලාකරුවන්ගේ විරෝධතා පාගමන (ගමගේ, ජන අරගලයේ කලාකරුවෝ, 2022*

සහ දේශපාලන වශයෙන් සහයෝගය ලබා දෙමින් අරගලයට දායක වූහ. 2022 වර්ෂයේ අප්‍රේල් 09 වෙනි දිනෙන් පසුව එය ගාලුමුවදොර පිටියේ ගෝඨාගෝගම ලෙස ස්ථාවර වෙමින් "අත්පත්කර ගැනීමේ" ව්‍යාපාරයක් බවට පත් විය. එය ශ්‍රී ලංකාවේ මුල්බැස ගෙන තිබූ අත්තනෝමතික දේශපාලනය ඇතුළු දිගු කාලීන සමාජ, දේශපාලන හා ආර්ථික ගැටලු පිළිබඳ ඔවුන්ගේ දුක්ගැනවිලි මෙන් ම ඇතිවූ ආර්ථික ව්‍යාකුලත්වය පිළිබඳ ඔවුන්ගේ අපේක්ෂා භංගත්වය පැමිණ ප්‍රකාශ කළ හැකි භූමියක් බවට පත්විය. එමෙන් ම, එය රටේ දුක්ගැනවිලි ප්‍රකාශ කිරීමටත්, විවිධ කරුණු මත ජනතාව ඒකාරාශී කිරීමටත් කලාකරුවන්ගේ එකමුතුව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය.

විවිධ කලා මාධ්‍යයන් ඔස්සේ විරෝධය පළ කිරීම මෙම අරගලයේ අනෙක් සුවිශේෂී ලක්ෂණය විය. ජනතා විරෝධතා ව්‍යාපාරය විවිධාකාර වූ අතර, ශ්‍රී ලංකාවේ ජන ජීවිතයේ මෙම නව අවධියේ සන්දර්භය තුළ කලාව නව අරුතක් ගත්තේය. විරෝධතා කලාවදැන් සියලු බාහිර ගැලරි දොරටු වලින් ප්‍රදර්ශනය වූ අතර, මහමග

ගමන් කළ සියලු දෙනාට ද එයට ප්‍රවේශ වීමට හැකි විය. වර්තමානයේ විවිධ ආකාරයෙන් මැසිවිලි ඉදිරිපත් කිරීමට මිනිසුන් විසින් කලාව භාවිත කර තිබේ. මුලදී එය පුවරු සෑදීම, සටන් පාඨ ලිවීම වැනි ක්‍රියාවලින් ආරම්භ විය. කලාත්මක ප්‍රකාශනය සහ විරෝධතා භාෂාව විවිධ දුක්ගැනවිලි ප්‍රකාශ කිරීමට පමණක් නොව දේශපාලන ඉල්ලීම් ඉදිරිපත් කිරීමට දල විශේෂයෙන් ම එවකට සිටි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට ධූරයෙන් ඉල්ලා අස්වන ලෙස බල කිරීමටභාවිත කරන ලදී. ජනතාව ඒකරාශී කිරීම සඳහා සහ විරෝධතා ව්‍යාපාරයට ජවයක් ලබා දීම සඳහා සමාජ මාධ්‍ය සහ තාක්ෂණය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. අරගල කලාව ජනතාවට වඩාත් සමීප කරවීම සඳහා නව මාධ්‍ය සහ තාක්ෂණය උපකාරී විය. නව මාධ්‍යමගින් කලාව රටේ සෑම අස්සක් මුල්ලක් නෑර සහ සමාජයේ බොහෝ කොටස් වෙත ව්‍යාප්ත කළේය.




*18 වෙනි ඡායාරූපය:2022 ජූලි මස මඩකලපුවේ පැවතියුක්තියේපාගමන (ගමගේ, යුක්තියේ පාගමන, 2022)*

අතිපරීක්ෂාකාරී, අවිචාරක,අතිශය පරස්පර සහ අවිනිශ්චිතතාවයෙන් යුත්කාල පරිච්ඡේදයක් වුවද, තම හැකියාවන්හි විභවය වෙත ළඟා වූ මෙම ශ්‍රී ලාංකීය කලාකරුවෝ අලංකාර, සංවේදී දේශපාලන කලාකෘති නිර්මාණය කළහ. ගාලු මුවදොර පිටිය අත්පත්කර ගැනීමේ ව්‍යාපාරය ක්‍රියාත්මක කර ගෝඨාගෝගම නිර්මාණය කිරීමත් සමග විරෝධතා කලාවේ මෙමනැඹුරුව මුල් බැස ගත්තේය. එසේම, කොළඹ අගනගරයෙන් බැහැර ප්‍රදේශවල පවා 'ගෝඨාගෝගම, මහනුවර', 'ගෝඨාගෝගම, වෙන්නප්පුව','ගෝඨාගෝගම, ගාල්ල','ගෝඨාගෝගම, කුරුණෑගල' සහ තවත් ප්‍රදේශවල එවැනි මධ්‍යස්ථාන නිර්මාණය කරමින් ජනතාව මෙම "අත්පත්කර ගැනීමේ ව්‍යාපාරය "විමධ්‍යගත කිරීමට පටන් ගත්හ. ශ්‍රී ලංකාවේ දීර්ඝතම විරෝධතාවය වන "අතුරුදහන් වූ දෙමළ මව්වරුන්ගේ විරෝධතාවය" මෙන් ම මඩකලපුවෙන් ආරම්භ කරන ලද "යුක්තියේ පාගමන" විරෝධතාවය ද පර්යන්ත ප්‍රදේශවල සිට මෙම විරෝධතා ව්‍යාපාරයට සහාය දැක්වීය. අනාගතයේ දී රජයට විරුද්ධ ජනතා විරෝධතා ව්‍යාපාර හෝ වේවා, වෙනත් මහජන විරෝධතා ක්‍රියාකාරකම් හෝ වේවා, සාමූහික දෝමනස්සයන් නියෝජනය කරන සහ නිරූපණය කරන චිත්‍ර, බිතුසිතුවම්, පද්‍ය, සංගීතය, නිර්මාණශීලී සටන් පාඨ,රංග කලා, නිරූපණ, චිත්‍රපට සහ අනෙකුත් දෘශ්‍ය රූප නොමැතිව එම විරෝධතාවයන් අසම්පූර්ණ ඒවා වනු ඇත.

ශ්‍රී ලංකාවේ 2022 ජන අරගලය ශ්‍රී ලාංකීය කලාව සහ සංස්කෘතිය පිළිඹිබු කරන බහුරූපේක්ෂණයක් වූ අතර, එය දැඩි ලෙස අවශ්‍ය කර තිබූ දේශපාලන ප්‍රකාශනය සහ අධ්‍යනය සඳහා අවකාශය සලසා දුන්නේය. විරෝධතා පුවරුවල තිබූ සටන් පාඨවල විවිධ වූ ප්‍රකාශනයන් තිබුණි. ඒවායෙහි විවිධ සංකේත භාවිත කරමින්, ජනතාවගේ මූලික අරමුණ වන ජනාධිපතිවරයාට ඉල්ලා අස්වන ලෙස බලකරන #Gotagohome යන්න අවධාරණය කෙරෙන විවිධ ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණි.




*19 වෙනි ඡායාරූපය: ජනතාව මුහුණ දෙන ආර්ථික පීඩනය නිරූපණය කිරීම සඳහා කලාකරුවෝ වීදි නාට්‍යයක් රඟ දක්වති. (ගමගේ, කුසගිනි අවතාරය, 2022)*

සුජිත් රත්නායක වැනි කලාකරුවන් "ගාලුමුවදොර අත්පත් කර ගනිමු" ව්‍යාපාරයේ ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළ අතර ගාලුමුවදොර පරිශ්‍රයේ චිත්‍ර සහ

සිතුවම්වල ප්‍රබල ප්‍රකාශනයන් දැකගත හැකිවිය. සුජිත් සටන් පාඨ, විරෝධත පුවරු මත ලිවීම, ශරීරය මත පින්තාරු කිරීම්, මූර්ති සහ වීදිවල,බිත්තිවල සහ අනෙකුත් මතුපිටවල චිත්‍ර ඇඳීම ආදිය යොදා ගනිමින් තම ප්‍රකාශනාත්මක, කලාත්මක දායකත්වය ලබා දෙමින් ආරම්භයේ සිටම අරගලයට සම්බන්ධ විය.ඔහු ශ්‍රී ලංකාවේ අර්බුදය පිළිබඳ ඔහුගේ හැඟීම ඔහුගේ කලාව තුළින් ප්‍රකාශ කළ අතර,අන් අයට ද එවැනි විරෝධය ප්‍රකාශ කිරීමේ ස්වරූපයන් අනුකරණය කිරීමට ඉගැන්වීමට ඔහු උත්සාහ කළේය.ජන අරගලය අත්පත්කර ගැනීමේ ව්‍යාපාරයක් ලෙස ගොඩනැගුණු විට, ඔහු සෑම පුද්ගලයකුටම අර්බුදය සහ දේශපාලනය පිළිබඳ තමන් තුළ ඇතිකම්පාව සාකච්ඡා කර ප්‍රකාශ කිරීමට සහ දේශපාලනය හා අර්බුදයට බලපෑ හේතු පිළිබඳව කලාව ඔස්සේ වැඩිදුර අධ්‍යපනය කිරීමට අවස්ථාව සැලසෙන පරිදිතම අත්පත් කරගත් අවකාශය විවෘත කලාගාරයක් බවට පරිවර්තනය කළේය. ඔහු ජන අරගලය සහ අර්බුදය පිළිබඳ තම හැඟීම් ප්‍රකාශ කිරීමට අරගලය ආරම්භයේ සිට ම කලා කෘතියක් නිර්මාණය කළේය. 2022 මැයි මස 9 වෙනි දින, රාජපක්ෂවරුන්ගේ දේශපාලන ආධාරකරුවන්, සෘජුව ම පවසන්නේ නම් මැරයින්, ගාලුමුවදොර පිටියේ අත්පත්කර ගෙන සිටි කොටසට පහර දුන් අතර, සුජිත් රත්නායක ගේ කලාගාරය ද ගිනිබත් කරන ලදී. එය ශෝකජනක මොහොතක් වුවද, සුජිත් රත්නායක කලාකරුවා පෙර දින පුළුස්සා දමා තිබූ තම නිර්මාණයේ අළු උපයෝගී කර ගනිමින් චිත්‍රයක් නිර්මාණය කරන අයුරු බලා සිටීම ද ආශ්වාදයක් විය. ඔහුගේ නිර්මාණශීලිත්වය තුළින් ඔහු දිගින් දිගට ම මෙම ක්‍රමයට අභියෝග කළේය.

අරගලය යනු ඉතාමත් ම වැදගත් සහ අර්ථාන්විත සිදුවීම් වලින් එකක් වන අතර, ආපසු හැරී බලන විට ඉතිහාසය එය එලෙස විනිශ්චය කරනු ඇත. එය ඉදිරි පරම්පරාවන් සඳහා සුරැකිය යුතු මතකයකි (de Silva and Ondaatje 2022). සුජිත් රත්නායක ප්‍රකාශ කළ ආකාරයට, "මට අවශ්‍ය වුණේ කිසිදු නියාමනයකින් හෝ සීමාකිරීමකින් තොරව ජනතා අරගලයට දායක වීමට සහ සම්බන්ධ වීමට. කලාව විවිධාකාරස්වරූපයන් ගෙන් අරගලයට සුවිශේෂී සහ අතිමහත් දායකත්වයක් ලබා දී තිබුණා. අවස්ථාව සහ කාලය අනුව වෙනස් වන, ආර්ථික සහ දේශපාලන අර්බුදයට අදාළ වූ මගේ කලා මාධ්‍යය ප්‍රකාශ කිරීමට මට අවශ්‍ය වුණා. එමෙන්ම, මට අවශ්‍ය වුණේ මගේ කලාව චිත්‍රාගාරයෙන් ඔබ්බට ගෙන ගොස්,සියලු දෙනාට ම දොරටු විවර කිරීමට. කලාගාර මූලික කරගත් චිත්‍ර, නැතහොත් කලාගාර තුළ ප්‍රදර්ශනය කරනු ලබන විරෝධතා සිතුවම් පවා යම් පැලැන්තියකට පමණක් සීමා වෙනවා. එම නිසා ඒ සීමාවෙන් ඔබ්බට යාමටයි මට අවශ්‍ය වුණේ. අරගලයේ කලාගාරය හරහා මමළමයින්ට මෙන් ම අනෙක් පුද්ගලයන්ටත් චිත්‍ර පිළිබඳව ඉගැන්වීමටත්, අපගේ මෙම දේශපාලන නිමේෂය පිළිබඳ ඔවුන්ගේ ප්‍රකාශනයන් සහ මතකයන් ග්‍රහණය කර ගැනීමටත් උත්සාහ කළා. ඒවගේම මගේ මුල් කලා කෘති පවා ජනතාව වෙනුවෙන් ම වූ නමුත්, මෙම දේශපාලන ව්‍යාපාරය ඉතාමත් තීරණාත්මකයැයි ද, එය තවදුරටත් ජනතාවගේ මග දෙසට හැරවිය හැකි යැයි ද මම සිතුවා" (රත්නායක 2022).




*20 වෙනි ඡායාරූපයඃ චිත්‍ර ශිල්පී සුජිත් රත්නායක විසින් ආරම්භ කරන ලද ගෝඨාගෝගම කලාග ාරය. තම කලාව ප්‍රගුණ කරමින් සිටින තරුණ කලාකරුවෙක්. (ගමගේ, ගෝඨාගෝගම කලාගාරය, 2022)*



*21 වෙනි ඡායාරූපය:" බේකරියෙ කට්ටිය" සංගීත කණ්ඩායම ගාලුමුවදොර විරෝධතා පාගමන අතරතුර (ගමගේ, බේකරියෙ කට්ටිය, 2022)*

2022 වර්ෂයේ අප්‍රේල් මස 09 වෙනිදා සිට ම,ජෙහාන් අප්පුහාමි, අජිත් කුමාරසිරි සහ විරාජ් ලියනාරච්චි යන ප්‍රසිද්ධ කලාකරුවන් ඇතුළත් "බේකරියෙ කට්ටිය"[2] නැමති සංගීත හා රංග කලා කණ්ඩායම ගීත ගායනා කරමින්, සංගීතය වාදනය කරමින් සහනාට්‍ය වේදිකාගත කරමින්, නිර්මාණශීලී ලෙස විරෝධතා ව්‍යාපාරය ඔප්නංවමින් මෙම විරෝධතා ව්‍යාපාරය සඳහා අගනා දායක්වයක් ලබා දුන්නේය. එසේම ඔවුහු "ජනතා පරමාධිපත්‍ය" වැනි සටන් පාඨ ප්‍රචලිත කිරීම සඳහා මුහුණේ ඇඳි සිතුවම් ඇතුළුව ශරීරයේ ඇඳි සිතුවම් භාවිත කළහ. බේකරියෙ කට්ටිය කණ්ඩායම ගෝල්ෆේස් ගොඨාගෝගම අරගල භූමියෙහි පමණක් නොව,මහනුවර, කුරුණෑගල, අනුරාධපුරය සහ අනෙකුත් බොහෝ ස්ථානවල විරෝධතාවන්ට ද සම්බන්ධ වී ඔවුන්ගේ දායකත්වය ලබා දුන්හ. එසේම, LGBTQ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් වූ විරෝධතා සහ සිරගත කර සිටි විරෝධතාකරුවන්ට ඇප ලබා දෙන ඉල්ලා සිදු කරනලද විරෝධතා ඇතුළු ජන අරගලයට සම්බන්ධ කුඩා විරෝධතා වලදී ද ඔවුන්ගේ සහාය ලබා දීමේ ක්‍රියාකාරකම් දැකගත හැකි විය. එසේම අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ විරෝධතාකරුවන් සහ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පීඩාවට පත්වූවන් වෙනුවෙන් යුක්තිය ඉල්ලා සිටින විරෝධතාකරුවන් ද මෙම කණ්ඩායම ඔවුන්ගේ විරෝධතා වෙනුවෙන් ද යොදවා ගන්නා ලදී. උදාහරණයක් ලෙස, 2022 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලාංකික රංගන ශිල්පී ජෙහාන් අප්පුහමි 2019 පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයේ වින්දිතයින්ට යුක්තිය ඉටු කරන ඉල්ලා ජීව ප්‍රමාණයේ කුරුසියක් උර මත තබාගෙන කටුවාපිටිය දේවස්ථානයේ සිට ගාලුමුවදොර පිහිටි ජනාධිපති කාර්යාලය දක්වා පාගමනින් පැමිණ සිය තෙදින පාගමන නිම කළේය. රටේ වර්තමාන තත්ත්වය සහ රජය මෙන් ම එහි ප්‍රධානීන් විසින් ද ජනතාව මත එල්ල කර තිබෙන පීඩනය ආවර්ජනය කරමින් රංගන ශිල්පී කලණ ගුණසේකර ද ගාලුමුවදොර ගෝඨාගෝගම පරිශ්‍රයේ දී රංගනයක් ඉදිරිපත් කළේය. අප්පුහාමිමෙසේ පැවසුවේය: "පසුගිය දශකය තුළදි ප්‍රධාන වශයෙන් ම නාට්‍ය, රංගනය, රංග කලාව සහ සිනමාව ඔස්සේ විරෝධතා කලාව සම්බන්ධයෙන් මා සතු හැකියාවන් භාවිතා කරමින් විවිධ කාර්යයන් සඳහා දායක වීමට මම උත්සාහ කළා.මම හිතන විදියට මෙම අර්බුදකාරී මොහොත ආර්ථික හේතූන් නිසා පමණක් නොවෙයිරජය සහ නායකයින් විසින් සිදු කරනු ලබන මර්දනය සම්බන්ධ අනෙකුත් බොහෝ හේතූන් නිසා ද ඉතාමත් වැදගත්.ප්‍රබල දේශපාලන මැදිහත්වීමක් සිදු කිරීමට කලාවට අති විශාල හැකියාවක් තිබෙන බව මට විශ්වාසයි. මට අවශ්‍ය වුණේ මගේ රංගනයන් සහ සංගීතය තුළින්ජනතාවගේ දුක්ගැනවිලි ප්‍රකාශය කිරීමටයි. එම නිසා විශාල සමූහයක සාමාජිකයන් ලෙස අපි අපගේ කලාව හරහා අපට කළ හැකි සියලු දේ කිරීමට උත්සාහ කළා. අපි දේශපාලනයේ දී නිර්මාණශීලී විය යුතු අතර, විරෝධය දැක්වීම අතිශය නිර්මාණශීලී විය යුතුයි" (අප්පුහාමි 2022).

[2] බේකරියෙ කට්ටිය යනු විකල්ප සංගීතය, විකල්ප රංගනය සහ දෘශ්‍ය කලා හඳුන්වා දෙමින් රඟ දක්වන කලාකරුවන්ගේ එකමුතුවක් වේ. නො.42/2, මහල්වරාව පාර, පන්නිපිටිය. 10230. ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි Bakeriya Space Art Centre පිහිටා ඇත. (bakeriyekattiya 2022)



*22වෙනි ඡායාරූපයඃ ශ්‍රී ලාංකික රංගන ශිල්පී ජෙහාන් අප්පුහාමි 2019 වර්ෂයේ පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් විපතට පත් වූවන්ට යුක්තිය ඉල්ලා ජීව ප්‍රමාණයේ කුරුසයක් උරහිස මත තබාගෙන ජනාධිපති කාර්යාලය වෙත පැමිණ සිය තෙදින පා ගමන නිමා කරන අවස්ථාව (ගමගේ, යුක්තිය 2022)*

ඕගා එකමුතුව, පද්මිණී ගමගේ රංගන කණ්ඩායම, ජනනි කුරේ, ප්‍රබුද්ධ දික්වත්ත ඇතුළු තවත් බොහෝ දෙනෙක් විවිධ විරෝධතා වැඩසටහන්වලට සමාග ාමීව ඔවුන්ගේ කලා නිර්මාණ ඉදිරිපත් කළහ. මෙම විරෝධතා වැඩසටහන්වලට පාස්කු ඉරු දින යුක්තිය උදෙසා විරෝධතාවය සහ 1983 වර්ෂයේ දී දෙමළ ජනයාට විරුද්ධව පැවති කලු ජූලිය කෝලහාලයේ දී සහ ඉන් පසුව යුද්ධයේ දී මියගියවුන්ගේ ආදරණීයයන් සිහිපත් කිරීම සඳහා දරන ලද ප්‍රයත්නයන්හි දී ජීවිතක්ෂයට පත් වූ සියලුම පුද්ගලයින් අනුස්මරණය කිරීමමෙම විරෝධතා ක්‍රියාමාර්ගවලට ඇතුළත් විය. විරෝධතා ව්‍යාපාර ඉදිරියට යත් ම, කලාකරුවන් බොහෝ දෙනෙක් පුද්ගලිකව විරෝධතාවයට එක් වී ඔවුන්ගේ සිතුවම් බෙදා ගනිමින්, විවිධ විරෝධතා ක්‍රියාමාර්ගවලට සහාය දෙමින් විවිධ ස්ථානවල දී මහජන ප්‍රසංග වේදිකා ගත කළහ. අජිත් කුමාරසිරි, නමානි පංචාලි, දිනූපා කෝදාගොඩ, නදීක වැලිගොඩපොල සහ ඉන්දිකා උපමාලි වැනි සංගීත ශිල්පීහු සංගීතයෙන් සහ විරෝධය හඟවන ගීත තුළින් විරෝධතා ව්‍යාපාරයට දායක වූහ. ගායිකා දිනූපා කෝදාගොඩ ඉස්මතු කර දක්වන ආකාරයට, "විරෝධය සඳහා නාදයක් නිර්මාණය කිරීමේ බලය සංගීතයට තිබේ. සංගීතයට මෙවැනි විරෝධතා ව්‍යාපාර ඉතා සජීවී කළ හැකි අතර, ජනතාවගේ විරෝධතා ක්‍රියාකාරකම් වලදී අවිහිංසාවේ ජීව ගුණය සුරක්ෂිත කළ හැකියි" (කෝදාගොඩ 2022).

අරගලය පිළිබඳ ගීත සහ සංගීත වීඩියෝ නිර්මාණය කිරීම ප්‍රවණතාවයක් බවට පත්විය. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ දූෂිත දේශපාලඥයින් පිළිබඳ මංජුල වෙඩිවර්ධනගේ පද්‍යයක් පාදක කර ගනිමින් "පල් හොරුනි" (දේශපාලන හොරු) ගීතය නිර්මාණය කරන ලදී (උපමාලි 2022).



*23 වෙනි ඡායාරූපයඃරාජපක්ෂ පාලනය යටතේ අත්විඳින ලද මර්දනයනිරූපණය කරන අරගලයේ තරුණ කලාකරුවෙක් (ගමගේ, සාටකය මර්ධනය, 2022)*

සිනමාව සහ චලන චිත්‍ර යනු ජනතා විරෝධතා ව්‍යාපාරය තුළ විවිධ අයුරින් භාවිත කරන ලද තවත් ප්‍රබල කලා මාධ්‍යයක් විය. "ජන අරගලයේ කලාකරුවෝ" එකමුතුව මගින් දූලීකා මාරපන, සුජීව ප්‍රියලාල්,නාමල් ජයසිංහ, ජගත් මනුවර්ණ කොඩිතුවක්කු, සමනලී ෆොන්සේකා සහ පීටර් ද අල්මේදා ඇතුලු තවත් කලාකරුවන් රැසක් ගොඨාගෝගම පරිශ්‍රයේ සිනමා ශාලාවක් පිහිටුවීමට මූලිකත්වය ගත් අතර, එය "කඳුළු ගෑස් සිනමාහල" යනුවෙන් නම් කරන ලදී. චිත්‍රපට අධ්‍යක්ෂකවරයෙක් සහ රංගන ශිල්පියෙක්වන ජගත් මනුවර්ණ ප්‍රකාශ කළ පරිදි "කඳුලු ගෑස් කියන්නෙ අරගලයේ අතරතුර දී සාමකාමී මහජන උද්ඝෝෂණ මැඩපැවැත්වීම සඳහා රජයේ හමුදාව පුරුද්දක් වශයෙන් භාවිත කළ දෙයක්. ගෑස් කැනිස්ටරය පිපිරීමෙන් පසුව එය පුද්ගලයෙකුගේ ඇස්වලට සෘජුවම බලපානවා. කිරීම සඳහා විකල්ප කලාවන් ඉතා වැදගත් වේ. ජනතා අරගලය විකල්ප කලාවන් ව්‍යාප්ත කිරිම සඳහාත්, ප්‍රතිවෘත්තාන්ත සඳහාත් වන අවකාශයක් බවට සහ එම පණිවිඩය විශාල ජනකායක් වෙත රැගෙන යාමේ මාධ්‍යයක් බවට පත් වූ බව මම දුටුවෙමි" (එම).

සමාජ, දේශපාලන සහ ආර්ථික ගැටළුසම්බන්ධ චිත්‍රපට අධ්‍යක්ෂණය කළ තරුණ චිත්‍රපට අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ නිර්මාණ ප්‍රදර්ශනය කිරීම සඳහා කලාකරුවන්ගේ එකමුතුව විසින් වේදිකාව විවෘත කරන ලදී. සෑම දිනකම ගෝලීය මට්ටමේ සමාජ හා දේශපාලන ව්‍යාපාරයන් සම්බන්ධ චිත්‍රපටයක් තිරගත විය. මෙය ගාලුමුවදොර නිදහස් චිත්‍රපට උළෙලේ විශාල පිරිසක් අතර දේශීය විරෝධතා ව්‍යාපාරයේ නිර්මාණශීලීත්වය ව්‍යාප්ත කිරීම සඳහා උපකාරී විය." අපිට ඕනැ වුණේ අපගේ හැකියාවෙන් අරගලයට



*24 වෙනි ඡායාරූපය: පාර්ලිමේන්තු පාර අත්පත්කර ගැනීමෙන් පසු සජීවී සංගීත කණ්ඩායම් ප්‍රසංග යක දී සංගීතවේදී අජිත් කුමාරසිරි " පාර්ලිමේන්තුවේ ජලභීතිකාව" නම් ගීතය ගායනා කරයි. විරෝධතාකරුවන් පාර්ලිමේන්තු පිවිසුම අත්පත්කර ගෙන එය "හොරුගෝගම" ලෙස නම් කළහ (ගමගේ, පාර්ලිමේන්තුවේ ජලභීතිකා රෝගය, 2022).*

සිනමාව ඇස් වලින් බලා අගය කරන නිසා මෙය" කඳුළු ගෑස් සිනමාව" යනුවෙන් නම් කිරීම විරෝධය දැක්වීමේ ක්‍රියාවක්". (මනුවර්ණ 2022). දේශපාලනය සහ විරෝධය දැක්වීම අවබෝධකර ගැනීමට නිර්මාණාත්මක යාන්ත්‍රණ ඇතුළත් කිරීමේ වැදගත්කම මනුවර්ණ වැඩිදුරටත් අවධාරණය කළේය. "පාලක පන්තියේ මැදිහත්වීම් හස්තයන් ඔස්සේ ජනප්‍රිය සංස්කෘතිය හරහා ගොඩනැගෙන ප්‍රධාන ධාරාවේ මතවාදයන් නිතරම පවතියි.මෙම අවස්ථාවේ දී, බලය දරන්නන්ගේ මූලික ම බලයන් විසින් ස්ථාපනය කරන ලද එම මතවාදී ගොඩනැගීමට ප්‍රතිවිරෝධය එල්ල පහසුකම් සැලසීමටයි. සිනමාහල්වල චිත්‍රපට නරඹන්නේ ස්වල්ප පිරිසක්. විවිධ හේතු නිසා අපිට ගෝඨාගෝගම ඒකාබද්ධ දේශපාලන අවකාශයතුළ සිටි සියලු දෙනා සඳහා"කඳුළු ගෑස් සිනමාහල" විවෘත කරන්න ඕනැ වුණා. මෙම ව්‍යාපාරය ක්‍රියාවලියක් වන අතර, ජනතාවගේ අයිතිය දිනා ගැනීම සඳහා කලාවට විශාල දායකත්වයක් ලබා දෙමින් දේශපාලනික වශයෙන් මැදිහත් විය හැකියි"යනුවෙන් කඳුළු ගෑස් සිනමාහල පිහිටු වීම සඳහා පුරෝගාමී වූ චිත්‍රපට නිෂ්පාදකවරියක් සහ කලාකාරිනියක් වන නයෝමි අප්සරා ප්‍රකාශ කළාය (අප්සරා 2022).




25 වෙනි ඡායාරූපයඃ ආරම්භක දිනය - ගෝඨාගෝගම කඳුළු ගෑස් සිනමාහල තුළ චිත්‍රපට තිරගත කිරීම (ගමගේ, කඳුළු ගෑස් සිනමාහල, 2022).




26 වෙනි ඡායාරූපයඃ අසංක සායක්කාර විසින් අධ්‍යක්ෂණය කර, ගෝඨාගෝගම එළිමහන් රංග පීඨයේ දී වේදිකාගත කරන ලද දේශපාලන උපහාසාත්මක නාට්‍යය "සංගදාසගේ චූටි කලිසම" (ගමගේ, සංගදාසගේ චූටි කලිසම, 2022)

ජන අරගලයේ දී නාට්‍ය සමාජ හා දේශපාලන දොම්නස ප්‍රකාශ කිරීමේ ඒකාබද්ධ ක්‍රමයක් බවට පත් විය. නාට්‍ය අධ්‍යක්ෂකවරුන් වන අසංක සායක්කාර, නාමල් ජයසිංහ සහ අතුල පතිරණ විසින් "අරගලයේ රඟමඩල" (ජන අරගලයේ එළිමහන් රංග පීඨය) පිහිටුවන ලදි. සායක්කාර මෙසේ පැවසුවේයඃ "අපි පළමුවෙන් ම උද්ඝෝෂණය කරන්න ආවේ අප්‍රේල් 09 වෙනිදා. ඊට පස්සෙ අපි කල්පනා කළා පසුගිය කාලෙ අපි අත්විඳපු දේ ප්‍රකාශ කරමින් නාට්‍ය මගින් මේ විරෝධයට අපේ දායකත්වය ලබා දිය හැක්කේ කොහොම ද කියලා." මෙහිදී රඟ දක්වන ලද "මෙය තුවක්කුවක් නොවේ", "සංගදාසගේ චූටි කලිසම" සහ "සඟ වෙද ගුරු ගොවි කම්කරු" ඇතුළු බොහෝ නාට්‍ය දේශපාලනික නාට්‍ය වන අතර, ඒවා අපගේ රටෙහි දේශපාලන හා සමාජ දුක්ගැනවිලි සාකච්ඡා කිරීම අරමුණු කර ගත් ඒවා විය. අප සියලු දෙනා ම දන්න පරිදි, ශ්‍රී ලංකාවේ විරෝධතා කලාවන් මෙම පිරිස තුළ එක්තරා කොටසකට සීමා වෙලා තිබුණෙ. විශේෂයෙන් ම රසවත් නාට්‍යයක් සහ රංගනයකිනුත් ඔබ්බට ගොස් එය විශාල කවයක් තුළට ගැනීම සඳහා මෙම දේශපාලනික ව්‍යාපාරය භාවිත කිරීමටයි අපට අවශ්‍ය වුණේ" (සායක්කාර 2022).




27 වෙනි ඡායාරූපයඃ මව සහ දරුවා (පෙරේරා 2022) අරගලය නිරූපණය කරන සංකේතාත්මක රූපය බවට පත් වූ අතර, පසුව එය බැනර්, පෝස්ටර්, ශරීරයේ ඇඳි සිත්තම් සහ සමාජ මාධ්‍ය සඳහා ග්‍රැෆික් ප්‍රතිනිෂ්පාදන මාර්ගයෙන් භාවිත කරන ලදි. 2022).

මිරිහාන උද්ඝෝෂණයේ දී එම විරෝධතාවයට සහභාගි වූ චානුක නදුන් පෙරේරා විසින් ගන්නා ලද "මව සහ දරුවා" ඡායාරූපය ශ්‍රී ලංකාවේ ජනතා විරෝධතා ව්‍යාපාරයේ සංකේතාත්මක අනුරුව බවට පත් විය. චානුක සඳහන් කරන පරිදි "මම ජීවත් වන්නේ මිරිහාන පැඟිරිවත්ත ආසන්නයේ. ආර්ථික පීඩන හේතුවෙන් මගේ අසල්වැසියන් එවකට ජනාධිපතිව සිටි ගෝඨාභය රාජපක්ෂගේ පෞද්ගලික නිවස

අසල රැස්වී විවිධ ඉල්ලීම් ඉදිරිපත් කරමින් ඔවුන්ගේ දුක්ගැනවිලි ප්‍රකාශ කරමින් සිටියා. විරෝධතාව අතරතුර තම දරුවා වඩාගෙන සිටි මවක් සටන් පාඨ පුවරු අතැතිව ඉදිරියෙන්ම විරෝධතාවයේ යෙදී සිටිනවා මම දැක්කා. මම එම ස්ථානයට ගිහින් මාගේ ජංගම දුරකථනයෙන් ඔවුන්ගේ ඡායාරූපයක් ලබා ගෙන එය ඒකවර්ණ ස්වරූපයෙන් මගේ ට්විටර් සහ ෆේස්බුක් ගිණුම් ඔස්සේ බෙදා ගත්තා. එය සංකේතාත්මක ඡායාරූපයක් බවට පත් වෙයි කියලා මට අදහසක් තිබුණෙ නැහැ, නමුත් පසුදා උදෑසන රජයේ හමුදා විසින් මිරිහාන විරෝධතාව දැවැන්ත ලෙස මර්දනය කිරීමෙන් පසුව ශ්‍රී ලංකාවේ මෙම ජනතා විරෝධයේ සංකේතය ලෙස එම ඡායාරූපය සංසරණය වන ආකාරය සහ ප්‍රතිනිෂ්පාදනය වන ආකාරය දැකල මම පුදුම වුණා" (පෙරේරා, මව සහ දරුවා අරගලයේ සංකේතාත්මක ඡායාරූපය, 2022).

"මානව ඉතිහාසයේ රූපවලට අතිවිශිෂ්ට කාර්යභාරයක් ඉටු කළ හැකියි. විශේෂයෙන් ම දේශපාලන සන්දර්භය තුළ, ඊළඟ මොහොත අවබෝධ කර ගැනීමට සහ ප්‍රතිචාර දැක්වීමට අපි දකින දේ නිර්වචනය කිරීම ඉතා වැදගත් වෙනවා. ශ්‍රී ලංකාවේ ජන අරගලය දේශපාලන ප්‍රතිරූප ඇතුළත් කිරීමේ වඩා විශාල අවකාශය බවට පත් වූ අතර, මෙම පින්තූර ජනතාව ඒකරාශී කිරීම සඳහා බලපෑමක් ඇතිකරන ක්ෂණික ප්‍රතිචාරයක් නිර්මාණය කළේය"යනුවෙන් දේශපාලන ආර්ථික විද්‍යාඥ සහ සමාජ වාර්තාමය ඡායාරූපකරණ වෘත්තිකයෙක් වන කල්ප රාජපක්ෂ ප්‍රකාශ කළේය. (රාජපක්ෂ 2022). ජන අරගලය ආරම්භයේ සිටම එය ඡායාරූපගත කළ ප්‍රවීණ ඡායාරූප මාධ්‍යවේදියකු වන අජිත් සෙනවිරත්න "අපි ජීවත් වන්නේ දෘශ්‍ය යුගයකයි. තාක්ෂණික දියුණුවත් සමගදෘශ්‍ය මාධ්‍ය මිනිසුන්ගේ එදිනෙදා ජීවිතයේ කොටසක් බවට පත්වෙලාතියෙනවා. පිංතූර වලට සමාජයේ විවිධ ස්තර නිරූපණය කළ හැකියි. දෘශ්‍ය දේශපාලනයේ ගතිකයන් සාම්ප්‍රදායික මාධ්‍ය ක්‍රම වලින් ඉතා ඔබ්බට යනවා.උදාහරණයක් ලෙස, ඩිජිටල් යුගයේ ප්‍රචලිතව ඇති ෆේස්බුක් මාධ්‍යයේ සිට ට්විටර් සහ ඉන්ස්ටග්‍රෑම් දක්වා වූ විවිධ ආකාරයේ නව මාධ්‍ය ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රය පුරා වැදගත් කාර්යභාරයක් ඉටු කරනවා" යනුවෙන් ප්‍රකාශ කළේය. (සෙනවිරත්න 2022).

ඡායාරූප මාධ්‍යවේදී ෂෙහාන් ගුණසේකර දශකයකට අධික කාලයක් පුරා විවේචනාත්මක සමාජ වාර්තාමය ඡායාරූපකරණයේ යෙදී සිටින අතර, ඔහුගේ කාර්යයන් යුද්ධය සහ පශ්චාත් යුධ අති- ජාතිකවාදය ඇතුළු බොහෝ දේශපාලන සිදුවීම් සමගසම්බන්ධ වීපවතියි.ඔහු විවිධ සිදුවීම් සහ සිදුවීම් වලට අදාළ සමාජ-දේශපාලන සංසිද්ධීන් ඡායාරූපගත කිරීමටත්, එම සමාජ දේශපාලන සංසිද්ධීන් ප්‍රශ්න කිරීමටත් කැපවී සිටියේය. දෘශ්‍ය රූපයේ ප්‍රතිඵලය ප්‍රධානධාරාවේ සහ ජනප්‍රිය වෘත්තාන්ත වලින් ඔබ්බට යනුඇතැයි ඔහු අදහස් කළේය "ජනතා අරගලය මට සහ තවත් බොහෝ දෙනෙකුට එම අවකාශය විවර කර දුන්නා. මට අවශ්‍ය වුණේ මගේ විරෝධය ප්‍රකාශ කිරීමට සහ ගෝඨාගෝගම ජනතා අරගලයට සහ විරෝධතා ව්‍යාපාරයට සහයෝගීතාවය ප්‍රකාශ කිරීමටයි." (ගුණසේකර 2022). තරුණ ඡායාරූප මාධ්‍යවේදියෙකු වන තිලිණ කළුතොටගේ නිරීක්ෂණය කළ ආකාරයට,"පසුගිය මාර්තු මාසයේ සිට මම අරගලයට අදාළ විවිධ සිදුවීම් පරීක්ෂණයකරමින් සහ ඒවා ග්‍රහණය කර ගැනීම ප්‍රගුණ කරමින් සිටියා. විරෝධතාවන් ග්‍රහණය කර ගැනීම සඳහා වඩාත් ම ඵලදායී ක්‍රමය ඡායාරූපකරණය බව මම සිතනවා" (කලුතොටගේ 2022).



*28 වෙනි ඡායාරූපය:සංකේතාත්මක "මව සහ දරුවා"ඡායාරූපයෙහි චිත්‍රයක් සහිත කොඩියක් රැගෙන යන විරෝධතාකරුවෙක්.ජන අරගලයේ 50 වෙනි දින පාගමනේ ගන්නා ලද ඡායාරූපය (ගමගේ, මව සහ දරුවා සිටින ධජය 2022).*



*29 වෙනි ඡායාරූපයඃ කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට ප්‍රවේශවීමේ මාර්ගයේ දී විරෝධය දැක්වීමේ රංගනයක්. නීතිවිරෝධී අත්තඩංගුවට ගැනීම්වලට එරෙහි විරෝධතා සහ රාජපක්ෂහිතවාදීන් විසින් ගෝඨාගෝගමට එල්ල කළ ප්‍රහාරය සම්බන්ධයෙන් යුක්තිය ඉල්ලා සිටීම (ගමගේ, නීතියේ ආධිපත්‍යය, 2022)*

## නිගමනය



*30වෙනි ඡායාරූපයඃ ජනාධිපති මන්දිරය අත්පත්කර ගැනීමේ විරෝධතාවය සඳහා දහස් සංඛ්‍යාත විරෝධතාකරුවන් කොළඹ වැතම් වීදියේ රැස්ව සිටියහ. 2022 ජූලි 9 වෙන දින හිටපු ජනාධිපති ගෝඨාභයබලයෙන් පහ කිරීමට පෙර ගන්නා ලදි. (ගමගේ, 2022 ජූලි 9 වන දින).*

මාධ්‍යයක් ලෙස කලාවට සමාජය තුළ පුළුල් කථිකාවන් සහ වාද විවාදයන් නිර්මාණය කිරීමේ හැකියාව ඇත. දේශපාලනයෙන් තොර කිසිවක් ජීවිතයේ නොමැති අතර සෑම කලාවකටම ඍජු හෝ වක්‍ර දේශපාලන අර්ථයක් ඇත. පාලක පන්තිය නූතන රාජ්‍යයේ ආධිපත්‍යය උසුලනුයේ එහි බලතල ක්‍රියාත්මක කිරීම මගිනි.

කලාව සහ කලාත්මක ප්‍රකාශනය එම බලයදරන්නන්ට සම්බන්ධව දිශා දෙකකට ගමන් කරයි. ජනප්‍රිය

සංස්කෘතියේ අධිපතිවාදී දෘෂ්ටිවාදය තහවුරු කරන ජනප්‍රිය වෘත්තාන්තය දෙසට ගමන් කිරීම එක් දිශාවක් වන අතර,ප්‍රධාන ධාරාවේ වෘත්තාන්තයට ප්‍රතිවිරුද්ධ වෘත්තාන්තයක් ප්‍රශ්න කිරීමට ලක්කරන සහ නිෂ්පාදනය කරන විකල්ප වෘත්තාන්තය දෙසටග මන් කිරීම අනෙක් දිශාව වේ.

ප්‍රධාන ධාරවේ කලාව මාධ්‍ය සහ අනෙකුත් බහුවිධ මූලාශ්‍ර හරහා ජනප්‍රිය විස්තාරණ සහ වර්ණනා කිරීම් රස විඳියි. එය ජනප්‍රිය සංස්කෘතියේ ඍජු හෝ වක්‍ර කොටසක් වන අතර,අධිපතිවාදී මතවාදය දේශපාලන, ආර්ථික සහ සමාජයීය අවශ්‍යතාවලට අදාළව බහුතරයක් දෙනාට මර්දනකාරී සහ අවාසිදායක වුව ද එය අධිපතිවාදී මතවාදය ගොඩ නගා එය තහවුරු කරයි. විකල්ප කලාවන්ට අප අවට සිදුවන, ජනතා අවශ්‍යතාවලට එරෙහිව ක්‍රියාත්මක වන සංසිද්ධිය ප්‍රශ්න කිරීම මගින් ප්‍රතිවෘත්තාන්තයක් නිර්මාණය කළ හැක. බොහෝවිට, මෙම වෘත්තාන්තය සංසරණය වන්නේ,ග්‍රහණය කර ගන්නේ සහ අවබෝධ කර ගන්නේ සීමිත පුද්ගලයින් පිරිසක් විසින් පමණි.

කෙසේවෙතත්, එය වැදගත් වන අතර එය බලය දරන්නන් සහ ජනතාව අතර සම්බන්ධතාවය කෙරෙහි බලපායි. ප්‍රධාන ධාරාවේවෘත්තාන්ත සහ ව්‍යාජ වෘත්තාන්ත වලින් ඔබ්බට ගොස්, සත්‍යය විස්තර කිරීමටත්, ජනතාවගේ දෘෂ්ටි කෝණයෙන් යථාර්ථය ප්‍රකාශ කිරීමටත් විකල්ප කලාවට හැකියාව ඇත.

රාජපක්ෂ පාලනයට එරෙහි සටන ආරම්භයේ සිටම විවිධ කලාකරුවන් ඔවුන්ගේ විවිධාකාර වූ දේශපාලන කලාවන් යොදා ගැනීම මගින් ශ්‍රී ලංකාවේ ජනතා ව්‍යාපාරය ශක්තිමත් විය. මෙම ජනතා අරගලය සහ විරෝධතා ව්‍යාපාරය පුරාවටම ප්‍රධාන ධාරාවේ කලාවෙහි වෘත්තාන්තය හරහා පැනවූ එම සීමාකිරීම් ජය ගැනීමට විකල්ප කලාව සමත් විය. විකල්ප කලාවල විරෝධය ප්‍රකාශ කිරීමටත් රාජපක්ෂ දේශපාලන උරුමය ප්‍රශ්න කිරීමටත්, විශාල ජනකායක් ඒකරාශී කිරීමටත් මූලිකත්වය ගත්තේය. එක්සේසත් වූ ජනතාව දේශපාලන විරෝධතාවයට සක්‍රීයව සහභාගී වෙමින් නිර්මාණශීලීව දායක වූහ. මේ අනුව, දැන් විකල්ප කලාව තමන්ගේම උරුමයක් නිර්මාණය කර ඇත.

## ආශ්‍රිත ලිපි


Bleiker, Roland. 2018. "Aesthetic Turn in International Relations." Oxford Bibliographies . June 27, 2018. https://www.oxfordbibliographies.com/display/document/obo-9780199743292/obo-9780199743292-0236.xml#:~:text=The%20study%20of%20aesthetics%20is,seemingly%20trivial%20realm%20of%20aesthetics. (accessed December 06, 2022).

de Silva , Samantha, and Angeline Ondaatje. 2022. Aragalaya art: Preserve it for posterity. August 28, 2022. https://www.sundaytimes.lk/220828/plus/aragalaya-art-preserve-it-for-posterity-492814.html (accessed December 21, 2022).

Appuhami, Jehan Srikantha, interview by Sakuna Gamage. 2022. Art Resistance and Aragalaya (December 15, 2022).

Apsara, Nayomi, interview by Sakuna Gamage. 2022. Aragalaya,Art & Cinema (December 20, 2022).

ඉakeriyekattiya. bakeriyekattiya. 2022. https://bakeriyekattiya.org/ (accessed January 17, 2023).

Benjamin, Walter. 1936. The Work of Art in the Age of Mechanical Reproduction. London, UK: Penguin.

ColomboPage. 2022. Massive protests near President's private residence demanding Sri Lankan President to 'go home'. March 31, 2022. http://www.colombopage.com/archive_22A/Mar31_1648747227CH.php (accessed 12 01, 2022).

Gamage, Sakuna M. 2022. Candlelight Vigil at Kohuwala. Kohuwala, March 01, 2022.

Gamage, Sakuna M. 2022. 9th of July. Colombo, July 09, 2022.

Gamage, Sakuna M. 2022. A Father's Grief. Colombo, May 27, 2022.

Gamage, Sakuna M. 2019. Anti CCA Protesters at New Delhi India. New Delhi, December 15, 2019.

Gamage, Sakuna M. 2022. Bekariya Kattiya. Colombo, April 09, 2022.

Gamage, Sakuna M. 2022. Cylinder Protest. Colombo, May 08, 2022.

Gamage, Sakuna M. 2022. GGG Galle. Galle, June 12, 2022.

Gamage, Sakuna M. 2022. Gotagogama Kalagaraya. Colombo, April 2022.

Gamage, Sakuna M. 2022. Jana Aragalaye Kalalaruwo. Kollupiliya, April 29, 2022.

Gamage, Sakuna M. 2022. Justice. Colombo, April 22, 2022.

Gamage, Sakuna M. 2022. Justice Walk. Baticaloa, July 2022.

Gamage, Sakuna M. 2022. Little Girl & Mom in times of Crisis. Colombo, May 21, 2022.

Gamage, Sakuna M 2022. Monk Protester. Colombo, April 13, 2022.

Gamage, Sakuna M. 2022. Occupy Galle Face Movement. Colombo, April 09, 2022.

Gamage, Sakuna M. 2022. People's Power. Colombo, July 09, 2022.

Gamage, Sakuna M.2022. People's Soveringty. Colombo, April 09, 2022.

Gamage, Sakuna M. 2022. Petrol Queue in Kelaniya. Kelaniya, May 25, 2022.

Gamage, Sakuna M.2022. Rabies in the Parliment. Battaramulla, May 06, 2022.

Gamage, Sakuna M. 2022. Sanagadasage Chooti Kalisama. Colombo, June 2022.

Gamage, Sakuna M. 2022. Tear Gas Cinema. Colombo, May 10, 2022.

Gamage, Sakuna M. 2022. The Creative Protester. Colombo, June 13, 2022.

Gamage, Sakuna M. 2022.The Farmers Protest. New Delhi, August 03, 2017.

Gamage, Sakuna M. 2022. The Forms of Resistence . Colombo, June 09, 2022.

Gamage, Sakuna M. 2022. The Hungry Ghost. Colombo, April 2022.

Gamage, Sakuna M. 2022. The Mother & Child Flag. Colombo, May 29, 2022.

Gamage, Sakuna M. 2022. The Rule of Law. Colombo, May 25, 2022.

Gamage, Sakuna M. 2022. The Suppression of Satakaya. Colombo, May 29, 2022.

Gramsci, Antonio. 2022. Selections from Prison Notebooks. London: Lawrence & Wishart, 1971.

Gunasekara, Shehan, interview by Sakuna Gamage. 2022. Aragalaya and Photograph (December 25, 2022).

Kalutotage, Thilina, interview by Sakuna Gamage. 2022. Argalaya and Photograph (December 25, 2022).

Kodagoda, Dinupa, interview by Sakuna Gamage. Aragalaya and Music resistance (December 24, 2022).

Manuwarna, Jagath, interview by Sakuna Gamage. 2022. Art,Aragalaya and Role of Cinema (Decemeber 16, 2022).

News1st. April 1st, 2022. https://www.newsfirst.lk/2022/04/01/37-people-injured-in-mirihana-protest/ (accessed 12 02, 2022).

Ortland, Eberhard ; Hoban, Wieland; Adorno, Theodor W;. Aesthetics. Wiley , 2017.

Perera, Chanuka Nadun, interview by Chanuka Nadun Perera. 2022. The iconic Mother and Child photograh of Aragalaya (January 10, 2022).

Perera, Chanuka Nadun. 2022. The Mother & Child. Mirihana, March 31, 2022.

Rajapaksha, Kalpa, interview by Sakuna Gamage. 2022. Aragalaya and Visual Resistance (December 22, 2022).

Rathnayaka, Sujith, interview by Sakuna Gamage. 2022. Art and Aragalaya (December 10, 2022).

SAHO. 2011.Towards a people's culture - Art and Resistance under Apartheid. October 19, 2011. https://www.sahistory.org.za/article/towards-peoples-culture-art-and-resistance-under-apartheid (accessed December 20, 2022).

Sayakkara, Asanka, interview by Sakuna Gamage. Aragalye Rangamadala(Theatre of People's Struggle) (December 24, 2022).

Senevirathna, Ajith, interview by Sakuna Gamage. 2022. Aragalaya and Photograph (December 25, 2022).

Singh, Priyanka. 2021. The Power Of Art: An Instrument For Activism & Resistance. July 08, 2021. https://feminisminindia.com/2021/07/08/the-power-of-art-an-instrument-for-activism-resistance/ (accessed December 03, 2022).

Sonderegger, Ruth, and Ines Kleesattel. 2021. "AESTHETICS AND POLITICS." In Introduction to Philosophy: Aesthetic Theory and Practice, by Valery Vino, 108-124. Qubec: Rebus Community, 2021.

Upamali, Indika. youtube.2022. April 8, 2022. https://www.youtube.com/watch?v=83hHkG6s-A8 (accessed December 25, 2022).

LAW & SOCIETY TRUST

**නීතිය හා සමාජය භාරය**

3, කින්සි ටෙරස්, කොළඹ 8
දුරකථනය : +94 11 2691228/2684845/2684853
ෆැක්ස් : +94 11 2686843
ඊ-මේල් : info@lstlanka.org

*අනුග්‍රහය-*
diakonia
PEOPLE CHANGING THE WORLD